# දහම්ගුරු මධ්‍යම විභාගය

# අත්පොත



ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# දහම් ගුරු මධ්‍යම විභාගය සඳහා අත්පොත



ශ්‍රී ලංකාවේ කතෝලික දහම් ගුරුවර, ගුරුවරියන් හට ඔවුන්ගේ දහම් දැනුම වර්ධනය කිරීම අරබයා, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් විභාග තුනක් පවත්වනු ලැබේ. එනම් දහම් ගුරු ප්‍රථම විභාගය, දහම් ගුරු මධ්‍යම විභාගය හා දහම් ගුරු අවසාන විභාගය වශයෙනි.

දහම් ගුරු මධ්‍යම විභාගයට පෙනී සිටින දහම් ගුරුවරුන් සඳහා විෂය නිර්දේශය ඇතුළත් කර මෙම පොත සම්පාදනය කර ඇත.

මෙම අත්පොත තුළින්, ශුද්ධවූ බයිබලය, දේව ප්‍රසාද නිධාන, දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශන, සන්නිවේදන මාධ්‍යයන් හා ආගම ඉගැන්වීමේ ක්‍රම, ලංකාවේ හා ලෝකයේ ශුද්ධවූ සභා ඉතිහාසය පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය. පළමු ප්‍රශ්න පත්‍රය සඳහා පාඩම් අංක 01 සිට 05 දක්වා ද, දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා 6 වන පාඩමේ සිට 9 වන පාඩම දක්වා ද, අධ්‍යයනය කළ යුතුය. දහම් ගුරු ප්‍රථම විභාගය සමත් අයට හෝ අ.පො.ස. (උ./පෙ.) ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය සමත් අයට දහම් ගුරු මධ්‍යම විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලැබෙනු ඇත. දහම් ගුරු මධ්‍යම විභාගයට පෙනී සිටින ඔබට අවශ්‍ය දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කර ගැනීමට මෙම අත්පොත මහඟු රුකුලක් වනු නොඅනුමානය.

ජේසු පිහිටයි.

ප්‍රදීප් නිරෝෂන් ප්‍රනාන්දු පියතුමා
ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ,
ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# පටුන

| | | පිටු අංකය |
|---|---|---|
| 1. | ශුද්ධවූ බයිබලය අධ්‍යයනය | 03 |
| 2. | උත්පත්ති හා නික්මයාම පොත් පිළිබඳ අවබෝධය | 10 |
| 3. | සමදර්ශක සුවිශේෂ ගැන පොදු හැඳින්වීම | 29 |
| 4. | ලූක් සුබාරංචිය | 45 |
| 5. | දේව ප්‍රසාද නිධාන | 56 |
| 6. | ශු. සභාව පිළිබඳ හා වර්තමාන ලෝකයේ ශු. සභාව පිළිබඳ වතිකාන ප්‍රකාශන පිළිබඳ අවබෝධය | 75 |
| 7. | සන්නිවේදන මාධ්‍යයන් හා ආගම ඉගැන්වීමේ ක්‍රම | 91 |
| 8. | මධ්‍යම හා නූතන යුගයේ ශු. සභා ඉතිහාසය | 97 |
| 9. | ලංකා සභා ඉතිහාසය (පෘතුගීසි යුගයට පෙර හා පෘතුගිසි යුගය) | 107 |

ISBN : 978-624-6121-01-3
නව මුද්‍රණය : 2025/03/28
මුද්‍රණය : එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 27/18 ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.
0112 384028 / 011 2 390873

හිමිකම් ඇවිරිණි

# පළමුවන පාඩම

## 1. ශුද්ධවූ බයිබලය අධ්‍යයනය

## 1.1 පංච පුස්තකය පිළිබඳ හැඳින්වීම

### 1.1.1 කර්තෘත්වය

පංච පුස්තකය යනු ශු. බයිබලයේ අඩංගු වන පළමු පොත් 5 වේ. එනම්, උත්පත්ති පොත, නික්මයාම, ගණන් කථාව, ලෙවි ව්‍යාවස්ථාව, ද්විතිය නීති සංග්‍රහය යන ග්‍රන්ථයන් ය.

පංච පුස්තකය, මෝසස්ගේ පොත් පහ වශයෙන්ද හඳුන්වනු ලබයි. නමුත් ඉන් අදහස් වන්නේ, ඒවා මෝසෙස් තුමා ලේඛනගත කළ වගක් නොවේ. පංච පුස්තකයේ ඇති ශෛලීන් සැළකිල්ලට ගැනීමේදී (උත්පත්ති1:1-2, 4, 2:5-25)

* එකම සිද්ධිය නැවත නැවත සඳහන් වීම - උදා : විශ්වය මැවීම.
* එකම සිද්ධිය දෙයාකාරයකට විස්තර කිරීම - උදා : ජලගැල්ම, සතුන්ගේ ගණන (උත්පත්ති 6:5-8, 6:19,7:2,8-9)
* ඉතිහාසය ගොඩනැගීමත් සමඟ එකම සිද්ධිය වෙනස්වීම - උදා : නුමුහුන් පූප මංගල්‍යය
* එක් කථාවකින් තවත් කථාවක් කොපි කිරීම - උදා : ඊසාක් පිළිබඳ (උත්පත්ති 12 න් උපුටා ගෙන ඇත.)
* නීති සංග්‍රහයේ ඇති වෙනස්කම්.

මේ ආදිය සැළකිල්ලට ගැනීමේදී පංච පුස්තකය, එක පුද්ගලයෙකු නිර්මාණය කරන ලද්දක් නොවේ. එක් එක් ජන කොටස් තුළ පැවැති පාරම්පරික සම්ප්‍රදායයන් හතරක අනුග්‍රහයෙන් ලියැවී ඇති බව ය. ඒ අනුව මෙම ලේඛනයේ ඇති සම්ප්‍රදායයන් හතර මෙසේ දක්වමු.

### 1.1.2 පංච පුස්තකයට අයත් සම්ප්‍රදායන්

| වාචික කාලය | | ලිඛිත කාලය | |
|---|---|---|---|
| 1. "යාවේ" සම්ප්‍රදාය | (ජේ) | ක්‍රි.පු. 950 | 900 |
| 2. "එලොහිම්" | (ඊ) | ක්‍රි.පු. 750 | 722 |
| 3. "ද්විතිය නීති | (ඩී) | ක්‍රි.පු. 700 | 621 |
| 4. "පූජක සම්ප්‍රදාය" | (පී) | ක්‍රි.පු. 400 න් පසු | |

### 1.2. JEDP සම්ප්‍රදායයන්

**1. "යාවේ" සම්ප්‍රදාය (ජේ) - ක්‍රි.පු. 950 - 900**

මෙම සම්ප්‍රදායයට "ජේ" නම භාවිතා කරනුයේ, එහි දෙවියන් වහන්සේට 'ජාවේ' යන නම යොදා ඇති බැවිනි. සමහර ග්‍රන්ථවල 'යාවේ' නම ද යොදා ඇත. 'යාවේ' 'වයි' වෙනුවට 'ජේ' යෙදීමට හේතු වූයේ ජර්මන් භාෂාවෙන් දෙවියන් වහන්සේගේ නම ලිවීමේදී "ජේ" අකුර භාවිතා කිරීම ය. මේ සම්ප්‍රදාය තුළ මුල සිටම 'ජවේ' නම භාවිතා කිරීමයි. හිබෲ භාෂාවේ 'ය' හා 'ජ' අතර වෙනසක් නැති නිසා ද වේ.

**අ) සුවිශේෂ ලක්ෂණ**

- ඉපැරණි ආගමික හා නීතිමය සංකලනයක් අඩංගු වී ඇත.
- මැවීම් පිළිබඳ කියැවෙන දෙවැනි කතාවත් සමඟ ආරම්භ වී මෝසස්ගේ මරණයෙන් නිමවේ. (උත්පත්ති 2:4-25)
- උත්පත්ති පොතේ හරි අඩකටත් වඩා මේ සම්ප්‍රදාය ඇත. (ද්වි. 34:4-6)
- ඉතිරියෙන් වැඩි කොටසක් නික්මයාම හා ගණන් කථාවේ අඩංගු ය.
- ලෙවි කථාවේ 'පී' නැත.
- ද්විතිය නීති සංග්‍රහයේ ඇත්තේ ද සුළු වශයෙනි. (ද්වි. 31:1-30,34:1-12)
- අති පුරාණ ඉතිහාසය පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරයි.
- ජූදා ප්‍රදේශය (දකුණු රාජ්‍යයේ ජෙරුසලෙම ආශ්‍රිතව) ලියැවී ඇත.
- ජෙරුසලම ප්‍රධාන නගරයයි. දාවිත් රජ වාසල ගැන ඉහළින් වර්ණනා කරයි.
- දකුණු රාජ්‍යයේ 'ජූදා' හා 'සිමියොන්' ගේ ගෝත්‍ර ගැන සඳහන් වේ.
- සාහිත්‍යමය හා සංස්කෘතික කටයුතු සියල්ලක් ම ජෙරුසලෙමේ හා දාවිත් රජ වාසල තුළ සිදු වූ බවට සාක්ෂි දරයි.

ආ) **භාෂාමය හා සාහිත්‍යමය ලක්ෂණ**
- ඉතා සරල ය. පැහැදිලි ය. විවිධත්වයකින් යුක්ත ය.
- ස්වාභාවික මෙන් ම නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරයි.
- මේ සම්ප්‍රදායයේ කතුවරු ජනප්‍රිය අදහස් උදහස්වලට ගරු කර ඇත.
- කථාන්තරවල නිරූපිත චරිතවලට විශේෂ ලක්ෂණ ආරූඪකර ඇත. (ලාබන් තණ්හාධික පුද්ගලයෙකු ලෙස)
- ත්‍රාසජනක සිද්ධි නිපුණත්වයකින් ඉදිරිපත් කරයි.
- කථා වස්තු ජීවමාන ය, ස්වාභාවික ය.
- කථාන්තර තුළින් පාඨක කුතුහලය අවුස්සයි. (ආබ්‍රහම් හමුවීමට ආ අමුත්තෝ)
- සමකාලීන මෙසපොතේමියාවේ හා ඊජිප්තුවේ පැරණි සාහිත්‍ය කථා උපුටා ගෙන ඇත. (ඒදන් උයන, ලෝකය මැවීම, නෝවාගේ කථාව, බාබෙල් කොත ආදී)

ඇ) **තේමා හා ඉදිරිපත් කරන ධර්මය**
- දේව විශ්වාසයට මුල් තැනක් හිමි වී තිබේ.
- කතුවරුන්ට ස්වාභාව ධර්මය හා මිනිස් ඉතිහාසය තුළ දෙවිඳුන් හමුවීම.
- සුපිරි මිනිසා හැටියට, දෙවියන් වහන්සේව මනුෂ්‍ය විලාශයෙන් හඳුන්වා දී ඇත.
- මිනිසාට ඉතා සමීපව වැඩ සිටින බව පෙන්නුම් කරන මානව රූපාකාරයෙන් විස්තර කරයි.
- දෙවියන් වහන්සේ මනුෂ්‍යයෙකු ලෙස ක්‍රියා කරයි, ගමන් කරයි, කථා කරයි.
- දෙවිඳුන්ගෙන් ඈත්වීමට, මෙලොව දුකට, වේදනාවට මරණයට පාපය හේතු වූ බව, එහෙත් දෙවිඳුන් මිනිසා අත් නොහරින බව.

**2. "එලොහිම්" සම්ප්‍රදාය (ඊ) - ක්‍රි.පූ. 750-722**

අ) **සුවිශේෂ ලක්ෂණ :**
- දෙවියන් වහන්සේට 'එලොහිම්' යන හිබෲ නම භාවිතා කරයි.
- අසිරියාව විසින් සමාරියාව ආක්‍රමණය කිරීමට පෙර ලියන ලදී. (ක්‍රි.පූ. 770) කාලයේ දී ජෙරබොවම් රජ උතුරු රාජ්‍යයේ රජකම් කරන ලදී. (ක්‍රි.පූ. 785-744).
- මේ සම්ප්‍රදාය මෙවැනි ස්වරූපයක් ගත්තේ උතුරු රාජ්‍යයේ දිවැසිවරුන් අතර ය. ඉශ්‍රායෙල්වරුන්ගේ එක්සත් රාජ්‍යය බිඳවැටී, උතුරු රාජ්‍යයේ සිට දකුණට ආ සරණාගතයන් මේ සම්ප්‍රදාය ගෙනෙන්ට ඇතැයි සිතන්නට පුළුවන.
- ආබ්‍රහම්ගේ කථාවේ (උත්පත්ති 15) සිට මෝසස්ගේ මරණය දක්වා (ද්විතී. 34) කොටසට අතුළත් ය. හරි අඩක් පමණ උත්පත්ති හා නික්මයාම ග්‍රන්ථවල අඩංගු ය.
- ලෙවී කථාවේ නැත.
- ගණන් කථාවේ පරිච්ඡේද 9 ක් හා ද්විතිය නීති සංග්‍රහයේ පරිච්ඡේද 3 ක් (31,33,34) අඩංගු ය.
- බෙතෙල් හා ෂෙකෙම් යන පැරණි සිද්ධස්ථානවලට හා ජාකොබ්ටත් ජෝශප්ටත් විශේෂ තැනක් හිමි වේ. මෝසස්ගේ ආශිර්වාදයෙන් මේ බව පෙනේ. (ද්විතී. 33).

ආ) **භාෂාමය හා සාහිත්‍යමය විලාශය :**
- භාෂා ශෛලිය 'ජී' සම්ප්‍රදායට වඩා කලාත්මක ය. සරළ ය. ඍජු ය. විස්තරාත්මක ශෛලියක් නැත. උසස් හිබෲ භාෂාවක් භාවිතා කර ඇත.
- 'ජේ' සම්ප්‍රදාය තරම් ස්වාභාවික නොවුවත් අදහස් කල්පනාකාරීව ඉදිරිපත් කර ඇත.
- ජීවිතය හා ස්වාභාවධර්මය දෙස බලා ඇත්තේ, තමන් හඳුන්වා දෙන චරිතයන්ගේ හැඟීම්වලට දක්වන ප්‍රතිචාර මගිනි.
- ඉතිහාසය ක්‍රමානුකූලවත්, තර්කානුකූලවත්, උසස් ලෙසත් ඉදිරිපත් කර ඇත.
- ඊසාක් ගේ 'යාගය' උසස්ම සාහිත්‍යාංගයයි. (උත්පත්ති 22).

ඇ) **තේමා හා ඉදිරිපත් කරන ධර්මය**
- දෙවියන් වහන්සේ මිනිසාට වඩා මුළුමනින් ම වෙනස් වූ දෙවි කෙනෙකි. මානව රූප විලාශයක් නැත.
- දෙවියන් වහන්සේ මිනිස් අත්දැකීම්වලින් දුරස්ථ ය. මිනිසා සමඟ සමීප සම්බන්ධකමක් නැත. දර්ශන, ස්වප්න, පණිවිඩකරුවන් (දේව දූතයන්) මගින්

මිනිසාට කථා කරන කෙනෙකු ලෙස හඳුන්වා දී ඇත. (උත්පත්ති 20:3,6,21:7,28:12,31:11)

- බහු දේවවාදී උත්තර රාජ්‍යයේ අන් දෙවිවරුන්ට වඩා දෙවියන් වහන්සේ උසස් ය.
- මෙසේ සම්ප්‍රදාය තුළ එන විග්‍රහයන් දිවැසිවර සම්ප්‍රදාය තුලින් ඉදිරිපත් කර ඇත.
- දෙවියන් වහන්සේ සාක්ෂිකරුවකු පමණක් නොව ගිවිසුමේ කොටස්කරුවෙකි.
- ජනතාව හා දෙවිඳුන් අතර සම්බන්ධය විස්තර කරන්නේ ගිවිසුමේ සේවාව උපයෝගි කරගෙන ය.
- දිවැසිවරු පිළිබඳ ධාර්මික ඉතිහාසයක් සිනායි ගිවිසුම් මුල් කරගෙන මෙහි ඇත.
- මෝසස්ට පමණක් මුහුණලා කථා කළ හැකි විය. මිනිසා දෙවිඳුන් වෙත ළං වුයේ භීතියෙන් හා ත්‍රාසයෙනි. (නික්මයාම 3:6)
- අවංක බව පක්ෂපාතිත්වය, ගැලවීම (ආශිර්වාදය) හා පාපය ( අපක්ෂපාති බව යන කරුණු මේ සම්ප්‍රදායයේ ගිවිසුම් ධර්මය තුළ අඩංගු වී ඇත.

**3. ද්විතීය නීති (ඩී) - ක්‍රි.පූ. 722-621**

**අ) සුවිශේෂ ලක්ෂණ**

- මෙම සම්ප්‍රදාය "ද්විතීය නීති සංග්‍රහය" පොතට පමණක් සීමා වී ඇත. උතුරු රාජ්‍යයේ වැටීමෙන් පසු ලෙවිවරු තමන් සමඟ ගෙන ආ ආගමික සිරිත්විරිත් මෙම සම්ප්‍රදායයේ ගැබ්ව ඇත.
- මෙම සම්ප්‍රදාය ජොෂියා රජුගේ කාලයට අයත් ය. (ක්‍රි.පූ. 906 - 630) එම රජතුමා මෙම සම්ප්‍රදාය මෝසස් තුමාගේ අනුශාසනා තුනක ආකෘතියකට ඇතුළත් කර ඉදිරිපත් කළේ ය. නව සංස්කරණයක් විප්‍රවාසය අරම්භයේදී සිදුවිණි.
- මෙම සම්ප්‍රදාය අනුව ඉතිහාසය යනු දෙවියන් වහන්සේ ජනතාවට දක්වූ ආදරයේ ප්‍රතිරූපයයි.

2 රාජාවලිය 22 පරිච්ජේදයේ සඳහන් පැරණි ව්‍යවස්ථා පොත මූලාශ්‍ර කරගෙන මෙම සම්ප්‍රදාය ගොඩ නඟා ඇති බව සඳහන් කරයි. කතුවරු නිර්නාමික ය. බොහෝ දෙනෙකුගේ මතය අනුව පෙකෙම් හී නීතිය පිළිබඳ පූජක විශාරදයකු හෝ විශාරදයෝ හෝ ලියා ඇති බවයි. මෙම සම්ප්‍රදාය තුළ ඉතා කෙටි කාල පරිච්ජේදයක් ඇතුළත් වෙයි. සීනයි සිද්ධි හා දෙවියන් වහන්සේ නීතිය දීම පිළිබඳ සිද්ධි ඉස්මතු කර දක්වයි. මෙහි එන එක ම ශ්‍රේෂ්ඨ පුද්ගලයා මෝසස් වේ. ඊ සම්ප්‍රදායට වඩා නවතාවයක් ඇත. දෙවියන් වහන්සේ හා ඇති කරගත් ගිවිසුම අලුත් කිරීමේ මෙහෙයයන්හි දී භාවිතා කළ වත්පිළිවෙත් මාලාවක් මෙහි අඩංගු ය.

**ආ) භාෂාමය හා සාහිත්‍යමය ශෛලිය :**

- ඉශ්‍රායෙල්වරුන්ට කෙලින්ම ආමන්ත්‍රණය කරන අවවාද මාලා දෙකක් මෙහි ඇත.
- පෙකෙම් හි පැවැත්වුණ වත් පිළිවෙත් අලුත්වැඩියා කිරීමේ මෙහෙයයන් තුළින් "ඩී" සම්ප්‍රදාය බිහිවිය.
- 'ගිවිසුම' හා බැඳෙන්නට, ඊට පක්ෂපාති වන්නට ජනතාවට ආරාධනා කරන්නේ දේශකයකුගේ එනම් අනුශාසනාත්මක (දිවැසිවරුන්ගේ) විලාශයෙකි.

**ඇ) තේමා ඉදිරිපත් කරන ධර්මය**

- ගිවිසුමට පක්ෂපාති වීමට නම් නීතිය පිළිපැදිය යුතු ය.
- ගිවිසුමට පිළිතුරු දීම හෙවත් නීතිය පිළිපැදීම දේව වන්දනාව බව.
- ගිවිසුමට පිළිතුරු දීම සෑම අවස්ථාවකදී ම සිදුවිය යුතු බව.
- ඉශ්‍රායෙල් ජනතාව තෝරා ගත්තේ දේව වචනය මඟින් ය. එම දේව වචනයට සවන් දීමට ආරාධනය කරයි. දේව වචනය මඟින් ප්‍රකාශ වන දෙවියන් වහන්සේ සියල්ල අභිබවා වැඩ සිටින බව.
- දේව දර්ශනයට පමණක් නොව හඬ ශබ්දයට පවා මිනිසා බිය වූ බව.
- දෙවියන් වහන්සේගේ මුහුණ, අත් පා ආදිය ධර්මය විග්‍රහ කරන උපමා වන අතර එමගින් බලය ශක්තිය, වැඩ සිටීම ද ප්‍රකාශ කෙරේ.
- කොයි ආකාරයට හෝ ප්‍රතිමා මගින් හෝ උන්වහන්සේට පිළිබිඹු නොකළ යුතු ය. (ද්.වි. 5:8)
- උන්වහන්සේ හැම දෙවි කෙනෙකුටම වඩා වෙනස් ය. (දවි. 12:29-31)
- ගිවිසුම් දාගැබ දෙවියන් වහන්සේ ගේ ආසනය නොව. දේව වචනය හෝ නීතිය තැන්පත් ස්ථානයකි. (ද්වි. 10:3-5)

- තෝරා ගත් ජනතාව 'ඩී' සම්ප්‍රදායට අනුව 'පොදු සංඝය' හෝ 'සභාවක්' ලෙස හඳුන්වා දෙයි. ජාතිය රැක ගැනීමට සංඝය දිරි ගැන්වී ය.
- එකම වන්දනා ස්ථානය ජෙරුසලෙම් දේව මන්දිරයයි.

**4. පූජක සම්ප්‍රදාය (පී) - ක්‍රි.පූ. 400 ත් පසු:**

**අ) සුවිශේෂ ලක්ෂණ:**

- ක්‍රි.පූ. 500 දී පමණ ලියැවී ක්‍රි.පූ. 422 දී පමණ 'ජේ' 'ඊ' 'ඩී' සම්ප්‍රදායයන් සමඟ මිශ්‍ර කරන ලදී. බැබිලෝනියානු විප්‍රවාසය නිසා නව ඉතිහාස ගත සිද්ධි හේතුකොට ගෙන ඉශ්‍රායෙල් ජනතාවගේ විශ්වාසය නව මාදිලියකට ඉදිරිපත් කිරීමට සිදු විය. මේ සඳහා පූජකවරු 'පී' ලියවිල්ල සම්ප්‍රදානය කරන ලදී.
- උත්පත්ති කථාවේ මුල් පරිච්ඡේදයෙන් ආරම්භ වී, මෝසස්ගේ මරණය දක්වා කොටස මේ සම්ප්‍රදායට ඇතුළත් වේ. (ද්වි. 34:1-9)
- නික්මයාම පොතේ අවසාන පරිච්ඡේද හය මේ සම්ප්‍රදායට අයත් විශාලත ම කොටසයි.
- සම්පූර්ණ ලෙවී කථාවත්, ගණන් කථාවේ පළමු පරිච්ඡේද 10 ත් 'පී' සම්ප්‍රදායට අයිති ය.
- ජනවන්දනා වත් පිළිවෙත් හා පූජක චාරිත්‍ර වාරිත්‍රවලට විශේෂ තැනක් දී ඇත.
- අභ්‍යන්තර පවිත්‍රතාවයට හා ශුද්ධවන්තභාවට විශේෂ තැනක් දීම.
- ගතානුගතික අදහස්වලට මුල් තැනක් දීම.
- වංශාවලිය හා සංඛ්‍යා ලේඛන බොහෝ සෙයින් භාවිතා කිරීම.
- දෙවියන් වහන්සේට මනුෂ්‍ය ස්වරූපය ආරූඪ නොකරයි.

**ආ) භාෂාමය හා සාහිත්‍යමය ශෛලිය**

- පුන පුනා කීම - උදා: උදය උදා විය. ඒ... දවස විය, විමසන සේක, සිදුකරන සේක.
- භාෂා ශෛලිය ඒකාකාර ස්වාභාවයක් උසුලයි.
- යොදා ගන්නා භාෂාව ශිල්පීය හා නීතිමය වන අතර අටුවා ටීකා ලෙස විස්තර කොට ඉදිරිපත් කර ඇත.

**ඇ) තේමා හා ඉදිරිපත් කරන ධර්මය :**

- මෝසස් හා දේව නීතිය ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීමෙන් ඉතිහාසය ධර්මයට සම්බන්ධකර ඇත.
- ආරම්භයේ දී මිනිසා දෙවියන් සමඟත් මුළු විශ්වය සමඟත් සාමයෙන් විසී ය.
- දේව සමානකමට මිනිසා මවා උන්වහන්සේට යටත්ව අන් මැවිලි කෙරෙහි අධිපතිකම් කිරීමටත්, මැවීමේ කාර්යයට හවුල් වීමටත් ආරාධනය කරන සේක.
- සබත් නීතියට යටත් වීම දෙවියන් වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාවයේ සලකුණක් වන බව.
- දෙවියන් වහන්සේ සියල්ලන්ට ම ඉහළින් වැඩ සිටීම.
- දෙවියන් වහන්සේ අති උත්කෘෂ්ඨ ලෙස ඉදිරිපත් කරයි.
- සිය බල මහිමය තුළින් ජනතාවට ප්‍රකාශ විය. වචනයෙන් මැවී ය. සිය බල මහිමය ප්‍රකාශ වූයේ මෝසස්ට පමණි. කූඩාරමත්, දේව මාළිගයක් දේව බලය ප්‍රකාශ වූ ස්ථාන විය.
- ජනතාවට කෙළින් ම දේව සබඳතා පැවැත්වීමට නොහැකි නිසා පූජකවරු මධ්‍යස්ථකයෝ වූහ.
- ඉශ්‍රායෙල් ජනතාවගේ මුළු ජීවිතය ම දේව වන්දනාවක් හැටියට නීතිය යටතේ සංවිධානය කරනු ලැබී ය.
- දෙවියන් වහන්සේට විරුද්ධ වුණොත්, චාරිත්‍රමය වන්දි ගෙවීමේ පිළිවෙතකට අනුකූලව කටයුතු කළ යුතු ය.
- පක්ෂපාති වූ විට ආශිර්වාදය ලබා දේව අභිමුව ජීවත් වූහ.
- මේ අයුරින් ජනතාවගේ නීතියත්, වන්දනාවත්, ඉතිහාසයත් අතර ඉතා සමීප සම්බන්ධයක් පැවතුණි.
- මිනිසා අභිබවා, දේව කැමැත්ත හා දේව වචනය මගින් ක්‍රියා කරන දෙවියන් වහන්සේ මෙහි දී හමු වේ.
- සබත ජන වන්දනාවට, ශුද්ධ වූ දවසක් ලෙස, විවේක ගන්නා දිනයක් ලෙස, දෙවියන් වහන්සේව සම්මුඛ වන දිනය ලෙස සැළකීම. (නික්මයාම 2416)

## සම්ප්‍රදායයන් පිළිබඳ සැසඳීමක්

| කාලපරිච්ඡේදය | 'ජේ' සම්ප්‍රදාය ක්‍රි.පූ. 10-9 සියවස් අතර | 'ඊ' සම්ප්‍රදාය ක්‍රි.පූ. 8 සියවස | 'ඩී' සම්ප්‍රදාය ක්‍රි.පූ.7 වන සියවස | 'පී' සම්ප්‍රදාය 6-5 සියවස් අතර |
|---|---|---|---|---|
| ආරම්භක ස්ථානය | ජෙරුසලෙම (දකුණු රාජ්‍යයේ) | ෂෙකෙම් (උතුරු රාජ්‍යය) | ෂෙකෙම් (උතුරු රාජ්‍යය) | ජෙරුසලෙම හා බැබිලෝනියාව (දකුණු රාජ්‍යය) |
| ශුද්ධ ස්ථානය හා සම්බන්ධය | ජෙරුසලේම, හෙබ්‍රොන්, බෙයර්ෂෙබා | ෂෙකෙම්, බෙතෙල් බෙයර්ෂෙබා | | |
| ගෝත්‍රික සම්බන්ධතාව | ජුදා | එප්‍රායිම් | | |
| ශෛලිය | වීර චරිතාත්මක ඓතිහාසික විග්‍රහයකි. | ඓතිහාසික | සාහිත්‍යමය අනුශාසනාව දිව්‍යැසි, ප්‍රඥ, වත්පිළිවෙත් | ඓතිහාසික හා නීතිමය |
| ආගමික නැඹුරුව | ප්‍රඥා | දිව්‍යැසි | හෙසෙකියා | නීතිමය ඇදහිල්ල |
| දේශපාලන සබැඳිම | සලමොන් හා රෙහෙබොවාම් | දෙවන ජෙරබොවම් | ගිවිසුම් ජීවිතයකට කැඳවීම | බැබිලෝනියානු හා පර්සියානු රාජධානි |
| මූලික තේමාව | ආදි පියවරුන් ලත් ආශිර්වාද | මොසස්ගේ ගිවිසුම | | ජීවිතය වන්දනාවකි |
| ශ්‍රේෂ්ඨ ඓතිහාසික පුද්ගලයෝ | ආබ්‍රහම් | ජාකොබ්, ජෝශප්, මෝසස් | මෝසස් | ආදම්, නෝවා, ආබ්‍රහම් හා මෝසස් |
| ඉශ්‍රායෙල් පිළිබඳ දර්ශනය | ජාතියක් | විවිධ ආගමික කණ්ඩායම් එකතුවක් | සංඝයක් හෝ පොදු හවුලක් | දෙවියන් වහන්සේව ඇදහීමේ රාජ්‍යයක් |

### 1.3. ලේඛනගත කිරීම:

බයිබලීය සාහිත්‍යයේ ආරම්භය වාචික සම්ප්‍රදාය දක්වා දුර දිව යන්නකි. වාචික සම්ප්‍රදාය පැවති කාලය වැදගත් වන්නේ, ශු බයිබලය ලිඛිත ග්‍රන්ථයක් ලෙස (ලිඛිත ස්වරූපයෙන්) සකස් වී ඇත්තේ පසු කාලයක දී වන නිසා ය. එනම්, දාවිත් රාජධානිය පිහිටුවා ගත් පසුව ය. ඊට පෙර ශත වර්ෂවල එනම්, ආදි පිතෘවරුන්, මෝසස්, ඉශ්‍රායෙල්වරු කානාන් දේශයේ පදිංචි වීම, වීරාවලිය, සාවුල්ගේ රාජ්‍ය කාලය අයත් වන්නේ වාචික සම්ප්‍රදාය පැවති කාලයට ය.

මේ කාලයේ දී ලිඛිත ප්‍රකාශන හෝ ලිඛිත කෘතීන් නොතිබුණු බවක් මින් අදහස් නොකෙරේ. උදාහරණයක් වශයෙන් ගිවිසුම් ව්‍යවස්ථාව (නික්මයාම 20:22-23:35).

දස පණත (නික්මයාම 20 සහ ද්විතිය නීති 5) වැනි කොටස් මීට ඉහත ලේඛනගත වී ඇති බවට පිළිගෙන ඇත. ඉශ්‍රායෙල් විනයධරයන් ආරක්ෂා කරගත් මෙවැනි කොටස් කීපයක් හැරෙන්නට, සිය ඉතිහාසය විකාශනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමය වශයෙන් වාචික සම්ප්‍රදාය උපයෝගී කරගෙන ඇත.


මේ සම්ප්‍රදාය තුළින් ජනතාව තම ජීවිතයේ එකරාශි කරගත් අත්දැකීම් සිරිත් විරිත්, වත් පිළිවෙත් හා විශ්වාසය ගෙවී ගිය කාලය තුළ ආරක්ෂා වී ඇත. ශත වර්ෂ ගණනාවක් තුළ දේව ජනතාව විසින් තම මුතුන්මිත්තන් දායාද කළ එම අත්දැකීම් ආරක්ෂා කරගැනීමේ දී, එම අත්දැකීම්වලට තමන්ගේ අත්දැකීම් ද එකතු කරමින් පැරණි සම්ප්‍රදාය ආරක්ෂා කරගන්නා ලදී. මෙවැනි එකතු කිරීම්වල දී පැරණි අත්දැකීම්වල මූලික හරය යටපත් වීමට ඉඩ නොදී ආරක්ෂා කරගන්නා ලදී. මෙලෙස ආදි පිතෘවරුන්, මෝසෙස් හා දෙවියන් වහන්සේගේ පණිවිඩකරුවන්ගේ ආගමික සාක්ෂි දැරීම් ඒ ආකාරයෙන් ම මතුවට ද ආරක්ෂා වී පැවතුණි.

මුඛ පරම්පරාගතව මෙසේ ඉදිරියට ගෙන ගිය දේව ජනතාවගේ විශ්වාසයේ අත්දැකීම් සලමොන් රජතුමාගේ කාලයේ දී (එනම් ක්‍රි.පූ. 950 දී පමණ) ලේඛනගත කරන ලදී. දාවිත්ගේ හා විශේෂයෙන් සලමොන්ගේ කාලයේ දී තම රාජධානිය තුළ පිටපත් සකස් කිරීම සඳහා නිල වශයෙන් අවස්ථාවක් ලැබුණි. මෙතෙක් ආරක්ෂා කරගත් පැරණි සම්ප්‍රදාය මෙහි දී ලේඛනගත කරන්නට විය. මෙම ලේඛනගත කිරීමේ දී ගෙවී ගිය ශතවර්ෂවල සංස්කෘතික උරුමයන් පමණක් නොව, ඉශ්‍රායෙල් දේශයේ ආරම්භයට කලින් එම ඉතිහාසය ද අඩංගු කර ඇති බව මෙහිදී මතක තබා ගත යුතු කරුණකි.

එසේ ම ඉශ්‍රායෙල් සාහිත්‍යය ගොඩනැගීම සඳහා තවත් හේතුවක් වශයෙන් දේව මාලිගය ගොඩනැගීමත්, එහි වත් පිළිවෙත්වලදී සිදු කළ විශ්වාසයේ අත්දැකීම් එකිනෙකා අතර බෙදාගැනීම ද දැක්විය හැකි ය. එවන් අත්දැකීමක් බෙදා ගැනීම සඳහා අනිවාර්යයෙන් ම ලිඛිත පාඨ අවශ්‍ය විය. ඒ නිසා වාචික සම්ප්‍රදාය තුළ ආරක්‍ෂා කරගත් පැරණි අත්දැකීම් හා කලින් කලට එක්වූ නම අත්දැකීම් ද සමඟ ග්‍රන්ථාරූඪ කරන ලදී. මූල පටන් මෙවැනි කාර්යයක ප්‍රධාන අරමුණ වී ඇත්තේ දේව ජනතාවගේ විශ්වාසය පෝෂණය කිරීම සඳහා එම අත්දැකීම් ඉවහල් කර ගැනීමට සැලැස්වීමයි.

ශු ලියවිල්ලේ විවිධ කොටස් පරිශීලනය කිරීමේ දී අමතක නොකළ යුතු කාරණා දෙකක් ඇත. එනම්,

1. අපක්‍ෂපාති විකාශනයක් සඳහා එකතු කරන ලද සිය උරුමයන්ගේ පැරණි බව.
2. විනයධරයන් කලින් එකතු කරන ලද සිය අත්දැකීම් ද, එම පැරණි සම්ප්‍රදාය තුළ අඩංගු වී ඇති බවයි.




වාචික සම්ප්‍රදාය ලිඛිත සම්ප්‍රදායට ගොඩනැගුන ආකාරය

## 1.4. මේ එක් එක් සම්ප්‍රදායයන්ගේ එක් කිරීම සිදුවූ අන්දම:

ඉශ්‍රායෙල් ජනතාව අහසින් කඩා වැටුණු ජනතාවක් නොවේ. ඔවුනට ඉතිහාසයක්, පසුබිමක් තිබුණි. අදි පිතෘවරුන් වටේ ඔවුහු ගෝත්‍ර වශයෙන් ජීවත්වූහ. ඔවුන් සැම කෙනෙකුට ම අවේණික ඉතිහාසයක් තිබුණි. ඉතිහාසය දෙස මේ අය බැලුවේ විශ්වාසයේ ඇසිණි. ඒ තුලින් ලබාගත් අන්දකීම් ගෝත්‍රය තුළ පරම්පරාවෙන් පරම්පාරාවට භාර දුන්හ. පසුකල මේ ගෝත්‍ර එකට එක්වී කානාන් දේශයේ පදිංචි වූහ. උතුරත් දකුණත් හැටියට යම්කිසි වෙනස්කමක් ඔවුන් අතරත් සංස්කරණය කිරීම සිදුවිය. මෙයින් යාවිස්තන සම්ප්‍රදාය බිහිවිය. ඒ අතර ම උතුරේ තිබුණ ඓතිහාසික අන්දකීම් පදනම් කරගෙන ක්‍රි.පූ. 750 දී පමණ එලොයිස්ත සම්ප්‍රදාය සංස්කරණය විය. මෙම සංස්කරණ දෙක ම ස්වාධීනව ජනතාව අතර තිබුණි.

ක්‍රි.පූ. 722 දී උතුරු දිග රාජ්‍යය වැටීමෙන් පසුව මෙම පංචපුස්තකය නමැති මහා කාව්‍යයේ උතුරු දිග පිටපත වූ "ඊ" සම්ප්‍රදායත් දකුණු දිග පිටපත වූ "ජේ" මූලාශ්‍රයත් එක් පිටපතක් ලෙස සම්බන්ධ විය. දකුණු දිග රාජ්‍යයේ වැටීමට සුළු කලකට පෙර ඉහත එක්වූ දෙකොටසට (ජේ, ඊ) ද්විතිය කථා (ඩී) සම්ප්‍රදායද එක්විය. මෙය සිදුවූයේ ක්‍රි.පූ. 622 න් පසුව ය. සම්ප්‍රදායයන් තුනේ එක්වීම නිසා එයට අලුත් අදහස් කිපයක් ද ඇතුළත් විය. එනම් දෙවියන් වහන්සේ එක් කෙනෙක් විය යුතු ය. එක ම ජනතාවක් විය යුතුය. තෝරා ගැනීම දෙවියන් වහන්සේගේ නිදහස් කැමැත්තෙන් සිදුවූවකි. බැබිලෝනියන් විප්‍රවාසයෙන් පසු පූජකවරුන්ගේ බලපෑම මත පූජක (පී) සම්ප්‍රදාය ද ඊට එක් කරන ලදී.

මෙසේ සම්ප්‍රදායයන්ගේ එකතු කිරීම විවිධ පොටවල් ගෙන කඹයක් වෙළීමක් හා සමාන ය. එක් එක් ගෝත්‍රවල තිබුණු ඉතිහාස කථා, ආගමික කථා, විශ්වාසයේ කථා, හා අන්දකීම් සංස්කරණය වී එය නැවත නැවතත් සම්ප්‍රදායයන් තුළ කලවම් වී, මිශ්‍ර වී ලොකු සම්ප්‍රදායයන් තුළත් නැවත ප්‍රතිසංස්කරණය වී අන්තිමේ දී බයිබලයේ පංච පුස්තකය හැටියට අපට ලැබී තිබෙන්නේ අවුරුදු හත් අට සියයක් තුළ පරණවී කලවම්වීමක් තුළ එකතු වූ පංච පුස්තකයක් ය.

එසේ නම් පංච පුස්තකයේ කර්තෘවරු බොහෝ දෙනෙකු සිටින බව පැහැදිලි ය. සංස්කාරකවරු ද එසේ ම බොහෝ දෙනෙකි. බයිබලය දෙවියන් වහන්සේ ලියන්නේ මිනිසා තුළිනි. මෙහි ඇත්තේ මංශගතවූ දේව වචනයයි. දේව වචනය මිනිස් සමාජය තුළින් බිහිවී ය. එම නිසා ය, බයිබලය තුළ පාවාදීම, මිනිස් දුර්වලකම්, වැටීම්, සුසුම් ලෑම්, මිනිමැරුම් යන මේ සියල්ලක් ම සඳහන් වන්නේ. ශු.බයිබලය මනුෂ්‍ය ජීවිතය තුළ දේව වචනය මාංශගතවීම සැබැවින් ම තේරුම් කරන පොතක් බව අපට අනිවාර්යයෙන් ම කිව හැකි ය. එම නිසා එක ම පරිච්ඡේදයක් තුළ මෙසේ සම්ප්‍රදායයන් එක්වී තිබීම අපට ප්‍රශ්නයක් නොවේ.

## 1.5. මෝසෙස්ගේ අභාෂය

ජුදා - ක්‍රිස්තියානි සම්ප්‍රදාය පංච පුස්තකයේ කර්තෘත්වය ජන නායක මෝසෙස් තුමන්ට ප්‍රදානය කර ඇත. මෙහි සුලමුල සොයන්නට නම්, මොසෙස්ගේ කර්තෘත්වයේ ස්වභාවය පිරන්නට නම් අප අපේ කාලයට වඩා බොහෝ වෙනස් ඒ කාලයට යා යුතුම ය. අපේ සංස්කෘතියට වඩා බොහෝ වෙනස් ජුදා සංස්කෘතියට පිය නැගිය යුතුම ය.

එදා අද මෙන් නොවේ. ග්‍රන්ථයක කර්තෘත්වය ව්‍යාජ ලෙස ආරෝපණය කිරීම ඉතා සුලභ විය. කිසියම් ජන සමාජයක පුද්ගලයෙකු පොතක් ලියයි. නමුත් ඔහු ඔහුගේ නම සඟවයි. එම සංඝයේ ජ්‍යෙෂ්ඨයෙකුට නායකයෙකුට, ආදි පිතුරුවරයෙකුට, මුතුන් මිත්තෙකුට කර්තෘත්වය ආරෝපණය කරයි. මෙය කරන්නේ හොඳ හිතිනි.

ශු. බයිබලය පුරා ම කර්තෘත්වය ආරෝපණය කෙරුණු අවස්ථා එමටයි. සුපුවත් ලියුවේ දෙවන පරම්පරාවේ ක්‍රිස්තියානින් ය. නමුත් ඔවුහු සුපුවත් හි කර්තෘත්වය පළමු පරම්පරාවේ ක්‍රිස්තියානින්ට, අපෝස්තුළුවරුනට ආරෝපණය කරන්නට අමතක නොකළහ. තමනට සුපුවත ලැබුණේ ඔවුන්ගෙනි. තම විශ්වාසයේ ආදි පිතෘරුවරු ඔව්හු ය. තම සංඝයන්හි ආරම්භකයන් ඔවුහු ය. එසේ ම සමහර පාවුළු ලිපි ලියුවේ එතුමන්ගේ ගෝලයන් විසිනි. නමුත් ඔවුහු කර්තෘත්වය සිය ගුරුතුමන්ට පිදූහ.

පංච පුස්තකය ගැන කිව යුත්තෙත් එයමය. **J.E.D.P.** සම්ප්‍රදායයන්හි කතුවරු පංච පුස්තකය ලියූ හ. නමුත් ජුදා ප්‍රජාව එහි කර්තෘත්වය මෝසෙස් හට පිදූහ. මෝසෙස් වනාහි ජන නායකයෙකි. නික්මයාම වීර කථාවේ වීරයා ය. පංච පුස්තකය පිටුපස ඇති ඉතිහාස ගමන් මගේ ප්‍රධාන නියමුවා, නඩේ ගුරා ඔහු ය. ඔහුගේ ආධිපත්‍යය ජුදා ප්‍රජා මතත්, ඔහුගේ ආභාෂය එම ප්‍රජාවෙන් බිහිවූ පංච පුස්තකය මතත් තිතැතින්ම ඇත්තේ ය. පංච පුස්තකයේ ඇති සමහර සම්ප්‍රදායයන්, නීති, ගිවිසුම් මෝසෙස් යුගය කරා දිව යයි. ඔහුගේ නික්මයාම මේ සංඝය කර දිව යයි.

මේ නයින් බලන කල පංච පුස්තකයේ සබඳ කතුවරයා මෝසෙස් නොවුවත්, ඔහු එහි අධිපත්‍යය **(Authority Behind the Book)** හා වක්‍රාකාරයෙන් කතුවරයා ද වන්නේම ය.

# දෙවන පාඩම

## 2. උත්පත්ති, නික්මයාම පොත් පිළිබඳ අවබෝධය

## 2.1. උත්පත්ති පොත

### 2.1.1 ප්‍රාග් ඉතිහාසය පිළිබඳ ශුද්ධ ලියවිලි දැක්ම (උත්පත්ති 1 - 11)

**හැඳින්වීම:**
මානව සංහතියේ උපත හා විශ්වයේ ආරම්භය පිළිබඳ ශු. ලියවිලි චින්තනය උත්පත්ති පොතේ මේ පරිච්ඡේද තුළින් දිග හැරේ. මෙය මුළු ශු. ලියවිල්ලට ම පෙරවදනක් වන අතර, මුල් ග්‍රන්ථයට "උත්පත්ති" (ග්‍රීක බසින් "ජෙනසිස්") යන නාමය මනාව ගැලපේ. පෘථිවිය සහ මුළු විශ්වයේ ද, ඉශ්රායෙල් ජනතාව හා මුළු මිනිස් සංහතියේ ද ප්‍රභවය හා වර්ධනය දෙවි සමිඳුන්ගේ අලංකාර සැලැස්මට අනුකූලව සිදුවන බව කතුවරයා පෙන්වා දෙයි.

මීට සියවස් ගණනාවකට කලින් රචනය වූ මේ කතා පුවත් අවබෝධ කර ගැනීමේ දී අප විසින් අවධානය යොමු කළ යුතු සාධක කීපයක් ඇත.

ප්‍රාග් ඉතිහාසයට විෂය වන්නේ ලෝක ආරම්භයේ සිට ආබ්‍රහම්ගේ කාලය (උත්පත්ති 12) දක්වා වූ දිගු කාල පරිච්ඡේදයයි. මෙය මැවීමේ ක්‍රියාවලිය ඇසින් දුටුවෙකුගේ වාර්තාවක් නොවේ. එය විශ්වාසයේ සහ මානව ප්‍රජාවගේ ආරම්භය පිළිබඳ ගැඹුරු දේව ධාර්මික විග්‍රහයකි. ක්‍රි.පූ. 10 වන සියවසේ දී පමණ බිහිවූ යාවේ සම්ප්‍රදාය (ජේ) ක්‍රි.පූ. 8 වැනි සියවසේ දී පමණ බිහිවූ එලොහිම් සම්ප්‍රදාය (ඊ) හා ක්‍රි.පූ. 6-5 සියවස්වල දී පමණ බිහිවූ පූජක සම්ප්‍රදාය (පී) ඇසුරින් සම්පාදනය වුණු දේව ධාර්මික ඉදිරිපත් කිරීමකි.

මැවීමේ ක්‍රියාවලිය ආශ්‍රිත ගැඹුරු දේව ධාර්මික කරුණු ඉදිරිපත් කිරීම සඳහා, එකල පැවැති කථාන්තර, භාෂා යෙදුම් වැනි සාහිත්‍ය අංග ශු. ලියවිලි කතුවරයෝ යොදාගත් හ. ලෝකයේ මැවීම, විනාශය, මිනිස් උපත පිළිබඳ දේව කථා, මිථ්‍යා කථා පැවතිණි. මෙසපොතේමියානු සාහිත්‍යයේ "එනුමාඑලිෂ්", "ගල්ගමේෂ්" වැනි වීර කාව්‍යයන් හි සඳහන් මැවීමේ සහ ජල ගැල්මේ කථා මීට නිදසුන් වේ. එබැවින් අප ශුද්ධ ලියවිල්ලේ ප්‍රාග් ඉතිහාසය හා සම්බන්ධ කථා මීට නිදසුන් වේ. එබැවින් අප ශුද්ධ ලියවිල්ලේ ප්‍රාග් ඉතිහාසය හා සම්බන්ධ කථා තේරුම් ගැනීමේ දී එම සාහිත්‍යමය පසුබිම අවබෝධ කර ගැනීම අත්‍යාවශ්‍යයි.

එබැවින් මෙම පරිච්ඡේද දෙක හැදෑරීමේ දී අපගේ අරමුණ විය යුත්තේ දේව ධාර්මික පණිවිඩය තේරුම් ගැනීමයි. ඓතිහාසික කරුණු, විද්‍යාත්මක සාධක සෙවීම වන්නේ, එය ශුද්ධ ලියවිල්ලේ කතුවරයාගේ අරමුණ නොවූ නිසයි.

### 2.1.2. විශ්වය සහ මානව සංහතිය මැවීම : (උත්පත්ති 1:1-2:25)

එකිනෙකට සමාන්තර කතා පුවත් දෙකක් මගින් මෙය විස්තර කෙරේ.

I උත්පත්ති 1:1:-2:4 ඒ (පූජක සම්ප්‍රදායීය කථා පුවත 'පී')

II උත්පත්ති 2:4-25 (යාවේ සම්ප්‍රදායීය කථා පුවත "ජේ")

කතුවරයන් තමන්ට ආවේණික වෙනත් පසුතලයක් හා දෘෂ්ටි කෝණ දෙකක් ඔස්සේ සම්පාදනය කළත් එමගින් මැවීමේ ක්‍රියාවලිය පිළිබඳ පුළුල් දැක්මක් පිරිනැමේ.

**මැවීම පිළිබඳ පළමු කථා පුවත**

මෙම කථාවේ සඳහන් මැවීමේ ක්‍රියාවලිය පැහැදිලි සැලැස්මකට අනුව ගොඩනගා තිබෙන බව පෙනේ. දෙවිඳුන්ගේ වචනය (ආඥාව), දේව වචනය ඉටුවීම, මැවිල්ලේ යහපත් බව දැක්වීම, කාලය (දිනය) සඳහන් කිරීම යනුවෙනි.

පුනරුච්චාරණය කෙරෙන රිද්මයානුකූල ගීතමය ආකෘතියක් අපට නිරීක්ෂණය කළ හැකි ය. "දෙවියන් වහන්සේ වදාළ සේක.... එය එසේ විය.... සවසක් විය.... උදයක් විය.... වැනි දවසයි" මෙය තුළින් ජනවන්දනාත්මක අරමුණක් තිබෙන බව අවබෝධ කර ගත හැකියි.

පූජක සම්ප්‍රදායට අනුකූලව දෙවියන් වහන්සේ ඇමතීම සඳහා "එලොහිම්" යන නාමය යොදා ඇත. මැවුම්කාර දෙවි සමිඳුන්ගේ මහෝත්තම බව සහ සර්ව බලධාරීත්වය, කථා පුවත තුළින් ප්‍රබලව ධ්වනිත වේ.

**විග්‍රහය**

1. **විශ්වයේ නිර්මාණය :**
"ආරම්භයේදී" යන්නෙන් කාලයේ නොහොත් ඉතිහාසයේ මුල ද "අහස හා පොළොව" යන්නෙන් මිනිස් ඉන්ද්‍රියනට අවබෝධ වන සකල විශ්වය ද ඉඟි කෙරේ. දෙවියන් වහන්සේ සකල විශ්වයේ නිර්මාතෘවරයාණන් වන සේක. (1 : 1)

පුරාතන ලෝකයේ චින්තනය අනුව "හිස් සහ පාළු බව" සංකේතවත් කළේ ජීවයෙන් තොර බවයි. පදාර්ථයේ ශූන්‍ය බවයි (34:11,ජෙරමියා 4:23). එය ශූන්‍ය තත්ත්වයකි. දෙවියන් වහන්සේගේ මැවීමේ ක්‍රියාවලිය සැබවින් ම ජීවයේ සහ පදාර්ථයේ උදාවකි.

දේව මැවිල්ල තුළ සෑම දෙයකට ම අනන්‍යතාවයක් ඇත. "අඳුරෙන් ආලෝකය" "රළයෙන් දවාල" වෙන් කිරීමේ සහ නම් කිරීමෙන් එක් එක් මැවිල්ලේ අනන්‍යතාව මතු කෙරෙන සැටි පැහැදිලි වේ. සොබා දහමේ නීති රීති ද මැවීමේ ක්‍රියාවලියේ ම අංගයකි. හිරු සහ සඳුගේ ක්‍රියාකාරීත්වය අනුව කාලසීමාවත්, සැකැස්ම සොබා දහමේ පැවතිය යුතු රිද්මයත් ආදී කරුණු දේව සැලැස්මට අනුකූල ය. (1 : 14)

පුරාතන ලෝකයේ හිරු සඳු සහ අනෙක් ස්වාභාව ධර්මයේ බලවේග දෙවිවරුන් ලෙස සැලකිණි. (ඊජිප්තුවේ, මෙසපොතේමියාව) මේ සියල්ල දෙවි සමිඳුන්ගේ මැවිලි සේ දැක්වීමෙන්, එතුමන්ගේ සර්ව බලධාරීත්වයත්, එක ම දෙවිකෙනෙකු පිළිබඳ ධාර්මික ඉගැන්වීමත් අවධාරණය කෙරේ.

**2. මානව සංහතියේ උපත**

මැවීමේ ක්‍රියාදාමයේ උච්චස්ථානය ලෙස මිනිසා සහ ගැහැණිය මැවීම ඉදිරිපත් කෙරේ මේ මැවීමේ උතුම්කම සහ විශේෂත්වය "අපි මනුෂ්‍යයා අපගේ ස්වරූපයට අනුව, අපගේ සමානත්වය ලෙස මවමු" යන බහු වචනාර්ථයේ භාෂා රීතියෙන් ඉඟි කෙරේ (1:26). මෙවැනි යෙදුමක් තත්ත්වයක්, වෘක්ෂලතා ආදිය මැවීමේ දී සඳහන් නොකිරීමෙන් මනුෂ්‍යයා අනෙක් මැවිල්ලට වඩා වෙනස් ලෙස පෙන්නුම් කෙරේ. විවිධාකාර සත්ත්ව වර්ග (පක්ෂීන්, සිව්පාවුන්, උරගයන්) සිටියත්, එකම මිනිස් වර්ගයක් ගැන පමණක් සඳහන් වේ. මනුෂ්‍යයා දේව ස්වරූපයට හා සමානත්වයට මවා ඇති අන්දම පැහැදිලි වනුයේ මැවිල්ල තුළ, මනුෂ්‍යයාගේ ක්‍රියාකාරීත්වය තුළින් ය. (1:26:28). දෙවියන් වහන්සේ ජීවයේ කතුවරයාණන් ලෙස ජීවය දානය කරන සේක. මනුෂ්‍යයා සිය පැවැත්ම හා වර්ධනය තුළින් ජීවයේ ක්‍රියාවලියට සහභාගී වෙයි. දෙවියන් වහන්සේගේ සැලැස්ම ක්‍රියාවට නංවයි. දෙවියන් වහන්සේගේ මුල් ම දෙබස මුල් මිනිස් යුවළ සමඟ සිදුවන සැටි කෙතරම් අර්ථාන්විත ද?

මැවිල්ල මත මනුෂ්‍යයාට පැවරෙන ආධිපත්‍යයට නැතහොත් බලයට පුළුල් අරුතක් ඇත. 'පාලනය කිරීම (හිබෘ බසින් "රාදා") යන ක්‍රියාව, කෘෂිකාර්මික හා එඬේරික පසුතලයක් අනුව "රැකබලාගැනීම" "මඟ පෙන්වීම" "සංරක්ෂණය" කිරීම ආදී, අර්ථයක් හඟවයි. එය යටත් කර ගැනීම "බලයට නතුකර ගැනීමක්" නොවේ. එය දේව ආශිර්වාදය මත සමඟ පිරිනැමෙන වගකීමකි. (1:28)

පුරුෂයා ද ස්ත්‍රිය ද එකම සමානත්වය හා ගරුත්වය අනුව දෙවිඳුන් අතින් නිර්මාණය වූ සැටි පැහැදිලිව දැක්වේ (1:27). එය සාමූහිකත්වයේ දිවියකි. මැවිල්ල "පාලනය කිරීමේ" වගකීම සාමූහිකත්වයේ වගකීමකි. ඔවුන් දෙදෙනා සමාජ දිවියේ ප්‍රතිමූර්තියක් ලෙස කතුවරයා ඉදිරිපත් කරයි.

කෘෂිකාර්මික පසුතලයක් ඔස්සේ දැක්වෙන මැවිල්ල තුළ, එහි සාමකාමී වතාවරණය කැපී පෙනෙන අංගයකි. ස්වාභාව ධර්මයෙන් පිරිනැමෙන ශාක පැලෑටි, ආහාර මත යැපීම ගැන සඳහන් වෙනත් මාංශ අනුභවය ගැන සඳහන් නොවේ. එය සොබා දහමේ රිද්මය හා එක්ව ජීවත්වීම පිළිබඳ හැඟවීමකි (යෙසායා 11:9-9). මේ බව මැවිල්ල නිමාවේ දී දෙවියන් වහන්සේ එය යහපත් බව නිරීක්ෂණය කිරීමෙන් වඩාත් තහවුරු වේ. (1:31)

**3. මැවිල්ල ශුද්ධවත් කිරීම :**

මැවිල්ලේ ක්‍රියාවලියේ නිමාව එළඹෙන්නේ එය ආසිරි ගන්වා ශුද්ධවත් කිරීමෙනුයි. හිස්, පාළු තත්ත්වය, ජීවයෙන් පිරි විශ්වයක් බවට පත්වී දෙවියන් වහන්සේගේ ශුද්ධවන්තභාවය ප්‍රකාශ කරයි.

මෙහිදී එක්තරා ජනවන්දනාත්මක අවධාරණයක් දැකිය හැකි ය. ශුද්ධවත් කිරීම (හිබෘ බසින් "කිද්දෂ්") ජනවන්දනාත්මක පසුබිමක බොහෝ විට යෙදේ. සබත් දවස නොහොත් සත්වෙනි දවස සංකේතවත් කරන්නේ දෙවියන් වහන්සේගේ ශුද්ධවත් බව පිළිගැනීම සහ එහි පංගුකාරයන් වීමයි. මේ සඳහා පදනම් වන්නේ "ගිවිසුම් සම්බන්ධතාවයයි. එනම් දෙවියන් වහන්සේ හා මානව සංහතිය අතර ගැඹුරු සම්බන්ධතාවය (නික්මයාම 19:4-5). මානව සංහතියේ කැඳවීම ශුද්ධවන්ත ජනතාවක් වීමයි. සබත් දවසේ කැපවීමේ පදනම එයයි.

එක් එක් දිනයේ මැවීමේ ක්‍රියාවක් අවසානයේ දී දෙවිඳුන් එහි යහපත් බව දුටු සේක. සත්වන දවස එය සමස්තයකට ගෙන එමින් දෙවිඳුන්ගෙන් ආසිරි ලබයි (2:3. සකල විශ්වය දේව ආශිර්වාදයෙන් පිරි, සුන්දරත්වයෙන් හෙබි යථාර්ථයකි. මේ ආසිරි ගැන්වීමේ හා ශුද්ධවන්ත කිරීමේ ක්‍රියාවලිය අනුව "සබත" යනු මැවීමේ ක්‍රියාකාරීත්වය නැවැත්වීමක් නොව ඉදිරියට ගෙන යාමකි.

**මැවීම පිළිබඳ දෙවැනි කථා පුවත**
යාවේ සම්ප්‍රදායික කතුවරයා විසින් ඉදිරිපත් කරන මෙම විස්තරයෙහි, කතාන්තර රූප ශෛලිය ද, නට්‍යමය ගුණය ද නොඅඩුව දකිය හැකිය. කෘෂිකාර්මික පරිසරයක් තුළ දිග හැරෙන මේ කථාවේ දෙවි සමිඳුන්ගේ ක්‍රියාකාරීත්වය මානව රූපී සංකේත මගින් විස්තර වේ (කුඹල්කරුවෙක් 2:7, උයන් ගොවියෙක් 2:8) සර්පයා, ජීවන වෘක්ෂය ආදිය පුරාතන ලෝකයේ සාහිත්‍ය අංශවලට නැකම් කියයි. මෙහි මැවුම්කාර දෙවිඳුන්ව හැඳින්වෙන්නේ "යාවේ" හෙවත් "ස්වාමින් වහන්සේ" ලෙස යි.

**විග්‍රහය**

**1. ස්වාභාවික පරිසරය :**
යාවේ සම්ප්‍රදායිය කතුවරයාගේ කතා පුවත මුල් කතා පුවතට සමාන්තරව, එහෙත් වෙනත් සැකසුමක් අනුව ගලා යයි. එනම්, විශ්වය නිර්මාණය කිරීම, මිනිසා මැවීම, ස්ත්‍රිය මැවීම, මනුෂ්‍යාගේ වැටීම ආදි පියවර වශයෙනි.

"ඒදන්" උයන තුළින් පුරාතන ලෝකයේ සශ්‍රික පරිසරය හා පැවැත්ම විදහා දක්වෙයි. එකම භූගෝලීය දත්තයන් ආශ්‍රිතව ගංගා සතරේ විස්තරය තුළින්, ඒදන් උයන මුළු විශ්වයේ ද කේන්ද්‍රය සේ දක්වෙයි (සිරාක් 24:25-27). යාවේ දෙවිඳුන්ගේ, විශ්වයේ ක්‍රියාකාරීත්වය ඒදන් උයන කේන්ද්‍රියව සිදුවීම දෙවි මැඳුර කෙන්ද්‍රියව සිදුවන එතුමන්ගේ විශ්ව ක්‍රියාකාරීත්වය හා සමානතාවක් දරයි. (එසකියෙල් 47:1-12). "ජලය" සහ "භූමිය" කෘෂිකාර්මික පරිසරයක ජීවය සඳහා මූලික අවශ්‍යතා වේ. විශ්වයේ සහ ජීවයේ ක්‍රියාකාරීත්වයට ඒදන් උයනින් මුල පිරෙන සැටි අපට දිස්වේ. රඟ මඬලේ පළමු ජවනිකාව ඒදන් උයනේ සිදුවීමයි.

**2. මිනිසා සහ ස්ත්‍රියගේ මැවීමේ ක්‍රියාවලිය**
සොබා දහම අලංකාර වුවත් මිනිස් ජීවයෙන් තොරව එහි ජීවයක් නොමැත. "පොළොව කොටන්නාගේ" ක්‍රියාවෙන් පෙන්නුම් කරන්නේ මානව දායකත්වය නිසා ලොව සරුඵල ගැන්වීමේ යථාර්ථයයි (2:5). දෙවි සමිඳුන් මිනිසා නිර්මාණය කරන්නේ භූමියේ දූවිල්ල තුළිනි. මිනිස් ස්වරූපය සංකේතවත් කරයි (2:7, 3:19) ජීවයේ කතුවරයාණන්. ජීවදායකයාණන් වන දෙවිඳාණෝ ද ජීවන හුස්ම හෙළමින් මිනිසා ජීව ගන්වන සේක" (2:7 ධර්මදේශකයා 12:7). මිනිස් ජීවිතයේ යථාර්ථය "මිනිසා සහ භූමිය" අතර සම්බන්ධතාවෙන් පෙනෙන අතර, හිබෲ බසින් යෙදෙන පද පෙරළියෙන් (ආදම් - 'අදාමාන්') එය ප්‍රබලව ධ්වනික කෙරේ.

පළමු මැවීමේ කතාවේ දී නොව දෙවන කතාවේ දී, ස්ත්‍රියගේ මැවීම සිදුවන්නේ පුරුෂයාගේ මැවීමෙන් පසුවයි. මෙමගින් පුරුෂයා හා ස්ත්‍රියගේ ස්වාභාවය ද, කාර්යභාරය ද විස්තර කිරීමට කතුවරයා පියවර ගනී. ස්ත්‍රියගේ වගකීම වන්නේ පුරුෂයා ඉදිරියේ "සහාය වන්නියක්" වීමයි. සහාය වන්නියක් යනු සේවිකාව, වහලියක් හෝ පුරුෂයාට වඩා අඩු ගරුත්වයකින් යුතු තැනැත්තියක් වීම නොවේ. එය සහජීවනයයි. සාමූහික පැවැත්මකි. අන්‍යොන්‍ය සබඳතාවකි. (2:18).

මිනිසා මෙන් ම භූමියෙන් නිර්මාණය වූ සත්ත්වයන්ට මෙම සහායවීමේ අවශ්‍යතාව සපිරීමට නොහැකි ය (2:20). ශුද්ධ ලියවිල්ල තුළ "සහායවීම" (හිබෲ වදන "එසෙර්") මූලිකව දෙවිඳුන් හා සම්බන්ධව යෙදේ (ද්විතිය නීති 33:26. නික්මයාම 18:4, ගීතාවලිය 33:20). දෙවිඳුන් වෙතින් නිරතුරුව ම මානව පරපුරට සහාය පැමිණේ. එබැවින් ස්ත්‍රිය යනු දෙවිඳුන්ගෙන්ම ලැබෙන සහාය වන්නියක වශයෙන් අපට තේරුම් ගත හැකි ය. මෙම සහාය වන්නිය, මිනිසාට සමාන මිනිසාගේම ස්වාභාවයෙන් සංයුක්ත අයෙකි. මිනිසාගේ "ඉළ ඇටයෙන්" තනනු ලැබූ ඇය "තමාගේ ම ඇටකටු හා මාංශය" ලෙස මිනිසා හඳුනා ගනියි. (2:22-23). පුරුෂයා සහ ස්ත්‍රිය අතර සබඳතාව දෙවිඳුන් අරමුණු කළ සහජීවනයකි. "මිනිසා හා ස්ත්‍රිය" සඳහා හෙබ්‍රෙව් බසින් යෙදෙන පද පෙරළිය (ඉෂ්-ඉෂ්ෂාන්) මෙය මනා ලෙස විදහා දක්වයි. මෙය දෙමාපියන් හා දරුවන් අතර සබඳතාව ඉක්මවා යන බැඳීමකි.

මනුෂ්‍යයා මැවිල්ලේ සියලු සත්ත්වයන්ට නම් තබන ආකාරය කතාවේ සඳහන් වේ (2:20). "නම් කිරීම" තුළින් ප්‍රකාශ වන්නේ සත්ත්වයන් කෙරෙහි ඔහු දක්වන ආධිපත්‍යයයි. එහෙත් ස්ත්‍රිය සම්බන්ධයෙන් එවැනි නම් කිරීමක් නැත. ඇයට "ස්ත්‍රී" යයි කියනු ඇත. (2:23) ඉන් දෙදෙනා අතර සමාන ස්වභාවය හා ගරුත්වය තවදුරටත් විස්තර කෙරේ.

**2.1.3. පාපයේ යථාර්ථය:**
**මානව ජීවිතය සහ මානව නිදහස**
දෙවිඳුන් නිර්මාණය කළ විශ්වය, එහි ඇති සොබා දහමේ විවිධත්වය, තුළ ඇති අලංකාරයෙන් හා සුන්දරත්වයෙන් පූර්ණව දිස් වේ. එහෙත් එය හුදෙක් තුරුලිය වලින් සැදුන වනයක් වීම නොව, මානව වර්ගයාගෙන් සැදුන වාස භවනක් වීමයි අරමුණ වූයේ. කෙසේ වෙතත් මිනිසාගේ භාවිතය ඉක්මවා යන විශේෂ වෘක්ෂයන් දෙකක් ගැන සඳහන් වේ. එනම් "ජීවන වෘක්ෂය" සහ "හොඳ නරක අවබෝධ කරගැනීමේ වෘක්ෂයයි". පළමු ගසෙන් ජීවයේ පැවැත්මත්, දෙවැනි ගසෙන් සදාචාර පැවැත්මේ ආධිපත්‍යය දෙවිඳුන් සතු බවත් ගස් දෙක වෙන් කොට දැක්වීමෙන් හැඟෙයි.

මානව ජීවිතයේ විශේෂ ලක්ෂණයක් වන්නේ නිදහසයි. "තීරණ ගැනීම" හෙවත් "තෝරාගැනීම" සැබවින්ම මිනිස්කමට උරුම වූ තිළිණයකි. සත්ත්වයනට ඒ හැකියාව නොමැත. මිනිසාට පැවැරුණු ලොව පාලනය කිරීමේ වගකීම නිදහස් ක්‍රියාවකි. එම නිදහසේ පසුතලය

ක්‍රියාකාරීවීමෙන්, මනුෂ්‍යයා දෙවිඳුන් වෙතින් තමනට ලැබුණු වගකීම් ක්‍රියාවට නංවයි. දෙවිඳුන් මනුෂ්‍යයාට යොමු කළ ආඥා දෙක වන, "අනුභව කරන්න" මෙන්ම "අනුභව නොකරන්න" යන්නද, මානව නිදහසට අනුකූල ය. "කිරීම" සහ "නොකිරීම" යන අංශ දෙකින් මානව නිදහසට හා තේරීමට ඇති අයිතිය සනාථ කෙරේ.

පාපය මානව නිදහස උල්ලංඝනය කිරීමකි. "සර්පයා" පුරාතන ලෝකයේ විවිධ අර්ථයන් සඳහා යොදා ගැනුණ සංකේතයකි. සංකීර්ණ හා වියවුල් බව, ගුප්ත ඥානය, සශ්‍රීකත්වය ඉන් සමහරකි. මේ කතා පුවත තුළින් "සර්පයා වියවුල් බව හා මානසික ආකර්ෂණය (ආශාව) සංකේතවත් කරන බැව් පෙනේ.

දෙවියන් වහන්සේ ඒව ට අණ කලේ සියලුම ගස්වල ගෙඩි අනුභව කරන ලෙසත්, හොඳ නරක අවබෝධ කරගැනීමේ ගසේ ගෙඩි අනුභව නොකරන ලෙසත් ය. අනුභව කරන්න/ නොකරන්න යන ආඥා දෙක ම මානව නිදහසට අනුකූල ය. එය නිදහසින් ජීවත්වීමට කළ ඇරයුමකි. හොඳ සහ නරක දැනගැනීම වරදක් නොවේ. එහෙත් හොඳ සහ නරක දැනගැනීමේ ආධිපත්‍යය දෙවිඳුන් පමණක් සතු දෙයකි. දෙවි සමිඳුන්ට හිමි එම ආධිපත්‍යය පැහැර ගැනීමට එනම් දෙවි සමිඳුන් හා සමාන වීමට ක්‍රියා කිරීමයි, මනුෂ්‍යයා කළ වරද වූයේ (3:5).

හොඳ නරක අවබෝධ කර ගැනීමේ ආධිපත්‍යය පැහැර ගැනීමට ක්‍රියා කිරීමට, එනම් සදාචාර පැවැත්මේ ආධිපත්‍යය තමන් නතුකර ගැනීම නිදහස උල්ලංඝනය කිරීමකි. "අනුභව කිරීමේ" ක්‍රියාවලිය සහ "අනුභව නොකිරීමේ" ක්‍රියාවලිය අතර වියවුල් වීමකි. නිදහස් තීරණ ගැනීමේ අයිතිය අනිසි ලෙස යොදා ගැනීමකි. "දෙවියන්ට සමාන" වීම වෙනුවට සිදුවූයේ හොඳ නරක වෙනස වියවුල් කරගත් යක්ෂයාට සමාන වීමකි. වැටුණු මනුෂ්‍යයා වෙත දෙවි සමිඳුන් දක්වන ආකල්පය අපගේ අවධානය යොමු විය යුතු උත්තරීතර සත්‍යතාවකි. සෑම මානව ක්‍රියාවක් ම සිදු වන්නේ දෙවි සමිඳුන් ඉදිරියේ ය. මනුෂ්‍යයා දෙවිඳුන් වෙතින් සැඟවීමට උත්සාහ කළත්, එතුමන් ඉදිරියේ සියල්ල අනාවරණය වන්නේ ය (2:10). "දෙවි සමිඳුන් ඔවුන් පසුකර යාම" එතුමන්ගේ හඬ ශබ්දය ඇසීම හඟවන්නේ මනුෂ්‍යයා කුමන තත්ත්වයකට මුහුණ දුන්නත් දෙවි සමිඳුන් ඔවුනට සමීපව නිරතුරු සිටින බවයි. (2 සාමුවෙල් 5:24, එසකියෙල් 3:12-13).

"නග්න බව" හෙවත් " නිරුවත" සංකේතවත් කරන්නේ මානව දුර්වලතාවය සහ අනාරක්ෂිත බවයි. වැටීමට පෙර සොබා දහම සමග සහජීවනයෙන් සිටි මනුෂ්‍යයාට, එය බාධාවක් හෝ අවහිරයක් නොවිණි (2:25). ඇත්තවශයෙන් ම එය සාමකාමීත්වයේ හා අහිංසකත්වයේ සංකේතයක් විණි. මනුෂ්‍යයා වරදට වැටීම හේතු කොට ගෙන, ඒ අහිංසකත්වය හා සාමකාමීත්වය නැවතිණි. දෙවිඳුන්ගේ පැනයට පිළිතුරු සැපයීමේ දී එකිනෙකා මත වරද පැටවීමෙන් පෙර පැවැති සහජීවනය පළුදු වූ සැටි පෙන්නුම් කෙරේ. දෙවි සමිඳුන් ඔවුනට වස්ත්‍ර පැළඳවීමෙන් සංකේතවත් කරන්නේ දුර්වල මනුෂ්‍යයා වෙත සැලසෙන දේව සංරක්ෂණයයි (3:21, 3:7).

වැටුණු මනුෂ්‍යයාගේ දෛවය කුමක් වී ද ? දුර්වල මනුෂ්‍යයා කෙරෙහි දෙවිඳුන් දක්වන කාරුණික, සාධාරණ ආකල්පය මෙම කථා පුවතෙහි කැපී පෙනෙන කරුණකි. ජීවයේ සහ විශ්වයේ කතුවරයාණන් ඉදිරියේ මානව වර්ගයාගේ මේ වැටීම බලාපොරොත්තු රහිත, ඛේදවාචකයක් නොවිණි. දෙවිඳුන්ගේ "දඬුවම් නියම කිරීම" "ශාප කිරීම" පෙන්නුම් කරන්නේ පාපයේ ආදීනව නොහොත් විපාකයයි. විශ්වයේ සහ මානව පැවැත්මේ සමතුලිතතාව දැන් බිඳී ඇත.

මිනිසා සහ ස්ත්‍රිය අතර සමතුලිත පැවැත්මද (ඉෂ්-ඉෂ්ෂාන්) මනුෂ්‍යයා හා භූමිය අතර සමතුලිත පැවැත්ම ද (ආදම් - ආදාමාන්) දැන් දෙදරා ගොසිනි (3:16, 17). එනම් මනුෂ්‍යයාගේ වැටීම සියලුම සම්බන්ධතාවන් (දෙවිඳුන්-මනුෂ්‍යයා-සොබාදහම) කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කොට ඇත.

දෙවිඳුන්ගේ ශාපය යොමුවන්නේ මිනිසා සහ ස්ත්‍රිය වෙත නොව, සර්පයා සහ භූමිය වෙතයි (3:14,17). ඉන් විදහා දක්වෙන්නේ මානව නිදහසට තීරණ ගැනීමට එරෙහි වන බලවේග සහ ස්වාභාවය දෙවිඳුන් වෙතින් ශාප ලබන බවයි. පොළොව කෙටීම, දරු ප්‍රසූතිය මැවිල්ල තුළ දේව ආශිර්වාදය තුළින් පැවරුණු මානව වගකීම් වේ. ඒවා මිනිස් දිවියේ අත්දැකීම් ය. එහෙත් දෙවිඳුන් තිළිණ කළ නිදහසේ පැවැත්මට පිටුපා "සර්පයාගේ හඬට" අවනත වීමෙන් මේ මිනිස් අත්දැකීම් අර්ථ රහිත අත්දැකීම් වේ. (3:16, 17-19). ඒ හා සබැඳි වෙහෙස, වේදනා, ඍණාත්මක "දඬුවම්" සේ හැඟේ. ශුද්ධ ලියවිලි කතුවරයා පාපයේ යථාර්ථය ඔස්සේ මිනිස් අත්දැකීම් මනාව විග්‍රහ කරන සැටි පෙනේ.

මෙම පසුතලය තුළින් උදාවන සුබවාදී දසුනක් අපට නිරීක්ෂණය කළ හැකි ය. එය දුර්වල තත්ත්වයක සිටින මනුෂ්‍යයා වෙත දෙවි සමිඳුන් දිගු කරන රැකවරණයයි. දෙවිඳුන් වෙතින් සැලසෙන සරණය, ගරුත්වය සහ රැකවරණය වස්ත්‍ර පැළඳවීමෙන් සංකේතවත් කෙරේ. මානව සංහතියත් මානව නිදහසේ පැවැත්මට එරෙහි වන අයහපත් බලවේග අතරත් අරගල දැන් ප්‍රකාශ වී ඇත. (ස්ත්‍රියගේ වංශය හ සර්පයාගේ වංශය අතර 3:15). දේව සැලැස්ම තුළ මනුෂ්‍යයා යළිත් මානව නිදහස, සහජීවනය, සමතුලිත පැවැත්ම කරා යන ගමන් මග වැටී ඇත්තේ මේ ජීවන අරගල ඔස්සේ ය. නව ගිවිසුමේ ජේසුස් ස්වාමීන් වහන්සේගේ විමුක්තියේ ක්‍රියාවලිය පිළිබඳ ඉඟියක් ද දැකිය හැකි ය.

**කායින් සහ ආබෙල් කතා පුවත: (උත්පත්ති 4:1-16)**
මෙම කතා පුවත මුල් පරිච්ඡේද දෙක හා සම්බන්ධ වෙමින්, එහි මූලික තේමා අවධාරණය කරමින් දිව යයි. අකීකරුකම සහ ඊට අනුබද්ධිත විපාක ලොව පුරා පැතිරෙන සැටි ඉන් පෙන්නුම් කෙරේ. වරද නිසා ඇද වැටුණු මිනිසාගේ දෛවය අයහපත සමග කෙරෙන නිරන්තර සටනකි (උත්පත්ති 3:15, 4, 7) පාපය නිසා සහෝදරත්වය සහ සාමූහිකත්වය දෙදරා යයි. වරද නිසා සිදුවන අසාරධාරණය (ආබෙල්ගේ මරණය) අභිබවා දේව සාධාරණත්වය උදාවන සැටි සෙත්ගේ උපතින් නිරූපණය වේ (4:25).

මෙම කතා පුවත තේරුම් ගැනීම සඳහා පුරාණ ගිවිසුමේ ඓතිහාසික පසුබිමෙන් එන සාධක සලකා බැලිය හැකි යයි සමහර විශාරදයෝ යෝජනා කරති. ඒ අනුව මින් ඉස්මතු වන්නේ පුරාණ ගිවිසුමේ එඬේර වෘත්තික ගෝත්‍ර සහ කෘෂිකාර්මික වෘත්තික ගෝත්‍ර අතර පැවති එදිරිවාදී බවයි. කෘෂිකාර්මික ජීවිතය, එඬේර ජීවිතයට වඩා ප්‍රමුඛ වීම මින් මතු කෙරෙන බවයි. ඒ මතයෙන් හැඟෙවෙන්නේ, තවත් විශාරද මතයක් වන්නේ ලෝකුරුවන්ගේ වෘතතියේ නියැලෙමින් තැනින් තැන ගිය කේනයික ගෝත්‍රයේ ආරම්භය කායින් ආබෙල් කතාවෙන් ඉදිරිපත් කෙරෙන බවයි.

කතාව තුළ කෙසේ වෙතත් ඉහත කරුණු ඓතිහාසික වශයෙන් සනාථ කිරීමට කතාව තුළ පදනමක් නොමැති පරිච්ඡේද ලෝකයේ ආරම්භය කරා යොමු වූවක් වන අතර, එඬේර වෘත්තිය, කෘෂිකර්මය (ක්‍රි.පූ. 10,000 ට පසුව) ලෝකුරු කර්මාන්ත (ක්‍රි.පූ. 5000 ට පමණ පසුව) පසුකාලෙක ඇති වූ ක්‍රියාවලියක් බව පෙනේ. තවද 4:17 න් වෙනත් ගෝත්‍රික ජනයා විසූ බවත්, ඉස්මතු වේ. එබැවින් මෙය ඓතිහාසික රචනයක් නොව, යාවිස්ත කතුවරයා තව දේව ධාර්මික පණිවිඩය ඉදිරිපත් කිරීම සඳහා උපයෝගි කරගත් කථාන්තරයක් ලෙස සැලකීම වැදගත් වේ.

චරිතයන් ඔස්සේ ගොඩනැගෙන කථා පුවත දෙස අවධානය යොමු කරමු. කායින් සහ ආබෙල් දෙසොහොයුරන් අතර වෙනස්කම් මුල සිට ම පෙන්නුම් කෙරේ.
උදා :- උපත, රැකියාව වෙනස්කම විරුද්ධවීමක් නොවේ. එහෙත් කායින් එය විරුද්ධතාවයක් සේ සලකයි. මේ විරුද්ධතාවය ඔහුගේ සොහොයුරා හා සම්බන්ධතාව කෙරෙහි ද බලපායි. මෙය ලෝක නිර්මාණයේදී දෙවි සමිඳුන් මිනිසාට තිළිණ කළ නිදහස් කැමැත්ත උල්ලංඝනය කිරීමකි. (6:6-7).

ආබෙල් සිය කැමැත්ත යොදා ගත්තේ දෙවි සමිඳුන්ට ප්‍රසන්න වන පරිදි ය. කුළුඳුල් පැටවුන්ගෙන් සමහරක් සහ "හොඳම කොටස්" පූජා කිරීමෙන් ඔහු දෙවි සමිඳුන් සඳහා කළ තෝරාගැනීම විදහා දැක්වේ. (4:4). එහෙත් කායින් සිය නිදහස් කැමැත්ත යොමු කළේ "සිය සොහොයුරු ආබෙල්ට එරෙහිව නැගීසිටීමට ය" (4:8). මාගේ සොහොයුරාගේ රැකවලා මම දැයි ඇසීමෙන් කායින් සොයුරුදම ප්‍රතික්ෂේප කරන අන්දම දිස් වේ.

රුධිරය ජීවයේ ධාරකය ලෙස පුරාණයේ සැලකුණු අතර, එය දෙවි සමිඳුන්ට පමණක් හිමි පූජනීය දෙයක් ලෙස පිළිගැනිණි (ලෙවි 17:11). යාගික වත් පිළිවෙත් වලට අනුව රුධිරය පූජාසනය මත තැවරීමෙන් එහි පූජනීයත්වය හුවා දැක්විණි. එබැවින් මිනිස් ඝාතනය එක් අතකින් දෙවි සමිඳුන් සතු දේ පැහැර ගැනීමකි. අනෙක් අතට සහෝදරත්වයට පිටුපා යාමකි. කායින් සිය සොහොයුරා ඝාතනය කිරීම දෙවිඳුන් හෘදය සාක්ෂිය ඔස්සේ කළ අනතුරු හැඟවීම නොතකා කළ බැවින් ඔහුගේ වගකීම වඩාත් බරපතලව දිස් වේ (4:6-7). මෝසස්ගේ නීතිය අනුව එය මරණ දණ්ඩනය හිමි විය යුතු දැඩි වරදකි. අසරණයන්ගේ, පීඩිතයන්ගේ සුසුම්ලෑම සහ මොර ගැසීම සාධාරණත්වයේ උල්පත වන දෙවි සමිඳුන් වෙත යොමුවීම කැපී පෙනෙන කරුණකි. (නික්මයාම3:7)

පාපයේ ප්‍රති විපාකය වන්නේ දෙවි සමිඳුන් වෙතින් ඈත් කරනු ලැබීමයි. "දෙවිඳුන්ගෙන් ඈත්වීම" පෘථිවියෙන් ඈත්වීම යන්නෙන් ඉස්මතු කොට දැක්වෙන්නේ කායින්ගේ අපරාධය නිසා මානව සම්බන්ධතා පළුදුවීමෙන් ඇති වූ නව තත්ත්වයකි (4:12). "ඉබාගාතේ යන්නෙකුගේ" අත්දැකීම් කැටි කොට දක්වන්නේ ශාපයක් ලෙසින් මානව සම්බන්ධතාවලින් තොර ජීවිතයකට පිවිසීමයි.

දෙවි සමිඳුන් කායින් පිට තැබූ සලකුණ දණ්ඩනයේ සලකුණක් නොව, දේව රැකවරණය පිළිබඳ සලකුණකි. සියලූ මානව දුබලකම් වෙත දේව රැකවරණය ළඟාවීම ශුද්ධ ලියවිල්ලේ පැහැදිලි ධර්මතාවයකි (3:12). දේව ක්‍රියාකාරීත්වය තුළ හිංසාවට, අසාධාරණත්වයට හා පාපයට එරෙහි දේව අභිමතය ක්‍රියාත්මක වන අන්දම පිළිබඳ මෙය අනගි නිදසුනකි.

සෙත්ගේ උපත මෙම කතා පුවතට අපූර්ව නිමාවකි. කායින් තුළ ඇති වූ සහෝදරත්වයට එරෙහි වූ තර්ජනය වර්ධනය වූ අවධියක්, ලාමෙන්ගේ කථා පුවතින් පෙන්නුම් කෙරේ (4:23-24). එහෙත් දෙවි සමිඳුන්ගේ ක්‍රියාකාරිත්වයට එරෙහිවීමට එයට හැකියාවක් නොමැත. ආබෙල්ගේ පැවැත්ම සිහි ගන්වමින් බිහිවන සෙත් යළිත් සහෝදරත්වය නැංවීම පිළිබඳ බලාපොරොත්තුව තීව්‍ර කරයි (4:25). සැබෑ ජනවන්දනාව යාගික ක්‍රියාකාරීත්වය යහපත් මානව සම්බන්ධතා සමඟ අත්වැල් බැඳගනී (4:26,යෙසායා 6:6).

**ජලගැල්ම : උත්පත්ති 6-9**
පරිච්ඡේද සතරක් ඔස්සේ දිව යන මෙම ජලගැල්මේ කතා පුවත යාවිස්ත (ජේ) සහ පූජක (පී) යන සම්ප්‍රදායයන්ගේ සංකලනයක් ලෙස සැලකිය හැකි ය. නූතන ගවේෂණවලට අනුව ජලගැල්මේ කථා පුවත් පුරාතන ලෝක සාහිත්‍යයේ අංගයක්ව පැවති බැව් සොයාගෙන ඇත.

පුරාණ මෙසපොතේමියානු නොහොත් බබිලෝනියානු පසුබිමින් බිහිවූ, ගිල්ගමේෂ්, අත්‍රහාසිස් වැනි වීර කාව්‍ය මීට නිදසුන් වේ. ශුද්ධ බයිබලයේ කතා පුවත අත්‍රහාසියේ වීර කාව්‍ය හා බොහෝ දුරට සමාන්තරව රචනය වී ඇති බැව් බොහෝ විශාරදයෝ පිළිගනිති. එබැවින් ජලගැල්මේ ඓතිහාසික කරුණු ගැන සෙවීම නොව, ජලගැල්මේ කථාන්තරය මාධ්‍ය කොට ගෙන ශුද්ධ ලියැවිලි කතුවරයා ගෙනහැරපාන පණිවිඩය අවබෝධකර ගැනීම වැදගත් වේ.

මෙම ජලගැල්මේ කතාන්තරය තුළ පොදු ආකෘතියක් දැකිය හැකි ය. මනුෂ්‍ය වර්ගයා මැවීම, දේව සැලැස්මට එරෙහිව ක්‍රියා කිරීම ජලගැල්ම දණ්ඩනයක් සේ එවනු ලැබීම, යළි මනුෂ්‍ය වර්ගයා වර්ධනය වීම යනුවෙනි. නෝවාගේ චරිතය (පුරාතන වීර කාව්‍යවල, අත්‍රහාසි, "උට්නපිෂ්ටිම්" වැනි චරිතවලට සමාන්තරව) නව මැවීමේ ක්‍රියාවලිය මූලික වන ධර්මිෂ්ඨ පුද්ගලයාගේ පැවැත්ම ආදර්ශයක් සේ හුවා දක්වයි. උත්පත්ති 6-9 දක්වා වන ජල ගැල්මේ කතාවේ ශු.ලියැවිලි කතුවරුන්ගේ දේව ධාර්මික දැක්ම සහ ඔවුනට ආවේණික වූ විශ්වාසය අවධාරණය කිරීම කැපී පෙනේ. උත්පත්ති 1 වන පරිච්ඡේදයේ දැක්වෙන දෙවි සමිඳුන්ගේ සැලැස්ම, ආසිරි ගැන්වීම දිගට ම ක්‍රියාත්මක වේ. (1:28-31,9:1-7). මනුෂ්‍ය සංහතියේ පරම්පරා පිළිබඳ සඳහන් කිරීමෙන් දෙවි සමිඳුන්ගේ මැවීමේ ක්‍රියාවලිය සහ ආසිරි ගැන්වීම ඵල දරන සැටි ප්‍රබල ලෙස ඉදිරිපත් කෙරේ.

**නෝවාගේ චරිතයෙන් මතු කෙරෙන ලොව උදාව :**
මෙම කතා පුවතේ නෝවා ප්‍රධාන මානුෂික චරිතයයි. ඔහු දැහැමි සත් ගුණවත් මිනිසෙකු විය (6:9). දෙවි සමිඳුන් කෙරෙහි ශක්තිය සහ විශ්වාසය ඔහුගේ දිවියේ ගුණාංග විණි. "සියල්ලන් අභිමුවෙහි නෝවා කරුණාව ලැබීම" කතුවරයා අවධාරණය කොට පෙන්වයි (6:8).

පාපය, අයහපත ලොව වර්ධනය වීමට පටන් ගත්තේ දෙවි සමිඳුන්ගේ මූලික අරමුණට පටහැනි වෙමිනි. එම වර්ධනයේ රිද්මය සහ විනාශකාරී බව යාවිස්ත කතුවරයා මානව රූපී ස්වරූපයෙන් එන දෙවි සමිඳුන්ගේ ප්‍රතිචාරය තුළින් මනාව දක්වයි (4 6:57). විශ්වයේ පැවැත්මට තර්ජනයක් වූයේ මානව සංහතිය තුළ ශීඝ්‍රයෙන් වර්ධන වූ හිංසාවයි (6:11). මතු සමයේදී දිවැසිවරුන්ගේ නිර්ධය හෙළාදැකීමට මානව හැසිරීම ලක්වූයේ  හිංසාව ඔවුන්ගේ ජීවිත වෙළාගත් බැවිණි. එය විශ්වාස තුළ දෙවි සමිඳුන්ගේ උත්තරීතර සහ ශුද්ධවූ සැලැස්ම කෙලෙසීමක් විණි. (එසකියෙල් 28:16-17).

දෙවි සමිඳුන් නෝවාට හෙළිදරව් කරන "ලොවේ විනාශය" පිළිබඳ තර්ජනයේ අරමුණ, ලොව විනාශ කිරීම නොව, මිනිස් වර්ගයා වර්ධනය කළ අයහපත ලොවින් තුරන් කර දැමීමයි. එය එක්තරා අන්දමක "පවිත්‍ර කිරීමේ" ක්‍රියාවලියකි (6:13). නෝවාගේ නෞකාව නැවත වරක් අපගේ අවධානය මුල් පරිච්ඡේදයේ සඳහන් මැවීමේ මුල් සිද්ධිය වෙත යොමු කරවයි. නැවට ඇතුළුවන සතුන්ගේ විස්තරය මුල් මැවීමේ කථාවේ විස්තරයට සමාන්තරව දිස් වේ (උත්. 1:21,28) ජල ගැල්මෙන් පසු දෙවි සමිඳුන් මුල් අවස්ථාවේදී මෙන් "නව විශ්වයක්" යළිත් මවන බවයි මින් අරුත් ගැන්වෙන්නේ. එමගින් නව මැවිල්ලක්, නව මිනිස් වංශයක්, නව ජනතාවක් දෙවිඳුන් උදා කරන බව සනාථ කෙරේ (8:20-22). නව මැවිල්ල ක්‍රියාත්මක වන්නේ දෙවි සමිඳුන්ගේ ආසිරි වදන්වල අනුහසිනි (9:17). සොබා දහම තුළ ද මනුෂ්‍යයා තුළ ද ජීවයේ සහ වර්ධනයේ ශක්තිය යළි උදා වූ අතර, මැවිල්ල තුළ දෙවි සමිඳුන්ගේ නියෝජිතයා ලෙස ක්‍රියා කිරීමේ උතුම් වගකීම යළි මිනිස් වර්ගයා වෙත පැවරිණි (9:1-2). මානව සංහතියේ වැටීම නිසා අවුල් වූ ලොව තුළ පුනර්ජීවනයක් ඇති කිරීමේ මෙහෙවර ජල ගැල්ම මගින් සමිඳුන් ට ඉටු කළ බැව් පාඨකයාට පැහැදිලිව පෙනේ.

දෙවි සමිඳුන් හා මිනිස් වර්ගයා අතර ගිවිසුම් සම්බන්ධතාව අපගේ අවධානය යොමු කළ යුතු වැදගත් කරුණකි. පුරාණ ගිවිසුමේ ජන ජීවිතයේ රටාව සැකසී ඇත්තේ ගිවිසුම් සම්බන්ධතාව මතයි (නික්ම. 19:5-6, ද්විතිය කතාව 26:18-19). ජලගැල්මෙන් පසුව ඇතිවූ පරිණාමය වන්නේ ගිවිසුම් ජීවිතයේ පුනර්ජීවනයයි. දෙවි සමිඳුන් කළාවූ "සිහිපත් කිරීම" සැබවින් ම මෙම ගිවිසුමේ පුනර්ජීවයයි. ගිවිසුම සම්බන්ධතාවේ ක්‍රියාත්මක වීමයි. (උත්පත්ති 9:15). විශ්වයේ සහ මානව වර්ගයාගේ නිරවුල් පැවැත්ම සඳහා මේ ගිවිසුම් සම්බන්ධතාව සුරැකීම අවශ්‍ය බව කතුවරයා දැඩි ලෙස අවධාරණය කරයි. "දේදුන්න" මගින් සංකේතවත් කෙරෙන්නේ පුනර්ජීවනයට ලක්වූ දෙවිඳුන් හා මානව වර්ගයා අතර ගිවිසුම් සම්බන්ධතාවයි. (9:13)

**බාබෙල් කොත පිළිබඳ කථා පුවත : උත්පත්ති 11:1-9**
මෙම කතා පුවත අවබෝධකර ගැනීම සඳහා 10 වැනි පරිච්ඡේදයේ විස්තරය සැලකිල්ලට ගත යුතු වේ. නෝවාගෙන් පසුව ඇතිවන පරම්පරා සහ ජාතිහු මුළු දෙරණ පුරා ව්‍යාප්ත වෙති (10:32). ඇත්තෙන් ම එය මැවීම ආරම්භයේදී, මානව පැවැත්ම පිළිබඳ දේව අභිමතය ක්‍රියාත්මක වීමක් වන අතර (1:28) එය විවිධ යුගයයන් ඔස්සේ ව්‍යාප්ත වූ සැටි පරම්පරා පිළිබඳ ක්‍රමවත් කිරීම්වලින් සනාථ කෙරේ (5:1,6:9).

මානව පැවැත්ම සඳහා භූමිය අත්‍යාවශ්‍ය අංගයකි. භූමිය පාලනය කිරීමෙන් මිනිස් ප්‍රගතිය සහ විශ්වයේ ප්‍රගතිය සපුරාලීම දේව සැලැස්ම වන සැටි මුල් පරිච්ඡේදයෙන් ඉස්මතු කෙරේ. පෘථිවියේ විවිධ බිම් කොටස් නිජබිම කරගෙන වර්ධනය වීම "බිම් මායිම්" හෙවත් සීමා පිළිබඳ විස්තරවලින් හැඟවේ. දසවැනි පරිච්ඡේදයේ වාචික සිතියම තුළින් එකල භූගෝලීය, වාර්ගික හා භාෂා

විෂමතාව හා විවිධත්වය පෙන්නුම් කෙරේ. ෂෙම්, හාම්, ජපෙත් යන තිදෙනා තුළින් මූලිකව භූගෝලීය වර්ගීකරණත් අපට නිරීක්ෂණය කළ හැකි ය.

බාබෙල් කොතේ කථාව අපගේ අවධානය යොමු කරන්නේ, මානව ව්‍යාප්තිය පිළිබඳ දේව සැලැස්මට එරෙහිව මිනිසා ක්‍රියා කිරීමේ යථාර්ථය වෙතටයි ( 9:19, 10:5,20). එය ලොව පුරා "විසිරයාමට" සැලැස්වීම මානව ව්‍යාප්තිය පිළිබඳ දෙවිඳු අරමුණට ඉඳුරා පටහැනි වීමකි. අනෙක් අතට මැවිල්ලේ ස්වාමින්ද්‍රයාණන් වන දෙවිඳුන් මත රඳා නොපැවති, උඩඟු හැසිරීමකට මිනිස් වර්ගයා යොමුවීම "අහය උසට නගින කොතක් ඇති නගරයක් අපටම ගොඩ නගා කීර්තිමත් වෙමු" යන්නෙන් අදහස් කෙරේ (11:4). "ෂිනාර්" නමැති පැරණි නමින් අදහස් වන්නේ පුරාණයේ යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගාධාර මැදිකොට බිහිවූ මෙසපොතේමියානු හෙවත් බබිලෝනියානු දේශයට ය. උස් කොතක් සහිත නගරය එම පසුබිමින් විස්තර වේ.

දේව සැලැස්මට එරෙහිවීමේ නොහොත් අකීකරුවීමේ මිනිස් හැසිරීමෙන් එම දේව සැලැස්ම ව්‍යාර්ථ නොවේ. දෙවිඳුන්ගේ ප්‍රතිචාරයෙන් එම අකීකරුකමේ ප්‍රවණතාව වෙනස් කෙරේ. හීබෲ බසින් "වියවුල් වීම" සඳහා යෙදෙන ක්‍රියා පදය "බාබල්" වන අතර, පද පෙරළිය තුළින් "බාබෙල්" නගරය උසස් නමකට වඩා වියවුල් භාවයකට සංකේතයක් දෙන බව අපට දැකිය හැකි ය. දෙවි සමිඳුන්ගේ එම ප්‍රතිචාරය නිසා, විවිධත්වය තුළින් සිදුවන විශ්වයේ සහ මානව වර්ගයාගේ වර්ධනය පිළිබඳ දේව සැලැස්ම, මානව පාපය අභිබවා ක්‍රියාත්මක වන සැටි මින් ප්‍රබල ලෙස ධ්වනිත වේ. දෙවියන් වහන්සේගේ මෙම මැදහත් වීම නිසා ඇතිවන නව හැසිරීම, මානව ප්‍රගතිය ආබ්‍රහම්තුමාගේ කීකරුකමේ ප්‍රතිචාරයෙන් මනාව පිළිබිඹු වේ. (12:1-4).

### 2.1.4. මුල් පියවරුන් පිළිබඳ ඉතිහාසය

උත්පත්ති පොතේ එකොළොස්වැනි අදියර පසුකර දොළොස්වැනි අදියරට පැමිණෙන විට ඊට අදාළ කාල සීමාව වනුයේ ක්‍රිස්තු පූර්ව 20 වැනි ශත වර්ෂය පමණ වන බව තේරුම්ගත යුතුය. මේ කොටසේ දැක්වෙන චරිත අතරින් අපට වැදගත් වන්නේ ආබ්‍රහම් ඊසාක් සහ ජාකොබ් යන තුන් චරිතයි. මේ චරිත මගින් ප්‍රකාශ වන්නේ දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟගේ මාර්ගයෙන් ක්‍රියා කිරීම පිළිබඳ ඉතිහාසයයි.

ක්‍රි.පූ. 20 වැනි සියවසේ හමුරාබි රජතුමාගේ බැබිලෝනියන් අධිරාජ්‍ය සමයේ ශිෂ්ට සම්පන්න සුමේරියානු පසුතලයක ඌර් නගරය පිහිටියේ ය (දනට වසර 4000 කට පෙර ඌර් නගරයේ තිබුණු දේවාලයක කොත්කිලය ද ඒ අසල පිහිටි මන්දිරවල අත්තිවාරම් ද ඒවායේ තැන්පත් කර තිබුණු මහා ධනස්කන්ධය ද පුරාවිද්‍යා දස්කම් නිසා 1923 දී ලොවට ප්‍රදර්ශනය කළ හැකි විය).

එවැනි පසුතලයක් සහ ඉතිහාසයක් ඇති ඌර් නගරයේ සෙත්ගේ පරපුරෙන් පැවත ආ පුද්ගලයකු ගැන උත්පත්ති පොත අපගේ අවධානය යොමු කරයි. තේරාගේ පුත් ආබ්‍රම් ඌර් නුවරින් පිටත්ව හාරාන් නම් ස්ථානයට ගොස් එහි පදිංචි විය.

ඒක දේව වාදයට නැඹුරුව සිටි ආබ්‍රම් බහු දේව වාදී සමාජය තුළ කොන්වන්නට ඇත. ඒ නිසාම ආගමික ස්වාධීනත්වය සහ පවුලේ අභිවෘද්ධිය තකා ප්‍රදේශය අතහැර යාමට ආබ්‍රම් තුළ පෙළඹවීමක් ඇතිවීම සාමාන්‍ය සිදුවීමකි.

ආබ්‍රහම්ගේ බිරිඳ සාරායි දරුඵල නොලද ස්ත්‍රියකි. ආදි සෙමිතික් ජනයා වඳ කාන්තාවන් සරදමට සහ උපහාසයට ලක්කර සමාජයෙන් කොන් කළහ. ආබ්‍රම් දරුඵලක් දෙන ලෙස නිතර නිතර තමන් අදහන දෙවිඳුන්ට කන්නලව් කළේය. එසේම තම පවුල කොන්කරන සමාජයෙන් ඉවත්ව යාම ද සුදුසු බව ඔහුගේ නික්මයාමට හේතු වූ තවත් කරුණක් විය හැකි ය.

ස්වාභාවික බලවේග දේවත්වයෙන් පිදුවා වූ සුමේරියන් බහු දේවවාදී සමාජය, අහසේ අධිපති මෙන් අනුද, වාතයේ නායකයා මෙන් එන්ලිල්ද, ජලයේ ආරක්ෂකයා මෙන් එන්කි ද අදහා එම දෙවිවරුන්ට මීපැණි, මිදිරස සහ ඉඳි කැවුම් ආදිය පූජා කළෝ ය. එවකට ශිෂ්ට සමාජයක් වුව ද සුමේරියානුන් අතර අමානුෂික අශිෂ්ට චාරිත්‍ර ද තිබුණි. නරබිලි පූජා, ළදරු ඝාතන, රජවරුන්ගේ මළ සිරුරු සමඟ ජීවමාන සේවක සේවිකාවන් රැසක් භූමිදාන කිරීම එවැනි චාරිත්‍ර කිපයකි. එපමණක් නොව "මාඩුක්" නම් දෙවියාට වන්දනා කළ යුතුයැයි බල කෙරෙන රාජාඥාවක් ද විය.

මෙවන් පසුබිමක සිටි ආබ්‍රහම් දෙවියන් වහන්සේගෙන් කැඳවීමක් ලබයි. බයිබල් කතුවරයා එම සිද්ධිය විස්තරකර ඇත්තේ මෙසේ ය.
*"දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට කථා කොට නුඹේ මව්බිම ද, නුඹේ නැදැයින් ද, නුඹේ පියාගේ ගෘහය ද අත්හැර දමා මා පෙන්වන්නට යන දේශයට යන්න. මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි. මම නුඹට ආශිර්වාද කරන්නෙමි. නුඹේ නාමයට ආසිරි පැතීමේ නාමයක් වන සේ කීර්තියට පමුණුවන්නෙමි.*

*ආබ්‍රහම් මේ කැඳවීමට අවනත වන්නේ බුද්ධියට වඩා හදවතකට මුල් තැන දීමෙනි. දේව කැඳවීමට අවනත වූ ආබ්‍රම්ට දෙවියන් වහන්සේ පණිවිඩයක් දෙයි.*
*'ආබ්‍රහම්, බිය නොවන්න. නුඹ රක්නා පළිහ මම ය. නුඹේ වාසනාව අති විසාල්ය".*
*"මහෝත්තම දෙව් ස්වාමීනි, දරුවකු නැති මට ඔබ වෙන කුමක් දුන්නත් කුමන ඵලක් ද?.... ඔබ මට දරු සම්පත් දී නැත. මාගේ ගෙදර උපන් වහලෙක් මාගේ උරුමකරු වන්නේ ය!.... "*
*"මෙවැන්නෙක් නුඹේ උරුමකරු නොවන්නේ ය...... නුඹ දරුවෙක් නුඹේ උරුමකරු වන්නේ ය ......."*

*(සමිඳාණන් වහන්සේ ද ඔහු පිටතට රැගෙන ගොස්)*
*"හැකිනම් ඔය තාරකා ගණන් කරන්න. නුඹේ දරු පරපුර ද එසේම වන්නේ ය"*

*ආබ්‍රහම් සමිඳාණන් වහන්සේ අදහා ගත්තේ ය. ඒ ඇදහිල්ල ඔහුගේ ධර්මිෂ්ඨකම වශයෙන් පිළිගත් සේක. (එතැන් සිට ආබ්‍රහම් විශ්වාසිකයන්ගේ පියා ය).*

*තවද ඉර බැස යයි. අඳුර පැමිණෙයි. දෙපළු කරන ලද සතුන් මැදින් දුම් නගින උඳුනක් ද දිලිසෙන ගිනි හුලක් ද පෙනේ. ඒ දවසේ දී සමිඳාණන් වහන්සේ ආබ්‍රම් සමඟ ගිවිසුමක් පිහිටුවා ගනිමින් "මිසරයේ ගංගාවේ සිට යුප්‍රටීස් මහ ගංගාව දක්වා කේනිවරුන් සහ කෙනිස්සිවරුන්, කද්මොනිවරුන් සහ හිත්තිවරුන්ද, පෙරිස්සිවරුන් සහ රෙපාවරුන් ද, අමොරිවරුන් සහ කානානිවරුන් ද, ගිර්ගාෂිවරුන් සහ ජෙබුසිවරුන්ද සතු මේ දේශය නුඹේ පෙළපතට මම දෙමි" යි වදාළ සේක.* (උත්. 15:1-21).

මෙතෙක් ඉදිරිපත් කළ කරුණු අනුව ආබ්‍රම්ට ලැබුණු ත්‍රිවිධ දිව්‍ය පොරොන්දු මේවා ය.

I. දේශයක් හිමිකර ගැනීම.
II. මහත් ජාතියක් වීම.
III. මුළු පොළොවේ සෙනඟට ආශිර්වාදයක් වීම.

දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ කළ ගිවිසුමේ බාහිර සළකුණ වශයෙන් සැළකුවේ චර්මඡේදන පිළිවෙත ය.

මේ පිළිවෙත ඇතැම් පෙරදිග රටවල පුරාණයේ දී පැවති බව පෙනේ. ඔවුන් එය කළේ වැඩිහිටියෙකු වශයෙන් සමාජය විසින් පුරුෂයෙකු පිළිගැනීම සංකේතවත් කිරීම සඳහා ය. පසුකාලයේ එය ආගමික පිළිවෙතක් වශයෙන් ද සම්මත වී තිබේ. ඉශ්රායෙල්වරුන්ට මේ පිළිවෙත තමන් දෙවියන් වහන්සේ විසින් තොරාගනු ලැබූ විශේෂ ජනතාවක් බව ඒත්තු ගැන්වීමේ සළකුණ විය. කිසියම් විජාතිකයෙකු ඉශ්රාලේ සමාජයේ සමාජිකත්වය ලැබීමට නම් ඔහු චර්මඡේදනය කළ යුතු විය. එදා අනුගමනය කළ එම පිළිවෙත මෙකල දේව ජනතාව වශයෙන් කිතුනුවන් ලබන ප්‍රසාද ස්නාපනයේ පූර්ව සළකුණ ලෙස ද සැලකිය හැකි ය.

**ඊසාක්**

සාරා වඳ තැනැත්තියක වූ බැවින් දේව පොරොන්දුව ඉටුවිය හැකිය යන්න පිළිබඳව නිශ්චිත ලෙස විශ්වාස කළ නොහැකි විය. ඇදහිල්ල සඳහා තවත් සාක්ෂි අවශ්‍ය විය. සාරා තම හිතුමතයට කටයුතු කරමින් තමාගේ මිසර ජාතික මෙහෙකාරිය වූ හාගර් උපයෝගි කර ගනිමින් තමාට දරුවකු ලබාගන්නා ලෙස ඉල්ලා සිටියා ය. එහි ප්‍රතිඵලය වයේ සාරාට සේවිකාවගේ සමච්චලයන් විඳ දරා ගන්නට සැලැස්වීමත් අන්තිමයේ දී ඒ මෙහෙකාරියත් දරුවාත් තම නිවසින් පලවා හැරීමත් පමණකි.

දෙවියන් වහන්සේ තම පොරොන්දුව ඉටු කළ සේක. සාරා ආබ්‍රහම්ට දාව පුත්‍රයකු ලැබුවා ය. ඔහු ඊසාක් ය. ඊසාක් ලැබීමෙන් පසු ඇති වූ අරගලයන්ගේ ප්‍රතිඵලය වූයේ හාගර් සහ ඇයගේ පුත් ඉෂ්මායෙල් ආබ්‍රහම්ගේ නිවෙසින් පිටමන් කිරීම ය (මේ ඉෂ්මායෙල් අරාබි ජාතීන්ගේ මීමුත්තා ලෙස සැලකේ).

දරුඵල ලැබූ පසු, මෙතෙක් "යහපත් පියා" යන අරුතැති, ආබ්‍රම් නැමැති චරිතය "ජාතීන්ගේ පියා වශයෙන් සලකා ආබ්‍රහම් වශයෙන් භාවිතා වන බව ද සැලකිය යුතු ය. සෙමිතික් සම්ප්‍රදාය අනුව පුද්ගලයෙකුගේ නාමය පූර්ණ පෞරුෂත්වයක් සංකේතයකි.

ආබ්‍රහම්ගේ ඇදහිල්ලේ ජීවිතය උරගා බලන දෙවි සමිඳාණන් වහන්සේ ඊසාක් දවන යාග පූජාවක් මෙන් තමන්වහන්සේට ඔප්පු කරන ලෙස ආබ්‍රහම්ට දක්වයි. ආබ්‍රහම් දේව නියමයට අවනත වෙයි. එහෙත් මේ පුවත අවසාන වන්නේ *"ආබ්‍රහම්, ආබ්‍රහම්, ළමයාට අත නොගසන්න. ඔහුට කිසි අනතුරක් නොකරන්න, ඔබේ පුත්‍රයා ඔබේ එක ම පුත්‍රයා පූජා කිරීමට තරම් ඔබ දේව ගරු බිය ඇත්තෙකු බව මට දැන් පෙනේ"* යයි යනුවෙන් දෙවියන් වහන්සේ විසින් කරනු ලැබූ ප්‍රකාශයෙනි.

ඊසාක් පූජා කිරීමට ගෙනයාමේ සිද්ධිය තුළින් මතු වී එන පණිවුඩ කීපයකි,

- එකල කුළුඳුල් දරුවන් දේව පූජාවක් වශයෙන් පිදීම චාරිත්‍රයකි,
- ආබ්‍රහම් ද ඒ චාරිත්‍රය ඉටු කිරීමට සැරසි ඇත. ආබ්‍රහම් සැලකුවේ ඊසාක් සාමාන්‍ය දරුවකු ලෙස ය. එහෙත් ආබ්‍රහම්ගේ මුළු බලාපොරොත්තුව ම ඔහු ය.
- දෙවියන් වහන්සේ තමන්ට පූජා කරන්නට ඉල්ලා සිටියේ ආබ්‍රහම්ගේ මුළු මහත් බලාපොරොත්තුව ය. ඔහු එය කිසිඳු පැකිළීමකින් තොරව ඉටු කිරීමට ඉදිරිපත් වෙයි.
- දේව අභිමතය ඉටු කිරීම පිළිබඳව ආබ්‍රහම් පරමාදර්ශයකි.
- තම දරුවන් දෙවියන් වහන්සේට පූජා කරන ලෙස අද ද දෙමාපියන්ගෙන් ඉල්ලනු ලැබේ. එවැනි අවස්ථාවල දී නූතන පියවරුන්ට තම මුළු මහත් බලාපොරොත්තුව ම තබා ඇති දරුවන් පුද කිරීමට සිදුවනු ඇත. මෙකල එය එසේ සිදුවේදැයි සිතා බලන්න.

- ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුළුවරුන් තමන් වෙතට කැඳවූ විට ඔවුන් දැක්වූ ප්‍රතිචාර ගැන සිතා බලා අපට ගතයුතු පියවර තීරණය කර ගත හැකි ය. විවාහකයෙකු වූ පේදුරුතුමා දෙවි අභිමතය අනුව ක්‍රිස්තු අනුගාමී වූ සැටි සිතා බලන්න.
- තවත් අතකින් බලන විට ඊසාක් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව පූර්ව ලකුණකි. ඔහු පියාණන්ගේ කියමනට අවනත වෙයි. තමා නිදොස් වුවත් මරණය වෙත යයි. මේ සිද්ධියේ දී ඔහු තම පියා ගැන කිසිදු අහිතක් ඇති කර නොගනී.
- සමකාලීනව පැවැති නරබිලි පූජාව දෙවියන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන බව ද තේරුම්ගත හැකි ඊසාක් කෙරේ පැහැදී ඇති ස්වාමීන් වහන්සේ ආබ්‍රහම් දුන් පොරොන්දුව මෙසේ අලුත් කරන සේක.

*"නුඹ පිය ආබ්‍රහම්ගේ දෙවිඳාණෝ මම ය.*
*බිය නොවන්න, නුඹ සමඟ ද මම සිටිමි.*
*නුඹට ආසිරි දෙමි.*
*මාගේ දාසයා වන ආබ්‍රහම් නිසා, නුඹේ පෙළපත මම වැඩි වර්ධනය කරමි."* **(උත්. 26:24).**
උත්පත්ති පොතින් ඉදිරිපත් කරන ආදිපියවරුන් පිළිබඳ සංදර්ශනයේ ඊළඟ ජවනිකාව සඳහා වේදිකාවට එන්නේ ජාකොබ් ය.

**ජාකොබ් :**
ඊසාක්ගේ බිරිඳ වූ රෙබෙකා ද ආබ්‍රහම්ගේ බිරිඳ වූ සාරා මෙන් ම වඳ ගැහැණියකි. එහෙත් දේව නියමය අනුව ඇය නිවුන් දරු දෙදෙනෙකුගේ මවක් වූවා ය. එයින් එක්කෙනෙක් ඒදොම්වරුන්ගේ පියා වූ ඒසව් ය. අනෙක් තැනැත්තා ඉශ්රායෙල්වරුන්ගේ ආදි පියා වූ ජාකොබ් ය.

ආරම්භයේ සිටම ජාකොබ් ආබ්‍රහම් මෙන් දේව ගරු බිය ඇතිව ජීවත් වූ පුද්ගලයකු නොවේ. තම සොහොයුරාගේ කුසගින්න නිවන්නට කෑම පිඟානක් දී වැඩිමහල්කමේ උරුමය ලබා ගත්තේ ය. මවගේ උපදෙස් අනුව ක්‍රියාකර ඒසව්ට හිමි පිතෘක ආශිර්වාද වංචනික ලෙස ලබා ගත්තේ ය.

දෙවියන් වහන්සේ විසින් ස්වකීය පොරොන්දු ඉදිරියට ගෙනයාම සඳහා අඩුපාඩුකමේ හා දුර්වලකම් ඇති පුද්ගලයන් ද තෝරා ගන්නා බවට මෙය ඉතා හොඳ නිදසුනකි. එහෙත් තෝරාගත් පසු එම කැඳවීම සාර්ථකව ඉටුකිරීමට අවශ්‍ය දේව වරප්‍රසාදයෙන් ඔවුන් පොහොණි කරවන සේක (තමා සතු දුබලතාවයන් ගැන සිත සිතා වගකීම් භාරගැනීමට හා ඒවා ඉටුකිරීමට පසුබට වන පුද්ගලයන්ට මේ මගින් වටිනා මග පෙන්වීමක් ලබාගත හැකි ය).

දේව කැඳවීම පිළිබඳව රෝමවරුන්ට අනුශාසනා කරන පාවුළුතුමා මේ සිද්ධිය පිළිබඳව දක්වන චින්තනය ද දැනගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.
*"රෙබෙකාගේ දරුවන් දෙදෙනාට ඊසාක් නම් එක ම පියෙක් විය. එහෙත් ඔවුන් උපදින්නට කලින් යහපත හෝ අයහපත කරන්නටත් පෙර "වැඩිමලා බාලයාට සේවය කරනු ඇතැ" යි ඇයට කියන ලදී. එසේ කියන ලද්දේ, දෙවියන් වහන්සේගේ තෝරාගැනීම, උන්වහන්සේගේ කැඳවීම අනුව මිස මනුෂ්‍යයාගේ ක්‍රියා මත රඳා නැති බව ස්ථිර වනු පිණිස ය"* (රෝම 9:10-13).

ආබ්‍රහම් විසින් දෙවියන් වහන්සේ අත්දුටු ස්ථානය හෙබ්‍රොන් ය. ඊසාක් තම අත්දැකීම ලැබුවේ බෙයර්ෂෙබාහි දීය. එසේම ජාකොබ් තුමා තම අනාගතය පිළිබඳව දේව සැලැස්ම තේරුම්ගත්තේ බෙතෙල්හිදීය. එහි අර්ථය (බෙත්එල්) "දෙවියන් වහන්සේගේ ගෘහය" යනුයි.

සංචාරක එඬේරෙකු වශයෙන් ජාකොබ් හාරාන් බලා යන අතරමග එක් තැනක දී රාත්‍රිය ගත කරන විට ඔහු අරුම පුදුම සිහිනයක් දුටුවේ ය.
- පොළොවෙහි තබන ලද ඉනිමඟකි. එහි මුදුන අහස දක්වා විය.
- දේව දූතයෝ එහි නගිමින් ද බසිමින් ද සිටියෝය.
- ස්වාමීන් වහන්සේ ඊට ඉහළින් සිට ජාකොබ් අමතා, ආබ්‍රහම් සමඟ කළ ගිවිසුම ජාකොබ් මගින් ඉදිරියට ගෙන යන බව සපත කළ සේක.

**ඒ පොරොන්දුවේ ත්‍රිවිධ අංශයන් මෙසේ ය.**
I. දෙවියන් වහන්සේ ඉශ්රායෙල්ට දේශයක් හිමිකර දෙන බව
II. ඉශ්රායෙල් ගණින් කළ නොහැකි තරම් වූ සෙනගක් වන බව
III. ඉශ්රායෙල් නිසා පොළොවේ වාසය කරන සියළුම ජනතාව ආශිර්වාද ලබන බව.

සිහිනයෙන් අවදි වන ජාකොබ් සැබැවින් ම සමිඳාණන් වහන්සේ මේ ස්ථානයේ වැඩ වසනා සේකැයි බිය වී මෙය අනෙකක් නොව දෙවියන් වහන්සේගේ ගෘහයකි. මෙය ස්වර්ගයේ දොරටුව යයි පැවසුවේ ය. මේ සිදුවීම් තුළින් ඔබේ අවධානය යොමුවිය යුතු කරුණු කිපයක් ඇත්තේ ය.

**ස්වර්ගීය ඉනිමඟ සහ බාබෙල් කොත :**
මනුෂ්‍යයන් තම ශක්තියෙන් අහස උසට (ස්වර්ගයට යාමට) ගොඩනැගිල්ලක් සාදා දේව සම්බන්ධතා ඇතිකර ගැනීමට ගත් උත්සාහය නිෂ්ඵල විය. එහෙත් දැන් පොළොවත් ස්වර්ගයත් අතර සම්බන්ධයක් ඇත. අහංකාරයෙන්, උඩගුවෙන්, මානයෙන්, ආත්මාර්ථයෙන් දැපී මනුෂ්‍යයාට

දේව සබඳතා ඇති කර ගත නොහැකි ය. එසේ කළ හැකි වන්නේ දේව දයාව හා වරප්‍රසාද මගිනි. ඒ අවස්ථාව උදා වන බවට ජාකොබ් දුටු ස්වර්ගීය ඉනිමඟ සළකුණකි.

ප්‍රාග් සුබාරංචිය සුගති උද්‍යානයේ දී දුන් දේව පොරොන්දුව (සංවර්ධනය වන ආකාරය) මෙයින් අපට තේරුම් ගත හැකි ය. ජාකොබ් දුටු මේ ස්වර්ගීය ඉනිමඟ දේව දයාව නිසා මනුෂ්‍යයාට අත්වන දේව සබඳතාවන්ට පෙර නිමිත්තකි. එය ජේසු සමිඳුන් හා මරිය මාතාවන් සංකේතවත් කරන්නක් වශයෙන් ද ගත හැකි ය.

බෙතෙල්හිදී ජාකොබ් අත්දුටු ගාම්භීර සිද්ධියේ සිහිවටනයක් වශයෙන් නිදාගන්නා විට තම හිසට තබාගත් ගල සිටුවා එහි මුදුනට තෙල් වත්කළේ ය. එය දේව ක්‍රියාකාරිත්වයේ සහ දේව ආධිපත්‍යයේ සළකුණ ය.

**ජාකොබ්ගේ බාරය**

බෙතෙල්හි ද ජාකොබ් දෙවියන් වහන්සේට බාරයක් විය. එය බයිබල ලේඛකයා ඉදිරිපත් කර ඇත්තේ මෙසේ ය.

*"දෙවියන් වහන්සේ මා සමඟ වැඩ සිටි, මෙසේ මා යන මඟ ආරක්ෂා කර මට කන්නට ආහාර ද, අඳින්නට වස්ත්‍රද දෙන සේක් නම් අනතුරක් නොමැතිව මාගේ පියාණන්ගේ ගෘහයට මට ආපසු යන්නට සලස්වන සේක් නම්, සමිඳාණන් වහන්සේ මාගේ දෙවියන් වහන්සේ වන සේක. තවද සිහිවටනයක් වශයෙන් මා සිටවූ මේ ගල දෙවියන් වහන්සේගේ ගෘහය වන්නේ ය. ඔබ මට දෙන සියල්ලෙන් දහයෙන් කොටසක් මම ඔබට දෙමි."*

මේ බාරය අනුව ජාකෝබ්ගේ ඉදිරි ජීවිතය සාර්ථක වෙයි. ජාකොබ් එතැනින් ඉදිරියට  ගමන් කර හාරාන්හි විසූ තම ඥාතීන් වෙතට පැමිණියේ ය. එහිදී ජාකොබ්ගේ වංක වැඩ පිළිවෙළ කෙසේ වෙතත් යාහ්වේ දෙවියන් වහන්සේ තමන්ට අවශ්‍ය සැම දෙයක් ම ලැබෙන්නට සැලැස්වීම කරණකොට ගෙන හෙතෙම මහා සම්පතක උරුමකාරයා වෙයි. භාර්යාවන් දෙදෙනෙක් ද (ලෙයා සහ රාකෙල්) උප භාර්යාවන් දෙදෙනෙක්ද පුතුන් එකළොස්දෙනෙක් ද, මෙහෙකරුවන් බොහෝ දෙනෙක් ද ලාබන්ගේ බැටළු රැල් වලින් ඉතාම හොඳ කොටස ද ජාකොබ් සතුවිය.

ජාකොබ් මේ වස්තු සම්භාරය ද රැගෙන ප්‍රයෝගකාර අරාමීය නැදැයාගේ ග්‍රහණයෙන් මිදී ආවේ ය. එසේ පැමිණ එතෙක් තමා සමඟ වෛරයෙන් සිටි සිට සොහොයුරා වූ ඒසව් වෙත තෑගිබෝග මහත් රාශියක් ඉදිරිපත් කිරීමෙන් ඔහුගේ සිත දිනාගැනීමට ද සමත් විය.

මේ සිදුවීමට පෙරාතුව ඇතිවූ තවත් සිද්ධියක් පිළිබඳව ඉතා සැකෙවින් යුතුව ඔබගේ අවධානය යොමු කිරීම උචිත යයි සිතේ. එනම් ජාකොබ්ගේ අද්භූත පොරබැදීම ය. බලාපොරොත්තු විරහිත තත්ත්වයක සිටිය දී ජාකොබ්ට දර්ශනය වී ඔහු දිරි ගැන් වූ දෙවියන් වහන්සේ මෙවර ඔහු වෙත එන්නේ, සම්පත්වලින් ආඪ්‍ය වූ අවස්ථාවක, රාත්‍රියක එන අමුත්තකුගේ ස්වරූපයෙනි. ජාකොබ් මේ දේව දූතයා සමඟ පහන් වනතුරු පොරබැදුවේ ය. පොරබැදූ ඔහුට යන්නට දුන්නේ ඔහුගේ ආශිර්වාදය ලබාගැනීමෙන් පසුව ය. මෙතෙක් ජාකොබ් නමින් පෙනී සිටි පුද්ගලයා එතැන් සිට "ඉශ්රායෙල්" නම් විය.

**ජාකොබ් මිසරයට යාම :**

ජෝශප් පිළිබඳව අතුරු කථා මාලාවකින් පසුබිම සකස් කර ජාකොබ් මිසරයට ගිය පුවත ලේඛකයා වාර්තා කර ඇත.

පාරාවෝගේ අනුග්‍රහයෙන් මිසරයේ දේශාධිපති වූ ජෝශප්ගේ සොහොයුරන් පිළිබඳ පුවත ඇසූ පාරාවෝ, ජෝශප්ගේ පියා ද, පවුල ද කැඳවාගෙන ඒමට නියම කරයි. ඔහුගේ දේපල ගැන කරදර නොවී පැමිණෙන ලෙසද දන්වන්නට කියයි. එසේ කීවේ මිසරයේ ඉස්තරම් ම සරු සාර ප්‍රදේශය ජෝශප්ගේ පවුලේ උදවියට පදිංචිය සඳහා ලබාදීමේ අරමුණ ඇතිව ය.

මේ රාජ අනුග්‍රහය අනුව ජාකොබ් තමන් සතු සියල්ල ම රැගෙන ගමනට පිටත්ව තම පියාගේ (ඊසාක්ගේ) සිද්ධස්ථානය වූ බෙයර්ෂෙබාවට පැමිණ දෙවියන් වහන්සේට යාග පූජාවක් ඔප්පු කළේ ය.
එයිනික්බිති දෙවියන් වහන්සේ ජාකොබ් අමතා මිසර ගමනට ඔහු දිරිමත් කළ සේක. ආබ්‍රහම්ට දුන් පොරොන්දුව නැවත අලුත් කළ සේක.

මේ සිද්ධීන් පෙළගස්වමින් "ඊ" සම්ප්‍රදායික ලේඛනය අවධාරණය කරන්නේ - මේ සැම සංසිද්ධියක් ම සිදු වන්නේ මනුෂ්‍යයන්ගේ උපායමාර්ගයන් අනුව හෝ ක්‍රියාකාරිත්වයන් අනුව හෝ ආර්ථික, දේශපාලනික බලපෑම් නිසා හෝ නොව, ඒ සියල්ලට ම ඉහළින්, සිට ඒවා පාලනය කරන දෙව් සමිඳාණන්ගේ සුබ සාධක සැලැස්ම අනුව ය යන සංකල්පය ය.

මෙසේ හෙබ්‍රෙව්වරුන් මිසරයේ (ඊජිප්තුවේ) ඉතා ම සරුසාර නයිල් ගංගා නිම්නය වූ ගොෂෙන් ඩෙල්ටා ප්‍රදේශයේ, ස්ථිරව පදිංචි වන නමුත්, දෙවියන් වහන්සේ දෙන්නට පොරොන්දු වූ දේශය මේ පළාත නොවේ. ඒ ආබ්‍රහම් සහ ජාකෝබ් තම බැටළු පට්ටි සමඟ සංචාරක එඬේරුන් වශයෙන් පැමිණි කානාන් දේශයයි. එහෙත් මිසරයට ආ ජාකොබ්ගේ සනුහරය මිසරයේ පදිංචිව ශත වර්ෂ හතරකටත් වැඩි කාලයක් එහි වැඩි වර්ධනය වන විට අපට පෙනෙන්නේ ඔවුන්ට "දේව

පොරොන්දු' සහමුලින් ම අමතක වූවා සේ ය. මෝසස් මේ සෙනඟ පොරොන්දු දේශයට ගෙනයන තුරු ගත වූ ශතවර්ෂ කිහිපය දේව සැලැස්ම ක්ෂණිකව ක්‍රියාත්මක නොවන්නක් බවට හොඳ ම සාක්ෂියකි.

## 2.2. නික්මයාම පොත

### 2.2.1. හැඳින්වීම

ශත වර්ෂ හතරක පමණ කාලයක් ඉශ්රායෙල්වරුන් මිසරයේ (ඊජිප්තුවේ) වාසය කළ හ. ජෝශප් මිසරයේ බලවත් තත්ත්වයකට පත්වීමත් ආහාර අහේනියේ දී ජාකොබ්ගේ පවුලේ උදවිය නයිල් ඩෙල්ටා ප්‍රදේශයේ පදිංචි වීමත් පිළිබඳව පුවත උත්පත්ති පොතේ අග කොටසේ දැක්වේ. මෙය ඓතිහාසික සිද්ධියකි.

ක්‍රිස්තු පූර්ව 20 වැනි සියවස පමණ කාලයේදී, සරු අඩසඳ ප්‍රදේශයට බලපෑ අමොරිය ආක්‍රමණය සහ හුරියානු සංක්‍රමණයට ඉක්බිති හික්සොස් ආක්‍රමණය ඇතිවිය. හික්සොස් යන මිසර යෙදුමේ අර්ථය විදේශීය පාලකයෝ යනුයි. මේ ආක්‍රමණය මිසරය දක්වා විහිදී ගියේ ය. මෙසේ ආක්‍රමණිකයන් වූ බහුතරය සෙමිතික් වාර්ගීය හෙබ්‍රෙව්වරු ය. ජෝශප් මිසරයට අධිපතියා වශයෙන් පත්කරනු ලැබුවේ හික්සොස් පාරාවෝ රජුන් ය. ජාකොබ්ගේ දරු පරපුරෙන් විකාශනය වූ සෙනඟ සෙමිතික් වාර්ගිකයෝ ය. ඉශ්රායෙල් නමින් හැඳින්වෙන්නේ ඔවුන් ය. ඔවුන් මිසරයට එන විට හික්සොස් නම් ආක්‍රමණික විදේශිකයන් වූ හෙබ්‍රෙව්වරු ද සිටියෝ ය.

ක්‍රි.පූ. 1600 සමයේදී එරට ඇතිවූ දේශපාලන කැරැල්ලකින් ස්වදේශීය පාලකයෝ බලය අල්ලා ගත් හ. එහි ප්‍රතිඵලය වූයේ ආක්‍රමණික හික්සොස්වරු පලස්තීනය දක්වා පළවා හැරීම ය. එහෙත් මිසරයේ ගොෂේන් ඩෙල්ටාවේ පදිංචිව සිටි ඉශ්රායෙල්වරු ද රටේ නොයෙක් තැන්වල සිටි හෙබ්‍රෙව්වරුන් ද නව පාලකයන්ට හිසරදයක් විය. ඔවුන් ශීඝ්‍රයෙන් වර්ධනය වීම ද රටේ සරුසාර ප්‍රදේශවල පදිංචිව සිටීම ද නිසා හෙබ්‍රෙව් උවදුර නැති කිරීමට නව පාලකයෝ දැඩි පියවර ගත් හ. එහි ප්‍රතිඵලය වූයේ හෙබ්‍රෙව්වන් රජයේ වහලුන්ගේ තත්ත්වයට පත්වීම ය.

ඩෙල්ටා ප්‍රදේශයේ පදිංචි වූ ජාකොබ්ගේ පරපුර දසදහස් ගණනින් වර්ධනය විය. සියවස් හතරකට ආසන්න කාලයක් ඔවුන් විදේශයක ජීවත්වුව ද ඔවුන්ට ම ආවේණික වූ අනන්‍යතාවයකට ඔවුහු ජීවත් වූහ. මිසරවාසීන්ට වඩා ඔවුන්ගේ පැවතුම් වෙනස් විය. ඔවුහු එක ම ගෝත්‍රික ජනතාවක් ලෙස ජීවත් වූහ.(සමූහයක් - පවුල් කණ්ඩායමක්) ඔවුන්ගේ ඇඳහිල්ල මිසරයන්ට වඩා වෙනස් විය. ඔවුන්ගේ භාෂාව වෙනස් විය. එහෙත් ඔවුන් මිසරයේ ගත කළ කාලයේ දී ජනතාවක් වශයෙන් ලැබූ ප්‍රතිලාභ රැසක් විය. පසුකලෙක මහත් ජාතියක් බවට පත් වන්නට සිටි මේ සෙනඟ අනාගතය සඳහා සූදානම් කිරීම දේව සැලැස්මේ අංගයක් ලෙස ද මෙය සැලකිය හැකි ය.

ලෝකයේ ඓතිහාසික වාර්තා අනුව මිසරයේ අභිමානවත් යුගය වුනේ මේ කාල පරිච්ඡේදයයි. වාස්තු විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය, කලාව, සාහිත්‍යය, වානිජ්‍යය සහ රණකාමිත්වය අතින් මිසරය අග්‍ර ස්ථානයක වැජඹුණේය. හෙබ්‍රෙව්වරු මිසරයන්ගේ යථෝක්ත දේවල් පිළිබඳ ප්‍රබල අත්දැකීම් ලබා ගත් හ. එහෙත් ඔවුන් වහලුන් බවට පත්කිරීමෙන් පසු මිසරය ඔවුන්ට තවදුරටත් ජීවත්වීමට සුදුසු තත්ත්වයක නොවී ය. දැන් එය හැඳින්වෙන්නේ වහල්කමේ දේශය වශයෙනි.

නික්මයාම යනු වහල්කමේ දේශයෙන් විමුක්තිය වෙත යාම ය. ඉශ්රායෙල් ඉතිහාසයේ අසමසම සිද්ධිය නික්මයාම ය. දෙවියන් වහන්සේ මහත් බලපරාක්‍රමයෙන් මුහුද දෙබෑ කර තම ජනතාව පොරොන්දු දේශය වෙත ගෙනයාම ය. පුරාණ ගිවිසුමේ කේන්ද්‍රීය සිද්ධිය නික්මයාම ය. මේ සිද්ධීන් තුළින් දේව ගරුබිය දැක්වීම ලේඛකයාගේ අරමුණ ය. ජීවිතයේ කටුක අත්දැකීම් මගින් දෙවියන් වහන්සේගේ අති මහත් ප්‍රේමය අත්දැකීමට සැලැස්වීම ය. මේ නික්මයාම අද ඇතැම් සමාජවාදීන් කියන ලෙස මෙලොව දුක්වේදනා උපේක්ෂාවෙන් විඳ දරාගෙන මරණින් පසු ස්වර්ගීය සම්පත ලැබෙන බව උගන්වමින් ජනතාව මෝහනයට පත් කරන නිදි පෙත්තක් නොවන බව පසක් කරගත හැකි උදාර ඓතිහාසික සිද්ධියක් ය. සැබෑ මානව විමුක්තිය යනු දේශපාලන, ආර්ථික වහල්කම්වලින් නිදහස් වීම පමණක් නොවන බව පෙන්වා දෙන අසිරිමත් සිද්ධියක් ය.

නික්මයාම සිදුවන කාලය වන විට ආබ්‍රහම් ජීවත් වූ කාල සීමාවේ සිට වසර පන්සියයක් පමණ ගෙවී ගොස් ය. ආබ්‍රහම්ගේ පරපුර වසර හාරසීයයක් පමණ මිසරයේ ම සිටිද්දී ඔවුන්ට නියමිත දේශය මිසරය නොවන බව අමතක වන තත්ත්වයකට පවා පත්ව සිටින්නට ඇත. එහෙත් දේව සැලැස්ම අතිශය පුදුමාකාර ය. යාවේ ස්වාමින් වහන්සේ තම ජනතාව පොරොන්දු දේශයට ගෙනයාමට ක්‍රියාකාරී වූ සේක.

### 2.2.2. නික්මයාම (1:2-22) වහල් මෙහෙවර :

ජෝශප් මිසරයේ (ඊජිප්තුවේ) සිටි කාලසීමාව තුළදී ජාකොබ් සමඟ තම තමන්ගේ පවුල් කැටුව ගොෂේන් ඩෙල්ටාවට පැමිණි අය මෙසේ ය. රූබන්, සිමියොන්, ලෙවී, ජූදා, ඉස්සාකර්, සාබුලොන්, බෙන්ජමින්, දාන් නප්තලී, ශාද් සහ අශේරිය. ජාකොබ් පෙලපතින් පැමිණි සියල්ලෝ ම ගණනින් 70 කි. එහෙත් පසුකලෙක මේ සෙනඟ සමෘද්ධිමත් වී, බොහෝ සේ වර්ධනය වී අතිශයින් ම

බලවත් වූයෙන් ඔවුන්ගෙන් රට පිරී ගියේ ය. මේ ජන කොටස එම දේශකයන්ට තර්ජනයක් වන තත්ත්වයට පැමිණියේ ය.

එකල ජෝශප් ගැන කිසිවක් නොදත්, අලුත් රජ (ස්වදේශීය පාලකයා) මේ විදේශිකයන් පිළිබඳ නිර්ධය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළේ ය. බලවත් ජාතිවාදියකු වූ 1 ආග්මොන් නමැති මිසර රජුගේ සිතේ විදේශීය පාලකයන් පිළිබඳව හිරවී තිබුණු වෛරය වෙනුවෙන් වන්දි ගෙවන්නට සිදුවූයේ ඉශ්රායෙල්වරුන්ට ය.

ඔවුන් රජයේ වහලුන් බවට පත්කර බලහත්කාරයෙන් වැඩ ගත් හ. ඉශරායෙල් ශ්‍රමය රාම්සෙස් වැනි මහා නගර ගොඩ නඟා ගැනීමට යොදා ගත් හ. ඒ සඳහා ඉශ්රායෙල්වරුන්ට කුඹල් කර්මාන්තය, ගඩොල් කර්මාන්තය, විවිධ කෘෂි කර්මාන්ත වල යෙදීම වැනි දරුණු වහල් මෙහෙවරින් වන්දි ගෙවීමට සිදුවිය. එපමණක් නොව ඔවුන්ට උපදින සියලුම කිරි දරුවන් මරා දමන්නට ද වින්නඹුවන්ට නියෝග කෙරිණි.

එහෙත් ෂිප්රා සහ පුවා නැමැති වින්නඹුවන් දෙදෙනා රාජ නියෝගයට පිටුපා ක්‍රියා කළ හ. මේ මිසර කාන්තාවන් දෙදෙනා ජාති විරෝධී රාජ නියෝගයට අවනත නොවූයේ ඔවුන් තුළ දේව භය ඇතිව සිටි නිසාත් තම හෘදය සාක්ෂිය අනුව ක්‍රියා කළ නිසාත් ය.

ඉතිහාසය විසින් ශ්‍රේෂ්ඨ පාලන යුග වශයෙන් හඳුන්වනු ලබන කාල සීමාවන් තුළ ජීවත් වූ පාලකයන් ගැන කථාකරනු මිස ඔවුන් විසින් නිර්දය ලෙස පීඩා කරන ලද පැගෙන ජනතාව ගැන සඳහන් කිරීම ඉතා අල්ප ය. එහෙත් බයිබල් ලේඛකයා, මේ පීඩිත ජනතාව ගැන වාර්තා කර ඇත. පීඩිත ජනතාවගේ පක්ෂය ගත් මිසර වින්නඹුවන්ට දෙවියන් වහන්සේගේ මහා කරුණාව හිමිවිය. ඔවුන්ට දරු සම්පත් ද ලැබිණි.

තම නියෝගය හරිහැටි ඉටු නොවන බව දුටු පාරාවෝ මුළු සෙනඟ අමතා හෙබ්‍රෙව්වරුන්ට උපදින සෑම පිරිමි දරුවකු ම නයිල් ගඟට විසි කළ යුතු ය. සෑම දුවකට ජීවත්වන්නට ඉඩ දිය යුතු යයි අණ කළේ ය.

වහල්කමේ දේශයේ වහලුන් වශයෙන් සියවසක් පමණ ඉශ්රායෙල්වරුන් ගත කළ ජීවිතය ද ගැලවීමේ දේව සැලැස්මෙහි අංගයකි. ඉශ්රායෙල්වරු වහල්වැඩ කිරීමෙන් පුරාණ මිසර සංස්කෘතියේ සම්මානය වූ කලා ශිල්ප ඉගෙන ගත්හ. මනා සේ සංවිධානය වූ ක්‍රමානුකූල රාජ්‍යයක ශක්තිය අත්දුටුවෝ ය. ගොවි කර්මාන්තය සහ ජල සම්පාදනය පිළිබඳ මිසර තාක්ෂණය ඉගෙන ගත්තෝ ය.

එසේ ම මිසරයේ පැවැති බහු දේව වාදයටත් මිත්‍යා ඇදහිලිවලටත් ඇතැම් ඉශ්රායෙල් ජන කොටස් නැඹුරු වන්නට ද ඇත. එමගින් ඔවුන්ගේ ඒකදේවවාදී ඇදහිල්ල ද දූෂිත වීමට අවස්ථා ඇතිවිය.

### 2.2.3. මෝසස්ගේ කැඳවීම (3:1-4:17)

පාරාවෝගේ මරණ වරෙන්තුවට අසු නොවී හෙබ්‍රෙව් දරුවෙක් දේව සැලැස්ම අනුව නායකත්වය සඳහා තෝරාගැනේ. ඒ මෝසෙස් ය. දේව නියෝජිතයා වන්නේ ඔහු ය. ගිවිසුමේ මධ්‍යස්ථකයා ඔහු ය. ඔහු ජාකොබ්ගේ ගෝත්‍ර දොළහෙන් ලෙවීගේ ගෝත්‍රයට අයිති ය.

එහෙත් ඔහු ළමා වියේ සිට තරුණ විය දක්වා වැඩුණේ පාරාවෝගේ මාළිගයේ ය. මිසර නායකත්වය මගින් ඔහුට රාජකීය මට්ටමේ අධ්‍යාපනයක් ලබා දෙන ලදී. ඒ අනුව මෝසස් රණශිල්පය උගත්තේ ය. පරිපාලන ශ්‍රෝත්‍රය පිළිබඳ අවබෝධයක් ලබා ගත්තේ ය. ගොඩනැගිලි තාක්ෂණයය උගත්තේ ය. නීතිය හැදෑරුවේ ය. අනාගත නායකත්වය සඳහා සෑම අංශයකින්ම ඔහු පරිණතභාවයට පත්වූයේ අනාගතයේ ජනතාවට ස්වාධීනත්වය ලබාගැනීමේ කාර්යභාරය ඉටුකිරීමට ය.

මෝසස් පාරාවෝගේ මාළිගයේ ඇතිදැඩි වුවත් තම හෙබ්‍රෙව් නෑදෑයන් පිළිබඳව නිරන්තරයෙන් ම අවදිව සිටියේ ය. තමා ද හෙබ්‍රෙව්වරයෙකු ලෙස අභිමානයෙන් සිටියේ ය. වහලුන් වැඩෙහි යෙදවූ මිසරයකු හෙබ්‍රෙව් වහලෙකුට පහර දෙනු දුටු විට මෝසස් ක්‍රියා කළ ආකාරයෙන් එය මනාවට පැහැදිලි වෙයි. රහසින් කරන ලද මේ මිනීමැරුම පිළිබඳ ආරංචිය රජුට සැලවෙතැයි බියට පත්වූ ඔහු මිදියන් දේශයට පලාගියේ ය. මිදියන් දේශය වනාහි සිනායි අර්ධද්වීපයේ ම කොටසකි. එය පාලනය කරන ලද්දේ මිදියන් ජාතික එඬේරුන් විසිනි. මෝසස් මිදියන් දේශයේ පූජකයා වූ ජෙත්‍රෝගේ දියණියක සරණ පාවා ගෙන එහි ජීවත් විය. එහෙත් මිසරයේ තම වාර්ගිකයන් විඳින දුක්වේදනා ගැන ඔහු නිරන්තරයෙන් ම කල්පනා කළේ ය.

ඔවුන්ට කෙසේ සහනයක් සැලසිය හැකිදැයි හුදකලාව සිත සිතා සිටියේ ය. මිදියන් දේශයේ එඬේරෙකු වශයෙන් සරුසාර තණබිම් සොයාගනිමින් ඔහු ලබාගත් අත්දැකීම අනාගතයේ දී ජනතාවට සුරක්ෂිත මඟ පෙන්වීමට ලැබුණු ප්‍රායෝගික පුහුණුවක් විය.

ඊජිප්තුවේ දුක්පීඩා මැද සිටි ඉශ්රායෙල් (හෙබ්‍රෙව්) ජනතාවගේ යාච්ඥාවට දෙවියන් වහන්සේ, සවන් දුන් මොහොත පැමිණියේය. හොරෙබ් නම් කන්දේදී පඳුරක් මැදින් නැගුණු ගිනි ජාලාවක

ආකාරයෙන් මෝසස්ට දෘශ්‍යමාන විය. මේ අපූර්ව සිද්ධිය නැරඹීමට ගිය මෝසස්ට නියෝගය ලැබෙයි.
*"මෙතැනට ලං නොවන්න. නුඹේ පාදවලින් වහන් ගලවා දමන්න. මෙතැන ශුද්ධ භූමියකි"*

දෙවිඳුන් වැඩවසන තැනට මෝසස් යා යුත්තේ ලෞකිකත්වයේ දූලි ඉවත්කරගෙන පවිත්‍රව ය. ලෞකිකත්වයට බැඳී සිටිමින් ස්වාමින් වහන්සේ වෙතට යා ගත නොහැකි ය. පියවරුන්ගේ දෙවියන් වහන්සේ තමන් අමතන බව අවබෝධ කරගත් මෝසස් තම මුහුණ වසා ගත්තේ ය.

**මොසස්ට ලැබුණු දේව ප්‍රකාශනය අනුව ......**

- මනුෂ්‍යයන් දුකට හා පීඩාවට පත්ව සිටින විට දෙවියන් වහන්සේ දුරස්ථව නොසිටින සේක.
- දෙවියන් වහන්සේ තමන්වහන්සේ එළිදරව් කරන්නේ තම ක්‍රියාවන් මගිනි.
- ඒ ක්‍රියා වනාහි ඓතිහාසික සිද්ධීන් ය.
  නික්මයාම ලේඛකයා මේ දේව ක්‍රියාකාරීත්වය අනාවරණය කරන්නේ විශේෂ භාෂා ශෛලියකිනි.
- මාගේ සෙනඟගේ දුඃඛිත තත්ත්වය මම දිටිමි.
- ඔවුන්ගේ විධායකයන්ට විරුද්ධව නැගෙන මොර ගැසීමට මම සවන් දුනිමි.
- ඔවුන්ගේ දුක්වේදනා මම හොඳින් දනිමි.
- ඔවුන් කිරියෙන් පැණියෙන් උතුරන දේශයකට පමුණුවාලීම සඳහා මම බැස ආවෙමි.

**යනු ඊට නිදසුන් ය.**

**දේව නාමය අනාවරණය කිරීම :**

ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද, ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ද මම ය" යි වදාරණ දෙවියන් වහන්සේ ආදි පියවරුන් කුමන නමකින් ආමන්ත්‍රණය කළත්, ඒ සැම දෙනාම වන්දනා නමස්කාර කළේ මට ය. මම වනාහි ස්වයංභූ තැනැත්වහන්සේ වෙමි" යි (ජෙහොවා : ප්‍රකාශ කළ ස්වාමින් වහන්සේ මෝසස්ට ඔහුගේ දූත කාර්යය කුමක්දැයි පෙන්වා දී "මම ඔබ සමඟ සිටිමි" යි අවධාරණය කළ සේක.

"මම ඔබ සමඟ සිටිමි" යි යන දේව ප්‍රකාශනය සුවිශේෂ සේවාවන් සඳහා කැඳවූ අය වෙත ලැබුණු බවට සාක්ෂි ශුද්ධ ලියවිල්ලේ ස්ථාන ගණනාවක ඇත.

"මම කල්පාන්තය දක්වා සදහටම ඔබ සමඟ සිටිමි" (මතෙව් 28:20).
"ස්වාමින් වහන්සේ ඔබ සමඟ ය" (ලූක් 1:28).

තමාගේ දුර්වලකම් දන්නා මෝසස් ඉශ්රායෙල් පුත්‍රයන් මිසරයෙන් පිටතට ගෙනයාමේ කාර්යයට ඉදිරිපත් නොවීමට විවිධ හේතු ඉදිරිපත් කළත් අවසානයේ දී දේව නියමයට අවනත වූයේ ය. පාරාවෝගේ සිත මෝසස් කෙරෙහි යොමුවන පිණිස දෙවියන් හාස්කම් කිරීමේ බලය ද ඔහුට දානය කළ සේක.

### 2.2.4. විමුක්තිය

#### (අ) විමුක්තිය සඳහා මැදිහත්වීම

මෝසස් දේව අනුමැතිය ඇතිව තම සොහොයුරා වූ ආරොන් ද කැඳවා ගෙන මිසරයේ සිටි ඉශ්රායෙල් ජනතාව වෙතට ගියේ ය. ඔවුහු ඉතා සුහදව ඔවුන් පිළිගත්තෝ ය. මේ දෙදෙනා දේව නියමය අනුව පාරාවෝ වෙතට ගොස් මූලික ඉල්ලීමක් කළෝ ය. එනම් ඉශ්රායෙල් ජනතාවට ඔහුගේ රටින් පිටවී යාමට අවසර දෙන ලෙස ය.

එහෙත් පාරාවෝ දුරදිග නොබලා මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. වසංගත වලින් (7:1-11,11:10) රටේ වෘත්තිය විජ්ජාකාරයන්ගේ බලය නිස්ප්‍රභා වී දේව හස්තයේ බලය අත්දුටුවෝ ය. පාරාවෝ දෙගිඩියාවෙන් සිට අන්තිමේ දී ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. ඊට හේතුව තමා ආරම්භ කර තිබුණු කර්මාන්ත ව්‍යාපාරවලට ඉශ්රායෙල් ජනයාගේ ශ්‍රමය අවශ්‍ය වීම ය. එහෙත් දසවන වසංගතය තීරණාත්මය සිද්ධියක් විය.

විනාශයේ දූතයා මිසරයේ සැම පවුලක ම කුළුඳුලා මරාදැම්මේ ය. පාරාවෝගේ පවුලේ කුළුඳුලා ද ඔවුන් අතර විය. ඉශ්රායෙල් ජනයාගේ ගෙවල උළුවහුවල බැටළු ලේ ආලේප කර තිබුණු නිසා මරණයේ දූතයා එම ගෙවල් පසුකර ගියේ ය. (පාස්කුව) ජාතික විපතක් වූ මේ සිද්ධිය නිසා පරාවෝගේ සිත වෙනස් වී මෝසස්ගේ ඉල්ලීමට ඉඩ දුන්නේ ය.

මිසර දේශයට පැමිණි වසංගත පිළිබඳව අපගේ අවධානය යොමුවිය යුතු කරුණු කිපයක් වෙයි.

1. මේ වසංගත ඇත්ත වශයෙන් ම මිසර වාසීන්ට හානිදායක ලෙස සිදුවූ ඒවාද ?
2. මේ වසංගත ස්වාභාවික සිද්ධීන් ද ? එසේ නම් ඒ ආපදාවන් දේව දඬුවමක් සේ ගත හැකිද ?

3. පාරාවෝ ගත් හිතුවක්කාර තීරණය නිසා මුළු මිසරවාසීන්ට දඬුවම් දීම සාධාරණ ද ?

පළමුවැනි කරුණ ගැන කිව යුත්තේ ඇතැම් විට මිසරයේ ඇතිවූ ස්වාභාවික ආපදා විය හැකි ය. එහෙත් මෙහි ඇති විශේෂත්වය වන්නේ මේවා කල්වේලා ඇතිව මෝසස් විසින් ප්‍රකාශ කරන ලදුව විශේෂ අවස්ථාවක දී සිදුවීම ය.

දෙවැන්න ගැන කිව යුත්තේ මේවා ස්වාභාවික සිද්ධීන් වුව ද ඒවා එක්තරා ආකාරයකින් කාලයේ සළකුණු විය හැකි බව ය. පාලකයන් මේ සළකුණු තේරුම්ගෙන ඊට උචිත ප්‍රතිචාර දැක්විය යුතු ය.

තුන්වන අදහස ගැන සැළකීමේ දී ශුද්ධ ලියවිලි ලේඛකයන් මේවා වාර්තාගත කරන කාලයේ දී පැවති සමකාලීන සංස්කෘතික පසුබිම අමතක නොකළ යුතු ය. ලේඛකයාගේ සංකල්පය අනුව මිසරය දේව විරෝධී රටකි. එසේ ම පාරාවෝ දෙවියන් වහන්සේගේ සතුරා ය. ඒ නිසා මුළු මිසරයටම දඬුවම් දීම සාධාරණ ය. ගොවි කම්කරු රටවැසි පුද්ගලයන් පිළිබඳ සැලකිල්ලක් නොවී ය.

**(ආ) පාස්කු මංගල්‍යය හා නික්මයාම (12:1-28-12:37-42) :**

ලේඛකයා නික්මයාම ඉදිරිපත් කරන්නේ ඉශ්රායෙල් මහා වීර කාව්‍යයක් වශයෙනි. නික්මයාම පොතේ දැක්වෙන පාස්කු චාරිත්‍ර හා සමාන සම්ප්‍රදායික චාරිත්‍ර, හෙබ්‍රෙව්වරුන් මිසරයට පැමිණීමටත් පෙර සංචාරක එඬේරුන් වශයෙන් තැනින් තැන යන වකවානුවල දී පවත්වා ඇත. ඔවුන් එම චාරිත්‍ර පැවැත්වූයේ වසන්ත සමයේ මුල් ම වරට අලුත් හඳ දැකීමත් සමඟ ය. ඉශ්රායෙල් වරුන් මිසරයේ වහල්කමින් මිදී නික්ම යන ගමනට පෙර ඉටු කලේ ද ඒ හා සමාන චාරිත්‍රයන් ය.

- එළුවන් හා බැටළුවන් අතරෙන් දැවුරුදු නිකැළල් පිරිමි සතෙකු තෝරා ගැනීම.
- එම මාසයේ 14 වැනි දින දක්වා ඌ තබා ගෙන එදින හවස එම පැටවා මැරීම.
- උගේ ලේ ගෙදර උළුවස්සේ උඩ ලීයේ තැවරීම.
- උගේ මාංශය මදගින්නේ පුළුස්සා තිත්ත පළා සහ නුමුහුන් රොටි සමඟ අනුභව කිරීම.
- ඉතිරිවන යමක් ඇත්නම් පුළුස්සා දැමීම.
- ජනතාව මිසරයෙන් පිටවී යන දිනය ස්වාමීන් වහන්සේට මංගලෝත්සව දිනයක් ලෙස පැවැත්විය යුතු වීම.
- මතු සියලු පරම්පරාවන් විසින් ම මේ මංගල උත්සව පැවැත්වීම නිල නියමය ය.

**මේ කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු විය යුතු ය.**
මිසර වැසියන්ගෙන් ඉල්ලා ලබාගත් සියලු වස්තු සම්පත් ද පොදි බැඳගෙන ඉශ්රායෙල්වරු ඒ අනුස්මරණීය රාත්‍රියේ පිටත්ව රාමසෙස් නුවර සිට සුක්කොත් නුවර දක්වා ගමන් කළහ. ලේඛකයා සඳහන් කර ඇති අන්දමට දරුවන් හා කාන්තාවන් හැර පයින් ගිය පුරුෂයන් ම හය ලකෂයක් වූහ. මේ මහා ජන සන්නිපාතය ඉශ්රායෙල්වරුන් මිසරයේ පදිංචිව ගෙවූ වසර 430 තුළ දී ඇති වූ ජනගහන වර්ධනයකි.

කවියා තම නිර්මාණ ඉදිරිපත් කරන්නේ අතිශෝක්තියෙන් ය. ඔහුගේ අරමුණ පාඨකයාට වින්දනයක් ලබාදීම ය. එවන් අතිශයෝක්තියක් යෙදීමට ඔහුට නිදහස ඇත (අපේ සම්භාව්‍ය කාව්‍යයක් වන "ගුත්තිලයේ සුරපුර වර්ණනාවේ කොතරම් අතිශයෝක්තියන් ඇත්දැයි සිතා බලන්න). ඒ අනුව නික්මයාම ඇති විවිධ සංඛ්‍යා සහ ඇතැම් සිද්ධීන් කාව්‍ය සම්ප්‍රදානුකූලව ඉදිරිපත් කර ඇති බව සාමාන්‍ය පිළිගැනීම ය. මේ කරුණු ගැන විමසිලිමත් වන්න.
- ගොෂේන් ඩෙල්ටා ප්‍රදේශයේ ලක්‍ෂ සංඛ්‍යාත ජනතාවකට ජීවත් වීමට ඉඩ තිබේ ද?
- මේ සා මහත් ජනතාවකට සේවය කිරීමට සිටියේ වින්නඹු මාතාවන් දෙදෙනෙකි.

**රතු මුහුද තරණය කිරීම :**

දෙවියන් වහන්සේ විසින් ඉශ්රායෙල් ජනතාව පාලූකරය ඔස්සේ වටවංගු මාර්ගයකින් ගෙන ගිය සේකැයි සඳහන් වේ. (13 : 18). වෙනත් වචනවලින් කියතොත් ඔවුන් රැම්සෙස් නුවරින් පිටත්ව, නූතන සූවස් ඇල ඉවුරේ තිබෙන වන කතරට පැමිණියේ ය.

මෙහි රතු මුහුද පිළිබඳ විවිධ මත ඇත්තේ ය. ලේඛකයා ඉදිරිපත් කරන විස්තරය අනුව ඉශ්රායෙල්වරුන්ට රතු මුහුද දෙසට යා නොහැකිය. රතු මුහුද පිහිටා ඇත්තේ ඔවුන් ගමන් කරන මාර්ගයට බොහෝ ඈතිනි.

- මධ්‍යධරණී මුහුදට කිට්ටුව ඇති කළ පුවක් වූ සිර්බෝනිස් විල දෙසට ඔවුන් ගමන් කරන්නට ඇතැයි සමහරු කියති.
- ටිම්ෂා විල් ප්‍රදේශයේ වගුරු බිම් කඩකට එන්නට ඇතැයි තවත් මතයකි.

- රතු මුහුද වශයෙන් පරිවර්තනය කර ඇත්තේ යන හෙබ්‍රෙව් වචනයකි. එහි නියම අදහස බටහිර-පැපිරස් මුහුද යන්නයි.

කෙසේ වෙතත් මිසරයෙන් පිටවූ සෙනඟ රතු මුහුද වැනි මහා ජලස්කන්ධයක් තරණය කළාදැයි සිතීම දුෂ්කර ය. ඒ නිසා ඇතැම් අය නිගමනය කරන්නේ විල් ප්‍රදේශයේ දී ඇතිවූ වඩදිය හා බාදිය පිළිබඳ සිද්ධියක් විය හැකි බව ය.

රටින් පිටවී යන සෙනඟ දේශ සීමාව ද පසුකර බේරී ගොස් සිටින බවත්, ඔවුන් මංමුලා වී කාන්තාරයේ සැරිසරන බවත්. දැනගත් පාරාවෝගේ යුද්ධ රථ හමුදාව තමන්ට ඉතා පහසුවෙන් ඉශ්‍රායෙල් සෙනඟ අසුකර ගත හැකියැයි කල්පනා කර, ඔවුන් අල්ලා ගැනීමට වේගයෙන් ඉදිරියට ආවෝ ය. එහෙත් රතු මුහුදේ දී සිදුවූයේ මහා නැස්පැත්තියකි.

ඉශ්‍රායෙල්වරු දේවාධාරයෙන් ජලය තරණය කර වහල්කමේ දේශයෙන් සම්පූර්ණයෙන් ම නිදහස් වෙති. ඔවුන්ගේ සතුරෝ එම ජලයෙන් ම විනාශයට පත්වෙති. එකම ජලකඳක් මගින් වහල්කමේ බලවේග විනාශ වී යන සැටිත් විමුක්තියේ බලවේග ඉදිරියට යන සැටිත් ජනතාව අත්දුටුවෝ ය. මෙය එක්තරා ආකාරයකින් අප ලබන ප්‍රසාද ස්නාපනය නමැති දේව ප්‍රසාද නිධානයේ පූර්ව සළකුණක් ලෙසින් ද පෙන්වා දිය හැකි ය. අප ලබන ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා වන ජලය පාපයේ විනාශයත් දේව ජීවිතයත් සංකේතවත් කරයි. මේ පිළිබඳව පාවුළු තුමා ඉදිරිපත් කරන අදහස් ද ඔබ දැන සිටීම ප්‍රයෝජනවත් ය.

"අපේ පියවරුන්ට කුමක් වීදැයි ඔබට මතක් කර දීමට මම කැමැත්තෙමි. ඔවුහු සියල්ලෝ ම වළාකුළක ද රතු මුහුදෙහි ද මෝසස් සමඟ සහභාගිකමට බව්තිස්ම-ස්නාපනය ලැබූහ. සියල්ලෝ ම දිව බොදුන් වැළඳූ හ. සියල්ලෝම අමා පැන් පානය කළහ. ඔවුන් පානය කලේ ඔවුන් කැටුව ගිය දිව්‍ය පර්වතයකින් ය. ඒ පර්වතය නම් ක්‍රිස්තුන් වහන්සේ ය. එහෙත් දෙවියන් වහන්සේ ඔවුන්ගෙන් වැඩිදෙනෙකු ප්‍රිය නොකළ සේක. එබැවින් ඔවුහු කාන්තාරයේ දී විනාශ වූහ (කොරින්ති 10:1-5).

**(ඇ) පාලුකරයේ දී දිව්‍ය සංරක්ෂණය (16:1-17:7):**

වහල්කමේ දේශයෙන් නිදහස ලබා පොරොන්දු දේශය කරා යන ඉශ්‍රායෙල් ජනතාව අතරමගදී, වනකතරේ දී දිව්‍ය සංරක්ෂණය අත්දුටු ආකාරය ලේඛකයා පෙන්වා දී ඇත.

කාන්තාරයේ දී ආහාර පාන ලබාගැනීම අතිශයින් ම දුෂ්කරය. මිසරයේ දී වහලුන් ලෙස වැඩ කළ නමුත් මෙම ජනතාවට එහිදී බඩ පුරා කෑම සහ බීම ලැබුණේ ය. ඇතැම් අය තම උත්තරීතර නිදහසට වඩා කෑම බීම ප්‍රධාන ලෙස සැළකූ නිසා ඒ පිළිබඳව මැසිවිලි නැගූහ. දෙවියන් වහන්සේ මේ ජනතාවට අනුකම්පා කළ සේක. ඔවුන්ට කෑම බීම ලැබෙන්නට සැලසූ සේක.

මන්නා සහ වටුවන් පිළිබඳ සිද්ධිය මගින් ද ගල්කුළු අතරින් ජලය ලබා දීමේ සිද්ධිය මගින් ද ජනතාව දේව ආදරය අත්දුටුවෝ ය. ජීවිතයේ ආලෝකමත් අවස්ථාවේ දී පමණක් නොව අන්ධකාර අවස්ථාවලදීත් දෙවියන් වහන්සේ ඔවුන් සමඟ සිටින බව තේරුම් ගන්න.

ඇතැම් විචාරකයන්ගේ අදහස් අනුව කාන්තාරයේ මෙවැනි සිද්ධීන් ස්වාභාවික දේවල් ය. (මෙහිදී අපට තේරුම ගත යුත්තේ මැවිල්ල තුළින් මැවුම්කරුවාණන්ගේ අනුහස පෙන්වා දෙන බව ය).

මන්නා යනුවෙන් අදහස් කර ඇත්තේ සීනායි පාලුකරයේ එෂේල් පඳුරුවල ලපටි කිනිතිවල සාරය උරා බොන කුඩා සතුන් විසින් නිපදවනු ලබන, මිහිරි රසැති ඇලෙනසුලු ද්‍රව්‍යයක් ගැන විය හැකි ය. මෙම මධු තුපර ශ්‍රාවය උණුසුම් වායුව සහිත භූමියට වැටුණු විට ඒ බින්දු වියළි ගොස් කබොල්ලක් පමණක් ඉතිරි වේ. මේ රස කැටි කුහුඹුවෝ රැගෙන යති. රාත්‍රී කාලයේ දී ඒවා එකතුවන බැවින් අලුයම වේලාසනින් අවදිවන අයට එම ද්‍රව්‍ය ආහාර පිණිස එකතු කර ගත හැකි ය. පැළැටි සාරය උරා බොන මේ කුඩා ජීවීන් අරාබි ජනතාව විසින් හඳුන්වා දී ඇත්තේ "මස්" යනුවෙනි. මන්නා නම් වූ මේ මධු තුපාර ප්‍රණීත ආහාරයකි.

මිසර දේශයේ දී අපි සමිඳාණන් වහන්සේගේ අතින් මැරුණෙමු නම් කොතරම් යහපත් ද? එහි දී අපට මස් පිරුණු බඳුන් ළඟ වාඩි වී ඇති තරම් කෑම කන්නට පුළුවන්කම තිබුණි. එහෙත් ඔබේ මේ මුළු ජනතාව සාගින්නෙන් මරා දැමීමට මේ පාලුකරයට ගෙනවාහුදැයි මෝසස්ට සහ ආරොන්ට විරුද්ධව මැසිවිලි කී අයට හිතේ හැටියට වටු මස් ලැබුණු බව ද ලේඛකයා පෙන්වා දෙයි.

වසන්ත සමයේ දී වටුවන් දහස් ගණන් රංචු වශයෙන් මේ ප්‍රදේශයට සංක්‍රමණය වීම සාමාන්‍ය සිද්ධියකි. උන් දැඩි වෙහෙසට පත්ව සිටින නිසාත්, ඇතැම්විට වැලි කුණාටුවලට අසුවීම නිසාත් පහසුවෙන් අල්ලා ගත හැකි ය.

මේ සිද්ධීන් අනුව ඉශ්රායෙල්වරුන්ගේ විශ්වාසය වූයේ දෙවි ස්වාමීන් වහන්සේ ඔවුන්ට දිනපතාම අවශ්‍ය දේ සපයන බවත් ආරක්ෂා කරන බවත් ය. එහෙත් මේවා ඔවුන්ගේ මැසිවිලි නැගීමත් කෙඳිරීමත් සහමුලින්ම නැති කිරීමට හේතු නොවී ය.

මෙවන් සිද්ධීන් තුළින් අද අපට ලැබෙන පණිවිඩය කුමක් ද? අපේ දින නිරන්තර භෝජනය දෙවියන්ගෙන් අපට ලබාදෙන බව ය. දුෂ්කර මාර්ගයක යාමට අප කැඳවා ඇති සෑම අවස්ථාවක ම අපට සහාය වෙමින් මග පෙන්වමින් අපගේ දෛනික අවශ්‍යතා සපුරාලන බව ය. මෙය වඩා හොඳින් තේරුම් ගැනීමට ද්විතීය නීති සංග්‍රහයේ මේ උපුටනය කියවා බලන්න. (**8:3**).

උන්වහන්සේ ඔබ යටහත් බවට පමුණුවා සාගින්නෙන් යන්නට හැරිය සේක. ඉන්පසු ඔබේ පියවරුන්වත් නොදන්නා මන්නා නැමැති කෑමෙන් ඔබ පෝෂණය කළ සේක. උන්වහන්සේ මෙසේ කළේ මිනිසා ජීවත්වන්නේ කෑමෙන් පමණක් නොව, සමිඳාණන්ගේ මුවින් නික්මෙන සියලු වචනවලින් බව ඔබට උගන්වනු පිණිස ය¨. මේ සංකල්පය වඩාත් හොඳින් තේරුම් ගැනීමට මාක් **6:35** සිට විස්තර වන පුප ප්‍රාතිහාර්ය ගැන වාර්තාව කියවන්න.

මානව පැවැත්මට අවශ්‍ය පෝෂණය දේව වචනයෙන් ලැබෙන බව එයින් ද මනා සේ අවධාරණය කෙරේ. උන්වහන්සේ ඔවුන් සියල්ලන් කාණ්ඩ වශයෙන් නිල් තණ බිම මත හිඳුවන්නට ශ්‍රාවකයන්ට අණ කළ සේක. ඔවුහු සියය බැගින් සහ පනහ බැගින් පේළි වශයෙන් හිඳගත්හ. උන්වහන්සේ රොටි පහත්, මසුන් දෙදෙනාත් ගෙන ස්වර්ගය දෙස බලා ආශිර්වාදය පවසා රොටි කඩා ඔවුන් ඉදිරියෙහි තබන්නට ශ්‍රාවකයන්ට දී මසුන් දෙදෙනාත් ඒ සැමට බාරදුන් සේක. සැම දෙනා ම කා තෘප්තියට පැමිණිය හ.

මේ අනුව බලන විට, තම බැටළුවන් හාමතේ නොතබා සරුසාර තණබිම් වෙතට ගෙනයන පරහිතකාමී එඬේරෙකු මෙන් ස්වාමීන් වහන්සේ ක්‍රියා කරන බව මෙසේ තේරුම්ගත හැකි ය.

*"ජීවනදායක භෝජනය මම ය. මා වෙත පැමිණෙන යමෙක් වේ ද ඔහුට සාගිනි නොවන්නේ ය. මා අදහන යමෙක් වේ ද ඔහුට කිසි කලෙක පිපාසය නොවන්නේ ය."* (**ජොහන් 6:35**)

කාන්තාරය නිරුදක ය (ජලය නැත). නික්මයාමේ දී සෙනඟ දේව නියමය අනුව රෙපිඩිම් නම් ස්ථානයේ කඳවුරු බැඳ ගත්හ. එහෙත් ඔවුන්ට බීමට ජලය තිබුණේ නැත. අපට බොන්නට වතුර දෙන්නැයි ජනතාව උද්ඝෝෂණය කළ හ. ඒ ඇසූ මෝසස් ඔවුන්ට දොස් පැවරුවේ ඔවුන්ගේ අවිශ්වාසවන්තකම නිසා ය. සෙනග මෝසස්ට විරුද්ධව වැඩි වැඩියෙන් කොඳුරන්නට පටන් ගත්හ. "මෝසස් ඔබ අප මිසරයෙන් පිටතට ගෙනාවේ අප ද, අපේ දරුවන් ද, අපේ ගව මහීෂයන් ද පිපාසයෙන් මරා දමන්නට ද ?"

මේ අර්බුදකාරී අවස්ථාවේ මෝසස් ස්වාමීන් වහන්සේ දෙසට හැරෙයි. කවර තරාතිරමක බලවත් පාලකයෙකු වුව ද ඔහුගේ බල පුළුවන්කාරකමට සීමාවක් ඇත්තේ ය. යහපත් දැහැමි පාලකයන් මේ සීමාව දැනගෙන ඉන් ඔබ්බෙහි වෙන දේවල් පිළිබඳව දේව උදව්ව අයදිති. මෝසස් ද එසේ කළේ ය. "මේ සෙනගට මා කුමක් කරන්න ද ? ඔවුහු මට ගල් ගසන්නට සැරසෙති" යි මෝසස් සමිඳාණන් වහන්සේට මොර ගැසුවේ ය. ඔහුට පිළිතුරු ලැබුණේ ය.

"මෝසස් ඔබ මූලිකයෝ කීපදෙනෙකු කැටුව ඉදිරියෙන් යන්න. ගංගාවේ දියට පහරදුන් සැරයටිය ද ගෙන යන්න. මම හොරෙබ් හි පර්වතය මත ඔබ ඉදිරියෙහි සිටිමි. ඔබ පර්වතයට ගැසිය යුතු ය. එවිට සෙනගට බීමට ජලය ගලා එනු ඇත."

හිතේ හැටියට පිපාසය නිවා ගැනීමට මහා ජලකඳක් පර්වතයෙන් නික්මුණේ ය. දෙවියන් වහන්සේට එරෙහි ව ජනතාව අවලා ද කී නිසාත්, ඔවුන් උන්වහන්සේ ගැන සැක කළ නිසාත් ඒ ස්ථානය මස්සා සහ මෙරිබා නමින් හැඳින්විණි.

මේ පර්වතය වනාහි මනුෂ්‍යයන් අතර වැඩ සිටින දෙවියන් වහන්සේ පිළිබඳ සංකේතයකි. ජීවනදායක උල්පත එයයි. නව ගිවිසුමේ ජොහන්තුමා පෙන්වා දෙන පරිදි ¨යමෙක් පිපාසයෙන් සිටිත් නම් ඔහු මා වෙතට පැමිණ පානය කෙරේවා" ශුද්ධ ලියවිලිවලින් කියා තිබෙන පරිදි මා කෙරේ අදහා ගන්නා තුළ ජීවන දායක ජලධාරා ගලන්නේ යැයි ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක. කුරුසගත වී සිටි ජේසුස් වහන්සේගේ හදවත හෙල්ලයකින් පහර දී සිදුරු කළ විට රුධිරයත්, ජලයත් ගලා ආවේ ය. මෙය ක්‍රිස්තුන් වහන්සේ තුළින් මතු පැමිණෙන ජීවනදායක ජලධාරාව වූ ශුද්ධාත්මයාණන් පිළිබඳ පූර්ව සලකුණ ය. (**19:34**).

### 2.2.5. සීනායි ගිවිසුම

#### (අ) සීනායි ගිවිසුමට සූදානම (19:1-25) :

රෙපිඩීම් නමැති ස්ථානයෙන් පිටත්වූ ඉශ්රායෙල්වරු සීනායි නැමැති පාලුකරයට පැමිණෙති. මේ ප්‍රදේශ ඔවුන්ගේ ජීවිත කෙරේ බලවත් ලෙස බලපෑ සංසිද්ධීන් රැසකට පසුබිම් වන්නේ ය. නික්මයාමේ 19:1 සිට ගණන් කථාවේ 10:11 දක්වා විස්තර වෙන දේවල් සිනායි ප්‍රදේශය ආශ්‍රිත ය. සාමාන්‍ය එඬේර ජනතාව වූ මේ සෙනඟ සුවිශේෂ දේව ජනතාවක් ලෙස හැඩගැසීම ආරම්භ වන්නේ මෙතැන් සිට ය. ඒ සඳහා අවශ්‍ය ගිවිසුම සඳහා සූදානම් වීමත්, ගිවිසුම ස්ථිර කිරීමත් පිළිබඳ ගාම්භීර සිද්ධීන් ගැන සඳහන් ය."මා මිසර වැසියන්ට කළ දේ ද, මා නුඹලා රාජාලියෙකුගේ පියාපත් මත ගෙන එන මෙන් මා වෙත නුඹලා උසුලාගෙන පැමිණි අයුරු ද නුඹලා දුටුවහු ය. එබැවින් දැන් ඉතින් නුඹලා සැබවින් ම මාගේ හඬට කීකරුවන්නහු නම්, මාගේ ගිවිසුම පිළිපදින්නහු නම්, සියලූ සෙනඟ අතරින් නුඹලා මට ම අයිති සම්පත වන්නාහු ය. මන්ද මුළු මහ පොළොව මා සතු ය. නුඹලා මට පූජක රාජ්‍යයක් ද, කැපවූ ජාතියක් ද වන්නාහු ය."

මේ පණිවිඩය මෝසස් ප්‍රජා මූලිකයන්ටත්, ඔවුන් සෙනඟටත් දැන්වූ විට, මුළු මහත් සෙනඟ ම එක හඬින් "සමිඳාණන් වහන්සේ වදාළ සියල්ල අපි ඉටුකරන්නෙමු" යි කිවෝ ය. යථෝක්ත උපුටනය පිළිබඳව අර්ථ කථනයක් කිරීමට ඔබට හැකිවිය යුතු ය.

සමිඳාණන් වහන්සේ කිතුනුවන් පමණක් නොව සමස්ත ලෝක වාසීන්ගේ ම දෙවියන් වහන්සේ ය. සකල මනුෂ්‍ය සංහතියේ ම ගැළවුම්කාරයාණෝ ය. මේ මානව සංහතිය තුළින් සුවිශේෂ කණ්ඩායමක් තෝරා ගැනීම දේව අභිමතයයි.

ඒ තෝරා ගන්නාවූ සෙනග ශුද්ධවූ ජාතියක් වන්නේ ය. එයින් අදහස් කරන්නේ ස්වාමීන් වහන්සේට පමණක් කැපවූ සෙනගක් වීම ය. ඒ නිසා ඉශ්රායෙලය, දෙවි සමිඳාණන්ගේ රාජ්‍යයයි. ඒ අනුව ඉශ්රායෙල් පාලකයන් දෙවි සමිඳුන්ගේ පරමාදර්ශය වූ සාධාරණත්වයේ කැඩපත විය යුතු ය. ඉශ්රායෙල්වරු නිදහස් ජනතාවක් විය යුතු ය. ඔවුන් අයිති වන්නේ දෙවියන් වහන්සේට ය. එබැවින් ඔවුන් අතර මිථ්‍යා ඇදහිලි නොතිබිය යුතු ය. විෂමාචාර පැවතුම් නොතිබිය යුතු ය. ලෞකිකත්වය අගයන ලොව අන් අය මෙන් නොවිය යුතු ය.

ඉශ්රායෙල් සෙනඟ පූජක රාජ්‍යයකි. පූජකවරයා යනු දෙවි මිනිස් සබැඳියාවේ අතරමැදියා ය. මධ්‍යස්ථකයා ය. දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයන් අතර සන්නිවේදන මාධ්‍යය ය. මේ අනුව මුළු ලොව සකල මනුෂ්‍යයන් වෙනුවෙන් පූජකත්වයේ වරම ලැබෙන්නේ ඉශ්රායෙල්වරුන්ට ය. සාධාරණත්වය සහ දේව පාරිශුද්ධිය ලොවට පෙන්විය යුත්තේ ඔවුන් ය.

ගිවිසුම ප්‍රකාශ කිරීමට මනුෂ්‍යයන් වෙතට පැමිණෙන දෙවියන් වහන්සේගේ ගරු ගාම්භිරාකාරයත් තේජස් විලාශයත් විස්තර කර පෙන්වීම සඳහා ලේඛකයා පාරම්පරික සම්ප්‍රදායික උපමා ශෛලිය උපයෝගි කරගෙන ඇත. මේඝ ගර්ජනා, විදුලිය කෙටීම, ඝන වලාකුළු, පොළෝ කම්පාවීම්, ගිනිජාලාව ඊට නිදසුන් ය. මනුෂ්‍ය ජීවිතයේ නොවටිනාකම සහ අස්ථිරත්වය පිළිබඳවත් දෙවියන් වහන්සේගේ පාරිශුද්ධත්වය සහ උත්කෘෂ්ඨභාවය පිළිබඳවත් බලවත් හැඟීමක් දැනවීම සඳහා මේ ශෛලිය භාවිතා කළ බව පෙනේ.

ජේසුස් ස්වාමීන් වහන්සේ අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේදී ප්‍රකාශ කළ දේව ගිවිසුම පිළිබඳ පසුබිම මේ අනුව අපට තේරුම් ගත හැකි විය යුතු ය.

මේ සඳහා ජොහන් 17 උත්තම පූජක යාච්ඤාවේ දැක්වෙන අදහසට ද, තම පියාණන් වන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස උන්වහන්සේගේ අප රාජකීය පූජක වංශයක් කළ සේක (එළිදරව්ව 1:6) යන සංකල්පයට ද අවධානය යොමු කිරීම සුදුසු ය.
දේව අභිමතය අනුව ඉශ්රායෙල් වංශයේ තෝරා ගැනීමට එම වංශිකයන් සුදුස්සන් කිරීම අවශ්‍ය ය. ඒ සඳහා නීති මාලාවක් නැතහොත් ව්‍යස්ථාවක් අවශ්‍යයි. සීනායිහි දී ප්‍රකාශිත ගිවිසුම ඒ නීති මාලාව ය. ව්‍යවස්ථාව ය.

#### අ) සීනායි ගිවිසුම

මිසරයේ වහල්කමේ වියගසින් මුදාගනු ලැබූ ජනතාව ප්‍රගති මාර්ගයේ ගමන් කිරීම සඳහා ඔවුන්ට මඟපෙන්වීමක් ලැබිය යුතු ය. නීතිමාලාවක්/ ව්‍යවස්ථාවක් අවශ්‍ය ය. උසස් අධ්‍යාපනයක් ලබන්නට සූදානම් වන බාලයකුට යා යුතු නිසි මඟ පෙන්විය යුතු ය. වල්මත් නොවී නියමිත ඉලක්කය වෙත ළඟාවීමට මාර්ගෝපදේශකත්වයක් ලැබිය යුතු ය. ඔහු තුළ විනය, සංවරබව, පරාර්ථකාමීත්වය, ඉවසීම ප්‍රගුණ විය යුතු ය. එසේ ම මෙතෙක් සංචාරක එඬේර පිරිසක් වශයෙන්, ආත්මාර්ථකාමීව අසංවර-දඩබ්බර ජීවිතයක් ගතකළ ඉශ්රායෙල් සෙනඟ විනයානුකූල සංවරශීලි දැහැමි පිරිසක් කිරීම සඳහා දෙවියන් වහන්සේ ව්‍යවස්ථාවක් දානය කළ සේක.

සංවර්ධිත සමාජයක් වශයෙන් කොයියම් හෝ ජනතාවක් ප්‍රගතියක් ලැබීමට නම් ඔවුන් සමස්තයක් වශයෙන් දෙ අංශයකින් වර්ධනය විය යුතු ය. එනම් ආධ්‍යාත්මිකව සහ

සමාජිකව ඒ සඳහා ඉශ්‍රායෙල්වරුන් වෙත දෙවියන් වහන්සේ ඉදිරිපත් කළ ගිවිසුම "**දස පණත**" වශයෙන් හැඳින්වේ.

එය සැකෙවින් මෙසේ ය.

1. මිසර දේශයෙන් ඔබ පිටතට ගෙනා ස්වාමින් වහන්සේ මම ය. මා හැර අන් කිසිම දෙවියකු නුඹට නොසිටිය යුතු ය.
2. නුඹේ දෙවි සමිඳාණන්ගේ නාමය අගරු ලෙස භාවිතා නොකළ යුතු ය.
3. දවස් හයක් තුළ නුඹේ වැඩ කළ පසු සබත් දිනය ශුද්ධ ලෙස ගත කිරීමට සිතට ගත යුතු ය.
4. නුඹේ පියාට ද මවට ද ගෞරව කළ යුතු ය.
5. මනුෂ්‍යයන් නොමැරිය යුතු ය.
6. කාමමිථ්‍යාචාරය නොකළ යුතු ය.
7. සොරකම් නොකළ යුතු ය.
8. නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකිව යුතු ය.
9. නුඹේ අසල්වැසියාගේ ගෘහයට, භාර්යාවට, සේවික සේවිකාවන් ආදීන් ට ඇළුම් නොකල යුතු ය.
10. නුඹේ අසල්වැසියා සතු කිසිම වස්තුවකට ඇළුම් නොකළ යුතුය.

මෙයින් මුල් පණත් තුන ආධ්‍යාත්මික වර්ධනය සඳහා දේව සබඳතා ඇතිකර ගැනීමට ද, ඉතිරි පණත් හත සාමාජීක වර්ධනය සඳහා සාරධර්ම පිළිපැදීමට ද යොමු කෙරේ.

පුරාණ රජවරු තමන්ගේ රාජ්‍යය දැහැමින් සෙමෙන් පාලනය කිරීම සඳහා දසරාජධර්මයක් අනුගමනය කළ හ. සමකාලීන රාජ්‍ය පාලකයන් අනුසාර කළ සේ ම සීනායි ගිවිසුම ද දසරාජ ධර්මයකි. පුරාණ රාජ්‍යපාලන නීති සංග්‍රහයක් වශයෙන් හමුරාබිගේ නීති සංග්‍රහය ගත හැකි ය. එහි "කළොත්" "නමුත්" වැනි අවිනිශ්චිතාර්ථ පද නැත. සීනායි ගිවිසුම ද විධායක නීති පද්ධතියකි. එහි ධනාත්මක නීති දෙකකි (කළ යුතු ය). ඍණාත්මක නීති අටකි (නොකළ යුතු ය).

දසපණත පිළිබඳ සඳහන් කිරීම් නව ගිවිසුමේ ද ඇත්තේ ය. ඒවායින කීපයක් ගැන අවධානය යොමු කරන්න.

I. "ඔබේ පියාට ද මවට ද ගෞරව කරන්නැ යි ද පියාට හෝ මවට නිග්‍රහ කරන්නා මරණ දඬුවම ලැබිය යුතුයැයිද මෝසෙස් පවසා ඇත". (මාක් 7:10)

II. "කාමමිථ්‍යාචාරය නොකරන්න. මිනී නොමරන්න. සොරකම් නොකරන්න. බොරු සාක්ෂි නොකියන්න. නුඹේ පියාටද මවට ද ගෞරව කරන්න යන ආඥා ඔබ දන්නෙහි ය" (ලූක් 18:20)

III. "කාමමිථ්‍යාචාරය නොකරන්න. මිනී නොමරන්න. සොරකම් නොකරන්න. ලෝභ නොවන්න යන අඥා ද තවත් සමහර ආඥා ඇත්නම් ඒවාද නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න යන පාඨයේ සම්පිණ්ඩනය වී ඇත." (රෝම 13:9)

IV. "කාමමිථ්‍යාචාරය නොකරවයි වදාළ තැනැන්වහන්සේ ම මිනී නොමරවයි කියාත් කී සේක. ඉදින් ඔබ කාමමිථ්‍යාචාරය නොකළත් මිනී මරන්නේ නම් ව්‍යවස්ථාව කඩකරන්නෙක් වන්නෙහි ය. (ජාකොබ් 2:11).

මීට අමතරව කන්ද උඩ දේශනයේ දී ජේසුස් වහන්සේ ව්‍යවස්ථාව පූර්ණත්වයට පත් කළ සැටි මතෙව් 5:6:7 පරිච්ඡේද කියවා දැනගත හැකි ය.

**(ඉ) ගිවිසුම ස්ථිර කිරීම :**

සීනායි ගිවිසුම අදියර දෙකකදී ස්ථිර කරනු ලැබිය. එයින් පළමුවැනි අවස්ථාව මෝසෙස් සහ ප්‍රජාමූලිකයන් හැත්තෑදෙනා සීනායි කන්ද මුදුනේ දී එය පිළිගැනීම ය. දෙවැනි අවස්ථාව කන්ද පාමුල දී සමස්ත ජනතාවට ගිවිසුම අනුමත කොට හස්ත තැබීම ය.

මේ ගිවිසුම ලැබෙන්නේ මෝසෙස්ට ය. මුළු මහත් ඉශ්‍රායෙල් ජනතාව වෙනුවෙන් ය. ගිවිසුමේ අනුමත කිරීම් පිළිබඳව පසු කලෙක විරෝධතා පැන නොනගිනු සඳහා සාක්ෂිකරුවන් අවශ්‍ය ය. මෝසෙස්ගේ අත්දැකීමට දායක වී සිටි අය අවශ්‍ය ය. ඒ නිසා ප්‍රජාමූලිකයන් 70 ක් ඉශ්‍රායෙල් වංශය නියෝජනය කරමින් සීනායි කන්ද මත දී මෝසෙස් ලැබූ ගිවිසුමට සාක්ෂිකාරයෝ වූහ.

වලාකුළින් තොර නිල් අහස් තලය ද කාන්තියෙන්, මහිමාලංකාරයෙන්, තේජශ්‍රීයෙන් බැබළෙන සූර්යයා ද දේව මහිමයේ උත්තරීතරභාවය ප්‍රකාශ කරද්දී ද ඔවුහු යම් ආකාරයකින් ස්වාමින් වහන්සේ අත්දුටුවෝ ය. දෙවැනි අවස්ථාව ජනතාව යාග පූජාවක් ඔප්පු කර ගිවිසුම අනුමත කිරීම ය.

ඔවුහු දවන යාග පූජා හා ගවයන් මරා සහභාගිකමේ පූජා ද සමිඳාණන් වහන්සේට ඔප්පු කළහ. මෝසෙස් සතුන්ගේ ලෙයින් දෙකෙන් කොටසක් ගෙන එය බඳුන්වල දැමී ය.

ලෙයින් අඩක් පූජාසනය මත ඉස්සේ ය. (පූජාසනය දෙවියන් වහන්සේ පිළිබඳ සළකුණය). පසුව ඔහු ගිවිසුම් පොත රැගෙන සෙනගට ඇසෙන ලෙස එය කියවීය. ඔවුහු ද පිළිතුරු දෙමින් *"සමිඳාණන් වහන්සේ වදාළ සියල්ල අපි ඉටු කරන්නෙමු" යි කීය. එවිට මෝසස් ලේ රැගෙන සෙනඟ මත ඉසිමින්, "මෙය වනාහි සමිඳාණන් වහන්සේ මෙකී සියළු අඥා ඔබට දෙමින් ඔබ සමඟ කරන ගිවිසුම ස්ථිර කරන ලේ ය" යි පැවසී ය (24:5-8).*

ජේසුස් වහන්සේ දානය කළ නව ගිවිසුම පිහිටුවීමේ දී ද මෙවැන්නක් සිදුවිය. ඒ බව මාක් 14:24 හී මෙසේ දැක්වේ.

උන්වහන්සේ ඔවුන්ට කථා කොට, මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරුවනු ලබන මාගේ ගිවිසුමේ රුධිරය වේ¨. (මාක් 14:34).

ගිවිසුම ලියන ලද ගල් පුවරු ඉශ්රායෙල් ජනතාව සැලකුවේ ඒ දෙවියන් වහන්සේ තමන් අතර ජීවත් වන බවට දෘශ්‍යමාන සළකුණක් ලෙස ය. ඒවා ඇතුළු කර "ගිවිසුම් කරඬුව" නිර්මාණය කළේ ඒ නිසා ය. යම් හෙයකින් ඔවුන් අතරින් ගිවිසුම් කරඬුව ඉවත් වුවහොත් එය තමන් වෙතින් දේවාශිර්වාදය ඉවත්වීමේ සළකුණක් ලෙස සැලකුණි. ජනවන්දනාව හා සබැඳි මුල් ම සංස්කෘතික ලක්ෂණය මේ ගිවිසුම් කරඬුව විය.

# තුන්වන පාඩම

## 3. සමදර්ශක සුවිශේෂ ගැන පොදු හැඳින්වීම

### 3.1. "සුබ ආරංචිය"

නව ගිවිසුමට ග්‍රන්ථ 27 ක් ඇතුළත් ය. ඒවා ඉතිහාස කතා-5 හසුන් පත් - 21, දිව්‍යස්වැකි - 1 යනුවෙන් බෙදා වෙන් කළ හැකි ය. ඉතිහාස පොත් පහෙන් පළමු පොත් හතර ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත කථාව අළලා ශු. මතෙව්, ශු. ලූක්, ශු. මාර්ක්, සහ ශු. ජොහන් විසින් ලියන ලද සුබ අස්නයන් වේ. පස්වන පොත වනාහි ආදි කිතුනු සාභාවේ ඉතිහාස පොතයි.

සුබ අස්නට "සුබ ආරංචිය" කියා ද කියනු ලැබේ. එය ග්‍රීක බසින් 'එව්' (සුබ, යහපත්) අන්ජෙලියොන් (පණිවිඩය, පුවත, ආරංචිය) යන නමින් ද හැඳින්වේ. ගිහි රෝම සමාජයේ සේසරු කෙනෙකුගේ උපත හෝ එවැන්නකුගේ ඔටුනු පැළඳවීමේ පිළිබඳ ආරංචියට "එව් ඇන්ජලියෝන්" යැයි කියනු ලැබේ. රාජාතිරජාණන්ගේ උපතට හා එතුමන්ගේ රාජ්‍යයේ පැමිණීම පිළිබඳ පුවතට කිතුනුවෝ සුබාරංචිය නැතහොත් "එව් අන්ජෙලියෝන්" කියානම් කර ඇත.

පුරාණ ගිවිසුමේ "සුබ ආරංචිය" යන වචනය සමහර තැන්වල කිසිම අරුතක් නොමැතිව යෙදී ඇත. 2 සාමුවෙල් 18:27 හී අඩංගු කැරලිකාර අබ්සෙලෝම්ගේ මරණය පිළිබඳ පුවත ගෙන ගිය අහිමසා ගැන, දාවිත් විසින් ඔහු යහපත් මිනිසෙකි. යහපත් ආරංචි ඇතිව එන්නේ ය යන කියමන මෙයට කදිම නිදසුනකි. (2 සාමුවෙල් 18:19:31 සහ රාජාවලිය 1:42 යන වගන්ති ද කියවා බැලීම වැදගත් ය.)

නමුත් දිවැසාවලියේ සුබාරංචිය වනාහි යහපත් ආරංචියක් පමණක් ම නොවේ. සියොනයට ගැළවීම ගෙනෙන සුබ ආරංචිය වේ.

*සියොන්ට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි,*

*උස් කන්දට නගින්න,*

*සියොන්ට සුබාරංචිය දන්වන්න,*

*ජෙරුසලමට සුබාරංචිය ගෙනෙන දූතයාණනි,*

*හඬ නගා ප්‍රකාශ කරන්න* (යෙසායා 40:9)

යෙසායා 41 : 27, 52 : 7) ද කියවා බලන්න.

නව ගිවිසුමේ කොයියම් තැනකවත් ලිඛිත දෙයක් සුබ ආරංචිය ලෙස හැඳින්වී නැත.

**සමදර්ශක සුවිශේෂයන් හී පහත සඳහන් දෑ සුබ අස්න ලෙස සඳහන් වේ.**

- ස්නාවක ජොහාන් තුමාගේ උපත ගැන මංගලම් කිම (ලූක් 1:19).
- ජේසු තුමාගේ උපත ගැන දැනුම් දීම (ලූක් 2:10).
- ස්නාවක ජුවාම් තුමාගේ දේශනය (ලූක් 3:18)
- ජේසුස් වහන්සේගේ අනුශාසනා හා දේව රාජ්‍යය පිළිබඳව දේශනා (මතෙව් 4:23), (ලූක් 4:43:8:1).
- මාර්ක් 10:29 සඳහන් පරිදි ජේසුන් වහන්සේ උදෙසාත් සුබ අස්න උදෙසාත් තම පවුලේ අය පවා අත්හැරිය යුතු ය. මෙලෙස කීමෙන් ජේසුස් වහන්සේ හා සුබ අස්න අතර ඇති සම්බන්ධතාවය ප්‍රකාශ කෙරේ.
- මතෙව් 14:7 හා මාර්ක් 1:15 යන වගන්තිවලට අනුව දේව රාජ්‍යය පිළිබඳ සුබ ආරංචිය වනාහි මනස්ථාපනයට කරනු ලබන ආරාධනයයි.
- සුබ අස්න දේශනා කිරීම තමාගේ කාර්යය බවත්, ඒ සඳහා ශුද්ධාත්ම ආලේපනය ලැබූ බවත් ජේසු තුමා කියයි. (යෙසායා 61:1, ලූක් 4:18). තවද දිළිඳුන්ට සුබ අස්න දෙසීම මෙසියස්ගේ ලකුණකි. (මතෙව් 11:5)
- දේව රාජ්‍යය ළඟා වූ බව දන්වා සුබ අස්න දේශනා කිරීමට ක්‍රිස්තුන් වහන්සේ විසින් ම ශ්‍රාවකයින්ව යවන ලදී (ලූක් 9:1-6).

මාර්ක් 1:1 අනුව "සුබාරංචියේ" අරුත මදක් වෙනස් වේ. එහි සඳහන් පරිදි එය දේව රාජ්‍යය ළඟාවීම නොව ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීමත්, උන්වහන්සේගේ ජීවිතයත්, මරණයත් උත්ථානයත් ය. පසු කාලයේ දී ශ්‍රාවකයෝ වෙහෙසෙන්නේ මෙය ප්‍රකාශ කිරීමට ය (ක්‍රියා 5:12, 11:20). මෙම අදහසට ගැළපෙන පරිදි ක්‍රිස්තුන් වහන්සේ ද සුබ අස්න දේශනා කිරීමේ කාර්යභාරය ගෝලයින්ට පැවරූ සේක (මාර්ක් 13:10, 14:9, 16:15).

ශු. පාවුළුතුමාට සුබ අස්න වනාහි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳවයි (රෝම 1:3-4). එය දේශනා කිරීම එතුමා වරප්‍රසාදයක් ලෙස සලකයි. (එපිස 3:8, රෝම 1:5). එසේ ම එය වගකීමකි. එයට එතුමා බැඳී ඇත. එය ඉටු නොකළහොත් කාලකන්නියෙකි (1 කොරින්ති 9:16). මේ සුබ ආරංචියේ අඩංගු දේ පළමුව අභිරහසක් වූ නමුත් දැන් එය එළිදරව් වී ඇත (රෝම 16:25).

මේ නයින් බලන කල සුබාරංචියේ අරමුණ ක්‍රිස්තුන් වහන්සේම ය. දේශනා කරන ලද්දේ උන්වහන්සේ ගැනය එසේ ම එහි කර්තෘවරයා ද උන්වහන්සේම ය. එය ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ දෙසුම් මාලාවක් නොවේ. එය ක්‍රිස්තුන් වහන්සේ ගැලවුම්කාරයා ලෙසත්, මෙසියස් ලෙසත්, පුරාණ ගිවිසුමේ පූර්ණත්වය ලෙසත් ඉදිරිපත් කිරීමකි. කුරුසිය සුබ අස්නේ කේන්ද්‍රස්ථානයක් ගනියි, (1 කොරින්ති 1:17-25, 2:2). සුවිශේෂය, ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය, දේශනා හා ක්‍රියා ඉදිරිපත් කරන අතර එය කියවන්නාට අභියෝගයක් ද ඉදිරිපත් කරයි. එහි අඩංගු උත්තරීතර දර්ශනය අනුව ජීවත් වීමට ආරාධනයක් ද කරයි.... "ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්නට ඔබින ලෙසට හැසිරෙන්න..... ඔබ ස්ථිරව ද, එක්සත්ව සිටින බවද, ඔබ හැම කෙනෙකු මෙන් සුබ අස්නේ ඇදහිල්ල සඳහා වීර්ය කරන බව ද, ඔබේ විරුද්ධවාදීන්ට අභීතව මුහුණ පාන බවද ඇසීමට මම කැමති වෙමි" (පිලිප්පි 1:27,28).

## 3.2. එකම සුබාරංචියේ සංස්කරණ හතර.

අපොස්තුළුවරු දේශනා කළ එකම සුබ අස්න සංස්කරණ හතරක් ලෙස අප අතට පත්වී ඇත. ශු. මතෙව් තුමා, ශු. මාක් තුමා, ශු. ලූක් තුමා, හා ශු. ජොහන් තුමා යනු සංස්කාරකවරුන් ය. ආදි කාලයේ දී සුවිශේෂ හතරක් නොව "එකම සුබ අස්නේ පොත් හතර " යයි සඳහන් විණි. (**MURATORIAN CANON)s**. ශු. අයිරේනිස් තුමා සඳහන් කර ඇත්තේ "සුබ අස්නේ හතර ආකාරය" යයි යනුවෙනි. එම නිසා ආදි කිතුනුවෝ

- ශු. මතෙව් තුමා විසින් ලියන ලද ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න,
- ශු. මාර්ක් තුමා විසින් ලද ජේසුන් ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න,
- ශු. ලූක් තුමා විසින් ලියන ලද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න,
- ශු. ජොහාන් තුමා විසින් ලියන ලද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න යනුවෙන් සඳහන් කළෝ ය.

**සුබාරංචි සංකේතවත් කරන රූප**
සුබාරංචි සංකේතවත් කරන රූපවල පදනම පුරාණ ගිවිසුමේ එසකියෙල් 1/10 හා නව ගිවිසුමේ එළිදරව්ව 4/7 හී සඳහන් සත්ත්වයන් සතර දෙනා ය. සුපුවත් සතරට බයිබලීය සත්ත්වයන් ගලපා ඇත්තේ එකිනෙක සුබාරංචි ඇරඹෙන ආකාරයට ය.

## 3.3. සා. අම්බ්‍රෝස් තුමාගේ සංකේතකරණය මෙය වේ.

| සුපුවත | ආරම්භය | සංකේතය |
|---|---|---|
| මතෙව් | ජේසුස් වහනසේගේ මිනිස් පෙළපත | මිනිසා |
| මාක් | ස්නාවක ජොහන්ගේ පාළුකරයේ දේශනාව | සිංහයා |
| ලූක් | සකරියස්ගේ ගව යාගය | ගවයා/වස්සා |
| ජොහන් | ජේසුස් වහන්සේගේ දේවත්වය | රාජාලියා |

මේ අනුව නිගමනය කළ හැක්කේ සුපුවත් සතරට මුල සිටම ගෞරවය ලැබුණු බවයැ.

## 3.4. සමදර්ශක ගැටළුව

සුවිශේෂකවරු හතර දෙනා ලියූ කථා වස්තූන් හතරෙන් පළමු තුන අතර ඉතා කිට්ටු සමානතාවක් දක්නට ලැබේ. මේවායින් සමහර කොටස් එකිනෙකට ඉතා සමීප බැවින්, ඒවා දෙස ඒකාකාරව ම බැලිය හැක. එම නිසා මෙම සුබාරංචි තුනට සමදර්ශක සුවිශේෂ යයි කියනු ලැබේ. ඉංග්‍රීසි බසින් ඒවා "සිනොප්ටික්" නොහොත්/එක ඇසින්" යනුවෙන් නම් කර ඇත. (මෙම සිනෝප්ටින් යන වචනය ග්‍රීක් වචන දෙකකින් සැදී ඇත.) "සුන් ඔප්ටෙයින්" **TO SEE TOGETHER** එකට බැලීම යන අදහසක් ගෙන දෙයි.

පහත සඳහන් උදහරණ මගින් එය මනාව පැහැදිලි වේ.

**මතෙව් 3:17**
තවද "මොහු මාගේ ප්‍රේමාන්විත පුත්‍රයාණෝ ය. මොහු කෙරේ ඉතා පැහැදී සිටිමි" යි අහසින් හඬක් විය.

**මාර්ක් 1:11**
තවද, "අහසින් හඬක් මෙසේ පැවසීය, ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය, ඔබ කෙරේ ඉතා ප්‍රසන්න වෙමි."

**ලූක් 3:22**
එවිට, "ඔබ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය ඔබ කෙරේ අතිශයින් පැහැදී සිටිමි" යි අහසින් හඬක් නික්මිණි.

මෙයාකාරයෙන් ම සමතාවයන් හා අසමතාවයන් කිහිපයක් පිළිබඳව ද සඳහන් වේ. මෙම ගැටළුවට සමදර්ශක ගැටළුව යයි කියනු ලැබේ.

**i. සමානකම්.**

**අ) අඩංගු කරුණු පිළිබඳව**
සමස්තයක් වශයෙන් ගත් කල ජේසුස් වහන්සේගේ වචන, ක්‍රියා, ප්‍රාතිහාර්ය, උපමා, දේශනා හා ප්‍රධාන සිද්ධීන් සුවිශේෂ තුනේ ම ඒකාකාරව සඳහන් වේ. සමහර කොටස් සුවිශේෂ තුනට ම පොදු ය. සමහරක් අඩංගු වී ඇත්තේ ග්‍රන්ථ දෙකක පමණි. එකක සුබ අස්නට සීමා වූ කොටස් ද ඇති අතර කලාතුරකින් සමහර කොටස් එකම ග්‍රන්ථයේ දෙවරක් සඳහන් වී ඇත.
**උදා:- ලූක් 8:16, 11:33, 9 48: 10:16**

සමදර්ශක සුවිශේෂ අතරින් කෙටි ම සුවිශේෂය වන්නේ ශු. මාර්ක් තුමා ලියූ සුවිශේෂයයි. එය සම්පූර්ණයෙන් ම වාගේ මතෙව් හා ලූක් සුවිශේෂ තුළ අඩංගු වේ. මාර්ක් තුමාට ම සුවිශේෂ වන්නේ ඉතා ස්වල්පයකි. මාර්ක් සුවිශේෂයෙන් 90% ක් හෝ වගන්ති 600 ක් පමණ මතෙව් සුවිශේෂය තුළ අඩංගු වී ඇත. මාර්ක් සුවිශේෂයෙන් 50% පමණ අඩංගු වන්නේ ලූක් තුමාගේ සුවිශේෂයේ ය. මතෙව් සුවිශේෂයට පමණක් විශේෂ වූ කොටස් මුළු සුවිශේෂයෙන් ම 30% කි. එමෙන් ම ලූක් තුමාට 50% ක් හිමි වේ. පහත සඳහන් වන්නේ ඒ පිළිබඳ විග්‍රහයකි.

| | **මතෙව්** | **මාර්ක්** | **ලූක්** |
|---|---|---|---|
| **මුළු වගන්ති** | 1070 | 677 | 1150 |
| **තමාටම විශේෂ** | 330 | 70 | 520 |
| **Unique Tradition** | **(1/3 පමණ)** | **(1/10 පමණ)** | **(1/2 පමණ)** |
| **ග්‍රන්ථ දෙකක අඩංගු** | 170-180 | 170-180 | 230 |
| **Two fold Tradition** | **මතෙව්-මාර්ක්** 230 | **මාර්ක්-මතෙව්** 50 | **ලූක්-මතෙව්** 50 |
| **ග්‍රන්ථ තුනක අඩංගු** | **මතෙව්-ලූක්** | **මාර්ක්-ලූක්** | **ලූක්-මාර්ක්** |
| **Three fold tradition** | 350-370 | 350-370 | 350-370 |

**ආ) කරුණු පිළියෙල කිරීම පිළිබඳව.**
සමදර්ශක සුවිශේෂකවරු ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයත්, ක්‍රියාකාරීත්වයක් එක ම ආකාරයට ම පිළියෙල කර ඇත. ස්නාවක ජොහාන් තුමාගේ පැමිණීම, බෞතිස්ම ස්නාපනය, පරීක්ෂා, ප්‍රසිද්ධ ජීවිතය, දුක් ගාවිනා, කුරුසියේ ඇණ ගැසීම, මරණය හා උත්ථානයගේ පහත දැක්වෙන ආකාරයට සඳහන් කර ඇත.

| | **මතෙව්** | **මාර්ක්** | **ලූක්** |
|---|---|---|---|
| • **සේවයට මුල් සූදානම** | 3:1 4:11 | 1:1-13 | 3:1-4:13 |
| • **ගලීලයේ සේවය** | 4:12-18:35 | 1:14-9:15 | 4:14-9:50 |
| • **ජෙරුසලෙම් ගමන** | 19:1-20:34 | 10:1-52 | 9:51-18:43 |
| • **දුක්ප්‍රාප්තිය හා උත්ථානය** | 21-28 | 11-16 | 19-24 |

**ඉ) භාෂාව**
පුරාණ ගිවිසුමෙන් උපුටා ගන්නා විට සුවිශේෂකවරු තිදෙනා ම බොහෝ විට එකඟ වෙති. ක්‍රිස්තුන් වහන්සේගේ වචන ග්‍රීක් බසින් බොහෝ විට ඒකාකාරව ම සඳහන් කරති. සමහර විට වාක්‍ය, වගන්ති වචනයෙන් වචනයට ගැලපේ.

**ii. අසමානකම්.**

**අ) අඩංගු කරුණු තුළ**
සමහර විට කරුණු ඉදිරිපත් කිරීමේදී දෙදෙනෙක් එකඟ වේ. සමහරවිට යම් කරුණු දැකිය හැක්කේ එක ම ග්‍රන්ථය තුළ පමණි. දෙදෙනෙක් එක ම කරුණු වාර්තා කරන විට පවා වෙනස්කම් ඇත. උදා: ජේසුස් වහන්සේගේ වංශාවලිය මතෙව් හා ලූක් ඉදිරිපත් කරති. නමුත් එලෙස කිරීමේදී දෙදෙනා වෙනස් ය. මාර්ක් තුමා ඒ ගැන නිහඬ වේ. උන්වහන්සේගේ බාල විය පිළිබඳව ද කිව හැක්කේ එයමයි. ජේසුස් වහන්සේගේ පරීක්ෂා

තුන ගැන මතෙව් හා ලූක් ඉදිරිපත් කරන ආකාරය ද වෙනස් ය. (මතෙව් 4:3-12, ලූක් 4:3-12) උත්ථානය පිළිබඳ වාර්තා ද විවිධ ය.

**ආ) කරුණු පිළියෙල කරන විට.**

දළ වශයෙන් යම් සමාන කාලයක් දැකිය හැකි නමුත්, කෙනෙක් යම් කරුණු රැසක් එක් තැනකට ගොනු කරන අතර අනිකෙක් ඒවා තැනින් තැන ද සඳහන් කරයි.

උපමා කොටස තුන්දෙනාට ම පොදු ය. නමුත් තුන්දෙනාගේ උපමාවල ගණන වෙනස් ය. ජේසුස් වහන්සේගේ දේශනා මතෙව් හා ලූක් සඳහන් කරන අතර මතෙව් තුමා ඒවා ප්‍රධාන දේශන(පොත්)පහකට ඇතුළත් කරයි. නමුත් ඒවා ලූක් තුමා, ජේසුස් වහන්සේ ජෙරුසලෙමට ගෙනගිය දීර්ඝ ගමනට ඇතුළත් කරයි. (9:51-18:14)

පරමණ්ඩල යාච්ඤාවට අයත් යැදුම් ප්‍රමාණය ද (මතෙව් 6:9-15:ලූක් 11:2-4)මංගල (භාග්‍ය) වාක්‍ය ගණන ද(මතෙව් 5:3-11, ලූක් 6:20-22) වෙනස් ය. පොදු සැලසුමේදී ලූක් තුමා මාර්ක් තුමාව අනුගමනය කරන අතර මතෙව් තුමා එලෙස නොකරයි.

**සමදර්ශක ගැටළුවට විවිධ විමසුම්.**

මෙවැනි ගැටළුවක් ගැන ශු. අගුස්තීනු මුනිතුමා (354-430) ලියූ පොතක (De Consensu Eangelistarum,) සඳහන් වේ. එනමුත් 18 වන ශත වර්ෂයේ මැද භාගය වන තෙක් එය මුදුන්පත් නොවී ය. මෙම ගැටළුව විසඳීමට එවක් පටන් කිහිප දෙනෙක් විවිධ විසඳුම් ඉදිරිපත් කර ඇත. ඒවා සැම එකක්ම හා ඒවායේ ඇගයීම ද අපි මෙහි සඳහන් නොකරමු. දැනට ඉදිරිපත් කර ඇති විසඳුම් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

1) සමදර්ශක ගැටළුවට හේතු වී ඇත්තේ සුබ අස්න ලිවීමට කලින් පැවැති මුල් සභාවේ දේශන, වාචික සම්ප්‍රදායක් බවට පත්වීම.

2) සුවිශේෂකවරු (පළමුව ලියූ තැනැත්තා හැර) තමාට කලින් ලියූ කාර්තෘ හෝ කර්තෘන්ගේ ලියවිලි මත රැඳී සිටීම ය.

මෙම දෙවන කොටසේ විවිධ මත දරු අය සිටිති. වාචික සම්ප්‍රදාය තනිව වේවා, ලියවිලි අතර ඇති සම්බන්ධය තනිව වේවා, සම්පූර්ණ පිළිතුර නොවන බව අපි දත යුත්තෙමු. එම නිසා කණ්ඩායම් දෙකේම සංයුක්ත වූත් වැඩිදෙනා දැනට පිළිගන්නා වූත් පහත සඳහන් විසඳුම් අපි ඉදිරිපත් කරමු.

ජේසුන් වහන්සේගේ වචන හා ක්‍රියා එක පොතක නොව ලියවිලි කීපයක සඳහන් විය. මුල් සභාවේ දේශනවාදීන්ටත්, උපදේශකයන්ටත් මේවා ආධාර වූ අත්පොත් වැනි ය. මේවා කිතුනු සංඝ කිහිපයක ම දක්නට ලැබිණි. ක්‍රමිකව මේවා එකතු වන්නට විය. පසුව සමදර්ශක සුවිශේෂකවරු මේවා එකතු කර තමාගේ කථා වස්තුන් ගොඩ නගා ඇත. මේ අතර වාචික සම්ප්‍රදාය දිගින් දිගට ම පැවති එකකි. ලිඛිත කොටස්වලට එම වාචික සම්ප්‍රදා එකතු විය. වාචික සම්ප්‍රදාය මගින් සුවිශේෂකයන් යම් කරුණු ඇතුළු කළ අතර, හැඩගැස්මක් ද සිදුවිය.

**සැ.යු:**

සමදර්ශක ගැටළුව විසඳීමට අවුරුදු ගණනාවක් තුළ කීපදෙනෙක් වෙහෙස වී ඇත. ඔවුන්ගේ උත්සාහයන් නිෂ්ප්‍රභා නොවිය. සැම විසඳුමක් ම පූර්ණ පිළිතුර නොවූවත්, එම පිළිතුර දෙසට අපව යොමු කර ඇත. සෑහීමකට පත්විය හැකි සම්පූර්ණ පිළිතුරක් මෙතෙක් අපට ලැබී නැත. සමහරවිට කිසි දිනක එය නොලැබෙන්නටත් පිළිවන.

## 3.5 සමදර්ශක සුවිශේෂවල ඓතිහාසිකත්වය

සුවිශේෂයන් හි මූල ධාතුව වශයෙන් ගැනෙන්නේ අපෝස්තුළුවරුන්ගේ වාචික දේශන බැවින් ඒවා ඇසින් දුටු සාක්ෂිකරුවන් ඉදිපත් කළ කරුණු මත රඳා පවතී.

අපෝස්තුළුවරු වේවා, දේශකවරු වේවා, සුවිශේෂක කතාන්තරය කියමින් තැනින් තැනට ගිය අය වේවා, අද අපි තේරුම් ගන්නා ආකාරයට ඉතිහාසයක් කීමට හෝ ලිවීමට කොහෙත්ම උත්සාහ කළේ නැත. ඔවුන්ගේ අරමුණ ඊට වඩා ශ්‍රේෂ්ඨ විය. ක්‍රිස්තුන් වහන්සේ අත්දැක උන්වහන්සේගේ පණිවිඩයෙන් තමන් තුළ ජීව විප්ලවයක් ඇති කරගෙන, යුක්තිය, සාමය හා ශුද්ධාත්ම-යාණන්ගෙන් එන ප්‍රීතිය අත්දුටු අයට (රෝම 14:17) අවශ්‍ය වූයේ එය අන්අය සමඟ බෙදා ගැනීමට ය. එනිසා අන් අයගේ සිත්හැරීමත්, ඔවුන්ට ආදර්ශයක් වීමත්, විශ්වාසය නමැති දේව දීමනාව ලබා ගැනීමට හදවත් සූදානම් කිරීමත්, එම විශ්වාසය පණගැන්වීමත්, එය ආරක්ෂා කිරීමත් මුල් සභා කිතුනුවන්ගේ අරමුණ විය. මෙම කාරණය නිසා ඔවුහු සත්‍යවාදී විය. සැබෑ සාක්ෂි ඉදිරිපත් කළෝ ය.

අවසානයේ දී සුබ අස්න සකස් කළ අයට ද ඇති වූයේ එවැනි ම අවංකකමකි. විශ්වාසවන්ත ලැදියාවකි. ඇඳහිල්ලේ මුල් උල්පත්වලට ගෞරවයකි. සමදර්ශක සුවිශේෂ තුන ඉතිහාස පොත් විය නොහැකි නමුත් එහි ඓතිහාසික කරුණු ඉදිරිපත් වේ.

නමුත් සඳහන් කර ඇති කරුණු ඒකාකාරව ම සිදු වූයේ යැයි අපි නොකියමු. සාක්ෂිකරුවෝ යම් කරුණක් ඉදිරිපත් කරන විටත්, එම සාක්ෂිය පැතිර යන විටත්, සාමාන්‍යයෙන් පවතින නීති රීති හා සම්ප්‍රදා අපි පිළිගන්නෙමු. එමෙන් ම කරුණක් සිදුවන විට එවේලේ ම එය ලේඛකයන් සටහන් නොකර ගත් බැවින් ද, සැම දෙයක් ම සටහන් කර ඇති ආකාරයට ම සිදුවූවා යැයි සිතීම නුසුදුසු ය. මෙම කරුණු පිළිබඳව පමණක් නොව, ඒවා පිළිවෙලට අඩංගු කර ඇති ආකාරය ගැන ද සැබෑ ය. මුල් කිතුනුවන්ගේ විශ්වාසය මෙවැනි දෙයකින් නොසෙල්විණි. ශුද්ධාත්මයාණෝ නිවැරදි යයි නිගමනය කරන්නේ ද ශුද්ධ ලියවිලි තුළ සඳහන් කර ඇති කරුණුවත් ඒවා සිදුවූ අවස්ථාවත් නොවේ. එම කරුණු මගින් දෙන අධ්‍යාත්මික පණිවුඩයයි.

## 3.6. සුබ අස්න සකස් වීමේ පියවර තුන.

### 1. ඓතිහාසික ක්‍රිස්තුන් වහන්සේගේ යුගය


ඓතිහාසික ක්‍රිස්තුන් වහන්සේ විසින් කිසිවක් ලේඛන ගත කළේ නැත. උන්වහන්සේ ගෝල පිරිසක් තෝරා ගත් සේක. උන්වහන්සේ කියූ හා කළ සැමකට ඔවුහු සාක්ෂිකාරයෝ වූහ. ජේසුස් වහන්සේ තම ගෝලයන්ට ගැළපෙන සේ (ඔවුන්ට වටහාගත හැකි ආකාරයට) කථා කළ විට ඔවුහු අවබෝධ කර ගත් හ. මේ හේතුවෙන් ජේසුස් වහන්සේ උපමා පාවිච්චි කළ සේක.

ජේසුස් වහන්සේ දේශනා කළේ ත්, ප්‍රාතිහාර්යය සිදු කළෙත් පලස්තීනය තුළ ය. එය අවුරුදු 2 1/2, 3 කෙටි කාලයකට සීමා විය. උන්වහන්සේට සවන් දුන් සැම දෙනෙක් ම පාහේ ජුදා ජාතිකයෝ ය.

### 2. අපෝස්තුළුවරුන්ගේ දේශනා යුගය .

ක්‍රිස්තුන් වහන්සේ කියූ හා කළ දෑ ගෝලයෝ වඩා අවබෝධ කර ගත්තේ, උන්වහන්සේගේ උත්ථානයෙන් හා ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමෙන් පසුව ය. (ජොහන් 14:16-17:23:26:16:13-15). මෙම පූර්ණ අවබෝධය නිසා ඓතිහාසික ක්‍රිස්තුන් වහන්සේගෙන් කලින් උගත් වචන හා ක්‍රියා ගැන දැනුම වෙනස් වූයේ නැත. ඒවා තහවුරු විය.

මෙම කරුණු ශ්‍රාවකයෝ තැනින් තැනට ගොස් දේශනා කරන විට ක්‍රිස්තුන් වහන්සේ කළාක් මෙන්ම ඔවුහුද සවන් දෙන්නන්ට ගැළපෙන සේ කරුණු සකස්කර ගත් හ. ඔවුන්ගේ දේශනා අවුරුදු 30, 40, 50 ක කාලයක් කෙරුන අතර, එදා ඔවුන් දන සිටි, ලෝකයේ සැම තැනකට ම ගියෝ ය. මෙම දේශනයන්ට සහභාගි වූවෝ ජුදෙව් ජාතිකයන් පමණක් නොව, නොයෙකුත් ප්‍රදේශවල පරිසරයන්ට මුහුණ දුන් අන්‍යජාතිකයෝ ද වූහ. ඔවුන් මුහුණ පෑ ප්‍රශ්න සමහරක් ශු. පාවුළු තුමාගේ සන්දේශවල සඳහන් වේ. එනමුත් මේ යුගයේ දී ඓතිහාසික ක්‍රිස්තුන් වහන්සේ සමග තිබූ සම්බන්ධය වෙන් නොවීය.



ඓතිහාසික ක්‍රිස්තුන් වහන්සේගේ යුගය

යුග දෙක අතර සම්බන්ධය නොකැඩී පැවතිණි.

අපෝස්තුළුවරුන්ගේ දේශනා යුගය


### 3. සුවිශේෂකවරුන්ගේ යුගය.

ක්‍රිස්තුන් වහන්සේ ගෝලයන්ට ඔවුන් ඇසූ දුටු දේ ලිවීමට අණ නොකළත්, කරුණු දෙකක් මත එවැනි දෑ ලේඛනගත කිරීමට අවශ්‍ය විය.

- කල්යත්ම සිද්ධීන් ඇසූ දුටු අයගේ ගණන අඩු විය.
- ධර්මදූත අවශ්‍යතාවයන් ඇතිවිය.

මාර්ක් තුමා පළමුවෙන් ම සුබ අස්න ලියන විට ගෝලයන්, විශේෂයෙන් ම පේදුරු තුමා, තමාගේ සුවිශේෂ කියවන අන් අයට ගැළපෙන සේ සංස්කරණය කළේය. එමෙන්ම මතෙව් හා ලූක් තුමා ද අවශ්‍යතාවයන්ට ගැළපෙන සේ ලියූහ. මෙම හේතුව නිසා සුවිශේෂ තුන අතර ම යම් යම් වෙනස්කම් දක්නට ලැබේ. දේවස්ථානය අපවිත්‍ර කිරීමේ සිද්ධිය, සමදර්ශක සුවිශේෂ ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ අවසාන ක්‍රියාවක් ලෙස දක්වන අතර, ශු. ජොහන් තුමා එය පළමු ක්‍රියාවක් ලෙස දක්වයි. එමෙන් ම උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශවීම ජෙරුසලෙමේ සිදුවූයේ යැයි ශු. ලූක් තුමා සඳහන් කර යි. ශු. මතෙව් තුමා එය "විජාතීන්ගේ ගලීලයේ" සිදුවේ යැයි සඳහන් කරයි (සෙසායා 8:23). මේ

සියල්ල සටහන් කරන විට සුවිශේෂකවරු ඓතිහාසික ක්‍රිස්තුන් වහන්සේව අමතක නොකළ හ.




සැ:යු: දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ දේව ප්‍රකාශන පිළිබඳ ධර්ම ව්‍යවස්ථාවේ (අංක 7 සහ 8) මෙලෙස සඳහන් වේ.

ශු. සභාව තුළ සුවිශේෂ නිතරම සම්පූර්ණ ම හා ජීවනාකාරයෙන් පවතිනු සඳහා අපෝස්තුළුවරුන් පත්කර තමනට හිමිව තිබූ ඉගැන්වීමේ කාර්යය ඔවුනට පැවරුවෝ ය. මෙලෙස දේවානුභාවයෙන් ලියැවුණු පොත්වලින් විශේෂයෙන් ප්‍රකාශ වන අපෝස්තුළුවරුන්ගේ දේශනය ඔවුන්ගේ නිලය නොකැඩී දිගට ම පවත්වන අය විසින් ලෝකාන්තිමය දක්වා ආරක්‍ෂා කර තබා ගත යුතුව තිබුණේ ය. එහෙයින්, අපෝස්තුළුවරු තමන් ලැබූ දේ විශ්වාසකයින්ට පවරා දෙමින් මුඛ වචනයෙන් හෝ ලියැවිලි වලින් හෝ ඔවුන් ඉගෙන ගත් පරම්පරාගත ධර්මය තදින් අල්ලා ගෙන සිටින ලෙස ද, එක් වරක් භාර දෙන ලද විශ්වාසය උදෙසා සටන් කරන ලෙස ද ඔවුන්ට අවවාද කරති......"

**සුවිශේෂ ලියැවුණු වර්ෂ:-**

| | | |
|---|---|---|
| ක්‍රි.ව. 27 | - | ස්නාවක ජුවාම් තුමාගේ දේශනය |
| | | ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කිරීම. |
| ක්‍රි.ව. 30 | - | පාස්කු මංගල්‍යයට පෙර දින ක්‍රිස්තුන් වහන්සේගේ මරණය, පෙන්තකොස්ත දිනය |
| | - | ශුද්ධාත්මයාණන් ප්‍රදානය කිරීම. |
| ක්‍රි.ව. 36-37 | - | ස්තේපන්ගේ මරණය සාවුල්ගේ සිත් හැරීම |
| ක්‍රි.ව. 45-49 | - | පාවුළු තුමාගේ පළමු ධර්මදූත ගමන. |
| ක්‍රි.ව. 50 | - | ජෙරුසලෙම් හි මන්ත්‍රණ සභාව (මතෙව් තුමාගේ ඇරැයුමකින් සුබ අස්න) |
| ක්‍රි.ව. 50-52 | - | පාවුළු තුමාගේ දෙවන ධර්මදූත ගමන |
| ක්‍රි.ව. 53-58 | - | පාවුළු තුමාගේ තෙවන ධර්මදූත ගමන |
| ක්‍රි.ව. 61-62 | - | පාවුළු තුමා රෝමයේ සිරගත වීම, ජෙරුසලමේ දී ශු. ජාකොබ් තුමාට ගල් ගසා මැරීම. |
| ක්‍රි.ව. 64 | - | ශු. මාර්ක් තුමාගේ සුබ අස්න |
| ක්‍රි.ව. 65 | - | ශු. ලූක් තුමාගේ සුබ අස්න, ශු.මතෙව් තුමාගේ සුබ අස්න (ග්‍රීක් සංස්කරණය) |
| ක්‍රි.ව. 67 | - | රෝමයේ දී ශු. පාවුළු තුමාගේ හා පේදුරු තුමාගේ මරණය. |
| ක්‍රි.ව. 68-70 | - | රෝම - ජුදා සංග්‍රාමය - ජෙරුසලමේ විනාශය. |
| ක්‍රි.ව. 70-80 | - | ශු. ලූක් තුමාගේ සුබ අස්න හා මතෙව් තුමාගේ සුබ අස්නේ අවසාන සංස්කරණය. |
| ක්‍රි.ව. 95 | - | ශු. ජුවාම් තුමාගේ සුබ අස්න. |
| ක්‍රි.ව. 100 | - | අවසාන ගෝලයා වූ ශු. ජුවාම් එපීසියේ පරලෝ සැපත් වීම. |

**සුබ අස්න සහ දේවානුභාවය**

සුබ අස්න තුළින් දෙවියන් වහන්සේ ම අප සමග කතා කරන සේක. ඒ නිසා එය ශුද්ධාත්මයාණන්ගේ මඟ පෙන්වීම යටතේ ලියන ලදී. දෙවියන් වහන්සේ අදහස් කළ දේ පමණක් ලිවීමට උන්වහන්සේ මිනිස් කර්තෘන්ට මඟ පෙන්වූ සේක. එමනිසා එම ග්‍රන්ථවල කර්තෘන් දෙවියන් යටතේ මිනිස් දැනුමක් හා මිනිස් සංස්කෘතියක් ඇති උපකරණ මෙන් වූහ.

**සුබ අස්න ලිවීමේ දී දේවානුභාවයේ පියවර තුනක් අපි හඳුනා ගනිමු.**

**පළමු පියවර** - ජේසුස් වහන්සේම දෙවියන් පිළිබඳ සත්‍යතාව තම අපෝස්තුළුවරුන්ට එළිදරව් කළ සේක. උන්වහන්සේ උපමා හා දේශනා මගින් විශ්වාස කළ යුතු හා අභ්‍යාස කළ යුතු දෑ ඉගැන්වූ සේක. තව ද ක්‍රියා මගින් ගැලවීම යනු කුමක් ද කියා පෙන්වූ සේක. තම ගෝලයින්ට ද මේ ගැලවීම සැම තැනකම දේශනා කිරීමට නියෝග කළ සේක.

**දෙවන පියවර** - ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් හා ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමෙන් පසු ශ්‍රාවකයෝ ඒ නියෝග ඉටු කළහ. තම දේශනා, ආදර්ශ හා උපදේශ මගින් ගුරුතුමාගේ ඉගැන්වීම් හා ක්‍රියා තව පරම්පරාවකට විශ්වාසීව ප්‍රදානය කිරීමට ශුද්ධාත්මයාණෝ අපෝස්තුළුවරුන්ට ආධාර කළහ. මෙම පියවරට අපෝස්තුළුවරුන්ගේ සම්ප්‍රදාය කියා කියමු (**Apostolic Tradition**).

**තෙවන පියවර** - මේ ශුද්ධාවත් ශ්‍රාවකයින් විසින් අපෝස්තුළුවරුන්ගේ දේශන ලේඛනගත කරන ලදී. පළමුව ගැලපෙන කොටස් එකට එකතු කරන ලදී. දෙවනුව ජේසුස් වහන්සේගේ පණිවුඩයේ වඩා සම්පූර්ණ සැකසුමක් පිළියෙල කරන ලදී. ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න ලිවීමේ දී, ශුද්ධාත්මයාණන් වහන්සේ ලේඛකවරුන් හතරදෙනාට මඟ පෙන්වූ සේක. දේවානුභාවය ඇත්තේ අවසාන කෘත්‍යයේ පමණක් නොව, එම අවසාන හැඩය ගැනීමට කලින් කොටස් වශයෙන් වේවා එයට සහභාගි වූ සැමදෙනාත් දේවනුභාවය ඇතිව ක්‍රියා කළෝ ය.

සැ.යු.

1) මෙම පියවර තුනේම ශුද්ධාත්මයාණන් ක්‍රියා කළ සේක.

I. ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් අවබෝධ කරගන්නට අපෝස්තුළුවරුන්ට උදව් වූ සේක.
II. එම අවබෝධ කරගත් දෑ විශ්වාසීව ප්‍රකාශ කිරීමට මුල් සභාවට මඟ පෙන්වූ සේක.
III. එම පණිවිඩය ලේඛනගත කිරීමේ දී සුවිශේෂකවරුන්ට ආධාර වූ සේක. සුබ අස්න ලිවීමේදී සැම පියවරකදීම දේවානුභාවය තිබිණ.

2) සභාවේ ඉගැන්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සුවිශේෂ හතර බිහිවිය. එම නිසා සුවිශේෂකවරු තමන්ගේ පෞද්ගලික මත නොලිවුවෝ ය. එබැවින් ඔවුන් ලේඛනගත කළේ සභාවේ නියෝජිතයන් ලෙස ය. තවද සභාවෙන් ම ලබා ගත් සුබාරංචියයි.

3) දේව ප්‍රකාශනය පිළිබඳ දෙවන වතිකානු සම්මන්ත්‍රණයේ අංක 7හි මෙලෙස සඳහන් වේ. "ජේසුස් වහන්සේ ........ මේ සුවිශේෂ සම්පූර්ණ කර තමන් වහන්සේගේ මුඛයෙන්ම එය පතුරුවා හැරිය සේක. සුවිශේෂ පතළ කිරීමට අණ ලැබූ අපෝස්තුළුවරු ක්‍රිස්තුන් වහන්සේගේ මුඛයෙන් ම, උන්වහන්සේ සමග ජීවත් වීමෙන් ද, උන්වහන්සේගේ ක්‍රියා වලින් ද, ස්ප්‍රීතු සාන්තු වහන්සේගේ පෙළඹවීමෙන් ද, ඉගෙන ගත් දේ වාචික දේශනයෙන් හා ආදර්ශයෙන් ද, ව්‍යවස්ථා මගින් ද, විශ්වාසවන්ත ලෙස පතුරුවා හැරියෝ ය. එපමණක් නොව, ඇතැම් අපෝස්තුළුවරු ද අපෝස්තුළුවරුන්ගේ කාලයෙහි ජීවත්ව සිටි තවත් ඇතැම් අය ද ස්ප්‍රීතු සාන්තු වහන්සේගේ ආනුභාවයෙන් පොළඹවන ලදුව ගැලවීමේ පණිවිඩය ලේඛනගත කළෝ ය."

## 3.9. මාක් සුබාරංචිය හැඳින්වීමක්

1. **නම**

ක්‍රියාපොතේ 12:12, 25 සඳහන් වන ජොහන්, මාර්ක් මෙම සුවිශේෂයේ කර්තෘ බව පිළිගෙන තිබේ. ඔවුන් ජොහාන් යන ජුදා නාමයෙන් ද, මාර්ක් යන ග්‍රීක ලතින් නමක් ද ඇති බැවින් ඔහු ග්‍රීක බස කථා කළ ජෙරුසලමෙට අයිති ජුදා ජාතිකයෙක් විය යුතු ය. 'ජොහන්' යන්නෙන් අදහස් වනුයේ 'යාවේ' (ස්වාමින් වහන්ස) ත්‍යාගශීලිය යනුයි. 'මාර්ක්' ප්‍රසිද්ධ රෝම නමක් වන මාකස් ය.

2. **කර්තෘත්වය**

මාර්ක් වනාහි පේදුරු තුමාගේ ගෝලයෙකි. පේදුරු තුමාගේ දේශනා තමා මතක තබා ගත් පමණටම ඔහු ලේඛන ගත කළේ ය. මාර්ක් ක්‍රිස්තුන් වහන්සේට සවන් දී නැත. උන්වහන්සේව ආශ්‍රයකර නොමැත. පේදුරු තුමා තම ශ්‍රාවකයින්ගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි දේශනා කළේ ය. මාර්ක් තුමා ඒවා සටහන් කළ විට තමාගේ මතකයේ තිබූ දෑ නිවැරදිව ද අංග සම්පූර්ණව ද ලියූ බව ක්‍රි.වර්ෂ 130 විසූ හියෙරෝපොලිස් හි රදගුරු පපියාස් සාක්ෂි දරයි.

එලෙසම 150-215 ඇලෙක්සැන්ද්‍රියාවේ විසූ ක්ලෙමන්ට් ද 160-240 විසූ ටර්ටුලියන්ද, 186-254 විසූ ඔරිජින් ද සනාථ කරයි. ඔවුන් කියන පරිදි දේශනය අසා සත්‍යමගම වැළඳ ගත්, රෝමයේ වැසියෝ එම දේශනා ලියන මෙන් මාර්ක්ගෙන් ඉල්ලා සිටිය හ. එම ඉල්ලීම හි ප්‍රතිඵලයක් වශයෙන් එතුමාගේ සුබ අස්න බිහිවිය.

**3. කර්තෘගේ ජීවිතය**

ජොහන්ට (ක්‍රියා 13:5) ජොහන් මාර්ක් කියා ද කියනු ලැබේ. (ක්‍රියා 12:12, 25:37) ඔහු බර්ණබස්ගේ මස්සිනා ය. (කොලොස්සි 4:10) ඔහු බර්ණබස් මෙන්ම ලෙවියෙක්ද විය. ඔහුගේ නිවස සයිප්‍රස් හි විය හැක. (ක්‍රියා 4:36) බාලකාලයේ දී ඔහු පලස්තීනයේ නොසිටි බැවින් ක්‍රිස්තුන් වහන්සේට සවන් දී නැතැයි පපියෙස් කියයි. පසු කාලයේ දී මෙම පවුල ජෙරුසලෙමට පැමිණ, එහිදී බර්ණබස් ක්‍රිස්තු ධර්මය වැළඳ ගති. ඔහු සතු කෙතක් විකුණා එයින් ලද මුදල ප්‍රේරිතයන් පාමුල තැබිය. (ක්‍රියා 4:36-37)

ක්‍රි.ව. 38 දී පමණ මාර්ක් පේදුරු තුමාගේ දේශන අසා ධර්මය වැළඳ ගන්නට ඇත. 1 පේදුරු 5:13 පේදුරුතුමා 'මාගේ පුත්‍ර මාර්ක්' කියා සඳහන් කිරීමෙන් මේ බව සනාථ වේ. මේ පවුල ශුද්ධවත් කිතුනු පවුලක් බවත්, (ක්‍රියා 9:27) මාර්ක්ගේ මව වන මරියා ඇගේ නිවස මුල් කිතුනුවන්ට රැස්විය හැකි ස්ථානයක් කළ බවත්. පේදුරු තුමා සිරගෙයින් නිදහස් වූ විට කෙළින් ම මේ ගෙදරට පැමිණි බවත් සඳහන් වේ. (ක්‍රියා 12:12-17)

ක්‍රි.ව. 45-49 බර්ණබස් හා පාවුළු විසින් මේ යුගයේදී උතුරු පලස්තීනයේ පිහිටි ඇන්ටියෝක්හි දූත මෙහෙවරක් අරඹන ලදී. මාර්ක් ජෙරුසෙලමෙන් ඇන්ටියෝක් නුවරට ගිය බව පැහැදිලි වේ. (ක්‍රියා 12:25). පසුව බර්ණබස් හා පාවුළු (රදගුරු) තිල ලබා සයිප්‍රස් දූපතට ගියහ. (ක්‍රියා 13:1-5) ඉන්පසු සයිප්‍රසයෙන් පිටත්ව (සුළු ආසියාවේ) පම්පිලියේ පර්ගාවට ගියහ. එහිදී යම් හේතුවක් නිසා (පවුලේ ප්‍රශ්නයක් හෝ සේවයේ දුෂ්කරතාවයක් මත හෝ) මාර්ක් වෙන්ව ජෙරුසලමට ගියේ ය. (ක්‍රියා 13:13) මෙම වෙන්වීම පාවුළුට නුරුස්සන ක්‍රියාවක් විය. එම නිසා පසුව තව දූත ගමනක් යාමට සැලසුම් යොදන විට මාර්ක් කැටුව යාමට පාවුළු අකමැති විය. එහෙත් ඔහුව කැඳවාගෙන යා යුතු යයි බර්ණබස් කියා සිටියේය. මෙයින් ඇතිවූ මතභේදය නිසා ගමන් දෙකක් සංවිධානය කරන ලදී. පාවුළු හා සීලස් සුළු ආසියාවට ද, බර්ණබස් මාර්ක් කැටුව සයිප්‍රසයට ද ගියහ. (ක්‍රියා 15:36-41)

ක්‍රි.ව. 60 සිට මාර්ක් ගැන අපට දැනගැනීමට ඇති කරුණු ඉතා අල්ප ය. පසුකාලයේ දී ඔහු පේදුරු තුමාට උදව් වූ බවත් 2 පේදුරු 5:13 හි සඳහන් වේ. (මෙහි බැබිලෝනියේ සභාව යන්නෙන් අදහස් වන්නේ රෝමයේ සභාවය).

ක්‍රි.ව. 61-63 මේ යුගයේ දී පාවුළු තුමාව රෝමයෙදී සිරගත කරන ලදී. එතුමාට මාර්ක් තුමා සහාය වෙමින් සිටි බවත් කොලොස්සි 4:10 ත්, පිලෙමොන් 24 ත් සඳහන් වේ. ක්‍රි.ව. 64 වසරේදී රෝමයේ දී මාර්ක්තුමා තම සුබ අස් ලියන්නට ඇත. ක්‍රි.ව. 66-67 නිරෝ සභාවට එරෙහිව කළාවූ පීඩනයේදී පේදුරු තුමා මිය යන්නට ඇත. පාවුළු තුමා දෙවන වරට රෝමයේ සිරගත විය. මේ කාලයේදී සුළු ආසියාවේ එපීසියෙ හි රදගුරු වූ තිමොති ට ශු. පාවුළු තුමා ලියන ලද දෙවන ලිපියේ ලූක් පමණක් තමා සමඟ සිටින බවත්, මාර්ක් ඔබ සමඟ කැඳවාගෙන එන්න කියාත් සඳහන් කරයි. මෙයින් හෙළිවන්නේ මාර්ක් තුමා මේ කාලයේදී සුළු ආසියාවේ දූත මෙහෙයක යෙදී සිටි බවයි. එතුමා පිළිබඳ අපට දැන ගැනීමට ඇති අවසාන සාක්ෂිය මෙය වේ.

(මාර්ක් 14:51,52 - නග්නව ගෙත්සෙමනි උයනෙන් පලා ගිය තරුණයෙකු ගැන කියැවේ. මොහු මාර්ක් තුමා යයි සමහර කියති. නමුත් ඉහත සඳහන් කරුණු අනුව එය පිළිගත නොහැක.)

**සැ.යු.**

මාර්ක් තුමාගේ පවුලේ අය ජෙරුසෙලමේ මුල් කිතුනුවන් වූ බැවින් ස්වාමින් වහන්සේගේ දේශනා හා ක්‍රියා ගැන සැහෙන අවබෝධයක් ඔවුන්ට තිබෙන්නට ඇත.

බර්ණබස්, පේදුරු හා පාවුළු යන ප්‍රධාන අපොස්තුළුවරුන්ගේ ආශ්‍රයෙන් අවුරුදු 20 කට වැඩි කාලයක් සිටි බැවින්, මාර්ක් තුමා මුල් සභාවේ කිතුනු ධර්මය පිළිබඳ මනා දැනුමක් ලබා ඉන්නට ඇත. මේ හේතුන් නිසා එතුමාගේ සාක්ෂිය සත්‍ය බව පිළිගත හැකි වේ.

**4. සුබ අස්නේ සැකසුම**

ක්‍රිස්තුන් වහන්සේගේ දූත මෙහෙය සිදුවූ ස්ථාන අළලා මාර්ක් තුමා සුබ අස්න යම් භූගෝලීය රාමුවක් තුළ ලියා ඇති බව පැහැදිලි ය.

පහත සඳහන් බෙදීම් සැමදෙනා ම පාහේ පිළිගත් එකකි.

පෙරවදන - මාර්ක් 1:1:13
ස්නාවක ජුවාම් තුමාගේ දේශනය -1:1-8

ජේසුස් වහන්සේගේ බෞතිස්මය හා පරීක්ෂා 1:9-13 මාර්ක් 1:14-66 ගලීලයේ සේවාව

- අපෝසතුළුවරුන් කැඳවීම
- ප්‍රථම ප්‍රාතිහාර්යයන්
- පරිසිවරුන්ගේ පළමු විරෝධය, ප්‍රථම ඉගැන්වීම
- නාසරතයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබීම (6:1-6)
- ජේසුස් වහන්සේගේ අපෝස්තලික ගමන් - මාර්ක් 6:6-10:52
- දොළොස්දෙනාව යැවීම 6:7-12
- ගලීලය මැදින් යාම 6:31-7:23
- තෙවන ගමන 7:28-8:12
- හතරවන ගමන 8:13-9:50
- ජෙරුසලෙම්හි දේශනා කිරීම 11:1-13:37
- දුක්ප්‍රාප්තිය 14:1-15:47
- ස්වාමීන් වහන්සේගේ උත්ථානය - මාර්ක් 16:1-8
- දර්ශනය වීම හා අවසාන උපදෙස්

මාර්ක් 16:19-20 අවසාන වගන්ති, මේ වගන්ති සමහර විට මාර්ක් තුමාගේ කර්තෘත්වය යටතේ නොවේ. එනමුත් දේවානුභාවයෙන් ලියැවිණැයි සම්මතයක් ඇත.
සැ.යු. ස්වාමීන් වහන්සේ සෑම දූත ගමනක් ආරම්භයේදී ම යොදා ඇති වාක්‍යයන් හි විශේෂත්වයක් ඇත. (මාර්ක් 1:14, 6:6,3 7:24 8:13 10:1)

**5. පේදුරුතුමා දැරූ සාක්ෂි**

මාර්ක්තුමා ලියූ සුබ අස්නේ විශේෂත්වයක් ඇත. එනම් ක්‍රිස්තුන් වහන්සේ විසින් ම ප්‍රධාන ගෝලයා වශයෙන් පත් කළා වූ පේදුරුතුමා, ජේසුතුමන් ගැන දැරූ සාක්ෂියයි. මෙම සාක්ෂි දැරීම විවිධ මාර්ගවලින් ප්‍රකාශිත වේ.

**අ) පළමුවරට පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේ හමුවූ අවස්ථාව**

| | |
|---|---|
| 1:16-18 | - පේදුරුතුමාව ක්‍රිස්තුන් වහන්සේ කැඳවීම. |
| 1:21-22 | - කපර්ණාවුමට පැමිණ අධිකාරී බලය ඇත්තෙකු මෙන් අනුශාසනා කිරීම. |
| 1:23-28 | - අශුද්ධාත්මයක් ආවේශ වූ මිනිසා සුව කිරීම. |
| 1:29-32 | - පේදුරුගේ ගෙදර නතර වීම. |
| 1:32-34 | - එදින බොහෝ දෙනෙකු සුව කිරීම. |
| 1:35 | - ජේසුස් වහන්සේගේ යාච්ඤාවේ ජීවිතය. |
| 1:36-39 | - දේශනා කරමින් නා යකුන් දුරු කරමින් අන් නගරවල සැරිසැරූ ආකාරය. |

ඉහත සඳහන් සිද්ධීන් මාර්ක්තුමාගේ මතකයේ බලවත් ව සටහන් වන්නට ඇත. මේවා ගැන එතුමා ඉතා උසස් උද්යෝගයකින් දේශනා කරන්නට ඇත.

**ආ) සමහර සිද්ධීන් තුළ පේදුරු තුමා ලත් අත්දකීම්**

ශ්‍රාවකයින් දොළොස්දෙනා අතරින් පේදුරු තුමා මුල්තැන දරයි. (3:16) මතු කියැවෙන සිද්ධීන් හීදී ජාකොබ් හා ජුවාම් සමග පේදුරු ද, ජේසුස්වහන්සේ සමග කිට්ටුවෙන් ආශ්‍රය කළේ ය.

| | |
|---|---|
| 5:37 | - ජායිරස්ගේ දියණිය මළවුන්ගෙන් නැගිටුවීම. |
| 9:2 | - අන්‍යරූපි විලාශවීම. |
| 13:3 | - අනාගතය පිළිබඳ දේශනා දෙන අවස්ථාව |
| 14:33-37 | - ගෙත්සෙමෙනෙහි යාච්ඤාව |

සියැසින් දුටු කෙනෙක් හැර අන් කෙනෙකුට මේවා දේශනා කළ නොහැකි ය. තවද පේදුරුතුමා මේවා ගැන වඩා ප්‍රාණවත් ආකාරයකින් අපොන්තුළුවරුන්ගේ යුගයේ දී දේශනා කරන්නට ඇත.

**ඉ) පේදුරුතුමා ක්‍රිස්තුන් වහන්සේට ආමන්ත්‍රණය කළාවූ වචන**

පේදුරු තුමා තම ස්වාමීන් වන ක්‍රිස්තුන් වහන්සේට කළ යම් යම් ශ්‍රේෂ්ඨ ප්‍රකාශන කිහිපයක් මාර්ක් තුමා අපට දී ඇත.

- මා කවරෙක් කියා ඔබ කියන්නෙහි ද ? යන ප්‍රශ්නයට පේදුරු තුමා, "ඔබ ක්‍රිස්තුස්" ය කියා පිළිතුරු දුන්නේය. (8:29).

  (ක්‍රිස්තුස් යන ග්‍රීක වචනයේ අර්ථය ආලේප කළ තැනැත්තා ය. හීබෘ භාෂාවෙන් එය මෙසායා නොහොත් මෙසියස් යයි නම් විය. එබැවින් පේදුරු තුමා, "ඔබ මෙසියස්" යයි ප්‍රකාශ කරන්නට ඇත.)

- රූප විපර්යාසයේ දී "ගුරු දේවයිනි අපට මෙහි සිටීමට ලැබීම මහත් වාසනාවකි. අපි මණ්ඩප තුනක් සාදමු" (9:5).
- ස්වර්ග රාජ්‍ය සඳහා හිස්වීම පිළිබඳව පේදුරුතුමා කතාකරමින් "බලන්න අපි සියල්ල හැර දමා ඔබ අනුව ආවෙමු". (10:28)
- වියළී අත්තික්කා ගස දුටු පේදුරු "ගුරු දේවයිනි බලන්න! ඔබ සාප කළ අත්තික්කා ගස වියළී තිබේ." (11:21).
- (මෙම කියමන ශ්‍රාවකයන් සැමදෙනාට ම පොදු එකක් බව මතෙව් තුමා (12:20) කියතත් මාර්ක් තුමාට නම් එය පේදුරු තුමාගේ ම කියමනකි.)
- අන්තිම රාත්‍රී භෝජනයේ දී පේදුරුතුමා කතාකොට, අන් හැම දෙනාම පැකිළුණාත් මම නම් එසේ නොවන්නෙමි. (14:29).

**ඒ) පේදුරුතුමා තුමාගේ වැරදි පිළිගැනීම**

පේදුරුතුමාගේ ම සාක්ෂියක් තවත් ආකාරයකින් මාර්ක් තුමාගේ සුවිශේෂයේ සඳහන් වේ. එනම් තමන්ට ම ප්‍රශංසාව ගෙන දෙන සමහර සිද්ධීන් පේදුරු තුමා ප්‍රකාශ කර නොමැත. එබැවින් ජලය මත ඇවිදීම වැනි දෙයක් (මතෙව් තුමා 14:28:31) සඳහන් කරන අතර, මාර්ක් තුමා සඳහන් නොකරයි. ඒ වෙනුවට පේදුරු තුමාගේ දුර්වලකම් හුවා දක්වා ඇත. පේදුරුතුමාට තරවටු කිරීම (මාර්ක් 8:32-33) පේදුරුගේ අපලාපය විස්තර සහිතව සඳහන් කිරීම (මාර්ක් 14:66-72) යනාදිය මෙහිදී උදාහරණ වශයෙන් ගත හැකි ය.

සැ.යු : ඉහත සඳහන් කරුණු සියල්ල ම පේදුරු තුමාගේ ජීවිත අත්දැකීම් කොතෙක් දුරට තමාගේ දේශනවලට ඇතුළු වූයේ දැයි පැහැදිලි වේ. එමෙන් ම ඒවා තුළින් මාර්ක්තුමා ජේසුස් වහන්සේගේ ජීවිතය අපට හඳුන්වා දෙන බව ද අපි පිළිගත යුත්තෙමු.

**6. සුවිශේෂක මාර්ක් ඉදිරිපත් කරන ක්‍රිස්තුන් වහන්සේ**

ප්‍රධාන පියවර දෙකකින් මාර්ක් ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වා දෙයි. මේ පියවර දෙක අතර පේදුරුතුමාගේ ජීවිතය ඉතා වැදගත් සිද්ධියක් වේ. පහත සඳහන් වන්නේ මේ කරුණු තුනයි.

**I. පළමු පියවර ක්‍රිස්තුන්වහන්සේ පිළිබඳ විස්මිත වීම.**

මෙහිදී ක්‍රිස්තුන් වහන්සේ කවුද යන්න ජනයා නොදනිති. උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ගැන ඔවුහු මවිත වූහ. උන්වහන්සේ ද තමා මෙසියස් නොහොත් ක්‍රිස්තුන් වහන්සේ බව එළිදරව් නොකරන සේක. උන්වහන්සේව හඳුනා ගත් අයට පවා එය ප්‍රචාරය නොකරන ලෙස තරයේ කියා සිටී.

**විශ්මිත වීම පිළිබඳ උදාහරණ:**

- **1:22** අනුශාසනාව ගැන ඔවුහු විස්මිත වූහ.
- **1:27** ඒ දුටු සියල්ලෝ ම මවිත වී ....
- **2:12** ....... සියල්ලෝ ම විස්මිතව, මෙවැන්නක් අප කවරදාවත් දැක නැත.
- **4:41** ඔවුහු මහත් භීතියකින් ඇළලී මේ කවරෙක් ද ? ...... කීහ.
- **5:20** යක්ෂාවේෂ වූ මිනිසාගේ සුවය ඇසූ සියල්ලෝම විස්මිත වූහ.
- **7:37** එය ඇසුවෝ අතිශයින් මවිතව උන්වහන්සේ ගොළුවන්ට බිණීම ද පවා සලසා දෙති යි කීහ.

**තමාගේ අනන්‍යතාවය හෙළි නොකිරීමට අණ:**

- **1:43** කුෂ්ඨ රෝගයෙන් සුව වූ මිනිසාට "කිසිවකුට කිසිවක් නොකියන ලෙස වග බලා ගන්න" යි අණ දුන් සේක.
- **3:11-12** තමා කවරෙක්දැයි හෙළි නොකරන ලෙස . . . . අණකළ සේක.
- **7:36** ඒ බව කිසිවෙකුට නොකියන්නට අන දුන් සේක.
- **8:26** බෙත්සයිදාවේ අන්ධයාට ගමට ඇතුළුවන්නට එපා යයි කී සේක.

සැ.යු. ජුදෙව්වන් බලාපොරොත්තුව සිටියේ දේශපාලන ගැළවුම්කරුවෙකු නොහොත් මෙසියස් කෙනෙකි. එබැවින් තමාගේ ධර්මය දේශපාලන මතයක් ලෙස ඔවුන් වටහා නොගැනීම ක්‍රිස්තුන් වහන්සේට වැදගත් විය. ජනතාවගේ ආධ්‍යාත්මික සුබ සිද්ධියත් එයට ඉවහල් වන ආධ්‍යාත්මික පණිවිඩයත් නිසි ලෙස ඔවුන් අවබෝධ කරදීම උන්වහන්සේගේ පළමු කාර්යය විය. ඉන්පසු පමණක් තමාගේ අනන්‍යතාවය උන්වහන්සේ ප්‍රකාශ කළ සේක.

**II. පේදුරු ඇතුළු ගෝලයන්ගේ ආකල්ප තුළ වෙනසක් ඇති වූ අවස්ථා**

මෙවන් වෙනසක් උන්වහන්සේ ඇති කරන්නේ පේදුරු ඇතුළු ගෝල පිරිස සමඟ සාකච්ඡාවක් ආරම්භ කරමිනි. එවන් සාකච්ඡාවකට මුල පිරීම ප්‍රශ්නයකි. මිනිස්සු මා කවරෙක්දැයි කියා කියත් ද? කියා ඇසූ විට විවිධ පිළිතුරු ලැබුනායින් පසු තම ශ්‍රාවකයන්ට උන්වහන්සේ ගැන සිතන්නට දෙවන ප්‍රශ්නය යොමු කරයි. මා කවරක්දැයි

ඔබ කියන්නහුද? මෙයට පිළිතුරු දුන්නේ පේදුරු ය. "ඔබ ක්‍රිස්තුස්ම ය" මෙලෙස තමාගේ අනන්‍යතාවය ගැන ප්‍රකාශනයක් ගෝලයන්ගෙන් ම ලබා ගන්නා සිද්ධිය මාර්ක් 8:27-30 හි සඳහන් වේ.

මෙවැනි සිද්ධියක් පේදුරුතුමාගේ මතකයේ කෙබඳු සටහනක් ඇති කරන්නට ඇතිදැයි සිතිය හැක. කෙසේ හෝ එම අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ තමා මෙසියස් බව ඒත්තු ගැන්වී ය. තව ද පේදුරු තුමාගේ ප්‍රකාශනය ස්ව ශක්තියෙන් ම කළා නොව එය දේව එළිදරව්වක් බව මතෙව් 16 :17 සඳහන් කරයි. ජේසුස් වහන්සේ දේශපාලන ගැලවුම්කරුවකු නොව ඊට වඩා හාත්පසින් ම වෙනස් මෙසියස් කෙනෙක් බව ශ්‍රාවකයෝ තේරුම් ගත්හ.

**III. දෙවන පියවර : තමා මනුෂ්‍ය පුත්‍රයාණන් බව ප්‍රකාශ කිරීම.**

මෙසියස් තුමාගේ දූත මෙහෙය සැබෑ ස්වභාවය කුමක්දැයි අවබෝධ කිරීමට ක්‍රිස්තුන් වහන්සේ භාවිතා කරන්නේ "මනුෂ්‍ය පුත්‍රයාණන්" යන විශේෂ නාමයයි. (මනුෂ්‍ය පුත්‍රයාණන්ට අරමයික් බසින් කියැවෙන්නේ බාර් එනොෂ් කියා ය) දිවැසිවර දානියෙල්ගේ පොතෙහි 7:13 මෙතුමා ගැන සඳහන් වේ. නමුත් එහි සඳහන් මනුෂ්‍ය පුත්‍රයා අහසේ වළාකුළු පිරිවරා එන පාලන බලය ද ගෞරවය ද, රාජ්‍යය ද ඇති කෙනෙකි. නමුත් ක්‍රිස්තුන් වහන්සේ අදහස් කරන මනුෂ්‍ය පුත්‍රයා බොහෝ දුක් විඳින ප්‍රතික්ෂේප කරනු ලබන මරනු ලබන නමුත් තෙදිනකට පසු උත්ථානවන කෙනෙකි. (මාර්ක් 8:31) මනුෂ්‍ය පුත්‍රයාණන්ට මෙවැනි අදහස් ක්‍රිස්තුන් වහන්සේ බද්ධ කරනුයේ දෙවන යෙසායා සඳහන් කරන දුක් විඳින දාසයා පිළිබඳ දිවැස් වැකියෙනි. (යෙසායා 52-53) මෙලෙස ක්‍රිස්තුන් වහන්සේ මනුෂ්‍ය පුත්‍රයා යන වචනය භාවිතා කරන විට එයට දානියලේගේ දිවැස් වැකියේ සඳහන්වන උත්කෘෂ්ඨතාවයත්, දෙවන යෙසායා අදහස් කරන දුක් විඳින දාසයාගේ ස්වාභාවයත් ඇතුළු කරයි. තව ද ක්‍රිස්තුන් වහන්සේ 'මනුෂ්‍ය පුත්‍රයා' යන නාමය තමා ගැන ම පමණක් භාවිතා කරයි. "මනුෂ්‍ය පුත්‍රයාණන් මහා බලපරාක්‍රමයෙන් ...... වඩිනු ඔවුහු දකිති" යි කියන විට අදහස් කරන්නේ "මම මහා බලපරාක්‍රමයෙන් ...... වඩිනු ඔවුහු දකිති" යනුයි.

පහත සඳහන් වගන්තිවලින් "මනුෂ්‍ය පුත්‍රයා" යන විරුදාවලිය තමාට ම යොදා ගනිමින් ක්‍රිස්තුන් වහන්සේ අදහස් කළේ කුමක් ද යන්න මාර්ක් තුමා පැහැදිලි කර දෙයි.

- 8:31 "මනුෂ්‍ය පුත්‍රයාණෝ බොහෝ දුක් විඳින්නත්...... ප්‍රතික්ෂේප කරනු ලබන්නටත්.... මරනු ලබන්නටත්..... නැවත නැගිටින්නටත් නියම බව"
- 8:38 "......... මනුෂ්‍ය පුත්‍රයාණෝ තේජසින් ශුද්ධ දූතයන් පිරිවරා වඩින කල උන්වහන්සේ ඔහු ගැනත් ලැජ්ජාවනු ඇත."
- 9:12 "......... මනුෂ්‍ය පුත්‍රයාණන් බොහෝ දුක් විඳින්නටත් නිග්‍රහ ලබන්නටත් නියමිත ය."
- 9:32 "......... මනුෂ්‍ය පුත්‍රයාණෝ මිනිසුන් අතට පාවා දෙනු ලැබෙති. ඔවුහු එතුමන් මරන්නොය. තෙදිනකින් නැවත නැගිටින්නාහ."
- 10:33 "බලව අපි ජෙරුසලෙමට යම්හ. මනුෂ්‍ය පුත්‍රයාණෝ නායක පූජකවරුන්ටත් විනයධරයින්ටත් පාවා දෙන සේක."

(මාර්ක් 10:45, 13:26, 14:41, 14:61-62 යන වගන්තිද කියවා බලන්න.)

මේ අනුව බලන කල මාර්ක් තුමා ක්‍රමිකව ක්‍රිස්තුන් වහන්සේව තම සුවිශේෂයෙන් හඳුන්වා දෙන බව ප්‍රත්‍යක්ෂ වේ. මෙම පියවර දෙක පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේගේ චරිතය ගැන කළාවූ භාවනාවක් විය හැකි ය. පළමුව ඔහු ක්‍රිස්තු චරිතයෙන් මවිත වන්නට ඇත. දෙවනුව ජේසුතුමා සැබෑ මෙසියස් බව වටහා ගන්නට ඇත. (වැදගත් ආධ්‍යාත්මික සිද්ධිය) පසුව තම ගුරු දේවයන්ගේ සැබෑ දූත මෙහෙය (ඉහත සඳහන් කළ මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ දූත මෙහෙය) ක්‍රම ක්‍රමයෙන් වටහා ගන්නට ඇත.

**7. ශු. මාර්ක් තුමාට විශේෂිත කොටස්**

සියළු සුබ අස්න අතරින් මාර්ක් ලියූ සුබ අස්න ඉතා කෙටි ය. එහි එතුමා මුල් තැන දුන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ වදන්වලට වඩා ක්‍රියාවන්ට ය. (අනෙකුත් සමදර්ශක සුවිශේෂයන් හි නැති කොටස් මෙහි ඉතා අඩු ය). මෙහි ඇති සෑම දෙයක් ම වාගේ අනිකුත් සමදර්ශක සුවිශේෂයන් හී සඳහන් වී ඇත. මෙහි පමණක් දැකිය හැකි සිද්ධීන් මෙසේ ය.

- 3:20-21 - ජේසු තුමාගේ නෑදැයින්ගේ කණස්සල්ල.
- 4:26-29 - වැඩෙන බීජය පිළිබඳ උපමාව.
- 7:31-37 - ගොළු බිහිරි මිනිසා සුව කිරීම.
- 8:22-26 - බෙත්සයිදාවේ අන්ධයාව සුව කිරීම.

- 14:51-52 - ගෙත්සමනියෙන් පලාගිය තරුණයා.

**8. මාර්ක්තුමාගේ සුබ අස්නේ විශේෂ ලක්ෂණ**

අ) අන් සුවිශේෂකවරු සඳහන් කරන දෑ මාර්ක් තුමා සඳහන් කළත් එතුමා එය වඩා විස්තර කර ඇත. මතෙව් 9:1-8 සහ මාර්ක් 2:1-12 සඳහන් කරන අංශභාග රෝගියා සුව කිරීමේ කතාන්තරය අපි කලින් සංසන්දනය කළෙමු. තවත් අවස්ථා කිහිපයක දී මාර්ක් තුමා අපට වැඩිපුර කරුණු සපයයි.

- චණ්ඩ මාරුතය හමන විට ජේසු තුමා "ඔරුවේ අවරයෙහි මෙත්තය මත" හුන් බව (මාර්ක් 4:38 මතෙව් 8:24, ලූක් 8:23)
- ජාකොබ්ට හා ජුවාම් ට "ගර්ජනා පුත්‍රයෝ" කියා කියනු ලැබීම (මාර්ක් 3:17, මතෙව් 10:2 ලූක් 6:14).
- ජෙරිකෝවේ අන්ධයාට "බර්තිමේයස්" යන නම ඇති බව (මාර්ක් 10:46, මතෙව් 20:20, ලූක් 18:35)
- වියලි අත ඇති මිනිසා සුව කිරීමේ දී ක්‍රිස්තුන් වහන්සේ "උදහසින් වටේ බැලූ වග" (මාර්ක් 3:5, මතෙව් 12:11, ලූක් 6:9)
- ළදරුවන් ආශිර්වාද කිරීමේදී ඔවුන් වඩාගෙන ඔවුන්පිට අත් තබා ඔවුන්ට ආශිර්වාද කළ පුවත (මාර්ක් 10:31-16, මතෙව් 19:13-16, ලූක් 13:15-17)

ආ) ශු.මාර්ක් තුමා සුවිශේෂය ලියන්නේ කුඩා දරුවෙක් කථාන්තරයක් කියන්නාක් මෙනි. (එකෙනෙහි ම "එවිට", "තවද" වැනි වචන භාවිතා කරමින් නොනවත්වා කීමේ ආශාවක් දක්වයි.

ඉ) ජේසුතුමාගේ ජීවිතයේ මානුෂික අංශය වඩා හුවා දක්වයි. මෙම අදහස එතුමාගේ සුබ අස්නේ කොපමණ කැපී පෙනෙනවා ද කිවහොත් මාර්ක් තුමාට පසුව ලියන සුවිශේෂකවරු එතුමා ලියූ දෑ ලිවීමට බියෙන් මෙන් එම කොටස් ලිවීමේදී යම් යම් වෙනස්කම් කර ඇත. උදාහරණ ලෙස, මාර්ක්ට ජේසු තුමා හුදෙක් "වඩුවා" ය. (6:3). මතෙව් "වඩුවාගේ පුතා" ය (මතෙව් 13:55) , ජේසුතුමාව පරීක්ෂා කිරීමේදී "ආත්මයාණෝ උන්වහන්සේව පාළුකරයට පලවා ලූ සේක." කියා මාර්ක් කියයි. (1:12) නමුත් මතෙව් හා ලූක් එම වචනය මදක් සෞම්‍යාකාරයෙන් දක්වමින් "පමුණුවනු ලැබූසේක" (මතෙව් 4:1) "ගෙනයනු ලැබූ සේක" (ලූක් 4:1) කියා සඳහන් කරයි.

මාර්ක් තුමා මෙන් අන් කිසිවෙක් ජේසුස් වහන්සේගේ චිත්තවේගය සඳහන් නොකරයි "සුසුම් ලා," (7:34, 8:12) අනුකම්පාව දක්වා (6:34) උදහසක්, තරවටු කිරීමක්, අමනාපවීමක් (3:5, 8:33, 10:14) සඳහන් කරන අතර ආදරයත් (10:21) අනුකම්පාවත් (6:34) ඇත්තාසේ ම අනුන්ගේ කුසගින්නත් දුබලකමත් තේරුම් ගන්නා (8:2-3) අප වගේ ම පුද්ගලයෙක් ලෙස මාර්ක් තුමා ක්‍රිස්තුන් වහන්සේව ඉදිරිපත් කරයි.

## 3.10. මතෙව් සුබාරංචියට හැඳින්වීමක්

**1. නම**

මතෙව් 9:9:13 දක්වා සඳහන් රේගු පොළේ සිටි මිනිසා මතෙව්ස් බවට සැකයක් නැත. මාර්ක් 2:13-17 සහ ලූක් 5:27-32 අනුව ඔහුගේ නම ලෙවිය. සිමොන්ගේ නම පේදුරු බවට වෙනස් කළා සේ ම ලෙවිගේ නමද වෙනස් වන්නට ඇත. හීබෘ බසින් "මතිත්යාහු" හෝ "මත්තන්යාහු" (දෙවියන්ගෙන් තිළිණය) යන වචනවල කෙටි නම වූ හීබෘ මත්තායි යන්නෙහි ග්‍රීක් පරිවර්තනය "මත්තසිඕස්" වේ.

**2. කර්තෘත්වය**

**අ) බාහිර සාක්ෂි**

අපෝස්තුළු මතෙව් ජේසුස් වහන්සේගේ දේශන ඇරමයික් බසින් ලියුවේ යයි 'හියෙරෝපොලිස්' හි රදගුරු පාපියාස් (130) සඳහන් කරයි.

ශු. ඉරේනියස් මුනිතුමා (ක්‍රි.ව. 180) මෙලෙස කියයි. "ශු. මතෙව් තුමා පලස්තිනයේ ජුදෙව්වන් අතර දේශනා කළෝ ය. පේදුරු හා පාවුළු රෝමයේ දේශනාකර සභාව එහි පිහිටුවන කාලයේදී ශු. මතෙව් තුමා ඔවුන්ගේ (ජුදෙව්වන්ගේ) භාෂාවෙන් සුබ අස්නක් ලිව්වේ ය."

ටර්ටුලියන් (160-240) ඇලෙක්සැන්ද්‍රියාවේ ක්ලෙමන්ට් (150-215) ඔරිගන් (186-254) පැන්ටාවෙයුස් (200), සෙකරියා හී අයුසේබියස් (265-340) හා තවත් මුල් සභාවේ පැරණි ගත්කරුවෝ කිහිපදෙනෙක් ම ශු. ඉරේනියස් මුනිතුමාගේ සාක්ෂිය සහතික කරති.

**ආ) අභ්‍යන්තර සාක්ෂි**

සුබ අස්න කියවීමේදී පහත සඳහන් කරුණු හෙළිදරව් වේ.

- මතෙව් ජේසුස් වහන්සේගේ සමීප ශ්‍රාවකයෙකි.
- ඔහුට පලස්තීනය ගැන මනා දැනුමක් ඇත.
- ජුදා චාරිත්‍ර වාරිත්‍ර ගැන පෞද්ගලික දැනුමක් ඇත.
- පුරාණ ගිවිසුම හොඳින් දැන සිටි දක්ෂ ගුරුවරයෙකි.

**3. දිනය**

ශු. ඉරේනියස් මුනිතුමා පමණක් දිනයකට ඉඟියාවක් ඇති කරයි. පේදුරු හා පාවුළු රෝමයේ සිටි කාලයේදී මතෙව් සුබ අස්න ලිව්වේ යැයි කියයි. ඒ නිසා එතුමාගේ මතය අනුව සුවිශේෂ ලියවිය යුත්තේ ක්‍රි.ව. 68 ට කලින් ය. නමුත් අභ්‍යන්තර ඔප්පු සාක්ෂි අනුව එය ජෙරුසලෙම් විනාශයට (ක්‍රි.ව. 70) පසු ලියවී ඇතැයි වැඩි දෙනෙකුගේ මතය වේ.

**4. ස්ථානය**

පලස්තීනයේ ජුදා චාරිත්‍ර වාරිත්‍ර අනුව ඒ පිළිබඳ මනා දැනුමක් ශු.මතෙව් තුමාට තිබූ බව පැහැදිලි වේ. සුබ අස්නේ සඳහන් වී ඇති භූමි ප්‍රදේශය වැඩි වශයෙන් ම ගලීලයයි. නමුත් එය ක්‍රි.වජ. 70 ට පසු ලිව්වා නම්, පලස්තීනයෙන් පිට ලියැවෙන්නට ඇත. වැඩි දෙනෙක් සිතන ආකාරයට සිරියාවේ ඇන්ටියොක් හී විය හැකි ය. මෙය ජුදා හා මිථ්‍යා ජාතීන් හමුවූ ස්ථානයකි. එමෙන් ම නීතිය හා සුබාරංචිය අතර සැහෙන ප්‍රශ්න මතුවූ ස්ථානයකි. (මේ පිළිබඳව ලූක්තුමාගේ ජීවිත කතාවේ පසුව සඳහන් වේ)

**5. සුබ අස්නේ පොදු සැකසුම**

මතෙව් තුමාට අවශ්‍ය වූයේ ක්‍රිස්තුන් වහන්සේ නව මෝසෙස් හා බලාපොරොත්තුව සිටි මෙසියස් ගුරුතුමාණන් ලෙස ඉදිරිපත් කිරීමයි. මේ හේතුව නිසා මෙතුමා සතු කරුණු ප්‍රධාන දේශන 5 ක් (මෝසස්ගේ පංච පුස්තකය මෙන්) වටා ගොතා ඇත. එයත් සමඟ ක්‍රිස්තු කතා වස්තුව ද ඉදිරිපත් කරයි.

**I. පෙරවදන - 1 :1 - 2:23**
**කථාන්තරය දේශනය**

- වංශාවලිය 1:1-17
- ජේසුස් වහන්සේගේ උපත 1:18-25
- ශාස්ත්‍රවන්තයිගේ පැමිණීම 2:1-12
- මිසරයට පලා යාම, ළදරු ඝාතනය 2:13-23

**II. පළමු පොත - රාජ්‍ය ප්‍රකාශ කිරීම - 3 :1-7 :27**

- සේවයේ ආරම්භය 3:1-4:25
- මහා මංගල දේශනාව 5, 1-7,29
- රාජ්‍යයේ ශුද්ධවන්තකම

**III. දෙවන පොත - ගලීල සේවය - 8 : 1-11:1**

- ක්‍රිස්තුන් වහන්සේගේ බලයත් ප්‍රේමයත් ප්‍රකාශ වන පෙළහර දසය 6:19:34
- ධර්ම දූත දේශනය රාජ්‍ය පතළ කිරීමේ දූත මෙහෙය 9:35-11:1

**IV. තෙවන පොත- විවාද හා උපමා 11:2-13:52**

- ජුදයින්ගේ අවිශ්වාසය හා විරෝධය 11:2-12:50
- රාජ්‍ය උපමා 13:1-52

**V. හතර වන පොත - ශ්‍රාවකයින්ගේ පුහුණුව - 13:52-18:35**

- ජෙරුසලම් ගමනට පෙර සිද්ධීන් 13:53-17:27
- සභාව පිළිබඳ දේශනය 18:1-35

**VI. පස්වන පොත - ජුදෙයාව හා ජෙරුසලෙම - 19:1-25:46**

ජෙරුසලම් ගමන හා එහි සිද්ධීන් - 19:1-23:39 ලෝකයේ අවසාන යුගය පිළිබඳ දේශනය 18:1-35

**VII. නව ගිවිසුමේ රාජ්‍ය ආරම්භ කිරීම සඳහා තම ජීවිතය පරිත්‍යාගය - 26:1-27:66**

**VIII. උත්ථානය හා රාජ්‍ය ආරම්භය - 28:1-20**

**සැ.යු.** සෑම දේශනයක් ම එක ම වාක්‍යයකින් අවසන් වේ. "මේ වචන කියා නිම කළ පසු" (7:28, 11:1, 3:53, 19:1 26:1)

6. **සුබ අස්නේ අරමුණු හා මූලික ධර්මය**

පුරාණ ගිවිසුමේ පොරොන්දුවන ලද මෙසියස් තුමා, ජේසු තුමා කියා පලස්තීනයේ ජුදෙව්වන්ට ඒත්තු ගැන්වීම ශු.මතෙව් තුමාගේ පරම අරමුණ විය. මෙය විවිධාකාරයෙන් එතුමා පෙන්නුම් කරයි.

i. **ජේසු තුමා දාවිත්ගේ පෙළපතින් එන්නෙකි.** (2 සාමුවෙල් 7:8-16, මතෙව් 1:1,6,17,20) එතුමාට දාවිත්ගේ පුත්‍රයා යයි කියනු ලැබේ. (මතෙව් 9:27, 12:23, 15:22 20:30-32, 21:9,15)

ii. **ජේසු තුමා නව මෝසස් ය.** (ද්වි 18-15-19) පරණ නීතිය සිනයි කන්දේ දී ප්‍රදානය කළාක් මෙන්, නව නීතිය කන්දක් මත දෙන ලදී (මතෙව් 5:1). පැරණි ව්‍යවස්ථාවලිය නව නීතියෙන් සම්පූර්ණ වේ (මතෙව් 5:17-20,21 සිට).
රූප විපර්යාසයේ දී පෙර ලකුණක් වූ මෝසස් ද දර්ශනය වේ. (මතෙව් 17:3-4) දික්කසාදය පිළිබඳ මෝසස්ගේ නීතිය ක්‍රිස්තුන් වහන්සේ අවලංගු කරන සේක (මතෙව් 19:3-9)

iii. **මෙසියස් තුමා පිළිබඳ දිවැසිවැකි ජේසු තුමා තුළ සම්පූර්ණ වේ.**

iv. **ජේසු තුමා දේව බලය ඇති මෙසියස් තුමාය.**

- දෙවියන් හා සම බව ද, විවිධාකාරයෙන් පෙන්නුම් කරයි.
- ජේසු තුමා දේව මන්දිරයට වඩාත් (12:6), ජෝනා හා සලමොන්ට වඩාත් (12:42). දාවිත්ට වඩාත් උතුම්ය. (22:46)
- දෙවියන්ට පමණක් කළ හැකි කුණාටුව නතර කිරීම (8:23-27, යායිරස්ගේ දියණිය උත්ථාන කිරීම (9:23-25) ප්‍රාතිහාර්ය කරයි ජේසුතුමා තම පුත්‍රයාණන් බවට පියාණන් වහන්සේ ම සාක්ෂි දරන සේක. (3:17, 17:5).
- පියාණන් වහන්සේ දන්නා සෑම දෙයම එතුමා ද දනියි (11:27) - සෑම මිනිසා ම බෞතිස්ම ස්නාපනය කිරීමේදී, ජේසු තුමා ද පියාණන් හා ශුද්ධාත්මයාණන් සමග එකම දෙවියෝ ය. (28:19)

v. **දේව රාජ්‍යය ජේසු තුමා ආරම්භ කළ සේක.**
නියම ජුදා සම්ප්‍රදාය අනුව "දේව" යන වචනය භාවිතා නොකර එයට "ස්වර්ග රාජ්‍යය" කියා කියනු ලැබේ. මෙම රාජ්‍යය පිළිබඳව දේශන පහේම සඳහන් වී ඇති අතර, එම රාජ්‍යයට ම අයිති වන අය සතු විය යුතු ධර්මතා ද ජේසු තුමා විස්තර කරයි.

**සැ.යු.**

1. ශු.මතෙව් තුමා 41 වතාවක් පුරාණ ගිවිසුම උපුටා දක්වයි. මෙයින් 21 වතාවක් ම මාර්ක් හා ලූක් ද සඳහන් කරයි 20 වතාවක් ම ශු. මතෙව් තුමා පමණක් සඳහන් කරයි. මෙම 20 න් දහයක් ම නව ගිවිසුමේ වෙන කිසියම් පොතක සඳහන් වී නොමැත.

2. උපුටා ගත් 41 න් 38 ක් "කිම ඉෂ්ට වන පිණිස ය" වැනි වගන්තියක් සඳහන් වේ. එයින් අදහස් කරන්නේ යම් සත්‍යතාවයක් පූර්ණත්වය කරා පැමිණීමක් විනා, කල් මත්තෙන් කියන ලද්දක් ඉටුවීම පමණක් ම නොවේ. (උදා: 1:22...මේ සියල්ල සිදුවූයේ..)

| **දිවසාවලිය** | | | **සුබ අස්න** |
|---|---|---|---|
| යෙසායා | 7:14 | කන්‍යාවකගෙන් ඉපදීම | මතෙව් 1:23-23 |
| හොසියා | 11:1 | මිසරයට පලා යාම | 2:15 |
| ජෙරමියා | 31:15 | ළදරු ඝාතනය | 2:18 |
| යෙසායා | 9:1-2 | ගලීලයේ සේවය | 4:15-16 |
| යෙසායා | 53:4 | සුව කිරීමේ ප්‍රාතිහාර්යයන් | 8:17 |
| යෙසායා | 42:1-4 | අප්‍රකට නායකත්වය | 12:17-21 |
| යෙසාය | 6:9-10 | සෙනගගේ අන්ධ බව | 13:17 |
| ගීතාවලිය | 78:2 | උපමා මගින් දේශනා කිරීම | 13:17 |
| යෙසායා | 62:11 | | |
| සෙකරියා | 9:9 | කොටළුවකු මත පැමිණීම | 21:4-5 |
| සෙකරියා | 11:12 | | |
| ජෙරමියා | 32:6-15 | ජුදාස්ගේ පාවා දීම | 27:9-10 |
| ජෙරමියා | 18:1-2 | | |

7. **ශු. මතෙව් තුමා පමණක් සඳහන් කරන කොටස්.**

අ) **ජේසු තුමාගේ ප්‍රසිද්ධ ජීවිතය පිළිබඳව**

9:27-31 - අන්ධයන් දෙදෙනෙක් සුව කිරීම
16:17-19 - පේදුරුතුමාට නායකත්වය පොරොන්දු වීම
17:24-28 - ජේසුස් වහන්සේ ගෙවූ බද්ද

27:3-10 - ජුදාස්ගේ දිවි නසා ගැනීම
27:62-66 - ජේසුතුමාගේ සොහොන රැකවල් කළ බල ඇණිය
1:2 - ජේසුස් වහන්සේගේ බාල කාලය පිළිබඳව
28:9-20 - උත්ථානය ගැන ඔප්පු සාක්ෂි සඳහන් වී ඇත

ආ) **උපමා**
5:14 - කන්දක් මත පිහිටි නුවර
7:6 - ඌරන් ඉදිරියේ මුතු ඇට විසි කිරීම
7:15 - බැටළු වෙස් ගත් වෘකයෝ
13:24-30 - තිරිඟු මැද වපුරන ලද කිරිඳි
13:44 - නිධානය සොයා ගත් මිනිසා
13:45-46 - මුතු ඇටය
13:47-48 - හොඳ හා නරක මසුන්ගෙන් පිරි දැල
13:52 - ගෘහ මූලිකයා හා ගබඩාව

18:23-35 - කමා නොවූ ණයකාරයා
20:1-16 - මිදි වත්තේ සේවකයෝ
21:28-31 - වැඩට කැමති අකැමැති පුතුන් දෙදෙනා
25:1-13 - යුවතියන් දස දෙනා
25:31-46 - යුවතියන් දස දෙනා

ඉ) **උපදේශ**
5:23-24 - යාගයට පෙර සමගි වීම
5:33-37 - දිවුරුම් පිළිබඳ ඉගැන්වීම
6:1-8, 16-18 - දන්දීම හා උපවාසය
11:28-30 - විය ගහ කරට ගැනීම
18:15-20 - සභාව තුළ අධිකාරී බලය
19:10-12 - බඹසර ජීවිතයේ අගය

8. **ශෛලිය**
ජේසුස් වහන්සේගේ ජීවිතයේ සිද්ධීන්ට වඩා ඉගැන්වීම් ගැන සැලකිල්ලක් මතෙව් තුමා මනාව දක්වයි. එතුමාගේ සුබඅස්නේ මුල්තැන දී ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේගේ දේශනා වලට ය. මේවාට පසුබිම සකස් කිරීම සඳහා පමණක් කථාන්තර කොටස් උපුටා ගන්නා ලදී.

ක්‍රිස්තුන් වහන්සේ විවිධ අවස්ථාවල කියූ කියමන් රාශියක් ඒකරාශී කර මතෙව් තුමා කන්ද උඩ දේශනාව ඉදිරිපත් කරයි. සිද්ධීන් ගැන සඳහන් කරන විට එතුමා කෙටියෙන් විස්තර කරන්නට උත්සාහ දරයි. නිදසුනක් ලෙස අංශභාග රෝගියා සුවකිරීම, මාර්ක් තුමා සවිස්තරව සඳහන් කරන අතර, (මාර්ක් 2:1-21), මතෙව් තුමා වගන්ති අටකින් කෙටියෙන් විස්තර කරයි. (මතෙව් 9:1-8) එම ප්‍රාතිහාර්යයේ විශාල පිරිසක් රැස්වූ බවත්, හතර දෙනෙක් රෝගියාව ගෙන ආ බවත්, ඔහුව පහතට බැස් වූ බවත් මතෙව් තුමා සඳහන් නොකරයි.

**එලෙස ම පහත සඳහන් සිද්ධීන් ද සසඳා බැලිය හැකි ය.**

| | |
|---|---|
| යායිරස්ගේ දියණිය සුවකිරීම | - මතෙව් 9:18-26 |
| ගෙරසීනයේ යක්ෂාවේශ වූවන් සුව කිරීම | - 9:28-34 |
| ස්නාවක ජුවාම් තුමාගේ මරණය | - 14:1-12 මාර්ක් 5:21-43 |
| අපස්මාර රෝගියා සුව කිරීම | - 17:-14-21 9:13-28 |
| ශ්‍රේෂ්ඨත ම ආඥාව පිළිබඳ ගැටළුව | - 22:34-40 12:28-34 |
| පාස්කු භෝජනය සූදානම් කිරීම | - 26:17-20, 14:12-17 |

ශු. මතෙව් තුමා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය පිළිබඳ සම්පූර්ණ දැනුමක් ඉදිරිපත් කරයි. නමුත් එතුමාගේ අවධානය සම්පූර්ණයෙන් ම යොමුවී ඇත්තේ, ක්‍රිස්තුන් වහන්සේ මුළු මිනිස් සංහතියේ ම ශ්‍රේෂ්ඨත ම ගුරුවරයා බව පෙන්නුම් කිරීමටයි. ශු. මතෙව් තුමා ජුදෙව් ජාතිකයනට ලියූ බැවින් ජුදෙව්වන්ගේ භාෂා විලාශය සුබ අස්න තුළ භාවිතා කරයි. ජුදෙව්වෝ දෙවියන් වහන්සේගේ නමට ගරු කළ බැවින් (ද්වි. 5-11) උන්වහන්සේගේ නාමය උච්චාරණය නොකරන සෑම අවස්ථාවකදී ම වෙන අයුරකින් උන්වහන්සේ ගැන කීවෝ ය. ශු. මතෙව් තුමා එවැනි භාෂා විලාෂයක් භාවිතා කළ බැවින් "දෙවියන්" යන වචනය යෙදෙන විට එතුමා "ස්වර්ගය" කියා ද (4:17, 7:11, 16:1, 21:25), පරාක්‍රමයාණෝ කියා ද (26:64) දේවත්වයෙන් වැඩම කර දෙවියන් වහන්සේගේ සිංහාසනයේ හිඳින බව කීමට "තේජශ්‍රීයෙන්" කියා ද, පැමිණෙන කළ තමන්ගේ මහිමාන්විත සිංහාසනයේ වැඩ හිඳින සේක (25:31) කියා ද, දෙවියන්ට ගෞරව වේවා වෙනුවට "ඔබගේ නාමයට" (6:9) කියා ද, දෙවියන් වහන්සේට හෝසන්නා වෙනුවට "උසස්

තැන්හි හෝසන්නා" (21:9) කියා ද, යොදා ඇත. මෙය සම්පූර්ණයෙන් ම ජුදා භාෂා විලාශයකි.

දෙවියන් වහන්සේගේ නාමය භාවිතා නොකිරීම සඳහා ජුදෙව්වන් විසින් යෙදූ තවත් උපක්‍රමයක් නම් අදාළ වාක්‍ය කර්මකාරකයට පෙරළීමයි. එලෙස යෙදූ විට එම වාක්‍යයේ කර්තෘ දෙවියන් වහන්සේ බව ඔවුහු අවබෝධ කර ගත්හ.

පහත සඳහන් උදාහරණවලින් මෙය මනාව පැහැදිලි වේ.

| වගන්තිය | අර්ථය |
|---|---|
| ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු සැනසීම ලබන්නෝය." (5:4) | මෙම ජීවිතයෙ ශෝකය ඇති අයව දෙවියන් වහන්සේ සනසන සේක. |
| දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දයාව ලබන්නෝ ය" (5:7) | දයාව දක්වන අයට දෙවියන් වහන්සේ දයාව දක්වන සේක. |
| පළමුකොට දෙවියන් වහන්සේගේ රාජ්‍යයද ධර්මිෂ්ඨකම ද සොයන්න. එවිට මේ සියල්ලත් ඔබට දෙනු ලැබේ." (6:33) | දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමටත්, ශුද්ධවන්තව ජීවත් වීමටත්,ඔබගේ පළමු අභිලාශය නම්, දෙවියන් වහන්සේ අන් දේවල් ද ඔබට දෙන සේක. |
| විනිශ්චය නොකරන්න, එවිට ඔබද විනිශ්චය කරනු ලබන්නෙහි ය." | ඔබ අනුන්ව විනිශ්චය කරන ආකාරයට ම දෙවියන් වහන්සේ ඔබව විනිශ්චය කරන සේක. |
| ඔබ මනින මිම්මෙන් ම ඔබටත් මැන දෙනු ලැබේ." (7:1-2) | ඔබ අනුන්ට ත්‍යාගශීලිවන තරමට දෙවියන් වහන්සේ ඔබට ද ත්‍යාගශීලිවන සේක. |

## හතරවන පාඩම

# 4 ලූක් සුබාරංචිය

## 4.1 හැඳින්වීම

ශුද්ධ ලියවිලි ග්‍රන්ථ අනුපිළිවෙල අනුව ශු.ලූක් සුබාරංචිය තුන්වෙනි සුබාරංචිය ලෙස නම් කෙරේ. ශු. ලූක් තුමා මෙම කෘතිය සම්පාදනය කළ අවධිය ජෙරුසලෙම් දෙව්මැදුරේ විනාශයෙන් පසුව විය හැකි බව විශාරදයෝ වැඩි දෙනෙක් පෙන්වා දෙති. ඒ අනුව ක්‍රි.ව. 80-85 අතර විය හැකි ය. ග්‍රන්ථයේ රචනය පලස්තීනයෙන් බැහැර අන්‍යජාතික පරිසරයක වූ බව සුබාරංචි ග්‍රන්ථය හා ක්‍රියා පොත ඉඟි කෙරේ. මේ පරිසරය අන්තියෝක් නගරය ආශ්‍රිතව බව විශාරද පිළිගැනීමයි.

කතුවරයා මේ ග්‍රන්ථය ලිවීමට හේතුවූ පරමාර්ථ දෙකක් දැක්විය හැකි ය.

1) ක්‍රිස්තුන් වහන්සේ ගැන ඓතිහාසික කතාන්දරයක් ඉදිරිපත් කරයි. එය අන්‍යජාතීන්ට පැහැදිලි විධියට ඉතිහාසය සහ සම්බන්ධ කරුණු අඩංගු කර එම පසුබිම තුළ විස්තරයක් ඉදිරිපත් කරයි. එය ජේසුස් වහන්සේ ගැන ඓතිහාසික දෘෂ්ඨි කෝණයකින් ඉදිරිපත් කරයි.

2) අනෙක් පරමාර්ථය ජේසුස් වහන්සේ ගැන නොලියවුණු කරුණු ඉදිරිපත් කිරීමයි. ක්‍රිස්තුන් වහන්සේගේ දූත සේවාව ගමන ලෙස දක්වයි. එබැවින් මුල සිට ම සියල්ල තතු පරිදි විමසා බැලූ මට ද ඔබ උදෙසා විධිමත් වෘතාන්තයක් ලිවීම මැනවයි සිතිණි. මා එසේ ලියන්නේ ඔබතුමාණන්ට උගන්වා ඇති කරුණුවල නියම සත්‍යය පහදා දෙන පිණිස ය. (ලූක් 1:1-4).

පැරණි ගිවිසුමේ පොරොන්දු ඉටුකරමින් මෙලොව සියලු දෙනාට ම මානව විමුක්තිය උදා කළ ජේසුස් ස්වාමින් වහන්සේගේ දයාව හා කරුණාව, ඉගැන්වීමෙන් හා ජීවිතාදර්ශයෙන් පෙන්වා දීම සුබාරංචියේ තේමාව ලෙස ගත හැක. ලූක්තුමා තම සුබාරංචිය මගින් ඉදිරිපත් කරන්නේ ජේසුස් වහන්සේ සැමගේ ම ගැලවුම්කාරයාණන් බවයි.

## 4.2. මූලාශ්‍ර

පාවුළු තුමා කයිසාරියේ සිරගතව සිටි අවුරුදු දෙකක් පමණ කාලයේදී ක්‍රිස්තුන් වහන්සේව ඇසින් දුටු හා ඇසුරු කළ කිහිපදෙනෙක් ම හමුවීමට ලූක් තුමාට ඉඩකඩ සැලසුණි. සමාරියේ අපොස්තුළුවරයා වූ තේවාචාරි පිලිප්වද හමුවන්නට ඇත. සමාරිය ගැන ලූක් තුමා පමණක් සඳහන් කරන යම් යම් කරුණු (9:52-56-9,17:11-19) ඔහුගෙන් දැනගන්නට ඇත. එමෙන් ම මනස්ථාපනය වූ පව්වු අගන ගැන තොරතුරු(7:36-50) එතුමා මේ දක්වා කෙටි කාලය තුළදී ලබාගන්නට ඇත.

ලූක් තුමාට වෙනත් කරුණු ලබාගැනීමට එයටත් වඩා ඔහුගේ ආකල්ප හැඩගැසීමටත් බලවත් ලෙස හේතු වූ තවත් කරුණක් නම් ශු. පාවුලු තුමා ඇසුරු කිරීම ය. සුවිශේෂයේ විවිධ තැන්වල මේ බලපෑම පෙනී යයි. (7:9 10:7-39, 11:13, 17.7-10, 18:1,14,21:19, 28:34) ගැලවීම ජුදෙව්වන්ට පමණක් නොව එය සැම දෙනාටම පොදු ය, යන ලූක් තුමා සුවිශේෂයෙන් හුවා දක්වන මතය පිටුපස ද පාවුළු තුමා සිටියි.
වාචික සම්ප්‍රදායයන්ගේ පමණක් (බ- ලූක්තුමා පෝෂ්‍ය වූයේ නැත. ලිඛිත කොටස් කිහිපයකින් විශේෂයෙන් ම මාර්ක් තුමා ලියූ සුබ අස්නේ ද හරය උරා ගෙන ඇත. ලූක් තුමාගේ සුවිශේෂයේ ඇති වගන්ති 150 න් 1/3 ක් මාර්ක් තුමාගේ ය.

ලූක් සුවිශේෂයට බලපෑ ග්‍රන්ථයක් නම් මතෙව් තුමා ලියූ අස්න ය. විශේෂයෙන් ම ක්‍රිස්තුන් වහන්සේගේ කියමන් වාර්තා කරන විට මතෙව් හා ලූක් බොහෝ විට වචනයක් වචනයක් පාසා එකඟ වේ. මෙයින් පෙනී යන්නේ මතෙව් හා ලූක් එක ම උල්පතකින් කරුණු ලබාගත් බවයි -


උදාහරණ සමහරක් මෙහි උපුටා දක්වමු.

| ලූක් | මතෙව් |
|---|---|
| 9:7-9 | 3,7-10 |
| 4:13-12 | 4:3-7 |
| 4:19-35 | 11:4-19 |

මතෙව් හා මාර්ක් අතර කිට්ටු සම්බන්ධයක් ඇත. මාර්ක් තුමාගේ සුවිශේෂයට අඩංගු වගන්ති 677 න් 170 ක් හෝ 180 ක් මතෙව් තුමාගේ සුවිශේෂයේ ද ඇත. එම නිසා දෙදෙනාම දේශනවාදීන්ටත් උපදේශකයන්ටත් ආධාර වශයෙන් පැවැති අත්පොත්වලින් (M) කරුණු ලබා ගන්නට ඇත.

මෙලෙස බලන කල ලූක් තුමා තම සුවිශේෂය ලිවීමට උල්පත් තුනකින් කරුණු සපයාගෙන ඇත.

- මාර්ක් තුමා මතෙව් තුමාගේ සුවිශේෂයෙහි දැකිය හැකි පොදු උපදේශක ඉගැන්වීම්වලින් (එයට , **"M"** , කියා කියමු).
- මතෙව් තුමා උපයෝගි කරගත් ක්‍රිස්තුන් වහන්සේගේ වචන අඩංගු සම්ප්‍රදාය (ජර්මන් බසින් ප්‍රභවටය කියා කියන බැවින් අපි එයට **"Q"** කියා කියමු.)
- ලූක්තුමා පමණක් දන සිටි යම් යම් සම්ප්‍රදා හෝ පරම්පරා ගත ධර්මයන් (එයට අපි, **"L"**, කියා කියමු.)




ලූක් තුමා , **"M"**, අනුගමනය කරමින් සුබ අස්න සකස් කර ගත් බැවින් ශු. මාර්ක් තුමා කරුණු පිළියෙල කිරීමේ දී අනුගමනය කළ රටාව ම ලූක් තුමාගේ සුවිශේෂයේ අපට හමුවේ. නමුත් සමහර අවස්ථාවලදී එතුමා **"Q"**, සහ ,**"L"**, සම්ප්‍රදායයන්ගෙන් ගත් කරුණු ඇතුළත් කරයි. එතුමාගේ ප්‍රධාන එකතුවක් වන්නේ **"Q"**, සහ ,**"L"**, සම්ප්‍රදායයන්ගෙන් සකස් කරගත් ජෙරුසලෙමේ ගමන ය. මාර්ක් තුමා **6:45** සිට **8:26** දක්වා ගමන් කරන සුළු ගමන් ලූක් තුමා අතහැර දමයි.

**"M"**, **"Q"** සහ **"L"**, සම්ප්‍රදායයන්ගෙන් සමන්විත ලූක් සුබ අස්න අපට පහත දැක්වෙන සේ ඉදිරිපත් කළ හැක.

| | | |
|---|---|---|
| 1:1-4 | - | පිළිගැන්වීම |
| 1:5-2:52 | - | ජේසුතුමාගේ බාලවිය **"L"** ප්‍රභවයට අයත්ය) |
| **3:1-950** | - | ජේසු තුමාගේ ගලීල සේවය (මාර්ක් තුමාට සම බවක් පෙන්වයි) **"M"** ප්‍රභවයට අයත්ය. |
| 9:51-19:28 | - | ජේසු තුමාගේ ජෙරුසලෙම් ගමන ජේසු තුමාගේ වචන ( **"Q"** ප්‍රභවයට අයත්ය) ලූක් තුමාටද විශේෂය (**"L"** ප්‍රභවයට අයත්ය. |
| 19:28-23:56 | - | ජේසුතුමා ජෙරුසලෙමේ කළ දූත මෙහෙය අවසාන ඉගැන්වීම පොදු උපදේශක ඉගැන්වීම දුක්ප්‍රාප්තිය (**"L"** ප්‍රභවයට අයත්ය) |
| 24:1-53 | - | ජේසුතුමාගේ පුනර්ජීවනය (ප්‍රධාන වශයෙන් ,බ, ප්‍රභවයට අයත් ය.) |

## 4.3. සැකසුම

ශු. ලූක් සුවිශේෂය (පරිච්ජේද 24) ප්‍රධාන කොටස් හයකට බෙදා දැක්විය හැක.

1) ගැලවීමේ පොරොන්දුව - (බාලකාලය හා සම්බන්ධ කතා) පරිච්ජේද 1 හා 2.
2) ධර්මදූත සේවාව හෙවත් ප්‍රසිද්ධ ජීවිතයට සුදානම - **3:1-4:13**
3) ගලීලයේ ධර්මදූත සේවාව - **4:14-9:50**
4) ජෙරුසලෙමට යන ගමනේදී කළ ධර්මදූත සේවාව - **9:51-19:28**
5) ජෙරුසලමේ දී කළ ධර්මදූත සේවාව - **19:29-21:31**
6) ජේසුස් වහන්සේගේ මරණය හා ජයග්‍රහණය - පරිච්ජේද 22-24

## 4.4. පරමාර්ථ

ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ සර්ව කථාව හෝ පොදු බව මුළු සුබ අස්නේ ම ප්‍රධාන තේමාව බව පෙනේ. ජුදා නොවන්නන්ගේ අපෝස්තුළුවරයා වූ ද තමාගේ රදගුරුතුමා වූ ද පාවුළු තුමාගේ ධර්මයෙන් ලූක් තුමා නොඅනුමානව ම මෙහි දී ප්‍රකාශ කරයි.

අ) මුළු මිනිස් සංහතියේ ම පියා වන ආදම්ගෙන් ජේසුස් වහන්සේ පැවත එන්නෙක් බව වංශාවලියෙන් ප්‍රකාශ කිරීමෙන්, උන්වහන්සේගේ මාංශගත වීම ලෝක ඉතිහාසයේ කේන්ද්‍රස්ථානය ගන්නා බව ලූක් තුමා පෙන්නුම් කරයි. එම නිසා ක්‍රිස්තුන් වහන්සේ මිනිසත් බව ගත්තේ ජුදෙව්වන් නිසා පමණක් නොව මුළු මිනිස් වර්ගයා උදෙසා ය. **(3:23-38)** මෙලෙස ලූක් තුමාගේ සුබ අස්න ලෝක ඉතිහාසයට සම්බන්ධ වේ.

ආ) ක්‍රිස්තු උපත රෝම අධිරාජ්‍යයේ සියළු වැසියන්ගේ සංගණනයක් ගත් අවස්ථාවක සිදු වූවකි. **(2:1-5)** එමෙන් ම ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ද ආරම්භ වූයේ තිබේරිස් අධිරාජ්‍යයා පැමිණි පසළොස්වන අවුරුද්දෙහි ය. **(3:1)** මෙලෙස ලූක් තම සුබ අස්න රෝම අධිරාජ්‍යයට සම්බන්ධ කරයි.

ඉ) ලූක් තුමා ලියූ දෙවන පොත නම් "අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත" යි. එය එතුමාගේ පළමු පොත වන සුබ අස්න හා සම්බන්ධ (ක්‍රියා 1:1-2) ය. දෙවන පොත මුල්ම සභාවේ ඉතිහාසයයි. මෙලෙස සමස්ත සභාව තුළ ද එතුමාගේ සුබ අස්න කෙන්ද්‍රස්ථානයක් ගනී.

ඊ) එතුමාගේ සුබ ආරංචිය මුළු මිනිස් වර්ගයා සඳහා ය.

- ක්‍රිස්තු උපතේ දී දූත පැතුම ජුදා ජාතීන්ට පමණක් නොවේ. "මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා" යි (2:14) ඔවුහු ගැයූ හ.
- ජෙරුසලෙමේ විසූ දිවැසිවර සිමියොන් දින 40 ක් වයසැති ජේසු තුමන් දෝතින් වඩාගෙන ගයන්නේ එලෙස ය.... සකල ලෝ වැසියන් අභිමුවෙහි පිළියෙල කළ විජාතීන් හට හෙළි කළ ප්‍රදීපයක් ද... ඉශ්‍රායෙල්ගේ තේජස ද වූ බව මම මාගේ දෙනෙතින් දිටිමි. (2:30-31).
- ස්නාවක ජොහන්ගේ දූත මෙහෙය විස්තර කරන ලූක් තුමා යෙසායා 40:3-5 දක්වා උපුටා දක්වයි. මේ අවස්ථාවේ දී මතෙව් හා මාර්ක් මෙන් නොව එතුමා වැඩිපුර වගන්තියක් ද සඳහන් කරයි. එනම් දෙවිඳුන් කෙරෙන් වන විමුක් මඟ සව්සත දකිනු ඇතැයි පාළුකරයේ මොරගා කියන හඬකි. (3:6)
- ජේසු තුමා ශ්‍රාවකයින්ට අවසාන උපදෙස් දෙන විට මනස්ථාපනය හා පව් කමාව "සකල ලෝක වාසීන්ට" ප්‍රකාශ කළ යුතු ම යයි කිවේ ය. (24:47)

උ) සමාරියයන් පිළිබඳව ක්‍රිස්තුන් වහන්සේගේ වචන හා ක්‍රියා අපට ආරක්‍ෂා කර දී ඇත්තේ ලූක් තුමා ය.

- සමාරියේ නගර විනාශ කරන්නට අවසර ඉල්ලූ ජාකොබ් සහ ජොහන්ට ස්වාමීන් වහන්සේ තරවටු කළ බව කියැවේ. (9:52-55)
- කුෂ්ඨ රෝගීන් දසදෙනා සුව වූ පසු දෙවියන් වහන්සේට ගෞරව කරන්නේ සමාරියා පමණයි. (17:12-19)
- අසල්වැසි දයාව පිළිබඳ උපමාවේ ආදර්ශය වශයෙන් ජේසුස් වහන්සේ ඉදිරිපත් කරන්නේ සමාරියයෙක් ය. (10:25-37)

**සැ.යු.** කලින් සඳහන් කළ ආකාරයට ලූක් තුමා ජුදා නොවන්නන් දෙස දක්වන ආකල්පය ම පාවුළු තුමා තුළ ද ඇති බව එපිස 2:11-14 හා 17 වගන්තිවල මොනවට පැහැදිලි වේ.

## 4.5. පිළිගැන්වීම

පුරාණයේ සිටි විශිෂ්ට ග්‍රීක ග්‍රන්ථ කර්තෘවරු (උදා ඩියොස්කුරිඩේස්) ජොසපස් හා ඇරිටෙයාස් තමන්ගේ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයන්ට හැඳින්වීමක් දුන් ආකාරයට ම ලූක් තුමාද සුබ අස්නට පෙරවදනක් සකස් කරයි. එහි ව්‍යාකරණ ද, පද ගැළපීම ද, බොහෝ දුරට සම්භාවනීය ග්‍රීක ග්‍රන්ථයන්ට සමාන හුරුවක් දක්වයි.

**වගන්ති 1** - "තියෝපිලස් තුමෙනි" නමින් හැඳින්වෙන ආකාරයට මොහු ග්‍රීක ජාතිකයෙකි. මොහුගේ නමේ අර්ථය නම් 'දෙවියන් විසින් ප්‍රේම කරන ලද හෝ 'දෙවිපෙමා'ය. බොහෝ දෙනෙකු උත්සාහ කර ඇත. ලූක් මෙයින් අදහස් කරන්නේ මතෙව්, මාර්ක් හා තමාට කලින් අත් පොත් වැනි දෑ සම්පාදනය කළ කිහිප දෙනෙක්ව ය.

**වගන්ති 2** - තමාට කලින් සුබ අස්නක් ලියූ ... ක්‍රිස්තුන් වහන්සේව සියැසින් දක ඇසුරු කළ අයයි. (මාර්ක් හැරෙන්නට) මේවායේ අපෝස්තුළුවන්ගේ දහම් පණිවිඩය අඩංගු වී ඇත.

**වගන්ති 3** - මම සියැසින් දුටු සාක්‍ෂිකාරයෙක් නොවෙමි. එනමුත් මුල සිට ම සියල්ල තතු පරිදි විමසා බැලූ මම ද අපෝස්තුළුවරුන්ගේ දේශනාවලට එකඟව "විධිමත් වෘතාන්තයක් ලිවීම" ට අදහස් කරමි.

**වගන්ති 4** - ඔබතුමා දැනටමත් දහම් උපදෙස් ලබා සිටින්නෙකි. නමුත් ඔබට තවත් කරුණු ඉදිරිපත් කිරීමටත්, දැනට ම ඔබ පිහිටා ඇති සත්‍යයේ ඔබව ස්ථිර කරන අදහසිනුත් "මම මේ අස්න ලියමි".

**සැ.යු.** මෙම පෙරවදනෙන් (1:1-4) මූලිකව කරුණු දෙකක් අනාවරණය වේ.

1) ලූක් තුමා සුවිශේෂය ලිවීමට කලින් සුවිශේෂයේ පණිවිඩය පිළිබඳව උපදෙස් දීමත්, කරුණු ඉගැන්වීමත් (වගන්ති 4) තිබුණ බව පැහැදිලි ය. උපදේශන කටයුතුවලටත්, සභාවක් ලෙස එක් රුස්වූ විට ජනවන්දනාවේදී දේව පණිවිඩය කියවීමටත්, මතෙව් සහ මාර්ක් තුමාගේ සුබ අස්නෙන් උපයෝගී කරගන්නා ලදී.

2) ලූක් තුමා අදහස් කරන පිළිවෙලට ජුදා නොවන ග්‍රීක ජාතිකයෙක් වන තියෝපිලස් සුවිශේෂ පණිවිඩය පිළිබඳව උපදෙස් ලබා ගත්තත් එය ඔහුට මදි ය. අන්‍ය ආගමකින් පැමිණි කෙනෙක් ඊට වඩා දැන ගත යුතු ය. එම නිසා පැරණි ඉගැන්වීම සනාථ කිරීමේ හා වඩා විස්තර කිරීමේ අදහසින් ලූක් තුමා තම සුබ අස්න ලියයි.

## 4.6. වෙනත් නම්

1. ජෙරුසලෙම් සුවිශේෂය
2. ශුද්ධාත්මයාණන්ගේ සුවිශේෂය.
3. යාච්ඤාවේ සුවිශේෂය.
4. දයාවේ හා කරුණාවේ සුවිශේෂය
5. කාන්තාවන්ගේ සුවිශේෂය.
6. සමාව දීමේ සුවිශේෂය.
7. පූර්ණ පරිත්‍යාගයේ සුවිශේෂය.
8. ක්‍රිස්තියානි සතුට, ප්‍රීතිය හා ප්‍රශංසාවේ සුවිශේෂය

**ජෙරුසලම් සුවිශේෂය**

මෙම නගරය සුවිශේෂයේ **33** වරක් ම සඳහන් කර ඇත. බොහෝවිට වෙනත් නගරවල නම් සඳහන් නොකර, නගරයක් පමණක් යනුවෙන් සඳහන් කරයි. ලූක් තුමා උත්සාහ කරන්නේ සිය සුබාරංචිය තුළින් "ජෙරුසලම" එක ම වැදගත් නගරය බව ඔප්පු කිරීමට ය. එනම් මිනිස් සංහතියට ම ගැලවීම ලබා දුන්නේ ජෙරුසලෙම් නගරයේ බව පෙන්වා දීම ය.

- සුවිශේෂය ආරම්භ වන්නේ (1:9) හා අවසාන වන්නේ (24:52) ජෙරුසලමෙනි.
- මෙසියානු යුගය ආරම්භ වන්නේ ලූක් සුබාරංචියට අනුව ජෙරුසලමෙනි. (1:25)
- ජේසුස් වහන්සේගේ බාල කාලය ගැන සඳහනේ තුන්වරක් යොදා ඇත. (1:8:2:22-41)
- ජේසුස් වහන්සේගේ බාල කාලයේ සිද්ධි දෙකක් ම ජෙරුසලමට සම්බන්ධකර ඇත.
- අන්නා නැමැති ස්ත්‍රිය ජෙරුසලමේ ගැලවීම ගැන කථා කරයි. (2:28)
- අන්තිම පරීක්ෂාව ජෙරුසලමට සම්බන්ධකර ඇත. (4:9-12)
- අන්‍යරූප විලාශයේදී ජෙරුසලම ගැන මෙතුමා පමණක් සඳහන් කරයි. (9:31)
- ජේසුස් වහන්සේගේ මරණය හා මහිමය ජෙරුසලමට සම්බන්ධකර දක්වයි. (9:31)
- ජේසුස් වහන්සේ ජෙරුසලම බලා හඬති. (13:34)
- ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය ජෙරුසලෙමේ සිදුවන බව (18:31-33)
- ජෙරුසලමට ජයග්‍රාහීව ඇතුළුවීම (19:28-48)
- උත්ථානයෙන් පසු ගෝලයින් ආපසු ජෙරුසලමට යෑවීම (21:13-35)
- උත්ථානයෙන් පසු ජෙරුසලමේදී දර්ශනය (24:15)
- නිතර ම ජෙරුසලමට යන ගමන (13:22, 17:11, 18:31)

**ශුද්ධාත්මයාණන්ගේ සුවිශේෂය :-**

- අන්‍ය සුවිශේෂවලට වඩා ස්ප්‍රිතු සාන්තු වහන්සේ ගැන සඳහන්ව ඇත. "දේව ස්ප්‍රිතුව" යන වචනය දාහත්වරක් යොදා ඇත. දාහතරවරක් ශුද්ධාත්මයාණන් ලෙසත්, දෙවරක් ස්ප්‍රිතුව ලෙසත් දක්වේ. (2:27, 4:1) එක්වරක් ස්වාමීන් වහන්සේගේ ස්ප්‍රිතුව ලෙසටත් (4:18) සඳහන් වේ.
- ආරම්භක පරිච්ඡේදවල හතරවරක්ම ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවීම සඳහන් වේ. ඒ අනුව ස්නාවක ජුවාම්, එලිසබෙත් තුමිය, සකරියස් තුමා, ජේසුස් වහන්සේ, මරිය තුමියි ගැන සඳහන් වේ.
- ලූක්තුමා ජේසුස් වහන්සේව ඉදිරිපත් කරන්නේ ස්ප්‍රිතුසාන්තු වහන්සේගේ ආයුධයක් හා නව යුගයේ ස්ප්‍රිතු සාන්තු වහන්සේ අන් අයට ලබා දෙන තැනැත්තා ලෙස ය. (24:49, 2:26)
- ස්ප්‍රිතු සාන්තු ආනුභාවයෙන් සිමියොන්ට, ජේසුස් වහන්සේ බව අනාවරණය වීම.
- ජුවාම් තුමාගේ ප්‍රකාශය "ජලයෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන්"
- ස්ප්‍රිතු සාන්තු වහන්සේගේ බලය හා මඟ පෙන්වීම තුළින් ප්‍රසිද්ධ ජීවිතය ඇරඹීම. (3:22, 4:14-18)
- ශුද්ධාත්මයාණන් කෙරේ ජේසුස් වහන්සේගේ ප්‍රීතිය (10:21, 14:25)
- ඉල්ලන අයට ස්ප්‍රිතු සාන්තු වහන්සේ දීමට පොරොන්දුව (14:13)
- සුවිශේෂය අවසානයේ යළි ශුද්ධාත්මයාණන් හමුව (24:19)

**යාච්ඤාවේ සුවිශේෂය**

ජේසුස් වහන්සේ 'යාච්ඤාව' ගැන තම ගෝලයන්ට ඉගැන්වීම පෙර යාච්ඤා කර ආදර්ශයක් දුන් සේක.

- නිතර යාච්ඤාව සඳහා කන්දක් තෝරා ගැනීම. (6:12, 9:28, 22:39)
- තමන්වහන්සේගේ ජීවිතයේ වැදගත් අවස්ථාවලදී යාච්ඤා කළ සේක (3:21)
- අපෝස්තුළුවරුන් 12 දෙනා තෝරා ගැනීමට පෙර (6:12, 9:29) අන්‍ය රූප විලාශ වූ අවස්ථාවේදී (ලූක්තුමා පමණක් මේ අවස්ථාව සඳහන් කරයි)
- පරමණ්ඩල යාච්ඤාව දීමට පෙර (11:1)

- පේදුරු තුමාගේ ප්‍රකාශයට පෙර (22:32)
- දුක්ප්‍රාප්තියට පෙර (22:39)
- ඔලිව කන්දේදී (22:41)
- කුරුස ගසේදී (22 : 46)
- ජේසුස් වහන්සේගේ මුළු ධර්මදූත සේවාව ප්‍රශංසාවෙන් හා යැදුමෙන් සිදුවූ බව (1:5, 2:52)
- උන්වහන්සේගේ ධර්මදූත මෙහෙවර ආරම්භ කලේත් අවසන් කලේත් යාච්ඤාවෙනි. (3:21, 23:46)
- අන් අයට යාච්ඤා කිරීමට නියෝග කරයි. (6:28)
- සතුරන් උදෙසා
- ධර්මදූත සේවකයන් සඳහා යාච්ඤා කළහ. (10:2)
- සැම කෙනෙක් ම නිතිපතා යාච්ඤා කළ යුතු බව (22:40)
- පරීක්ෂාවට නොවැටීම සඳහා යාච්ඤා කළ යුතු බව (22:46)
- ජනතාව යාච්ඤා කළ අවස්ථා ලෙස, සෙකරියාගේ (1:10) අන්නාගේ (2:37), ස්නාවක ජුවාම්තුමාගේ ගෝලයෝ (5:33)
- ජේසුස් වහන්සේ ගෝලයන්ට නිසි ලෙස යාච්ඤා කළ යුතු අයුරු උගන්වති. (11:1-5, 11:6-12, 18:1-6, 18:10-14)

**දයාකරුණාවේ සුවිශේෂය**

- ජේසුස් වහන්සේගේ ධර්මදූත සේවාව විශේෂයෙන් දුප්පතුන්ට හා (ශාරීරිකව, මානසිකව, ආධ්‍යාත්මිකව හා දිළිඳු සමාජයේ කොන් කරන ලද වූවන්ට බව පෙන්වා දෙයි). "බැහැපත්කම" උතුම් ගුණාංගයක් ලෙස දක්වයි. (1:48, 52,9:47, 10:21, 14:11, 18:14-17, 22:26) එසේ ම ධනවතුන්ට අත්වන දරුණු ඵල විපාක ගැනත් දුප්පතුන්ට අත්වන යහපත් විපාක ගැනත් මෙහි සඳහන් ය.
- උන්වහන්සේගේ උපත ගැන පළමුවෙන් ප්‍රකාශ කලේ දුප්පත් එඬේරුන්ට ය. (2:10)
- ජේසුස් වහන්සේ මෙලොවට ආවේ දුප්පතුන්ට දේශනා කිරීමට ය. (7:28)
- දේව රාජ්‍යය අයිති දුප්පතුන්ට ය. (6:20)
- පොහොසත්වීමෙන් අත්වන අයහපත් විපාක ගැන සිද්ධීන් හා උපමාවලින් දක්වයි.

**උපමා**

- මෝඩ ධනවතා (12:16)
- මංගල භෝජනය (ලූක් තුමා දුප්පතුන්ට ආරාධනා කරන බව පෙන්වයි.) (18:22)
- ලාසරස් හා ධනවතා (16:19)
- ධනවත් තරුණයාගේ කතාව (18:22)
- ධනවතුන්ට ස්වර්ග රාජ්‍යයට යාමේ ඇති අසීරුතාව (18:25)
- සකේවුස්ගේ කතාව (19:8)

**ජේසුස් වහන්සේ දැක්වූ දයාව හා කරුණාව ප්‍රාතිහාර්යවලින් ද පෙන්නුම් කරයි.**

- නායිම් නුවර පුනරුත්ථාපනය සිද්ධිය (7:11-15)
- කුදු ස්ත්‍රිය (13:10-17)
- දිය උදර රෝගියාට සුවය (14:1-6)
- ලාදුරු රෝගීන්ට සුවය (17:11-19)

**දුප්පතුන් ගැන**

- දුප්පතුන්ට උදව් කිරීම සැමගේ යුතුකම බව (3:10, 14:12-14)
- දුප්පතුන්ට උදව් කිරීමට නොහැකිවූවන්ට අත්වන විපාක (16:15)

**ලූක්තුමා ජේසුස් වහන්සේ හා ගෝලයන්ට සම්බන්ධ කතා පුවත්වල සිද්ධි ඉතා මෘදු ලෙස ඉදිරිපත් කරයි.**

- මාර්ක්තුමා මෙන් ජේසුස් වහන්සේ කෝපවූ බවක් සඳහන් නොකරයි. (3:5)
- අත පණ නැති මිනිසා සුව කිරීමේ දී (6:10)
- දේවමාළිගාව පවිත්‍ර කිරීම පිළිබඳ සිද්ධියේ වෙළෙඳුන් පළවා හැරීම ගැන පමණක් සඳහන් කරයි.
- ජේසුස් වහන්සේට කෙළ ගැසීම ගැන, ජුදාස් සිප වැළඳගැනීම ගැන සඳහන් නොකරයි.
- ස්නාවක ජුවාම්තුමාගේ හිස සිදීම සඳහන් නොකරයි.

**කාන්තාවන්ගේ සුවිශේෂය**

ජේසුස් වහන්සේ ස්ත්‍රීන් හට දයා කරුණාව දැක්වූ බව ලූක්තුමා සඳහන් කරයි. එදා පැවති ජුදා ආකල්පයෙන් වෙනස් මඟක යමින් කාන්තාව හා පිරිමියා සමාන තත්ත්වයකින් ඉදිරිපත් කරයි. අන් සුවිශේෂවලට වඩා කාන්තාවට තැනක් දෙමින් සමහර අයට වගකිවයුතු ස්ථාන පවා දී ඇත. එදා හෙලනිස්ත ලෝකයේ (ග්‍රීක) ජුදා සමාජයට වඩා කාන්තාවන්ට උසස් තැනක් දී තිබුණු නිසා එම සංකල්පය අනුගමනය කරන්නට ඇතැයි සිතිය හැක. ගැලවීමේ සැලැස්ම ක්‍රියාවට නගද්දී

මරියතුමියගෙන් හා අනෙක් කාන්තාවන්ගෙන් සිදුවූ සේවය පැහැදිලි කරයි. ජේසුස් වහන්සේගේ මෑණියෝ සියලු ස්ත්‍රීන් අතුරින් ආශීර්වාද ලද්දිය බව පවසයි. (11:26, 56, 2:34-51, 14:26-28)

- එලිසබෙත් තුමිය (1:5-6)
- අන්නා (2:37-38) උසස් ලෙස දක්වයි.
- නායිම් නුවර වැන්දඹුවට දැක්වූ කරුණාව (7:11)
- මග්දලාහී මරියාගේ සිත් හැරීම (7:36)
- සමහර කාන්තාවන් ජේසුස් වහන්සේගේ ධර්මදූත සේවාවට සහභාගී වීම (8:1-3)
- මාර්තා හා මරියාගේ ගෙදර ජේසුස් වහන්සේගේ ඉගැන්වීම (10:38-41)
- කුදු ස්ත්‍රිය සුවකිරීම (13:38-42)
- ජෙරුසලෙම් ස්ත්‍රීන් සැනසීම (23:27-27-31)

**උපමා කථාවලින් ද ඉදිරිපත් කරයි.**

- නැතිවූ කාසිය (15:18)
- වැන්දඹුව (18:1)
- මතෙව්, මාක් සුවිශේෂවල සඳහන් කාන්තාවන් ගැන ද සඳහන් කරයි.
- සිමොන්ගේ නැන්දනිය (4:38)
- මහලේ රෝගී ස්ත්‍රිය (8:43)
- දුක් ප්‍රාප්තියට සාක්ෂි දැරූ ස්ත්‍රීන් (23:49)
- කාසිය දැමූ ස්ත්‍රිය (21:1)
- උත්ථානයට සාක්ෂි දැරූ ස්ත්‍රීන් (24:1-10)

**සමාවදීමේ හා සාමයේ සුවිශේෂය**

මනුෂ්‍ය පුත්‍රයාණෝ නැතිවූ දේ සොයන්නට ද, ගලවන්නට ද වැඩම කළ සේක¨ යි සඳහන් කරන්නේ ලූක් තුමා පමණි. (19:10) අන් සුවිශේෂවලට වඩා පව් කාරයන් ගැනත් (22 වරක්) සමාව ගැනත් (18 වරක්) දෙවියන් වහන්සේගේ දයාව ගැනත් (8 වරක්) සඳහන් වේ. සමාව දීම ගැන විවිධ සිද්ධීන් ද උපමා මගින් ද ඉදිරිපත් කර ඇත.

- පව්කාර ස්ත්‍රියගේ කතාව (7:36-50)
- සකේවුස්ගේ කතාව (19:1-10)
- කුරුසියේ ඇණ ගැසූ අයට සමාව දීම (23:34)
- දකුණේ සොරාට සමාව දීම (23:39-43)

සාමය¨ යන වචනය වැඩියෙන් භාවිතා කරන්නේ ලූක් තුමා ය. (16 වරක්)

**පූර්ණ පරිත්‍යාගයේ සුවිශේෂය**

පරිත්‍යාගශීලීභාවය ගැන හා එම අදහස හා සම්බන්ධ වචන දහ හතර වාරයක් සඳහන් වේ. ජේසුස් වහන්සේ දුක්විඳිය යුතු බව අනෙක් සුවිශේෂවලට වඩා දක්වයි.

- පේදුරුතුමා හා අනෙක් අයගේ කැඳවීම (සියල්ල හැරදමා) (5:11)
- ලෙවිගේ කැඳවීම (සියල්ල හැරදමා) (5:28)
- තැනිතලා ස්ථානයේ දේශනය (6:20-26)
- පේදුරු තුමාගේ මහා ප්‍රකාශයෙන් පසු (9:22)
- මීමැස් මොර රෝගියා සුවකිරීම (9:44)
- දේව රාජ්‍යයේ පැමිණීම ගැන කථා කළ අවස්ථාව (17:25)
- ධනවත් තරුණයාගේ සිද්ධිය (සියල්ල විකුණා) (18:22)
- ගෝලයන් තමන් වෙත කැඳවා අනුශාසනා කළ අවස්ථාව (18:31)
- වැන්දඹුව සතු සියලු ම වස්තුව පරිත්‍යාග කිරීම (21:4) 'සියල්ල' යන්න යොදා ඇත්තේ ද ලූක් තුමා පමණි.
- අනුගාමිකයන් වීමට නුසුදුසු අය. (නගුලට අත තබා ආපසු බලන) මේ යෙදුම ඇත්තේ ලූක් සුබාරංචියේ පමණි. (9:57-62)
- ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කිරීමට නොහැකි බව. (16:13)
- ක්‍රිස්තු අනුගාමිකයෙක් දේව රාජ්‍යය සඳහා සැම දෙයක් ම පරිත්‍යාගී කළ යුතු බව. (18:29, 14:33, 12:33)
- ධනවතෙකුට දේව රාජ්‍යයට ඇතුළුවීමට ඇති අපහසුතාව. (18:25)
- සකේවුස්ගේ සිද්ධියෙන් පරිත්‍යාගශීලි භාවය (19:8)

**ක්‍රිස්තියානි සතුට, ප්‍රීතිය හා ප්‍රශංසාවේ සුවිශේෂය**

ලූක් සුබාරංචියට අනුව ගැලවීමේ කාලය සමඟ සතුට සාමය සහ ප්‍රශංසාවේ කාලයක් ඇති වූ බව පෙන්වා දෙයි.

- ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ සතුට ගෙන දෙන සුබාරංචිය (1:14-2:11)
- ගෝලයන් 72 දෙනා ආපසු ඉමහත් ප්‍රීතියෙන් පැමිණීම. (10:27)
- ජේසුස් වහන්සේ කළ කී දේ ගැන ජනතාව සතුටු වීම (13:7)
- එක පව්කාරයෙකුගේ සිත් හැරීම ගැන ස්වර්ගයේ ප්‍රීතිය (15:7)
- ජේසුස් වහන්සේ කළ ප්‍රබල ක්‍රියා ගැන උන්වහන්සේගේ ප්‍රශංසා හා දෙවියන් වහන්සෙට කළ ප්‍රශංසා (19:37)

- ස්වර්ගාරෝහණයෙන් පසු උන්වහන්සේගේ ගෝලයෝ ඉමහත් ප්‍රීතියෙන් තම සතුට ප්‍රකාශ කිරීම. (24:52)
- සතුට ප්‍රකාශ කරන ගීතිකා මෙහි සඳහන් ය.
- මරියතුමියගේ උදාන ගීතය (1:46)
- සෙකරියස්ගේ ප්‍රශංසා ගීය (1:68)
- දේව දූතයන් කළ ප්‍රශංසා ගීය (2:11)
- සිමියොන්ගේ ප්‍රශංසා ගීය (2:29)

## 4.7. ලූක් සුබාරංචියට විශේෂතා

- කිතුදහම විවිධ ජාතීන් හා සීමාවන් අභිබවා යන විශ්ව ආගමක් ලෙස ඉදිරිපත් කරයි.
- ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරීත්වය ප්‍රථමයෙන් ජේසුස් වහන්සේගේ සේවාව තුළ ද, ඉන්පසු අපෝස්තුළුවරුන්ගේ සේවාව තුළ ද නොකඩවා සිදු වූ බව ඉදිරිපත් කරයි.
- දිළිඳුන් වෙත විශේෂ දයා කරුණාව දක්වා ධනවතුන්ට අකාරුණාවන්ත වී ඇත.
- කිතුනු සංඝය තුළ කාන්තා සහභාගිත්වය ගැන උද්යෝගයක් දක්වා ඇත. යාච්ඤාවට විශේෂ තැනක් දී ඇත.
- පව් කමාව ගැන සුලභව සඳහන් කර ඇත.
- ලූක් සුවිශේෂය, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත හා එකට බැඳුණු දිඝ් කෘතියක ප්‍රථම කොටස වී ඇත.

ලූක් සුබාරංචියේ පෙර වදනේ සඳහන්වන (ආමන්ත්‍රණය කරන) තියෝපිලස් තුමා ලූක් තුමා හා සම්පව ඇසුරු කළ ජනසමාජය නියෝජනය කළ වැදගත් පුද්ගලයෙකු විය හැක. අන්තියෝකයේ ධනවත් පුරවැසියෙකු බවට ද මතයකි.

## 4.8. කර්තෘත්වය

**තුන්වන සුවිශේෂයේ කර්තෘ ලූක් තුමා:**
ඔහු සිරියාවේ ඇන්ටියෝක් නුවර වැසියෙකු වූ අතර ග්‍රීක හෙලනිස්ත පවුලකට අයත් වුවෙකි. පලස්තීනයෙන් පිට එවකට තිබුණු ක්‍රිස්තියානින්ගේ ප්‍රධාන නගරයකි, ඇන්ටියෝකිය. මෙම සභාවෙන් ක්‍රිස්තු ධර්මය වැළඳගත් මෙතුමා වෘත්තියෙන් වෛද්‍යවරයෙකි. අපෝස්තුළුවරුන්ගේ ගෝලයෙකි. පාවුලු තුමා සමඟ සේවයේ යෙදුනෙකි.

ලූක් තුමා ගැන නව ගිවිසුමේ තුන්වරක් සඳහන්ව ඇත. අපේ හිතවත් ලූක් නම් වෛද්‍යවරයා ද, දේමස්ද ඔබට ආචාර කරයි (කොලොස්සි 4:14) පිලමොන්ට ලියූ ලිපියේ "මාගේ හවුල් සේවකයන් වන මාර්ක්ද, අරිස්තර්කකර්ස්ද, දේමස් ද, ලූක් ද ඔබට ආචාර කරති." "ලූක් පමණක් මා සමඟ සිටී" (2 තිමති 4:11) සමහරුන්ගේ මතය අනුව "දෙවියන් වහන්සේ අප කැඳවූ බව ඔහුගේ දර්ශනයෙන් තේරුම් ගත් ' අපි එකෙනෙහිම ......... (ක්‍රියා 16:10) අපි ඔවුන්ගෙන් වෙන් වී නැව් නැගී කෙළින් ම .................. (ක්‍රියා 21:17, 18), (27:1-28) මෙසේ ක්‍රියා පොතේ සඳහන් අනුව "අපි" යන්න ලූක් තුමාට සම්බන්ධයයි පිළිගැනේ.

ලූක්තුමා ජුදයෙක් නොවේ. අන්තියෝකයේ ජීවත්වූ ක්‍රිස්තියානි දහම වැළඳ ගත් අන්‍ය ජාතිකයෙකි. ඔහු උසස් පුද්ගලයෙකු වූ අතර වෘත්තියෙන් වෛද්‍යවරයෙකි. ඔහු සිය සුබාරංචිය රචනා කළේ ග්‍රීක ශිෂ්ටාචාරය පැතිරුණු පරිසරයක එනම් අකියා නුවරදී ය.
ලූක් තුමා ලූක් සුබාරංචිය ලියූ බව පිළිගත හැකි විවිධ සාක්ෂි ඇත.

**අ) පිටස්තර සාක්ෂි:**

- දෙවන ශතවර්ෂය අවසානයේදී ශු. සභාව ලූක් සුබාරංචියේ කර්තෘ ලූක්තුමා බව පිළිගනියි.
- පැරණි සභා පියවරුන්ගේ සාක්ෂිද ඇත. (ක්‍රි.ව. 177-189)
- ගලීලයේ ඉරනේයස් තුමා
- ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් තුමා (ක්‍රි.ව. 195)
- උතුරු අප්‍රිකාවේ ටර්ටුලියන් (ක්‍රි.ව. 200)
- සිරියාවේ එව්සේබියස් තුමා (ක්‍රි.ව. 325)

  මෙතුමා ලූක්තුමා හඳුන්වා දෙන්නේ ඇන්ටියෝකයෙන් පැමිණි වෛද්‍යවරයෙකු හා ක්‍රියා පොත ලියූ තැනැත්තා ලෙසින් ය.

- ජෙරුසලම්හි ශු. ජෙරොම්තුමා (ක්‍රි.ව. 400)
- "මුරතෝරියන්" නාමාවලියේ (ක්‍රි.ව. 175) ලූක්තුමා වෛද්‍යවරයෙකු බවත් පාවුලු තුමා සමඟ ධම්දූත සේවාවේ යෙදී සිටි බවත් සඳහන් වේ.

**ආ) සුබාරංචිය තුළින් ඉදිරිපත් කළ හැකි සාක්ෂි:**

- ලූක් සුබාරංචියේ කතුවරයා අන්‍යජාතිකයෙකි. පොත පිළිගන්වන්නේ (1:1) ශ්‍රීමත් තියෝපිලස් නමැති කෙනෙකුට ය. මොහු ද අන්‍යජාතිකයෙකි. ශ්‍රීමත් යනු රෝම ආණ්ඩුකාලයේ උසස් තනතුරක් දරු කෙනෙකුට භාවිතා කළ ගෞරවාන්විත නාමයකි.

මෙවැන්නෙකුට තම පොත පිළිගැන්වීමෙන් අදහස් කරන්නේ ක්‍රිස්තියානි ලොවට පමණක් නොව සමස්ත ලෝකයට ම යොමුකරන බවය. සුබාරංචිය ලියුවේ වෛද්‍යවරයෙකු බව සඳහන් වේ. සාමාන්‍යයෙන් ජුදෙව්වරු වෛද්‍යවරයෙකු පිළිගත්තේ පහත් තත්ත්වයේලා ය. එහෙයින් ඔහු ජුදෙව්වෙක් විය නොහැක. ජුදෙව් සිරිත් විරිත් හා (චර්මඡේදනය 2:21, මෝසස්ගේ නීතිය 2:22, යාග පිළිබඳ නීති 1:9, 5:14, අමුත්තන් පිළිගැනීම 7:44) නගර (නාසරෙත්, කපර්ණාවුම්. අරමතියාව, එම්මාවුස්) ගැන පැහැදිලි විස්තර සුවිශේෂයේ ඇත. මෙහි ග්‍රීක වචන පමණක් භාවිතා කර ඇත.

**අන්‍ය ජාතීන්ට ප්‍රසංශා කළ අවස්ථා ඇත.**

ජුදා සමාජයේ ඉතා පහත් යයි කොන් කළ සමාරියයන් සහෝදර දයාවේ සහ කෙළෙහිගුණ සැලකීමේ ආදර්ශය ලෙස ඉදිරිපත් කරයි. (10:25, 17:11) අන්‍යජාතීන් යහපත් හැසිරීමේ හා ක්ෂණික විශ්වාසයේ ආදර්ශ ලෙසට ද ඉදිරිපත් කරයි. (7:9)

- නාමන් නැමැති සිරියානු ජාතිකයාගේ සුවය හා සරෙප්තාහි වැන්දඹු ස්ත්‍රිය වෙත එළියා යැවීම පිළිබඳ සිද්ධි සඳහන් කරයි. (4:25-27)
- නායිම් නුවර වැන්දඹුවගේ පුත්‍රයාට යළි පණදීම. (7:11-17)
- ශතාධිපතියාගේ විශ්වාසය ගැන ප්‍රශංසාව (7:9)
- යහපත් සමරිතානුවරයාගේ උපමාව (10:37)
- ලාදුරු රෝගීන් දස දෙනා සුවපත් කිරීම (17:18)
- පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව (18:10)

**මෙම පොතේ කර්තෘ වෛද්‍යවරයෙකි:**

- මෙම සුවිශේෂයේ "ලෙඩ" හෙවත් "අසනීප" යන වචනය 10 වරක් යෙදී ඇත. ක්‍රිස්තුන් වහන්සේ සුවය දෙන වෛද්‍යවරයෙකු, ලෙසට (14) වරක් සඳහන් කර ඇත.

උදා:-

- නොයෙක් රෝගවලින් පීඩිත වූ අය ගෙන ආ බව (4:40)
- බොහෝ රෝගීන් සුවකර ගැනීමට උන්වහන්සේ වෙත ගෙන ආ බව (5:15)
- අත පණ නැති මිනිසා සුවකිරීම (6:8)
- අනුහස නික්ම ගොස් සුවය ලැබූ බව (6:19)
- ශතාධිපතියාගේ දාසයා සුවවීම (7:3)
- බොහෝ දෙනෙකුගේ ලෙඩ සුවකර දුන් සේක. (7:21)
- ලෙඩ රෝග වලින් සුවය ලත් ස්ත්‍රීන් (8:2)
- මහලේ රෝගයෙන් පීඩිත වූ ස්ත්‍රිය (8:47)
- සුවය අවශ්‍ය වූ අය සුව කළ සේක (9:11)
- කුදු ස්ත්‍රිය සුව වීම (13:14)
- දිය උදර රෝගියා (14:14)
- ලාදුරු රෝගීන් (14:15)
- නායක පූජකයාගේ මෙහෙකරුවාගේ කණ සුව කිරීම (22:51)

- ජේසුස් වහන්සේ අධ්‍යාත්මික සුවය දෙන්නෙකු ලෙසට හත්වරක් සඳහන් වේ.

උදා :-

- කපර්ණාවුම් ධම්ශාලාවේ දී අශුද්ධ ආත්මයක් සුව කිරීම (4:35)
- යක්ෂයෝද දේව පුත්‍රයා යයි කියමින් මොර දුන්හ (4:41)
- අශුද්ධ ආත්මයන්ගෙන් පීඩිත වූවෝ සුවකරනු ලැබූහ. (6:18)
- බොහෝ දෙනෙකුගේ අශුද්ධ ආත්ම දුරු කර සුවය දුන්හ (7:21)
- ගෙරසීනයේ යක්ෂාවේශ වූවෙකු සුව කිරීම (8:33)
- මීමැස් මොර රෝගියාට සුවය (9:42)

- පෙරදිග සම්ප්‍රදාය අනුව වෛද්‍යවරයා රෝගියා සමඟ ශාරීරික සබඳතාවක් ඇති කර ගන්නාවූ කෙනෙකි. ජේසුස් වහන්සේද එලෙස රෝගීන් ස්පර්ශකර සුව කළ හ. (6 වරක්)

උදා:-

- එකිනෙකා පිට අත තබා (4:40)
- අත දිගුකොට ඔහු මත තබා (5:13)
- ළංවී දෙනට අත තැබූ සේක. (7:14)
- ඇගේ අත අල්ලා (8:54)
- ඇය පිට අත් තැබූ සේක. (13:13)
- ඔහුගේ කණ අතගා (22:51)

- අත් අය ජේසුස් වහන්සේ ස්පර්ශ කිරීමට උත්සහා කළ අවස්ථා ඇත (6:9). ගෝලයන් ද ලෙඩුන් සුව කළ අවස්ථා දෙකක් සඳහන් ය (9:6, 10:9). කර්තෘ වෛද්‍ය විද්‍යාවේ සමහර වචන ලෙඩුන් සුව කිරීමේ දී භාවිතා කර ඇත.

උදා:-

- බලවත් උණ රෝගයෙන් (4:38)
- මුළු සර්වාංගයෙහි ලාදුරු (5:12)
- පණනැති (6:6)
- මහලේ රෝගයෙන් (8:43)
- පෙන දමමින් සලිත කොට (9:39)
- කෙළින් එන්නට බැරි (13:11)
- දිය උදර රෝගයෙන් (14:2)

- සුවකිරීමේ අවස්ථාවලදී අවට සිටි අයගේ ප්‍රතික්‍රියාද කර්තෘ දක්වයි.

උදා:-

- සියල්ලෝ ම විශ්මිතව (4:36)
- ඔහු කෝපයෙන් උමතු වී (6:11)
- සියල්ලෝ බියපත්ව (7:16)
- ඇගේ දෙමාපියෝ විශ්මිත වූහ. (8:56)
- මුළු සෙනඟ මහා භිතියට පැමිණ (8:37)
- සමූහයෝ පුදුම වූහ. (11:14)
- මුළු සමූහයා අමන්දානන්දයට (13:17)
- මුළු ජනතාව දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ (18:43)

**මෙම සුබාරංචිය ලියූ කර්තෘ දක්ෂ ලේඛකයෙකි:**

ලූක් තුමා ග්‍රීක භාෂාවේ නිපුණතාවක් ලැබුවෙකි. ග්‍රීකයින් දක්ෂ ලෙස ලිවීමට හැකියාවන් පෙන්නුම් කරයි. ලේඛනයේදී භාවිතා කළේ උසස් ග්‍රීක බස ය (1:1-4). එතුමා එදා ග්‍රීක සාහිත්‍යයේ භාවිතා කළ සාහිත්‍යමය උපක්‍රම සුවිශේෂය රචනා කිරීමේ දී යොදා ගෙන ඇත.

- අදහස් කිපයක් එක විශේෂ තේමාවක් ඔස්සේ ගෙනහැර දැක්වීම ග්‍රීක සාහිත්‍යයේ ලක්ෂණයකි.

උදා:-

- පව්කාර ස්ත්‍රියගේ කථාව (7:36-50)
- පරිසිවරුන්ට හා විනයධරයන්ට තරවටු කිරීම. (11:37-54)
- ආගන්තුක සත්කාරය (14:7-24)
- සමුගැනීමේ අනුශාසනා (අන්තිම රාත්‍රි භෝජනය) (22:14-38)

**කර්තෘවරයාට ආවේණික රීතියක් අනුගමනය කර ඇත. (1:3)**

- ස්නාවක ජුවාම් තුමාගේ ජීවිතයේ සිද්ධීන් සියල්ලම එක තැනකට ගොනුකර දක්වයි.
- ජේසුස් වහන්සේගේ නාසරතයේ ධර්මදූත සේවාව හා නුවරට පැමිණි අවස්ථාව එක තැන ඉදිරිපත් කරයි. (4:16)
- ජේසුස් වහන්සේගේ ජීවිත කතාව සම්පූර්ණ කතාන්දරයක් ලෙස අන් සුබාරංචිවලට වඩා ඉදිරිපත් කරයි.

- ග්‍රීක සාහිත්‍යයෙන් වූ ජනප්‍රිය හා දක්ෂ උපක්‍රමයක් වන, කෙනෙකු ගැන ලිවීමේදී ඔහු ගමනක් යාම හෝ ගමන ලෙසින් ඉදිරිපත් කිරීම, මෙහිදී ද දක්වා ඇත.

- දේවමාතාව එළිසබෙත් තුමිය බැහැදැකීමට යාම (1:39)
- ජුසේ තුමා හා මරියතුමිය බෙත්ලෙහෙමට යාම (2:4)
- දේව මාළිගාවට ඔප්පු කිරීමට යාම (2:20)
- ගෝලයෝ සමඟ ජෙරුසලමට යාම (9:51-27)
- එම්මාවුස් නගරයට යාම (24:23)

**ලූක්තුමා සඳහන් කරන ගමන් තේමා :**

- දෙවියන් වහන්සේ මිනිසා වෙතට පැමිණෙන අවස්ථා (මිනිස් ඉතිහාසය යනු)
- ජුදෙව්වරු හා අන්‍යජාතීන් ජේසුස් වහන්සේ වෙතට ගමන් කරති. (ඔවුන්ගේ සංස්කෘතිය හා ඉරණම සම්පූර්ණ කළ හැකි වූයේ උන්වහන්සේට පමණි)

- ජේසුස් වහන්සේ හා ගෝලයෝ මරණය හා උත්ථානය කරා ජෙරුසලෙම දෙසට ගමන් කරති.
- ලූක්තුමාට අනුව ලෝකයේ කේන්ද්‍රස්ථානය වන රෝමය කරා මුළු සභාව ම ගමනක යෙදේ.
- මුළු මිනිස් සංහතිය ම ගමනක යෙදී ඇත. එහි අවසානයේදී ඔවුහු මනුෂ්‍ය පුත්‍රයා ඉදිරියේ පෙනී සිටිති. (21:36)

**මෙම සුවිශේෂයේ කතුවරයා ඉතිහාසඥයෙකි:**

ජේසුස් වහන්සේගේ ජීවිත කතාවේ හිස්තැන් පිරවීමට ලූක්තුමා පමණක් උත්සාහ කර ඇත. එම නිසා ලූක් සුබාරංචිය ජීවිත කතාවක් සේ ගලායන ස්වරූපයක් ද දක්නට ඇත. මෙවැනි අඩුපාඩු සම්පූර්ණ කළ අවස්ථා,

- දේවමාළිගයේ නැතිවී යළි හමුව නාසරතයේ කීකරුව විසීම. (2:41-50)
- නාසරත්හි අප්‍රසිද්ධ ජීවිතයේ සාරාංශය (2:51-52)

ජේසුස් වහන්සේගේ ඓතිහාසික ජීවිතයේ සිද්ධීන් හඳුන්වා දීම සඳහා උපමා වශයෙන් ඉදිරිපත් කරයි.

- යහපත් සමරිතානුවරයා (10:29-38)
- ආරාධිත අමුත්තන්ගේ අසුන් ගැනීම (14:7-11)
- නැතිවූ බැටළුවා (15:1-7)

**කාලයට සම්බන්ධ බොහෝ ඉතිහාස කරුණු සඳහන් කරයි.**

- සකරියස්ට ප්‍රකාශවීම (1:5)
- ජේසුස් වහන්සේගේ උපත මරියතුමියට ප්‍රකාශ කිරීම (1:26)
- ජේසුස් වහන්සේගේ උපත (2:1-5)
- ස්නාවක ජුවාම්තුමාගේ ධර්මදූත සේවාව. (3:1-2)
- ජේසුස් වහන්සේගේ වංශාවලිය (3:23)

**බොහෝ පුද්ගලයන්ගේ පසුබිම ගැන හඳුන්වාදීමක් කරයි.**

- සකරියස් (1:5)
- සිමියොන් (2:25)
- ජේසුස් වහන්සේ (3:23)
- අන්නා (2:36)
- ජුසේතුමා (1:27-2:4)
- යායිරස් (8:41)
- සිරිනියේ සීමොන් (23:26)
- එලිසබෙත් (1:5)
- රෝම ශතාධිපතියා (7:2)
- ජුවාම් (3:2)
- හෙරෝද්(9:7)
- අරිමිතියේ ජෝශප් (23:30)

**අප්‍රසිද්ධ කුඩා නගර හඳුන්වා දෙයි.**

- නාසරෙත් (1:2)
- කපර්ණාවුම් (4:31)
- අරිමිතියාව (23:51)
- එම්මාවුස් (24:23)

මෙම සුවිශේෂය අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතට හා පාවුලුතුමාගේ ඉගැන්වීම් හා සංදේශවලට සමානකමක් ද දක්වයි.

## 4.9. ලූක් සුබාරංචිය අනික් කෘතීන් සමඟ සම්බන්ධතාව

**ක්‍රියා පොත හා සබඳතාව:**

උදා :-

- පිළිගැන්වීම එකම පුද්ගලයාට ය.
- භාෂාව, ශෛලිය හා වාක්‍ය ගැලපීම සමාන ය.
- තේමාව ගැලවීමේ සකල ජනතාවට බව පැහැදිලි ය.

- ගමන සම්බන්ධව තේමා දෙක ම ඇත.
- රෝම සම්බන්ධතා ගැන ක්‍රියා පොතේ ඇත.

**පාවුලු තුමාගේ ලිපි හා ඉගැන්වීම අතර සබඳතාවː**

**උදාː-**

- දෙක ම අන්‍යජාතීන්ට ලියා ඇත.
- ගැලවීම සියල්ලන්ටම පොදු ය.
- ජේසුස් වහන්සේ සමිඳාණෝ ලෙස දැක්වේ.
- අන්තිම භෝජනය (1 කොරින්ති 15:5)
- ලූක්තුමා පාවුලු තුමාගේ ගෝලයෙකු බව

## 4.10. ලූක් සුවිශේෂයට ආවේණික කරුණු, ප්‍රාතිහාර්ය සහ උපමා

- ස්නාවක ජුවාම් තුමාගේ සහ ජේසුතුමාගේ උපත. (1:5-2:52)
- මාර්තා හා මරියා (10:38-42)
- මනස්ථාපනය නොවීමේ විපාක. (13:1-5)

**ප්‍රාතිහාර්යයන්**

- මසුන් රාශියක් හසුවීම (5:1-11)
- නායිම් නුවර තරුණයාගේ පුනර්ජීවනය (7:11-17)
- කුදු ස්ත්‍රියගේ සුවය (13:10-17)
- දිය උදර රෝගියාගේ සුවය (14:1-6)
- ලාදුරු රෝගීන් දසදෙනා(17:11-19)
- උත්තම පූජකයාගේ දාසයාට සුවය (22:50-51)

**උපමා :**

- ණයකරුවන් දෙදෙනා (7:36-50)
- යහපත් සමාරියා (10:25-37)
- නොකඩවා ඉල්ලූ මිත්‍රයා (11:5-8)
- පොහොසත් මෝඩයා (12:13-21)
- විශ්වාස දාසයා (12:35-40)
- ඵල නැති අත්තික්කා ගහ (13:6-9)
- බැහැපත්කම ගැන උපමාව (14:7-14)
- නැතිවූ කාසිය (15:8-10)
- නැතිවූ පුතා (15:11-31)
- වංචනික ගබඩාකරු (16:1-13)
- ධනපතියා හා ලාසරස් (16:19-31)
- වගකිවයුතු දාසයා (17:7-10)
- වැන්දඹුව හා විනිශ්චයකාරයා (18:1-8)
- පරිසිවරයා සහ අයකැමියා (18:9-14)

# පස්වන පාඩම

## 5. දේව ප්‍රසාද නිධාන

### 5.1 දේව ප්‍රසාද නිධාන පිළිබඳ පොදු හැඳින්වීම

දේව ප්‍රසාද නිධානයක් යනු කමක් ද? යන ප්‍රශ්නයට ඉතාමත් සරළ අයුරින් පිළිතුරු දෙන්නේ නම් මෙසේ ප්‍රකාශ කළ හැක ''කිතුනු ජීවිතයට දේව වරප්‍රසාද ගලා එන දිය උල්පතක් වැනි වත්පිළිවෙතකි.'' එපමණක් නොව මෙම වත්පිළිවෙතේ ලක්‍ෂණ කීපයක් සඳහන් කළ හැක. පිටස්තර සළකුණු හා සංකේත දැකිය හැකි, අභ්‍යන්තර වරප්‍රසාද මිනිසාට ලබාගත හැකි, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් ම ස්ථාපිත කර තිබීම එම ලක්‍ෂණ වේ.

දුක්විඳ උකුත්වී උත්ථාන වූ කිතු සමිඳුණන් දේව ප්‍රසාද නිධාන තුළ ක්‍රියාත්මක වෙමින් උන්වහන්සේගේ ගැලවීමේ බලය ක්‍රියාත්මක කරන සේක. මෙම දේව ප්‍රසාද නිධාන තුළින් මිනිසා උත්ථාන වූ කිතු සමිඳුණන්ට හා උන්වහන්සේගේ ගැලවීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ ය.

දේව ප්‍රසාද නිධාන සඳහා භාවිතා කරන නාමයකි ''සක්‍රමේන්තු'' යන වචනය. එය ''සක්‍රමෙන්ටුම්'' යන ලතින් වචනයෙන් බිඳී එන්නකි. තවද එම වචනය මිස්ටෙරිඩන් යන ග්‍රීක වචනයේ පරිවර්තනයක් වේ. එහි අරුත වනුයේ ''අභිරහස්මය දෙයක්'' යන්නය. සක්‍රමේන්තු පිළිබඳ මූලික සංකල්පය ශු. බයිබලයේ සටහන් වී ඇත. එමෙන්ම සක්‍රමේන්තු හා බැඳීගිය ඇතැම් වත්පිළිවෙත් ඩිඩාකේ (ක්‍රි.ව. 100) හා හිප්පොලිටස්ගේ ''අපෝස්තුලික සම්ප්‍රදාය'' (ක්‍රි.ව. 215) කෘතියේ දී අඩංගු වේ. මෙයින් ගම්‍ය වනුයේ සභාවේ මුල් යුගවලදී මෙම වත්පිළිවෙත් ඉතා සරළව භාවිතා වී පසු කාලයේ දී ඒවා වැඩියෙන් විකාශනය වූ බව ය. ක්‍රි.ව. 207-212 වකවානුවේ සක්‍රමේන්තු යන වචනය මුලින්ම ටර්ටුලියන් තුමා භාවිතා කර ඇති වග ඉතිහාසය පෙන්නුම් කරයි.

#### 5.1.1 දේව ප්‍රසාද නිධාන (සක්‍රමේන්තු) වල අරමුණු :

1. මනුෂ්‍යයන් ශුද්ධවත් කිරීම.
2. ක්‍රිස්තු දේහය නඟා සිටුවීම.
3. දෙවියන් වහන්සේට වන්දනා කිරීම.

දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමේ දී මූලිකම අවශ්‍යතාවයක් වනුයේ විශ්වාසය යි. මේ නිසාම සක්‍රමේන්තු විශ්වසයේ සක්‍රමේන්තු ලෙස ද හඳුන්වයි. තවද දේව ප්‍රසාද නිධාන විධිමත් ලෙස ලබා ගැනීමෙන් දේව වරප්‍රසාද විශ්වාසකයන් භුක්ති විඳින අතර වඩාත් අර්ථවත් අයුරින් දේව වන්දනාව හා ගෞරවයද දෙවියන් වහන්සේට පිදෙනු ඇත. මේ හෙයින් දේව ප්‍රසාද නිධාන නිතර නිතර ලබාගැනීම හා ඒ දේව ප්‍රසාද නිධානවල සලකුණු අවබෝධ කරගැනීමෙන් ක්‍රිස්තියානි ජීවිතය පෝෂණය වනු ඇත.

#### 5.1.2 දේව ප්‍රසාද නිධානවල ඇති සලකුණු හා සංකේත

සලකුණු හා සංඥාවන් ගැන හරි අවබෝධයක් ලබාගත යුතු වේ. සලකුණක් සංඥාවකට වඩා වෙනස් වේ. සංඥාවක් අපට යම්කිසි පණිවුඩයක් ගෙන දෙයි. සළකුණක් පණිවුඩයක් පමණක් නොව ඊට වඩා තව කරුණු රාශියක් ගෙන දේ. අත්දැකීම් රාශියක් අපට සිහි කරවනු ඇත. කාලවකවානු හා පුද්ගල ගොන්නකට අපිව බද්ධ කරනු ඇත. ඒ නිසාම සක්‍රමේන්තු තුළින් අපට කතාකරනු ඇත. සක්‍රමේන්තු සළකුණු හා සංකේත භාවිත කරයි.
උදා : ප්‍රසාද ස්නාපනයේ දී ජලය භාවිතා කරයි.

**ජලය :** සංකේත හා සලකුණු රාශියක් මතක් කර දෙනු ඇත.

- ලෝකය මැවීමේ දී ජලය මතුපිට දේවානුභාවය හැසිරීම.
- නොවාගේ කාලයේ ජලගැල්ම තුළින් අළුත් අහසත් අළුත් පොළොවක් බිහි කිරීම.
- රතුමුහුද තරණයේ දී වහල් කම පරාජය කිරීම හා නිදහස් මිනිසෙක් බිහිවීම.
- ප්‍රසාද ස්නාපන ජලයෙන් පාපයේ වහල් බවින් මිදීම.
- ජේසුස් වහන්සේ ජොර්දාන් නදියේ දී බව්තීස්ම ස්නාපනය ලැබීම

යන කරුණු කාරණා ප්‍රසාද ස්නාපනීය ජලය අපට සිහි ගන්වයි. එබැවින් ප්‍රසාද ස්නාපනයේ දී නිකම්ම ජලයක් නොව මහා අර්ථාන්විත, යුග ගණනාවක් එකට යා කරන පුද්ගලයින් රාශියක් සිහිගන්වන අර්ථයක් සිහිගන්වයි.

පුරාණ ගිවිසුමේ ජනතාව තම ජන වන්දනාත්මක ජීවිතයේ දී වැදගත්වන සංකේත හා සළකුණු උරුම කරගෙන ඇත. උදා: රජවරුන් හා පූජකයින් ආලේප කිරීම හා අභිෂේක කිරීම, හිස මත අත් තැබීම, සඳහා ''නික්මයාමය''. පුරාණ ගිවිසුමේ මෙම සලකුණ නව ගිවිසුමේ සක්‍රමේන්තුවල පූර්ව සළකුණ වේ. ජේසුස් ස්වාමීන් වහන්සේ එම පූර්ව සළකුණට නව අරුතක් දානය කළ සේක. නික්මයාමට හා පාස්කුවට නව අරුතක් ලැබුණි. එබැවින් සක්‍රමේන්තු සිදුකිරීමේ දී ගැලවීමේ ඉතිහාසය හරියකාරව අවබෝධ කර ගත යුතු වේ.

තවද සක්‍රමේන්තු තුළ අතීතය වර්තමානය හා අනාගතය යන යුග තුනම අඩංගු වේ. සක්‍රමේනත්වක් සංඥාවක් නොවේ. සංඥාවක් මඟින් යම්කිසි පණිවුඩයක් නිකුත් කරයි.

උදාහරණ :

- හතරමං හන්දියේ ඇති මාර්ග සංඥාවේ රතු එළිය දැල්වුණු විට වාහන නවතින අතර කොළ එළිය දැල්වුණු විට නැවත වාහනය පනගන්වා ධාවනය වේ.
- උසාවියක් ඉදිරිපිට නලා නාද නොකිරීමට දෙන සංඥාව වලංගු වනුයේ උසාවිය ඉදිරිපිටට පමණි. එම සීමාව පසු කළ විට නලා නාද කළ හැක.

එබැවින් සක්‍රමේන්තුවක් යනු සංඥාවක් නොවේ එය මිනිසාගේ ජීවිත කාලය දක්වාම පවතී. උදා: ආශිර්වාදකාර බන්ධනය සක්‍රමේන්තුව විවාහවන දිනයට පමණක් නොවේ. එදින සිදුවන්නේ එම සක්‍රමේන්තුවේ ජීවිතය ආරම්භ කිරීමක් පමණි. ආශිර්වාදකාර බන්ධනයේ සක්‍රමේන්තුව තුළින් එක් කරන ස්ත්‍රිය හා පුරුෂයා මැරෙන තුරා එම සක්‍රමේන්තුවේ ජීවිතය තුළ ජීවිතය ගෙන යයි. ඔවුන් මැරෙන තුරාම එක පවුලක් වේ. එනම් ''දෙවියන් එක් කළ දෙය මිනිසා වෙන් නොකෙරේවා'' ය.

**දේව ප්‍රසාද නිධානවල ඇති සලකුණු දෘෂ්‍යමාන ය. එහෙත් එහි ප්‍රතිඵල අදෘෂ්‍යමාන ය.**

***උදාහරණය***

- පුප සහ මිදිරස දෘෂ්‍යමාන ය. එහෙත් දිව්‍ය සත්ප්‍රසාදය තුළ සිටින ජේසුස් ස්වාමන් වහන්සේ අපට අදෘෂ්‍යමාන ය.
- තවද ජනවන්දනාවේ සංකේත හා සළකුණු සභාවේ සංකේත නිසා ඒවා පුද්ලයාගෙන් පුද්ගලයාට හෝ එක් රටකින් තවත් රටකට වෙනස් නොවේ. එබැවින් ජනවන්දානවේ සංකේත තමාගේ සංකේත බවට පත්කරගත් විට සක්‍රමේන්තු තුළින් දෙවියන්ට නමස්කාර කිරීමට පහසු අතර සක්‍රමේන්තුවේ සැබෑ අරුත අවබෝධ කර ගත හැක.
- මෙය වඩාත් සාර්ථක කරගැනීම පිණිස ප්‍රායෝගිකව කළ යුතු දෙයක් ඇත. සක්‍රමේන්තු දානය කිරීමට පෙර සැඳහැවතුන්ව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ. විශ්වාසයෙන් හා සක්‍රීයව ජීවත් විමේ හැකියාව ඒ තුළින් අත්දැකිය හැක.

### 5.1.3 ප්‍රසාද නිධාන ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කර ඇත.

ශු. තෝමස් ඇක්වයිනස් තුමා පවසා ඇති අන්දමට දේව ප්‍රසාද නිධාන ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති අතර එය ඍජු හා වක්‍ර යන ක්ෂේත්‍ර තුළ විහිදෙයි.

**දේව ප්‍රසාද නිධාන 7 කි.**

වර්තමානයේ දී ශු. සභාව දේව ප්‍රසාද නිධාන 7ක් බව ස්ථිර වශයෙන් ම සනාථ කර ඇත. සභාවේ මූල් වකවානුවල මෙම සංඛ්‍යාවේ වෙනස් කම් තිබූ බවට සභා ඉතිහාසය සාක්ෂි දරයි.

## 5.2 ප්‍රසාද ස්නාපනය

මෙලොව උපත ලබන සැම මනුෂ්‍යයෙකුටම උපත ජීවිතයේ ආරම්භයක් වන්නා සේ ම ප්‍රසාද ස්නාපනය දේව ජීවිතයට පිවිසීමක් නැතහොත් ආරම්භයක් වනු ඇත. ප්‍රසාද

ස්නාපනය නමැති සක්‍රමේන්තුව මිනිසාගේ ජම්ම පාපයෙන් නිදොස් කර ඔහුව දේව දරුකමටත් ශු. සභාවේ සාමාජිකත්වයටත් ඔසවන සේක.

1. ස්වර්ග රාජයයට පිවිසීමට ප්‍රසාද ස්නාපනයේ අවශ්‍යතාවය ජේසුස් වහන්සේම වදාළ සේක. ජේසුස් වහන්සේ නිකදේමුස්ට පිළිතුර දෙමින් ''ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. යමෙකු වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකි ය.'' (ජොහාන් 3:5)

2. උන්වහන්සේ එසේ ඉගැන්වූවා පමණක් නොව උන්වහන්සේ ද ජනතාවට බව්තීස්ම ස්නාපනය දානය කළහ. ''ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් කැටුව ජුදා දේශයට පැමිණි සේක. එහි උන්වහන්ස් ඔවුන් සමඟ නැවතී සිට බව්තීස්ම ස්නාපනය කළ සේක...'' (ජොහාන් 3:22)

3. එමෙන්ම උන්වහන්සේ තම ශ්‍රාවකයින්ට දුන් අවසාන ආඥාව වූයේ ද ප්‍රසාද ස්නාපනය ගැන ය. ''එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ගෝලයින් කරන්න. පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණානගේ ද නාමයෙන් ඔවුන් බව්තීස්ම ස්නාපනය කරන්න...'' (මතෙව් 28:19)

**ශු. සභාව ආරම්භයේ සිටම...**

- ශු. සභාව ආරම්භයේ සිට ම උන්වහන්සේගේ ආඥාව ගෝලයින් පිළිපැදීය. ස්වාමින් වහන්සේව විශ්වාස කළ අයට ප්‍රසාද ස්නාපනය දානය කරන ලදී. පේදුරු තුමා ශුද්ධාත්ම වරම් ලබා කළ මංගල දේශනයෙන් පසු ''ඔහුගේ වචන පිළිගත් අය බව්තීස්ම ස්නාපනය කරනු ලැබූහ. ඒ දවසේ දී තුන්දහක් පමණ පුද්ගලයෝ ඔවුන්ගේ සංඛ්‍යාවට එකතු කරන ලදහ.'' (ක්‍රියා 2:4)

- සභාවේ මුල් අවධියේ දී ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ප්‍රසාද ස්නාපනය ලබාගත් බව පේදුරු තුමාගේ වචන මෙලෙස මතක් කර දෙයි. ''පේදුරු තුමා පිළිතුරු දෙමින් ''ඔබ සියලු දෙනාම මනස්ථාපනය වී පව් කමාව ලබන පිණිස ජේසුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම ස්නාපනය ලබන්න...'' (ක්‍රියා 2:38, 10:48, 19:5, රෝම 6:3, ගලාති 2:17)

- සභාවේ අපෝස්තුලීක යුගයේ සිට තුන්දෙනා වහන්සේලාගේ නාමයෙන් බව්තීස්ම ස්නාපනය දානය කර ඇති අතර අදත් ඒ පැරණි ඉගැන්වීම හා ක්‍රම වේදය අනුව ප්‍රසාද ස්නාපනය දානය කරනු ලැබීමේ උතුම් සක්‍රමේන්තුව ක්‍රිස්තුන් වහන්සේ තුළ මුල් බැස අපෝස්තලික යුගයෙන් පෝෂණය වී වර්තමානයේ විස්වාසකයින් දේව දරුවන් කරනු ඇත.

- යමෙක් ප්‍රසාද ස්නාපනය ලැබීමට අවශ්‍ය මූලිකම සුදුසු කම වනුයේ ස්වාමින් වහන්සේ තුළ ඇති විශ්වාසය යි. එපමණකුදු නොව ජේසුස් වහන්සේව අදහාගත්තවුන්ට බෞතිස්ම ස්නාපනය දානය කිරීමේ බලය අපෝස්තුළුවරුන්ට පමණක් නොව තවත් අයට ද හිමිවී තිබුණි.

  *උදාහරණ :*
  ක්‍රියා 9/10-19 - අනනියස් සාවුල්ට බෞතීස්ම ස්නාපනය දානය කිරීම.
  ක්‍රියා 8/26-39 - තේවාචාරි පිලිප් ඵතියෝපීය නපුංෂකයාව බව්තීස්ම ස්නාපනය කිරීම.

- ස්වාමින් වහන්සේ තුළ විශ්වාසයෙන් සිත් හැරුණු ජනතාව ප්‍රසාද ස්නාපනය ලබා සභාවේ සාමාජිකත්වය තුළින් දෘෂ්‍යමානව දේව දරුවන් වීම ප්‍රකාශ කරයි. එම දේව දරුකම තුළ විශ්වාසයේ ජීවිත මගින් ඔවුන්ගේ විධිමත් කැපවීම හා සියළු විශ්වාසකයින් සමඟ එකමුතුව ආදරයේ ජීවිතය පැවැත්ම ක්‍රිස්තියානි සංසයක් බිහි කරයි. තවත් අයුරකින් ප්‍රකාශ කරන්නේ නම් ප්‍රසාද ස්නාපනය සංසයක් බිහි කරයි.

- මෙම සංසය තුළ ළදරුවාට නොව වැඩිහිටියාට බෞතීස්ම ස්නාපය දීම මුල් යුගවලදී සිදුවිය.

- ඩිඩාකේ (අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් අඩංගු ග්‍රන්ථය) හි සටහන් වී අති ලෙස පීඩන යුගයේ දී දුක් කරදර දරාගැනීමට නොහැකි අයට ප්‍රසාද ස්නාපනය ලබා දීමෙන් වැළකී ඇත.

- එමෙන්ම ප්‍රසාද ස්නාපනය ලබාන්නාත්, සක්‍රමේන්තුව දානය කරන්නාත් සංඝයේ හැකි සියළු දෙනාත් ප්‍රසාද ස්නාපනයට පෙර නිරාහාරශීලය රැකිය යුතු විය.

- ගලායන දිය පහරක් බෞතීස්ම ස්නාපනයට තෝරා ගන්නා ලදී. ඒ චාරිත්‍රය දේවස්ථානය තුළට ගෙන ආවේ රඳගුරු තුමාගේ දේවස්ථානය වන ආසන දෙව් මැදුරේ බෞතීස්ම පොකුණ පැති අටකින් යුක්තව ඉදිරි කිරීමෙන් පසුව ය.

**දෙවන සියවසේ දී පමණ**

- සභාවේ ආරම්භක අවධියේ දී ජේසුස් වහන්සේ තුළ විශ්වාසය ඇති බව ප්‍රකාශ කළ විගසම ඔවුන්ට බෞතීස්ම දානය කළ ද,

- තුන්වන සියවසේ දී පමණ ස්වාමීන් වහන්සේ තුළ විශ්වාසය පමණක් නොව සුදානම් වීමේ කාලයක් ද බෞතීස්මයට අවශ්‍ය බව සභාව තේරුම් ගන්නා ලදී. ඒ නිසාම එම විශ්වාසකයින් වසර 2 ක් හෝ 3ක් වැනි කාලයක් බෞතීස්මයට සුදානම් වීමේ කාලය ලෙස වෙන්විය. (Period of Catechumenate) එම කාලය තුළ ධර්මෝපදේශය ඉගැන්වීමත්, සාතන්ව ප්‍රතික්ෂේප කරමින් එකම දෙවියන් වහන්සේ තුළ විශ්වාසීය ජීවිතයකට නැඹුරු කළහ. එම සුදානම් වීමෙන් පසු එම අයට බෞතීස්ම ස්නාපනය දානය කළේ ආලේලුයියා සෙනසුරාදා පූර්ව රාත්‍රියේ දී ය. වැඩිහිටි අපේක්ෂකයින්ට බෞතීස්ම දානය කළ අතර චතාරික කාලයේ විශේෂයෙන් ඔවුන්ව සුදානම් කළේ ය.

## 5.2.1 ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද

* ජම්ම පාපයෙන් නිදොස් වීම.
* ප්‍රසාද ස්නාපනය තුළින් ශු. ත්‍රිත්වයම ප්‍රසාද ස්නාපනය ලබන්නා වෙත පතිත වීම තුළ ඔහු/ඇය නව මිනිසෙක් වනු ඇත. මෙම සක්‍රමේන්තුව තුළින් මෙම නව මිනිසා ලබන අලුත් ජීවිතය දෙවියන් වහන්සේගෙන් ලබන නව වරප්‍රසාදයේ ජීවනය වේ. එම නව ජීවනය ජේසුස් වහන්සේගේ මරණයේ පින්කුසල් හේතුවෙන් බෞතීස්මය ලත් නව මිනිසාට උරුම වේ. එය වරප්‍රසාදයේ ජීවිතයකි. (රෝම 3:24)
* තවද ප්‍රසාද ස්නාපනයේ දී ශුද්ධාතමයාණන් වහන්සේ එම අපේක්ෂකයාගේ ශරීරය ශුද්ධවත් කර ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයක් බවට පත් කරන සේක. ''ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නා හු ද?'' (1 කොරින්ති 6:19)
* මෙම නව ජීවිතය හේතුවෙන් බෞතීස්ම ලැබූ මිනිසා දෙවියන්ගේ දරුවෙක් වනු ඇත. තවත් අයුරිකින් ශු. ත්‍රිත්වය හා සමඟ සාංඝික ජීවිතයකට ඇතුළු වන හෙයින් සදාතන ජීවිතයට ද උරුමකම් කියනු ඇත.

## 5.2.2 බෞතිස්ම ස්නාපනය කා සඳහා ද?

### 1. ළඳරු ප්‍රසාද ස්නාපනය

සභාවේ මුල්ම අවධියේ දී පැවතියේ වැඩිහිටි ප්‍රසාද ස්නාපනය බව මතක තබාගත යුතු වේ. ගලායන වතුර පාරක ඔවුන්ව ගිල්වා ප්‍රසාද ස්නාපනය දානය කිරීම සභාවේ මුල් යුගයේ තිබූ චාරිත්‍රය වේ. පසුව ළඳරු වයසේ දීම ප්‍රසාද ස්නාපනය ලබාදී දෙවියන් වහන්සේගේ ආදරය හා ආදර්ශය තුළ දෙමාපියන්ගේ හා ආත්මික මව්පියන්ගේ විශ්වාසය ඇපයක් කොට ගනිමින් සාන්ත සභාව තුළ කාය ශක්තියෙන් ද ප්‍රඥා මහිමයෙන් ද වැඩි වර්ධනය වන්නට අවස්ථාව ලබාදීමට ළඳරු වයසේ දීම දරුවන් ක්‍රිස්තියානි කිරීම ආරම්භ විය.

- සභා ශාසන නීතිය අනුව (867/1) දරුවා ඉපද මුල් සති කීපය තුළ දරුවාව ප්‍රසාද ස්නාපනය කළ යුතු ය.

- දරුවා ප්‍රසාද ස්නාපනය කිරීමේ දී දරුවාගේ දෙමාපියන්ගේ කැමැත්ත තිබිය යුතු ය.
- දරුවා කතෝලික දහම තුළ ඇති දැඩිවේ යන බලාපොරොත්තුව ප්‍රසාද ස්නාපනය දානය කරන පියතුමාට තිබිය යුතු ය.
- දරුවාගේ දෙමාපියන් ආශිර්වාදකාර බන්ධනයේ සක්‍රමේන්තුව ලබා තිබිය යුතු ය.

**ආත්මික මව්පියන්**

- ඔවුන් දරුවන්ගේ දෙමාපියන් සමඟ දරුවාව ප්‍රසාද ස්නාපනය ලැබීමට යොමු කිරීම.
- ප්‍රසාද ස්නාපනය මගින් ලබන දේව ජීවිතයට අනුව දරුවාට හැදී වැඩෙන්නට උදව් උපකාර කිරීම.
- දෙමාපියන්ට දරුවා වෙනුවෙන් වගකීමක් තිබෙන්නා සේ ම ඥාන මව්පියන්ට ද එලෙසම දරුවාගේ ආත්මික ජීවිතය සංවර්ධනය කිරීමට වගකීමක් ඇත.
- දරුවා ළදරුවෙක් බැවින් බෞතීස්මය දානය කරනුයේ දෙමාපියන් හා ඥාන මව්පියන්ගේ දේව විශ්වාසය මත ය.
- එබැවින් ප්‍රසාද ස්නාපනය ලබා එම දරුවා හොඳ නරක අවබෝධ කරගන්නා වයසට එන තුරු දෙමාපියන් හා ආත්මික මව්පියන් එම දරුවාගේ විශ්වාසය ආරක්‍ෂා කොට පෝෂණය කළ යුතු ය. එය ඔවුන්ගේ මූලික වගකීමකි.
- වැඩිහිටියෙකුගේ හා ළදරුවකුගේ ප්‍රසාද ස්නාපනයේ දී ඥාන මව්පියන් ප්‍රසාද ස්නාපනය ලබන්නාගේ ආත්මික ජීවිතය පිළිබඳ වගකීම් දරනුයේ නෑ හිතවත් කම් නිසාම පමණක් නොව ප්‍රධාන වශයෙන් කතෝලික සභාව නියෝජනය කරන්නෙක් වන නිසා ය. ශුද්ධවූ සභාවේ සාංඝිකත්වය ඉන් ඉස්මතු කරයි.
- එබැවින් දෙමාපියන් තම දරුවාගේ ඥාන මව්පියන් තෝරා ගැනීමේ දී දෙවියන් වහන්සේ ඉදිරියේ දරුවා වෙනුවෙන් වගකිම් හා යුතුකම් කොටසක් ඉටුකළ යුතු බව අවබෝධ කර ගත යුතු වේ.

**ආත්මික මව්පියන් වීමට සුදුසුකම්**

- වැඩිහිටි ප්‍රසාද ස්නාපනයේ දී අපේක්‍ෂකයා ඥාන පව්පියන් තෝරා ගත යුතු වේ.
- ළදරු ප්‍රසාද ස්නාපනයේ දී දරුවාගේ ඥාන මව්පියන් තෝරාගනු ලබන්නේ දරුවාගේ දෙමාපියන් ය. එසේ නොමැති අවස්ථාවලදී පියතුමා පත් කරනු ලබයි.
- පදවියේ රදගුරු තුමා විසින් වයස් සීමාවක් ඥාන මව්පියන් තෝරා ගැනීමේ දී පනවා නැතිනම් ආරම්භක ප්‍රසාද නිධාන ලබා ඇති (ප්‍රසාද් ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය හා අභිවෘද්ධි ආලෝපය) අය විය යුතු ය.
- තමාගේ දේව විශ්වාසය ජීවත් කරවන හා තම වගකීම් ගැන අවබෝධයක් ඇති අය විය යුතුය.

## 2. වැඩිහිටි ප්‍රසාද ස්නාපනය

- සභාවේ මුල් යුගයේ දී පැවතියේ වැඩිහිටි ප්‍රසාද ස්නාපනය වේ.
- වැඩිහිටි ප්‍රසාද ස්නාපනයේ දී අවශ්‍යය මූලිකම කාරණා වනුයේ
    * අපේක්ෂකයාගේ නිදහස් කැමැත්ත.
    * කිතු දහම පිළිබඳ නිවැරදි අවබෝධය.
    * ආධුනිකයෙකු ලෙස කිතුනු දිවිය පිළිබඳ උනන්දුවක් දක්වා තිබීම.
    * පෞද්ගලිකව පව්වලට පසුතැවිලි වී සිටිම.

### I. වැඩිහිටි ප්‍රසාද ස්නාපනයේ අධියර

පළමු වන අධියර වනුයේ එම අපේක්‍ෂකයා ප්‍රසාද ස්නාපනය ලැබීමට සුදානම්වන්නකු ලෙස පිළිගැනීමේ පිළිවෙත ය.

ප්‍රසාද ස්නාපනය පතන එම අපේක්ෂකයාව කිතුනු සභාවට පිළිගෙන විවිධ අදියර ඔස්සේ පුරුදු පුහුණු කිරීම්වලට යොමු කළ යුතු වේ. කිතුනු සභාවේ

ධර්මය ඉගැන්වීමත්, විශ්වසා කළයුතු වේද සත්‍යතාවන් අවබෝධ කරදී ක්‍රිස්තු චරිතය හඳුන්වාදීම කළ යුතු වේ.

II. **වැඩිහිටි ප්‍රසාද ස්නාපනය දානය කිරීම**
අපේක්ෂකයා අවබෝධ කරගත් ක්‍රිස්තියානි ධර්මය තුළ සහ ස්වාමින් වහන්සේ තුළ ගැඹුරු විශ්වාසයක් ඇතිබව සහා පාලකයින්ට අවබෝධ වූ විට ඔහුට හෝ ඇයට ප්‍රසාද ස්නාපනය දානය කිරීම සිදුකෙරේ. එම පිළිවෙත සිදුකිරීමට වඩාත් යෝග්‍යය දිනය වනුයේ ආලේලූයියා සෙනසුරාදා රාත්‍රි මෙහෙය වේ.

III. **ආත්මීක මව්පියන්**
මෙහිදි ආත්මීක මව්පියන්ගේ මූලිකම වගකීම වනුයේ අපේක්ෂකයාට කිතුනු ජීවිතයක් ආරම්භ කිරීම සඳහා සහයවීම ය.

අපේක්ෂකයා ප්‍රාර්ථනා කරන ප්‍රසාද ස්නාපනය ලබාගැනීමට නවකයා කොතරම් සුදුසු ද යන්න සාක්ෂි දරණුයේ ඥාන මව්පියන් ය. ක්‍රියා 9:26-27 මතක්කර දෙන ලෙස ශු. පාවුළු තුමා ප්‍රසාද ස්නාපනය ලබාගැනීමට පෙර ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයින් ඉදිරියේ බර්ණබස් සාක්ෂි කරුවෙකු ලෙස ක්‍රියා කළ අයුරු අපට මතක් කර දෙයි.

## 3. රුධිරයේ ප්‍රසාද ස්නපානය

යම්කිසි පුද්ගයෙක් ප්‍රසාද ස්නාපනය ලැබීමට පෙර ප්‍රාණ පරිත්‍යාගිවරයකු ලෙස තම ජීවිතය විශ්වාසය වෙනුවෙන් පූජා කිරීමට සිදුවුවහොත් එම පුද්ගලයා ස්වර්ග රාජ්‍යයේ ප්‍රාණ පරිත්‍යාගි කිරීටය හිමිකර ගනී. එසේ සිදුවනුයේ එම පුද්ගලයාගේ රුධිරයෙන් ප්‍රසාද ස්නාපනය ලබා නව ලෙයින් පවිත්‍ර කරනු ලැබීම හේතුකොට ගෙනය. එය රුධිරයේ ප්‍රසාද ස්නාපනය ලෙස හඳුන්වයි.

## 4. ආශාවේ ප්‍රසාද ස්නාපනය

දෙවියන්ව වහන්සේගේ ආදරය හේතු කොටගෙන යම් කෙනෙක් තමන්ගේ පාපවලට මනස්ථාපනය වී සිටින අවධියක ප්‍රසාද ස්නාපනයට පෙර හදිසියේ මියගිය හොත් එම තැනැත්තා ආශාවේ ප්‍රසාද ස්නාපනය තුළින් ගැළවීම අත් කරගත හැක.

### 5.2.3 ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන සංකේත

1. **ජලය**
- ප්‍රසාද ස්නාපනයේ ප්‍රධාන සංකේතයයි (ජලය ජීවයේ උල්පත ය.)
- ලොව ආරම්භයේ දී ජලය මත දේවාත්මානුභාවය හැසුරුණේය. (උත්පත්ති 1/2)
- ජේසුස් වහන්සේ ම නිකදේමුස්ට පිළිතුරු දෙමින් ''ඒකාන්තයෙන්ම මම නුඹට කියම් යමෙකු වතුරෙන්ද, ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකි ය.'' (ජුවාම් 3/5)
- සභා පිය ටර්ටුලියන් තුමා පැවසු පරිදි ජලය මැවීමේ කාර්යයේ දී පූර්ව පැවතුනා සේම ප්‍රසාද ස්නාපනය තුළි මිනිසා නව මැවිල්ලක් බවට පත්කිරීමට ජලය උපකාරී වේ.
- ලෝකය ආරම්භයේ දී ජලය මත දේවාත්මානුභාවය හැසුරුණා සේ ශුද්ධාත්මයාණෝ පරවියකු විලසින් ජෝර්දාන් නදි ජලය මත ජේසුස් වහන්සේගේ බව්තීස්මයේ දී ද හැසුරුණු සේක. (මතෙව් 3/16) එබැවින් පළමු මැවීමත් නව මැවීමත් යා කරන පුරුක ජලය බව ඇලෙක්සැන්ඩ්‍රියාවේ ඩිඩිමුස් පවසයි. එබැවින් ජලය මැවීමේ සත්‍යතාවය ගෙන හැරපාන සංකේතය වී ඇත.
- ජලය මැවීමේ හා ජීවයේ සංකේතයක් වන්නා සේ ම විනාශයේ ද සංකේතයකි. නෝවාගේ කාලයේ සිදුවූ ජල ගැල්ම ඊට හොඳම නිදසුනක් වේ. එය එක්තරා ආකාරයක විනාශයට වඩා පවිත්‍ර කිරීමේ සංකේතයකි. ප්‍රසාද ස්නාපනය මඟින් මිනිසාගේ පාප විනාශ කර නව මිනිසෙක් උපදවයි.

- රතු මුහුදේ දී වහල් කමේ සතුරාව විනාශ වූවා සේ ප්‍රසාද ස්නාපනයේ ජලය තුළින් අපත් දෙවියන් වහන්සේත් අතර ඇති සතුරුකම් බිඳහෙළන බව ශු. බැසිල් තුමා පෙන්වා දෙයි.
- පාස්කු පූර්ව රාත්‍රියේ දී ප්‍රසාද ස්නාපන ජලය ආසිරිගන්වන විට මෙලෙස උච්චාරණය කරනු ලබයි. ''දෙවි ස්වාමිනි ආබ්‍රහම් ආදිපිතුරුවන්ගේ දරුවන් වන ඊශ්‍රායෙල් ජනතාව රතුමුහුදේ ජල කඳ මැදින් ගෙන ගොස් පාරාවෝ රජුගේ වහල්කමින් නිදහස් කොට ප්‍රසාද ස්නාපනය මඟින් බිහිවන ඔබගේ ම ජනතාවගේ ප්‍රතිමූර්තියක් මෙන් දැක්වූ සේක් වේ ද?''
- ජේසුස් වහන්සේගේ බව්තීස්ම ස්නාපනය ගැන කියවීමට ශු. මාක් තුමාගේ, ශු. මතෙව් තුමාගේ, ශු. ලූක් තුමාගේ සුවිශේෂ කියවන්න. (මතෙව් 3:13-17, ලූක් 3:21-22, මාක් 1:9-11)

**2. සුදු වස්ත්‍රය**

- සුදු වස්ත්‍රයෙන් අපට මතක් කර දෙනුයේ පිරිසිදුකම ය. අපවිත්‍රතාවයෙන් තොරව පිරිසිදු වීම ය. මෙම පිරිසිදුභාවය ආත්මික පිරිසිදුභාවයේ සංකේතයයි. සභාවේ මුල් යුගයේ දී ප්‍රසාද ස්නාපනය ලබන අපේක්ෂකයින් වැඩිහිටියන් වූ අතර ඔවුන් ජලයට බැස ස්නාපනය ලබා ගොඩට අවුත් සුදු වස්ත්‍රයක් පැළඳ ගැනීම චරිත්‍රය විය. ශු. පාවුළු තුමා ගලාතිවරුන්ට ලියූ ලිපියේ මෙසේ සටහන් වී ඇත. ''ඔබ අතරෙන් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයට බෞතීස්ම ස්නාපනය කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුන් වහනසේගේ ජීවිතයෙන් සැරසී සිටිති.'' (ගලාති 3:27) මේ හෙයින්ම ප්‍රසාද ස්නාපනයේ දී දරුවාගේ ඇඟට දමන සුදු වස්ත්‍රයෙන් සලකුණු වනුයේ පාපයට වැටුණු මිනිසා ප්‍රසාද ස්නාපනය තුළින් ක්‍රිස්තු ජීවිතයට ප්‍රවේශවීම ය. සුදු වස්ත්‍රය ක්‍රිස්තුන් වහන්සේගේ සලකුණ වේ. පැරණි පාපිෂ්ඨ ස්වභාවය ඉවතලා නව ස්වභාවය හෙවත් නව මිනිසා වන ක්‍රිස්තුන් වහන්සේව පැළඳ ගැනීම ය. මෙය කොලොස්සිවරුන්ගේ ලිපියේ 3:9 වගන්තියෙන්ද මතු කර පෙන්වනු ඇත.
- 5 වන හා 6 වන ශත වර්ෂවල දී අශිලාචාර ගෝත්‍රික ජනයාට ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී ඔවුන්ගේ පැරණි වනචාරි ජීවිතය අතහැර ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවිතයකට පිවිසීමට ද මෙයින් මතු කරන තවත් අර්ථයකි.
- ජේසුස් වහන්සේගේ අන්‍යරූප විලාශවීමේ දී ගෝලයින් දුටු ස්වාමින් වහන්සේගේ ප්‍රතිරූපය මෙලෙස මාක් සුවිශේෂකවරයා ඉදිරිපත් කරයි. ''මිහිපිට කිසිවෙකුටවත් සෝදා සුදුකළ නොහැකි තරම් ධවල දීප්තියකින් උන්වහන්සේගේ වස්ත්‍ර බැබළිනි.'' (මාක් 9:3) එලෙස ම ප්‍රසාද ස්නාපනයේ දී දරුවාගේ ඇඟමත තබන හෝ පළඳවන සුදු වස්ත්‍රය ස්වාමින් වහනසේගේ අන්‍ය රූප විලාශවීමේ දී ක්‍රිස්තුන් වහන්සේ පැළඳ සිටි ධවල වස්ත්‍රය සිහිපත් කරයි. සංකේතවත් කරයි. ක්‍රිස්තුන් වහන්සේගේ අන්‍ය රූප විලාශ වීම උන්වහන්සේගේ උත්ථානයේ පෙර දැක්මකි. පාපයට මැරී ප්‍රසාද ස්නාපනය තුළින් නව මිනිසෙක් බවට පත්වන කිතුනුවා උත්ථානවූ ක්‍රිස්තුන් වහනසේගේ මහිමයට කොටස් කරුවෙක් වේ.

**3. ආලේපය**

- අලේප කිරීම පැරණි ගිවිසුමේ ඉතා පැහැදිලිව දැකියහැකි අතර ගැඹුරු අරුතක් මතු කරයි. පැරණි ගිවිසුමේ ආලේප කළ පුද්ගලයින් වූයේ රජවරු හා දිවැසිවරුන් ය. එසේ ආලේප කිරීම තුළින් දෙවියන්ට කැපවූ යන අරුත ඉස්මතු කරයි. එහෙයින් ම දෙවියන්ට කැපවූ තැනැත්තා දෙවියන් වහන්සේට හා මනුෂ්‍යයාට සේවය කළ යුතු වේ.
- ප්‍රසාද ස්නාපනයේ දී ආලේප ලබන තැනැත්තා දෙවියන් වහන්සේට හා මනුෂ්‍ය ප්‍රජාවට සේවය කළ යුතු වේ. ඒ සේවය තුන් ආකාරයෙන් ඉටු කළ හැක. එනම් පූජක, දිවැසිවර හා රාජකීය ලෙස කෙනෙකුට සේවය කළ හැක.

**ආලේප කිරීමේ දී භාවිතා කරන තෙල් වර්ග**

1. ශික්‍ෂණාලේපන (පූර්ව) තෛලයෙන් සහ
   (Oleum Catechumenorum O.C - oil of catechumens )
2. ක්‍රිස්මා තෛලයෙන් (Sacrum Chrisma S.C - සක්රූම් ක්‍රිස්මා) ආලේප කරයි.

i. දෙමාපියන් තම දරුවෙක් තුවාළ වූ විට තෙල් ගල්වා සුවකර ගැනීම පූරාණ මිනිසුන් අතර ජනප්‍රිය විය. ඒ හෙයින් තෛලය සුවය දානය කිරීමේ, ගැළවීමේ ඖෂධයකි. එමෙන්ම ශික්ෂණාලේප තෛලයෙන් ප්‍රසාද ස්නාපනයේ දී ආලේප කිරීම (O.C) උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ අපගේ ආත්මීක තුවාළ සුව කරන බව මතක් කර දෙයි.

ii. ප්‍රසාද ස්නාපනයේ දී ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් කැපකරනු ලබන යන අර්ථය ගන්වන ක්‍රිස්මා (Chrisma) තෛලයෙන් ආලේප කරනු ලබයි. එයින් අර්ථවත් වනුයේ ශක්තිමත් කිරීම යන්න ය. බෞතීස්මය ලබන්නෙත් මෙලෙස ශක්තිමත් කරනු ලබන්නේ තම දේව විශ්වාසයට අනුව ජීවත් වීමටත් විශ්වාසයට විරුද්ධ යමක් ඇතිවූව හොත් එයට විරුද්ධව සටන් කිරීමටත් ශක්තිය ලැබීම පිණිස ය.

iii. ප්‍රසාද ස්නාපනය ලබන්නා පූජක දිවැසි හා රාජකීය කෙනෙක් වන හෙයින් දෙවියන් වහන්සේටත් මිනිසාටත් සේවය කිරීමට මේ ආලේපයෙන් දේව ශක්තිය ලැබෙනු ඇත.

4. **පාස්කු ඉටිපන්දම**

- පහනක මූලික කාර්යය වනුයේ අඳුර දුරුකර ආලෝකය ලබා දීම ය. පාස්කු ඉටිපහන යනු වෙනත් පහනකට පඩා විශේෂත්වයක් ඇත. එය උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේව සලකුණු කරයි. එබැවින් ප්‍රසාද ස්නාපනය දානය කරන තැන දල්වා ඇති පහන පාස්කු ඉටිපහන බැවින් එය ප්‍රසාද ස්නාපනය ලබන දරුවාගේ ඇතුළාන්ත ජීවිතයට ලැබෙන උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේගේ ආලෝකය වේ. මෙම ආලෝකය තුළ ගමන් කරන කිසි කෙනෙකුට අන්ධකාරයට ඇද නොවැටෙන බවට සලකුණක් ද වේ. ''මන්ද වරක් ඔබ අන්ධකාරයෙහි සිටිය නමුත් දැන් සමිඳුණන් වහන්සේ තුළ අලෝකයෙහි සිටින්නහු ය. ආලෝකයට අයිති දරුවන් මෙන් හැසිරෙන්න. ආලෝකයේ ප්‍රතිඵලය නම් සියලු ආකාර යහපත්කමත්, ධර්මිෂ්ඨකමත්, සැබැකමත් ය.'' (එපීස 5:8-9)

## 5.3 දිව්‍ය සත්ප්‍රසාදය

දිව්‍ය සත්ප්‍රසාදය නමැති සිංහල වචනය හඳුන්වනුයේ ජේසුස් ස්වාමින් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය බවට පරිවර්තනය වූ පූප හා මිදියුෂ හැඳින්වීම සඳහා ය. මෙලෙසින් හඳුන්වාදීමට ''දිව්‍ය සත්ප්‍රසාදය'' නමැති වචනය නිර්මාණය කර ඇත්තේ ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන් විසින් බව පැරණි පොතපත පෙන්වා දෙයි. ''දිව්‍ය'' යනු දෙවියන් වහන්සේ බවත් ''සත්'' නැතහොත් හත පූර්ණත්වය පෙන්වීමට ශු. බයිබල් කතුවරයා ද වාර කීපයකදීම භාවිතා කර තිබීමත් හා ''ප්‍රසාද'' යනු වරම් නැතහොත් වරප්‍රසාදය යනුවෙන් වචන ත්‍රිත්වයක් එක් කර ''දිව්‍ය සත්ප්‍රසාදය'' නමැති වචනය නිර්මාණය කර ඇත. එලෙසින් බලන කල දිව්‍ය සත්ප්‍රසාදය දෙවියන් වහන්සේගෙන් කිතුනුවෙකුට ලබා ගත හැකි සියළුම ආශීර්වාදයන් ගලා එන දේව ප්‍රසාද නිධානයක් වේ. දෙවියන් වහන්සේගේ මහා ආශීර්වාදයන් ලබා දීමට අප අතරට වැඩම කළ දෙවියන් වහන්සේ ම වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ හැර වෙන කිසි කෙනෙක් නොමැති හෙයින් දිව්‍ය සත්ප්‍රසාදය තුළින් එය ලබන්නා වෙත එම දිව්‍ය සමිඳුණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ම වැඩම කරයි.

ප්‍රසාද ස්නාපනය මගින් රාජකීය පූජක තත්ත්වයට ඔසවනු ලැබ අභිවෘද්ධි ආලේපයෙන් ආලේප වී ක්‍රිස්තුන් වහන්සේට වඩාත් සමීප ලෙස සම්බන්ධවූ කිතුනුවා දිව්‍ය සත්ප්‍රසාදය තුළින් කිතුනු සංඝය සමඟ උන්වහන්සේගේ යාගයේ යාවජීව කොටස් කරුවෙක් වේ. එබැවින් මෙම ප්‍රසාද නිධානය අනෙකුත් ප්‍රසාද නිධානයන්ගේ මුදුන් මල්කඩ වේ. මෙය ජේසුස් ස්වාමින් වහන්සේ ම ස්ථාපිත කර අඛණ්ඩව කල්පාන්තය දක්වා උන්වහන්සේ සිහිවීමක් ලෙස කිරීමට අණ දුන් දේව ප්‍රසාද නිධානයකි.

## 5.3.1 කිතුනු ජීවිතයේ උල්පත හා මුදුන් මල්කඩවූ දිව්‍ය සත්ප්‍රසාදය

**දිව්‍ය සත්ප්‍රසාදය දෙස බලන්නා වූ පැතිකඩ කීපයකි**

1. දේව ප්‍රසාද නිධානයකි.
2. භෝජනයකි.
3. යාගයකි.
4. ගිවිසුමකි.
5. ස්තුති කිරීමකි.
6. සිහි කිරීමකි.

### 1. දේව ප්‍රසාද නිධානයකි.

මෙම දේව ප්‍රසාද නිධානය ජේසුස් වහන්සේ විසින්ම උන්වහන්සේගේ අවසාන රාත්‍රි භෝජනයේ දී ස්ථාපිත කර උන්වහන්සේව සිහිවීම පිණිස ඉටු කිරීමට ආඥාවක් දී ඇත. (මතෙව් 26:26-28, මාක් 14:22-24, ලූක් 22:19-20, 1 කොරින්ති 11:23-26) මෙලෙසින් මෙම සක්‍රමේන්තුව ජේසුස් වහන්සේ ස්ථාපිතකර උන්වහන්සේගේ දෙවන ආගමනය තෙක් මෙය පවත්වාගෙන යාමට (කුරුසියේ යාගය) මඟ පෑදී ඇත. දිව්‍ය සත්ප්‍රසාදීය යාගය සියළු වන්දනාවන්ගෙන් උතුම්ම වන්දනාව වේ.

### 2. භෝජනයකි.

දිව්‍ය සත්ප්‍රසාදය භෝජනයක් බව තේරුම් ගැනීමට වඩාත්ම පහසු වනුයේ ශු. ජුවාම් තුමා තම සුවිශේෂයේ සටහන් කර ඇති විස්තරය කියවීමෙනි. ජේසුස් වහන්සේ ඔවුන්ට මෙසේ ඇමතු සේක. ''ඒකාන්තයෙන්මම ඔබට කියමි. ඔබ මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ මාංශය අනුභව නොකරන්නාහු නම් ඔහුගේ රුධිරය පානය නොකරන්නාහු නම් ඔබ තුළ ජීවනය නැත. යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේ ද, මාගේ රුධිරය පානය කරන්නේ ද ඔහුට සදාතන ජීවනය ඇත. තව ද මම ඔහු අන්තිම දවසේ දී උත්ථාන කරන්නෙමි. මාගේ මාංශය සැබෑ භෝජනය වේ. (ජොහාන් 6:53-56) තවද මෙයින් තවත් දෙයක් මතක් කර දෙනු ඇත. දිව්‍ය පූජාවේ දී දිව්‍ය රහස් කරන ලද පූප හා මිදියුෂ සැබවින්ම උන්වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය බවට පරිවර්තනය වේ.

''මාගේ මාංශය අනුභව කරන්න, මාගේ රුධිරය පානය කරන්න...'' යන මේ වචන මිනිසුන් අනුමත කරනු ඇත. මනුෂ්‍ය ලේ බීම හා මිනිමස් අනුභවයට සාමාන්‍ය මිනිසුන් එකඟ නැත. ඒ හෙයින්ම උන්වහන්සේ අවසාන රාත්‍රි භෝජනය අවස්ථාවේ දී රොටි අතට ගෙන ආශීර්වාදය පවසා ''මෙය රැගෙන අනුභව කරන්න. මෙය මා සිහිවීමක් ලෙස ද කරන්නැ''යි පැවසීය.

දිව්‍ය පූජාවේ දී පියතමා පූපය අතට ගෙන ජේසුස් වහන්සේ පැවසූ ආශීර්වාදය පවසා ජනතාවට පූපය ලබා දෙයි. එහිදී ඒ ආශිර්වාදාත්මක වදන් සමඟින් පිටිවලින් තැනූ පූපය ජේසුස් වහන්සේගේ ශරීරය බවට පත්වෙන මහා ප්‍රාතිහාර්යය සිදු වේ. දිව්‍ය සත්ප්‍රසාදය යනු සංකේතාත්මක ආහාරයක් නොව සැබවින්ම ජේසුස් වහන්සේවම අපගේ ජීවිතයට ලබාගන්නා ජීවනදායක භෝජනය වේ.

### 3. යාගයකි.

ජේසුස් වහන්සේ අවසන් රාත්‍රි භෝජන වේලේ දී රොටී අතටගෙන ''මේ මාගේ ශරීරයයි. රැගෙන අනුභව කරන්න.'' මිදියුෂ කුසලාන අතට ගෙන ප්‍රකාශ කළේ ''මේ මාගේ රුධිරයයි. රැගෙන පානය කරන්න'' යනුවෙනි. එය භෝජනයක ස්වරූපය ගත්වග පැහැදිලිව පෙනී යයි. එනමුත් නොනැවතී ඒ වෙනුවට මෙලෙස ද පැවසී ය. ''ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරයයි; මෙම කුසලාන ඔබ උදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුම ය.'' (ලූක් 22:19-20) මෙ හෙයින් ශරීරය ඔවුන් උදෙසා දෙනු ලබන ආහාරයක් හා රුධිරය ඔවුන් උදෙසා වගුරුවනු ලබන යාගයක් බවත් මතුකර පෙන්වයි. එය කල්වාරි යාගයට සම්බන්ධකර දිව්‍ය සත්ප්‍රසාදය භෝජනයක් පමණක් නොව යාගයක් බවත් පෙන්නුම් කරයි.

දිව්‍ය පූජා යාගයේ දී අල්තාරය මත නැවත මැරීමක් සිදු නොකෙරේ. එය ඉතා පැහැදිලිව ශු. පාවුළු තුමා රෝම ලිපියෙන් මතක් කරදෙයි. ''උත්ථාන කරනු ලැබූ

ක්‍රිස්තුන් වහන්සේ යළිත් නොමැරෙන බව ද අපි දකිමු. මින්මතු මරණය උන්හන්සේ කෙරෙහි බල පවත්වන්නේ නැත.'' (රෝම 6:9) එබැවින් කල්වාරි කඳු මුදුනේ ඒ සිදුවූ ජීවිත පූජාව අද අල්තාරය මත සිදුවෙන විට එය සත්ප්‍රසාදිය යාගයක් හා සක්‍රමේන්තුමය යාගයක් වේ. එදා කල්වාරියේ යාගයෙන් ඉටුවූ අග්‍ර ඵලය අල්තාරය මත පූප හා මිදිරස තුළින් අපගේ ජීවිතවලට කාන්දු වේ. එවිට අද කතෝලිකයින් අල්තාරය මත ඔප්පු කරන දිව්‍ය යාගය තුළින් එදා ජේසු තුමා කළ අවසාන රාත්‍රී භෝජනය හා කල්වාරි කඳු මුදුනේ ඔප්පු කළ ජීවිත යාගය යන කරුණු දෙකම එක් කර ජීවන දායක දිව්‍ය යාගයේ සක්‍රමේන්තුව සමරනු ඇත. මෙම දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගි වෙමින් ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය ලබා ගැනීමෙන් ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානයට හවුල්වෙන අතර එයින් ලැබෙන ගැළවීමේ කුසල් තම ජීවිතය තුළින් භුක්ති විඳිය හැක.

**4. ගිවිසුමකි.**

ශු. ලූක් තුමා පවසන පරිදි ''එලෙසම භෝජනයෙන් පසු කුසලානය දී ''මේ කුසලාන ඔබ උදෙසා වගුරුවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුම ය.'' (ලූක් 22:20) 1 කොරින්ති 11:24-25 තවද මෙම ගිවිසුම ගැන ජෙරමියා දිවැසිවරයා ඉඟි කර ඇත. (ජෙරමියා 31:31-34) මෙම නව ගිවිසුම හා පැරණි ගිවිසුම සන්සංදනාත්මකව අධ්‍යයනය කළ හැක.

***පැරණි ගිවිසුම වනුයේ සීනයි ගිවිසුම ය***
***සීනයි ගිවිසුම ස්ථිර කර ලද්දේ සතෙකු පූජා කිරීමෙනි. (නික්මයාම 24:4-8)***

***නව ගිවිසුම ස්ථිර කරන ලද්දේ***
***ජේසුස් වහන්සේගේ රුධිරයෙනි. (හෙබ්‍රෙව් 9:14-22, 1 කොරින්ති 11:25)***

**5. සිහි කිරීම.**

අන්තිම රාත්‍රි භෝජනයේ දී ජේසුස් ස්වාමින් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදීය පිළිවෙත ස්ථාපිත කරමින් ගෝලයින්ට දුන් අණ වූයේ ''මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න''ය. ඒ හෙයින් අපෝස්තුළුවරන්ගෙන් පටන්ගෙන අදත් හෙටත් උන්වහන්සේගේ දුක්විඳීම මරණය උත්ථානයේ දිව්‍ය යාගය ජන වන්දනා පිළිවෙත් තුළින් සිහිපත් කිරීම සිදුවෙනු ඇත. ස්වමින් වහන්සේ පරම ආඥාව හා බලාපොරොත්තුව එලෙසින් සිදු වේ.

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත ඉතා පැහැදිලිව එම ආඥාව මුල් කිතුනු සභා යුගයේ සිදුවූ බව පෙන්වා දෙයි. ''ඔවුහු ප්‍රේරිතයින්ගේ ඉගෙන්වීමෙහි ද සහභාගි කමෙහි ද, රොටි කැඩීමෙහි ද යාච්ඤාවෙහි ද නිරතව කල් ගත කළහ....'' (ක්‍රියා 2:42-46, ක්‍රියා 20:7) එතැන් සිට උන්වහන්සේගේ දෙවන ආගමනය දක්වා උන්වහන්සේගේ පාස්කු අභිරහස සිහිපත් කරමින් ජීවත් වනු ඇත.

### 5.3.2 භාවාර්ථ පරිවර්තනය

දිව්‍ය පූජාවේ පඬුරු ඔප්පු කිරීමේ දී ඔප්පු කරන පූප සහ මිදිරස දිව්‍ය සත්ප්‍රසාදය නොවේ ය. සංක්‍රිස්තියන් කාමරයේ ඇති ඔස්ති පෙට්ටියේ තිබෙන ඔස්ති දිව්‍ය සත්ප්‍රසාදය නොවිය. එනමුත් දිව්‍ය පූජාවේ පඬුරු ඔප්පු කිරීමෙන් පසුව කෙරෙන දිව්‍ය රහස් කිරීමෙන් පසු අල්තාරය මත ඇත්තේ ඔස්ති නොව ජේසුස් වහන්සේගේම ශරීරය හා රුධිරය වේ. එය දිව්‍ය සත්ප්‍රසාදය වේ. මෙම මහා පරිවර්තනය කුමක් ද? කුමක් ලෙස හඳුන්වයි ද මෙම පරිවර්තනය භාවාර්ථ පරිවර්තනය ලෙස හඳුන්වයි.

*(**Transubstantiation** - Cardinal Ratzinger explains the abstract notion thus: “The Lord taken possession of the bread and wine and so to speak raises them from their baric everybody reality to a new made of being” (The Seven Sacraments, By Anselm Griun Tramlated by Jhon Cumming, P.60)*

බොහෝ වස්තුන්ට ඇතුලත්හරයක් හෙවත් භාවාර්ථයක් තිබේ *(Substantance).* තවද එම වස්තුවලට ම භාවාර්ථය අමතරව බාහිර පෙනුමක් ද ඇත *(Appearance).* නැතහොත් ස්වභාවික නිර්මාණ දෙස බලන කල සමහර දෑ වල බාහිර පෙනුම වෙනස් වුවත් ඇතුළාන්ත හරය වෙනස් නොවේ. උදාරණයකට මැටි බඳුනක් දෙස බලන්න. මැටි බඳුන මොන හැඩයකට හැදුවත් (බාහිර පෙනුම කෙසේ වෙනස් කළත්) ඇතුළාන්ත හරය මැටිම වේ.

එමෙන්ම ලී කොටයක් පිළිස්සූ විට ලී කොටසේ ඉතිරි වනුයේ අළු ය. බාහිර පෙනුමත් අභ්‍යන්තර ගුණයත් විනාශ වී අළු ගොඩක් වේ. ස්වභාව ධර්මයේ දී එලෙස වේ. ඇතුළාන්ත හරය වෙනස් වන සෑම විටම බාහිර පෙනුම වෙනස් වේ.

දිව්‍ය සත්ප්‍රසාදයේ භාවර්ථ පරිවර්තනයේ දි මෙයට වඩා වෙනස් වේ. එයයි එහි ඇති විශේෂත්වය හා උත්තරීතරත්වය මෙන්ම අභිරහස්මය පැතිකඩ පියතුමා දිව්‍ය පූජාවේ දි දිව්‍ය රහස් කිරීමත් සමගම (ජේසුස් වහන්සේ කළ තුති පිදීමේ යැදුම උච්චාරණය කිරීමෙන් පසු) පූප හා මිදියුෂ වල හැඩය පාට රසය හා පෙනුම වෙනස් නොවී ඇතුළාන්තය පමණක් වෙනස් වේ. එහි ඇතුළාන්තය උත්ථානවූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය බවට පරිවර්තනය වේ. තවද දිව්‍ය සත්ප්‍රසාදයෙහි මෙම භාවාර්ථ පරිවර්තනය සැබවින්ම සිදුවන බව ඓතිහාසිකව ද සනාථ වී ඇත. උදාහරණයක් ලෙස ලංචියානෝ නුවර සිදුවූ ප්‍රාතිහාර්ය දැක්විය හැක. ඒ අයුරින් දිව්‍ය සත්ප්‍රදානීය ප්‍රතිහාර්යන් ලොව පුරා සිදුවී ඇත.

### 5.3.3 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පැරණි ගිවිසුමේ සලකුණ.

1. සාලෙම් නුවර (ජේරුසලම) රජවූ පරමෝත්තම දෙවියන් වහන්සේගේ පූජකවරයෙක් වූ එමෙන්ම එහි රජවූ මෙල්කිසදෙත් ප්‍රථමවරට රොටි හා මිදියුෂ ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කරමින් ආබ්‍රහම්ට ආශිර්වාද කළේ ය. (උත්පත්ති 14:18-21)

2. ඊජීප්තුවේ වහල්කමින් වුදවා ගත් ජනතාව පොරොන්දු දේශය බලා කාන්තාරය මැදින් යන ගමනේ දී ඔවුන්ට මන්නා නමැති ආහාරය දී පෝෂණය කිරීම.

3. පාරාවෝ රජුගේ වහල් කමින් මිදි ඊජිප්තුවෙන් කඩිනමින් පලායාම සිහිකිරීමට අවුරුදු පතා සිහිකිරීමට සිදුකළ පාස්කු භෝජනය පැවැත්වීම.

### 5.3.4 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ නව ගිවිසුමේ සලකුණ.

1. පන්දහසකට කෑමට පූප බෙදාදුන් ප්‍රාතිහාර්ය ය.
2. අවසාන රාත්‍රි භෝජනය.

ආදි කරුණුවලින් දිව්‍ය ස්තප්‍රසාදය වනාහි නව ගිවිසුමේ දේව ජනතාවගේ කුසගිනි නිවීමට පමණක් නොව ඔවුන්ගේ සදාකාලීක ජීවිතයට ඇතුළුවීමට අවශ්‍ය භෝජනයක් බව මතක් කර දුනි.

ජුවාම්තුමා අවසන් රාත්‍රි භෝජනය ගැන කතා නොකර භෝජනයෙන් පසු ඇති පාද දෝවනයට වඩාත් පුළුල් විස්තරයක් ලබා දෙනු ඇත. ඒ තුළ ගැඹුරු දේව ධර්මයක් හා දිව්‍ය සත්ප්‍රසාදයේ මූලික හරයක් ඉස්මතු කරයි.

ජුවාම් සුවිශේෂය ලේඛන ගත කර ඇත්තේ ක්‍රි.ව. 100 දී පමණ බව බයිබල් විශාරදයින් පෙන්වා දෙයි. ඒ වකවානුව වන විට ජේසුස් වහන්සේ අවසාන රාත්‍රි භෝජනය පවත්වා වසර 65-70 ත් පමණ වේ. මේ වකවානුව තුළ කිතුනුවන්ට නැවතත් රාත්‍රි භෝජනය ගැන කථා කිරීමේ අවශ්‍යතාවයක් එතරම් ප්‍රබලව පැන නැඟී නැත. ඔවුන් ඉතා හොඳන් එම කරුණු අවබෝධ කරගෙන ස්වාමින් වහන්සේ විසින්ම ස්ථාපිත කළ බවක් විශ්වාස කළ නිසාම දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත ඔවුන්ගේ වන්දනා පිළිවෙත්වල මූලික කාරණාව වී තිබුණි.

එනමුත් ඔවුන්ට අමතක වී ඇති කරුණක් ජුවාම් තුමා ඉතා ඕනෑකමින් පාද දෝවනය තුළින් කියා දුනි. දිව්‍ය සත්ප්‍රසාදය අඛණ්ඩව පැවැත්විය යුතු වත්පිළිවෙත් පමණක් නොව ප්‍රේමයේ හා එකමුතුකමේ දේව ප්‍රසාද නිධානය බව මතක්කරදුණි. එබැවින් දිව්‍ය සත්ප්‍රසාදය ස්වාමින් වහන්සේගේ බොජුන් මේසයේ වාඩිවී කිතුනු ප්‍රේමයෙන් එකිනෙකාට ඇප උපස්ථාන වෙමින් ''ගුරු දේවයෙනි'' ස්වාමිනි කියා ඇමතුවත් ගෝලයින්ගේ පාද සේදීමට තරම්

බැහැපත්වීම තුළින්, එකිනෙකාට උපකාර වෙමින් ස්වාමින් වහන්සේ තුළ බැහැපත් හා ප්‍රේමයේ ජීවිත පැවැත්ම ගැන ඉස්මතු කරයි.

දිව්‍ය සත්ප්‍රසාදය ප්‍රේමයේ හා සහෝදරත්වයේ සක්‍රමේන්තුවක් බව කීමට පුවාම් තුමා වැඩි වශයෙන්ම පෙළඹුණේ පුවම් තුමාගේ කිතුනු සංඝය හා කොරින්තියේ කිතුනු සභාව ප්‍රේමය හා සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගවීම එදා සිදු වූ නිසා ය.

ශු. පාවුළු තුමා 1 කොරින්ති 11:17-21 දක්වා මේ කරුණු ඉතා ගැඹුරින් විස්තර කර දෙයි. එහි දී කරුණු කීපයක් ඉස්මතු කරයි.

- කොරින්තියේ ජනතාව ඔවුන්ගේ රැස්වීම් වලදී යහපතට වඩා අයහපත සිදු කරයි. ඔවුන් අතරේ භේදයක් ඇති වීම.
- ඔබේ භේදභින්නකම් නිසා සභාවක් වශයෙන් රැස්වන විට ස්වාමින් වහන්සේගේ රාත්‍රි භෝජනය වැළඳීමක් සිදු නොවේ.
- මන්ද ඔබ කෑම කනවිට අනිත් අය ගැන නොසිතා කෑදරකමින් අනුභව කරනු ඇත.
- එබැවින් එක්කෙනෙක් බඩ ගින්නේ සිටින අතර අනෙක් කෙනා වෙරිමතින් සිටී.
- ඔබ දෙවියන් වහන්සේගේ සභාවට නිඟා කරයි.

මේ නිසාම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ අප සැම දෙනාම එකම ශරීරයක් නොවන්නේ නම් එය දිව්‍ය සත්ප්‍රසාද තුළින් මතුකර දක්වන යථාර්ථය අමතක කිරීමකි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ස්තුති ප්‍රශංසා කර බාහිර අලංකාරවලින් උත්සව පැවැත්වූවත් වැරද්දක් නැත. වැරද්ද වනුයේ දිව්‍ය සත්ප්‍රසාදයෙන් මතු කර දක්වන දයාව ප්‍රේමය එකමුතු කම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන්නන්ගේ ජීවිත තුළින් විද්‍යාමාන නොවෙන විට ය. එබැවින් දිව්‍ය සත්ප්‍රසාදය කිතුනු ජීවිතයේ විශ්වාස කළ යුතු වේද සත්‍යතාවක් පමණක් නොව එය ජීවන ක්‍රමයකි. තම සහෝදරයා සමඟ සහජීවනයෙන් ජීවත්වෙමින් ස්වාමින් වහන්සේට සාක්ෂි දරණ පැවැත්මකි.

## 5.3.5 ජුදා පාස්කුව හා අන්තිම රාත්‍රී භෝජනය.

ජුදයින්ගේ පාස්කුව ඔවුන්ගේ ජන ජීවිතයේ උතුම් මංගල්‍යයක් විය. එය එසේ වනුයේ ''පාස්ක්'' යන්න එතෙර වීම නිසා ය. එතර වූයේ ඊජිප්තුවේ වහල්කමින් නිදහස කරා ය. එය ජුදා ජනතාවගේ මහා උපත විය. විමුක්තියේ උපත ලද ඒ සිද්ධිය අතී ගෞරවාන්විතව සැම වසරක් පාසාම සමරණ ලදි. සැමරීම කී වි නැවත මතක් කිරීමටත් වඩා ඒ උතුම් සිද්ධිය ජීවමාන කිරීම ය. වර්තමානයට ගෙන ඒමය. ඒ තුළ ජීවත් වීම ය.

## 5.3.6 ජුදා පාස්කු මංගල්‍යයේ දී පිළිවෙත් 2 ක් විය.

1. බැටළුවා පිළිබඳ පිළිවෙත.
2. නුමුහුන් පූප පිළිබඳ පිළිවෙත.

### 1. බැටළුවා පිළිබඳ පිළිවෙත

මෙය ඇත අතීතයේ එඬේර යුගයේ සිට පැවත එන්නකි. එඬේරුන්ට අතී දුෂ්කර කාලයක් වන සීත ඍතුව වසන්තයේ නව තණබිම් කරා යෑමට පෙර දේව ආරක්ෂාව පතා රැළේ බැටළුවෙකුව මරා උගේ ලේ තම කුඩාරමේ ඉදිරිපස කණුවේ තැවරීය. එය ඔවුන්ගේ පැරණි චාරිත්‍රයක් විය. දේව ආරක්ෂාව ඔවුන් අත් දිටීය.

පාරාවොගේ කෲරකමින් හා සීත ඍතුවෙන් දේව ජනතාව මුදා කිරියෙන් පැණියෙන් උතුරා යන දේශයකට දේව ජනතාව ගෙන යන ගමනේ දි (දෙවියන් වහන්සේ යොමු කළ 10 වෙනි වසංගතය ඊජිප්තුවේ කුළුඳුලන්ට පහර දීමේ දී) දේව ජනතාව ආරක්ෂා කර ගැනීමට කළේ ද ඔවුන්ගේ එඬේර සිරිතට අනුව බැටළුවෙක් මරා උගේ ලේ කුඩාරමේ උළුවැස්සේ තැවරීම ය. ''එවිට එම ලේ දකින විට ඊශ්‍රයෙල් ජනයා අතර මිනිසෙකුටවත් මෘගයෙකුටවත් විරුද්ධව බල්ලෙකු පවා බුරන්නේ නැත.'' (නික්මයාම 11:7) පාරාවෝ රජු වෙත පැමිණි මෙම උදහසින් කම්පනයට පත් ඔහු ඊශ්‍රායෙල් ජනයාව මුදා හරින ලදී.

### ෙ. නුමුහුන් පූප

නුමුහුන් පූප පිළිබඳ කතාව කෘෂි කාර්මික යුගය දක්වා දිවයනු ඇත. එදා ගොවියෝ බාර්ලි අස්වැන්න නෙළීමෙන් පසු පරණ මුහුන් තම නිවෙස්වලින් ඉවත් කර අලුතින් සාදා ගන්නා තුරු නුමුහුන් පූප අනුභව කළහ. ඔවුන් එසේ කළේ වසරේ පළමු පුර පසළොස්වක රාත්‍රියේ සිට පුරා දින 7 දක්වා ය.

මෙම චරිතය කෘෂි කාර්මික යුගයේ සිටි පැරන්ණන් අනුගමනය කළත් නුමුහුන් පූප හා නික්මයාම අතර ඇති සම්බන්ධය ඊට වඩා වෙනස්කමක් ඇත. එනම් ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවෙන් හදිසියේම පිටවීමට සිදුවූ හෙයින් ඔවුන් ඇනූ පිටි නැලි මුහුන් වී නොතිබුණි. එබැවින් ඔවුන්ට අනුභව කිරීමට සිදුවූයේ නුමුහුන් රොටි ය. ''එවිට පාරාවෝ රාත්‍රියේ දීම මෝසෙස් හා ආරොන් කැඳවා නුඹලා සහ ඊශ්‍රායෙල් ජනයා නැගිට මාගේ සෙනඟ කෙරෙන් පලාගොස් නුඹලා කී පරිදි සමිඳුණන් වහන්සේට නමස්කාර කරන්න. තවද නුඹේ එළු බැටළු ගව පට්ටි ද රැගෙන යන්න. මට ද ආශිර්වාද කරන්නැයි කීය. නැතිනම් අප හැම දෙනාම මැරෙන්න පුළුවනැයි කියමින් මිසර වැසියෝ ඊශ්‍රායෙල් ජනයාට වහා රටින් පිට වන ලෙස බල කළහ. එවිට සෙනඟ ඇනූ පිටි පිපෙන්න කලින් ගෙන තමන්ගේ පිටි අනන හට්ටි ද තම ඇඳුම්වල ඔතාගෙන කරේ තබා ගත්හ.'' (නික්මයාම 12:31-34)

නික්මයාම නමැති මහා මංගල්‍යය සමරණවිට මේ චාරිත්‍ර දෙකම එකට සම්බන්ධ කරගෙන ජාතික - ආගමික මංගල්‍යයක් කරගන්නා ලදි. පාස්කු බැටළුවා පිදීම හා අනුභව කිරීමත් ඊට පසු දින 7 ක් නුමුහුන් පූප අනුභව කිරීමත් එකල සිරිත විය.

## 5.4 අභිවෘද්ධි ආලේපය

ප්‍රසාද ස්නාපනයේ සක්‍රමේන්තුවෙන් දේව දරුකම උරුම කර ගන්නා දරුවා අභිවෘද්ධි ආලේපයෙන් ශක්තිමත් කරනු ලබන අතර කිතුනු විශ්වාසය තුළ පරිණතභාවයට පත්වේ. එබැවින් මෙම සක්‍රමේන්තුව පරිණතභවේ සක්‍රමේන්තුව යනුවෙන් ද හඳුන්වා දිය හැක. මෙය වැඩි වශයෙන්ම ආධ්‍යාත්මික පරිණතිය වේ. එහිදි ශාරීරික පරිණතිය නොසලකා හැරීමක් කෙසේවත් සිදු නොවේ. දෙවියන් වහන්සේ තුළ ඇති ගැඹුරු විශ්වාසය ලෝකය ඉදිරියේ තම ජීවිතයෙන් සාක්ෂි දරමින් එළිදරව් කිරීමට ඇති බලගතුවීම මෙයින් මතක් කර දෙනු ඇත. යහපත හා අයහපත, සත්‍යය හා අසත්‍යය ඉදිරියේ ක්‍රියාකාරී වීමේ බලය පරිණතියේ මිනුම්දණ්ඩ වේ.

*උදා :* ප්‍රාණ පරිත්‍යාගින්ගේ ජීවිත
ශුද්ධවන්තයින්ගේ ජීවිත

සැම කිතුනුවෙක් ම තම ප්‍රසාද ස්නාපනයේ දී ශුද්ධාත්ම වරමින් පූර්ණ කරවන සේක. එහෙයින් ශුද්ධවූ ත්‍රිත්වයට ප්‍රසාද ස්නාපනය තුළින් එම අපේක්ෂකයා වෙත වැඩම කරනු ඇත. එනමුත් අභිවෘද්ධි ආලේපයේ දී ප්‍රසාද ස්නාපනය ලැබූ තැනැත්තාව කිතුනු පරිණතභාවය තුළ ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය සමාජය තුළ වඩාත් ප්‍රායෝගික කිරීමට දෙවන වරටත් ශුද්ධාත්ම බලයෙන් විශේෂාකාරයෙන් පූර්ණ කරයි. එය ඉතා පැහැදිලිව සිදුවූ අවස්ථාව අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි මොහොත (ක්‍රියා 2 : 1-13), එම ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමත් සමඟ අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාකරීත්වය අති සුවිශේෂ විය. මිනිසුන්ගේ සිත් හැරීම් හා බෞතීස්ම ස්නාපනය ලැබූවන් ගණනින් 3000ක් පමණ විය.

අද නව යොවුන් වියේ ළමයෙක් ලබාගන්නා අභිවෘද්ධි ආලේපයේ සක්‍රමේන්තුවත් එදා අපෝස්තුළුවරුන් පෙන්තකොස්ත දිනයේ දී ලබාගත් ශුද්ධාත්ම බලය හා සමාන කළ හැක. පෙන්තකොස්ත දිනයේදී ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුළුවරුන් පරිණත කිතුනුවන් ලෙස නිර්භීතව තම දූත සේවාව ආරම්භ කළා සේ අභිවෘද්ධි ආලේපය ලබන තැනැත්තා ද එවන් ක්‍රියාකාරී ඇදහිල්ලකට යොමුවිය යුතු බව මතක් කරයි.

කතෝලික සභාවේ ධර්මෝපදේශය නැමති ග්‍රන්ථය මතක් කර දෙන ලෙස අභිවෘද්ධි ආලේපය ප්‍රසාද ස්නාපනය ස්ථිර කරයි. ප්‍රසාද ස්නාපනීය වරප්‍රසාද සම්පූර්ණත්වයට පත් කරයි. (අංක 1285 - ක්‍රියා පොත 8:14, 19:5-7) අභිවෘද්ධි ආලේපය මඟින් ශුද්ධාත්ම වරප්‍රසාද

පූර්ණ ලෙස ලබාගත් කිතුනුවා ක්‍රිස්තුන් වහන්සේට වඩාත් සමීප ලෙස ඒකාබද්ධ වේ. දේව රාජ්‍යය ගොඩනැඟීම සඳහාත්, ශු. සභාවේ දූත කාර්යට සහභාගි වනු සඳහාත් අවශ්‍ය ශක්තියත් ධෛර්යයත් ලබා ගනී. එබැවින් ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකාට සම්බන්ධ වෙමින් එම ප්‍රසාද නිධාන ලබන්නාට ශු. සභාවේ පූර්ණ සාමාජිකත්වය දානය කරනු ලැබේ. මෙම සක්‍රමේන්තු දෙක හරියට එකම කාසියේ දෙපැත්ත සේ ඉතා ගැඹුරු සම්බන්ධතාවයකින් යුක්තයි. අභිවෘද්ධි ආලේපය දානය කිරීමට පෙර ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කිරීමෙන් ද මෙම ප්‍රසාද නිධාන දෙක අතර ඇති සබැඳියාව ඉතා පැහැදිලි කරයි. එමෙන්ම ඔහුගේ ජීවිතයේ කේන්ද්‍රය ක්‍රිස්තුන් වහන්සේ වනු ඇත. (2 කොරින්ති 2:15) මෙම ආලේපය මඟින් මෙම ප්‍රසාද නිධානය ලබාගන්නා තැනැත්තා, ශුද්ධාත්මයාණන් වහන්සේගේ මුද්‍රාව ලබාගනී. (එපීසි 1:13)

තම පියාණන් වහන්සේගේ මුද්‍රාවෙන් ක්‍රිස්තුන් වහන්සේට ද මුද්‍රා තබනු ලැබූ සේක. දෙවියන් වහන්සේ අපව ද ක්‍රිස්තුන් වහන්සේ මඟින් මුද්‍රා තබා ඇත ශුද්ධාත්මයාණන්ගෙන් පිරිපුන් කරන සේක.(2 කොරින්ති 1:21-22, එපීසි 1:13) ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් අප ලබන මෙම නොමැකෙන මුද්‍රාව අප සම්පූර්ණයෙන් ම ක්‍රිස්තුන් වහන්සේට අයිති බවට සළකුණකි. සදාකාලයටම උන්වහන්සේට සේවය කරන බවට සහතිකයකි. එමෙන් ම අප ජීවිත අවසානයේ දී පවතින දේව විනිශ්චයේ දී දේව රැකවරණය ලැබෙන බවට සහතිකයකි.

''දෙවියන් වහන්සේගේ මුද්‍රා සළකුණු තමන්ගේ නළල්වල නැති මනුෂ්‍යයන්ට මිස පොළොවේ තණ කොළවලටවත් පැළෑටිවලටවත් කිසි ගසකටවත් අනතුරු නොකරන ලෙස උන්ට කියන ලද්දේ ය.'' (එළිදරව්ව 9:4/ එපීස 9:4-6)

ශුද්ධාත්ම වරප්‍රසාදවලින් හා දීමනාවන්ගෙන් පෙන්තකෝස්ත දින සේනාකුළු ශාලාවේ සිටි සියළුදෙනාවත් මුළු කිතුනු සංහාරයත් පිරිපුන් කිරීමට බලගතු කිරීමට ක්‍රිස්තුන් වහන්සේ මෙම සක්‍රමේන්තුව ස්ථාපිත කළ සේක.

''මංගල්‍යයේ අවසාන මහා දවසේ දී ජේසුස් වහන්සේ නැගිට, හඬනගා යමෙක් පිපාසයෙන් සිටිත් නම් ඔහු මා වෙතට පැමිණ පානය කෙරේවා. ශුද්ධ ලියවිල්ලෙහි ලියා තිබෙන පරිදි මා කෙරෙහි අදහන්නා තුළින් ජීවනදායක ජලධාරා ගලන්නේය'යි ප්‍රකාශ කළ සේක. උන්වහන්සේ මෙසේ වදාළේ තමන් වහන්සේ කෙරෙහි අදහාගත්තවුන් මතු ලබන්නට සිටි ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳව ය. ශුද්ධාත්මයාණන් ඒතාක් නොදෙන ලද්දේය. මන්ද ජේසුස් වහන්සේ ඒතාක් මහිමයට පත් නොවූ බැවිනි.'' (ජොහාන් 7:37-39) ක්‍රිස්තුන් වහන්සේ අප සැම ශුද්ධාත්ම වරමින් පුරවන සේක. පරිණත කරවන සේක.

ජේසුස් වහන්සේ පොරොන්දු වූ ප්‍රකාර ප්‍රථම ශුද්ධාත්මදානය උන්වහන්සේගේ උත්ථානයෙන් පසු ඇති වූ ප්‍රථම දර්ශනයේ දී ශ්‍රාවකයින් වෙත දානය කරන ලදී. ''උන්වහන්සේ ඉක්බිති ඔවුන් පිට හුස්ම හෙළා ශුද්ධාත්මයාණන් පිළිගන්න....'' (ජොහන් 20/22) මෙය ශ්‍රාවකයින්ට ලැබුණු ප්‍රථම ශුද්ධාත්මදානය යි. එමඟින් ඔවුන්ව ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ කර, ඔවුන්ගේ පව් කමා කර, ඔවුන් දේව දරුවන් බවට පත් කළ සේක. එනමුත් ඔවුන්ට එම සත්‍යය තේරුම් ගෙන එය ලෝකයට ප්‍රකාශ කිරීමට තරම් බලගතු වීමක අවශ්‍යතාවය හැඟීගිය හෙයින් පරිණත සාක්ෂිකරුවන් කිරීම සඳහා ශුද්ධාත්ම වැගිරීමක් පෙන්තකෝස්ත දින දී සිදුවිය. (ක්‍රියා 2:1-4) එම ශුද්ධාත්ම වැගිරීමට නතුවූ ශ්‍රාවකයින් දෙවියන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියා ප්‍රකාශ කළ සේක. (ක්‍රියා 2:11, 2:17-18) අපෝස්තුළුවරුන්ගේ දේශනා ඇසූ සැදැහැවතුන් සිය දහස් ගණන් ඒ වචන විශ්වාස කර බව්තීස්ම ස්නාපනය ලබා ගත්තේ ය. (ක්‍රියා 2:38)

අපෝස්තුළුවරු බව්තීස්ම ස්නාපනය ලැබූවන් මත අත් තබා ශුද්ධාත්ම වරම් දානය කළේ ය. එබැවින් අත් තැබීම අභිවෘද්ධි ආලේප පිළිවෙතේ ආරම්භය විය. (ක්‍රියා 6:2) අත් තැබීම තුළින් ශුද්ධාත්මයාණන් දානය කිරීම නැතහොත් අභිවෘද්ධි ආලේපය හඳුන්වා දී ඇත. (ක්‍රියා 19:5-6)

මෙම අත්තැබීමේ පිළිවෙතට (අභිවෘද්ධි ආලේපයට) ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම එකතු කරන ලදී. මෙම ආලේපයත් සමඟ ආලේප කරන ලද නැමති අර්ථය ඇති ''ක්‍රිස්තියානිකාරයා'' යන්න එකතු විය. ආලේප කිරීමේ පිළිවෙත පෙරදිග සභාවල ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම යනුවෙන් හඳුන්වා දී ඇති අතර අපරදිග සභාවල මෙය හඳුන්වනුයේ සනාථ කිරීම (Confirmation) යන අර්ථයෙනි. එහි අරුත් දෙකක් සිහපත් කරයි.

1. ප්‍රසාද ස්නාපනය සනාථ කිරීම.
2. ප්‍රසාද ස්නාපනීය වරප්‍රසාද ශක්තිමත් කිරීමකි.

## 5.4.1 අභිවෘද්ධි ආලේපය ලබන්නන්ට ලැබෙන දීමනා හා එල

**ශුද්ධාත්ම දීමනා**

1. ප්‍රඥාව
2. තේරුම් ගැනීම
3. දැනගැන්ම
4. දැනමුතුකම
5. ධෛර්යය
6. දේවභය
7. දේව භක්තිය

**ශුද්ධාත්ම එල**

1. ස්නේහය
2. ප්‍රීතිය
3. සමාදානය
4. ඉවසීම
5. කරුණාව
6. යහපත්කම
7. නොබිඳෙන දිරිය
8. ශාන්තදාන්තකම
9. විශ්වාසවන්තකම
10. මරියදාවය
11. ව්‍රතභාවය
12. පිරිසිදුකම

## 5.4.2 අභිවෘද්ධි ආලේපය දානය කිරීම

**රදගුරු තුමා**

සභා නීතියට අනුව (ශාසන නීතිය 882) පදවියේ රදගුරුතුමා හෝ එතුමාගේ අවසරය ඇතිව රදගුරුවරයෙක් අභිවෘද්ධි ආලේපය දානය කරනු ලබයි. පෙන්තකෝස්ත දිනයේ දී ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවූ අපෝස්තුළුවරු තම හස්ත සෙසු විශ්වාසිකයින් මත තබමින් ඔවුනට ශුද්ධාත්ම වරම් දානය කරන ලදී. ඉන්පසු එම අපෝස්තුළුවරුන්ගේ සේවාවට අනුප්‍රාප්තිකයන් වූ රදගුරුවරු අභිවෘද්ධි ආලේපය දානය කිරීම ඉදිරියට පවත්වාගෙන ගොස් ඇත.

★ **අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ පිළිවෙත**

* දේව වාක්‍යය පිළිවෙතට පසුව අපේක්ෂකයින් අභිවෘද්ධි ආලේපය දානයට කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| *රදගුරු තුමා* | : | ඔවුන් සුදුස්සන් බව ඔබ දන්නෙහි ද ? |
| *මීසම්භාර පියතුමා* | : | මෙම සක්‍රමේන්තුව ලබාගැනීම සඳහා ඔවුන් සුදුස්සන් බව මම සහතික කරමි. |
| *රදගුරුහිමි* | : | අප ස්වාමින් ද දෙවියන් ද ගැළවුම්කරුවාණන්ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පිහිටෙන් මේ අපගේ දරුවන් අභිවෘද්ධි ආලේපය දානය කිරීම සඳහා තෝරා ගතිමු. |

* රදගුරුතුමාගේ අනුශාසනාව.
* ප්‍රසාද ස්නාපන පොරොන්දු අළුත් කිරීම.
* රදගුරුතුමා අපේක්ෂකයින් මත දෑත් දිගුකර යාච්ඤා කිරීම.
* ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම.

අපේක්ෂකයාගේ නළල මත ක්‍රිස්මා තෛලයෙන් කුරුසිය ලකුණ අඳිමින් ''ශුද්ධාත්ම දීමනාවේ මුද්‍රාව ලබාගන්න.'' යනුවෙන් වදාරමින් අභිවෘද්ධි ආලේපය දානය කරනු ලබයි.

මෙම උතුම් සක්‍රමේන්තුව දානය කිරීමට භාවිතා කරන ක්‍රිස්මා තෛලය වාර්ෂිකව රදගුරුතුමා ශු. සතියේ පවත්වන තෛලාශිර්වාදිත දිව්‍ය පූජාවේ දී ආසිරි ගන්වනු ලද ක්‍රිස්මා තෛල්‍යයයි.

රදගුරුතුමා අභිවෘද්ධි ආලේපය ලබන තැනැත්තාව ක්‍රිස්මා තෛලයෙන් ආලේප කරන විට ඔහුගේ හෝ ඇයගේ ආත්මික මව්පියන් දකුණු අත අපේක්ෂකයාගේ උරහිස මත තැබිය යුතු ය.

**ක්‍රිස්මා තෛලය**
ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම එක්තරා අයුරකින් මුද්‍රා තැබීමකි. උන්වහන්සේ තුළින් ඔබ ද සත්‍ය ධර්මය වන ඔබගේ ගැළවීම සළසන සුබ අස්න අසා අදහාගෙන පොරොන්දු වූ ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබීම කරණකොටගෙන සහතික කමේ මුද්‍රාව ලැබූවාහු ය. (එපීස 1:13) මුල් යුගවලදී කිතුනුවන් කුරුසියේ ලකුණ ද ක්‍රිස්තුන් වහන්සේට අයත් වීමේ මුද්‍රාවක් ලෙස පිළිගත් අතර එය අදත් කුරුසිය පැළඳ ගැනීම තුළින් ඉඟි කරයි.

ක්‍රිස්මා තෛලය සඳහා භාවිතා වන්නේ ඔලිව් තෙල් ය. ඔලිව් තෙල් තුවාළ සුව කිරීමට ඖෂධයක් ලෙස ද භාවිතා කළේ ය. යහපත් සමරිතානුවරයාගේ උපමා කතාවේ මෙලෙස සටහන් වේ. ''ඔහු වෙතට ගොස් තෙල් හා මිදියුෂ ගල්වා තුවාළ බැඳ තමාගේ ම මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේ ය.'' (ලූක් 10:34) ක්‍රීඩකයින් අත් පාවලට තෙල් ගල්වා එයින් ශක්තිය ලබා ගත්තේ ය. තවද රජවරුන්ගේ අභිෂේකයේ ද තෛලයෙන් ආලේප කිරීම සිරිතක් ව පැවතිණි. අභිවෘද්ධි ආලේපය තුළින් විශේෂ බලයක් හා ජවයක් ලැබෙන අතර ආත්මික තුවාළ සුවපත් වේ යන අරුත මතක් කරදෙනු ඇත.

## 5.5 පව් කමා කිරීමේ සක්‍රමේන්තුව

පව් කමා කිරීමේ සක්‍රමේන්තුව නැතහොත් සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය යනු කුමක් දැයි ප්‍රශ්න කරන විට දිය හැකි සරලම පිළිතුර වනුයේ ප්‍රසාද ස්නාපනයේ පසු කෙරෙන සියලු පාපයන්ට කමාව ලබා දෙන ප්‍රසාද නිධානය ය. මෙම සක්‍රමේන්තුව පව් කමා කිරීමේ හෙවත් ආධ්‍යාත්මික සුවය දානය කරන දේව ප්‍රසාද නිධානය ලෙස හැඳින්විය හැක. පශ්චාත්තාපයේ පාප උච්චාරණයේ සමාව ලබා ගැනීමේ සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලෙස සමහරු නම් කරනු ඇත විවිධාකාර අයුරින් හැඳින්වූවත් දෙවියන්ගේ අප්‍රමාණ කරුණාව හා සමාව මේ සක්‍රමේන්තුව තුළින් පව්කාර වූ මිනිසා වෙත ගලා එයි.

මෙම සක්‍රමේන්තුව තුළින් බිඳීගිය දෙව් මිනිස් බැඳීම නැවත යා කරන අතර මිනිසා මිනිසාමෙන් වීමට ඇති බාධා ද හෝ ගැඹුරු සබඳතාවයට ඇති බාධා ද දුරු කරයි. සැබෑ සිත් වෙනසක් තුළින් මිනිසා අතර බිඳියන සබැඳියාව තහවුරු වෙන අතර දෙවියන්ගේ රැකවරනයට නව මිනිසෙක් සේ සමීප වේ.

***දෙවියන් වහන්සේ දානය කරන කමාව***
දෙවියන් වහන්සේගේම සමාන කමට හා ස්වරූපයට අනුව මිනිසාව මවා ඔහුට සහකාරියක් ද මවා දී සතුටින් ජීවත් වීමට පොළවතලය පැවරුවත් මිනිසා දෙවියන් වහන්සේට පිටු පා ක්‍රියා කිරීම ආදම් ඒවගේ මුල්ම පාපය විය. ඒ හෙයින් දෙවියන් හා මිනිසා අතර බිඳීගිය ඒ සබැඳියාව නැවත ඇති කරගැනීමමට දෙවියන් වහන්සේ මිනිසාට සාප නොකර උන්වහන්සේගේ සමාව දීමේ දෑත් දිගු කළේ ය. යාවේ දෙවියන් වහන්සේ ප්‍රේමයේ දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කරමින් විවිධ අනාවරණ හා ගිවිසුම් මඟින් වරදට වැටුණු මනුෂ්‍යයාට වරදින් හැරී ඒමට ආරාධනා කරයි. මෙම ක්‍රියාවලිය පුරාණ ගිවිසුමේ දිවැසිවරුන්ගේ පොත්වලින් ඉතා බලගතුව ඉස්මතු කරයි.
උදා : එසකියල් 37:1-10

**(01)** ''සමිඳුණන් වහන්සේගේ හස්තය මා පිට පැමිණියේ ය. උන්වහන්සේ සිය ආත්මානුභාවයෙන් මා පිටතට පමුණුවා ඇටකටුවලින් පිරී තිබුණු මිටියාවතක් මැද මා සිටෙව් සේක.... මම ද උන්වහන්සේ මට අණ කළ පරිදි දිවැසි වැකි පැවසීම් එවිට ජීවන හුස්ම ඔවුන් තුළට පැමිණ ඔව්හු ජීවය ලැබ නැඟිට ඉතා මහත් සේනාවක්ව සිටගත්තෝ ය.''

පව්කාරයින්ගේ දිරාගිය ඇටකටු ආත්මයාණන්ගේ ආනුභාවයෙන් ආලේප කරනු ලැබ නව ජීවනය ලැබීමේ හා සමාව ලැබීමේ සංකේතයක් විය.

(02) විසිරිගිය ඊශ්‍රායෙල් ජනතාව මනස්ථාපනය තුළ එක ජාතියක් ලෙස ඒක රාශී කිරීම දෙවියන් වහන්සේගේ සමාව දීමේ ක්‍රියාවලියේ එක් සන්ධිස්ථානයක් බව ජෙරමියා දිවැසිවරයා තුළින් බයිබල් කතුවරයා පෙන්වා දෙයි. ''ඔවුන්ටත් ඔවුන්ට පසු ඔවුන්ගේ දරුවන්ටත් සුබසිද්ධවන පිණිස හැම කල්හි ම මා කෙරෙහි ගරුබිය දක්වීමට එක ම හිතක් හා එක ම මඟක් ඔවුන්ට දෙන්නෙමි.'' (ජෙරමියා 32:39)

(03) පව්කාර මිනිසාව දෙවියන් වහන්සේ සමාව දානය කරන අයුරු හා ඔහුව ආරක්ෂා කරන අයුරු එසකියෙල් දිවැසිවරයා මෙලෙස ප්‍රකාශ කරයි.
''මහෝත්තම දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. බලන්න මම ම මාගේ බැටළුවන් ගැන සොයා බලා උන් රැකබලා ගන්නෙමි. එඬේරෙකු තමාගේ බැටළු රැළෙන් විසිර ගිය සමහරෙකු සොයා යන්නාක් මෙන් මමත් මාගේ බැටළුවන් සොයා ගොස්.... මුලාව ගිය බැටළුවන් ආපසු ගෙනෙන්නෙමි...'' (එසෙකියෙල් 34:11-16)

(04) දාවිත් රජතුමා දෙවියන් වහන්සේගේ සමාව ඉල්ලා මොරගසන මනස්ථාපනයේ ගීතය ගීතාවලියේ 51 ගීතයෙන් බයිබල් කතුවරයා අපට ඉදිරිපත් කර ඇත.

දෙවියන් වහන්සේ පව්කාර මිනිසාට දක්වූ කමාව හා අනුකම්පාව ගැන වැඩිපුර දැනගැනීමට කියවන්න.
* දානියෙල් 9:4-19
* එසකියෙල් 9:9-11
* යෙසායා 58:6-7
* යෙසායා 53:8-12

## 5.5.1 නව ගිවිසුම තුළ දෙවියන් වහන්සේගේ කමාව

දෙවියන් වහන්සේ සැම විට ම අප කරන පව්වලට සමාව දීමට ඉතා ආශාවෙන් දෑත් දිගුකර ගෙන බලා සිටින සේක. 'පසුතැවිලිවන්න ස්වර්ග රාජයය ළඟා වී ඇතැ'යි ජේසුස් වහන්සේ වදාළ සේක. (මතෙව් 4:17) පව්කාරයාට සමාව දීමට බලාසිටින දෙවියන් වහන්සේ ගැන ලූක් සුබාරංචියේ උපමා තුනක් සඳහන් කර ඇත.
* නැතිවූ බැටළුවා පිළිබඳ උපමාව
* නැති වූ කාසිය පිළිබඳ උපමාව
* නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව

මෙම උපමා තුළින් දෙවියන් වහන්සෙගේ දයා කරුණාවේ තරම පෙන්වා දෙනු ඇත. ඒ නිසාම ස්වාමින් වහන්සේ මෙලෙස වදාරා ඇත. ''මනස්ථාපනය වීමට වුවමනා නැතැයි සිතන සිල්වතුන් අනූනවදෙනෙකුට වඩා මනස්ථාපනය වන එක පව්කාරයෙකු ගැන ස්වර්ගයේ ප්‍රීතිය ඇතිවන්නේ ය.''

නිතර පාපයට වැටෙන මනුෂ්‍යයාව ගලවා ගැනීම ජේසුස් වහන්සේගේ මූලික දූත කාර්යය විය. ඒ බව අපට තේරුම් ගැනීමට ඉතාමත් ප්‍රබලව ගලීලියේ කළ මුල්ම දේශනය ''නියමිත මොහොත පරිපූර්ණ වී ඇත. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය. මනස්ථාපනය වන්න. සුබ අස්න අදහාගන්න.'' (මාක් 1:15) මනුෂ්‍යයාගේ පාපය හේතුවෙන් ජීවිත පූජාවෙන් වන්දි ගෙවූ අතර දේව කමාව තුළ මිනිසාව රඳවා තබාගැනීමට ජේසුස් වහන්සේ රොටි ගෙන ආශීර්වාදය පවසා ඒවා කඩා ශ්‍රාවකයින්ට දී ''රැගෙන වළඳන්න. මේ මාගේ ශරීරය යැ'යි වදාළ සේක. උන්වහන්සේ කුසලාන ද ගෙන තුති පුදා ඔවුන්ට දී ''ඔබ උදෙසා වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ...'' (මතෙව් 26:26-27)

පාපය පෞද්ගලිකව මිනිසා විසින් කරන ලද්දක් වූවත් එහි සාමාජීය පැත්තක් ඇත. මිනිසා පව් කරනුයේ ඔහු ජීවත් වන සමාජ යාථාර්ථය තුළ ය. ඒ හෙයින් ඔහුට බැඳී පවතින තවත් ජන කොටසක් එයට බද්ධ වේ. එයින් බැට කන සහෝදර සහෝදරියන් පිරිසක් සිටිනු ඇත. එබැවින් දෙවියන් වහන්සේට පුද පඬුරු පිදීමට පෙර සිය සහෝදරයෙක් සමඟ සමගි වීමේ ඇති අවශ්‍යතාවය ජේසුස් වහන්සේ වැඩියෙන් අවධාරණය කළහ.

''ඔබ පූජාසනය වෙත පඬුරක් ගෙනෙන කල ඔබේ සහෝදරයා ඔබට විරුද්ධව යම් කිසි අවමානයක් ඇතිව සිටින බව එහි දී සිහි වී නම් පඬුර පූජාසනය ඉදිරියෙහි තබා ගොස් පළමුව සහෝදරයා හා සමගි වී පසුව අවුත් පඬුරු පුදන්න.'' (මතෙව් 5:23-26)

පාපය හේතුවෙන් මිනිසා දෙවියන් වහන්සේගෙන් ඈත් වන අතර මිනිසා මිනිසාගෙන් ද ඈත් වේ. වරද පිළිගැනීම හා සිත් හැරීම තුළින් තම සහෝදරයා සමඟ සමඟ වීමෙන් පසු දෙවියන් වහන්සේ යවන සමගිවීමට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් ඒ බැඳීම තහවුරු කර ගත හැක.

''මිනිසුන්ගේ පව් ඔවුනට විරුද්ධව ගණන් නොගෙන ක්‍රිස්තුන් වහන්සේ කරණකොට ගෙන දෙවියන් වහන්සේ ලෝකය තමන් වහන්සේට සමගි කර ගනිමින් සිටි'' (1 කොරින්ත 5:18-19)

ප්‍රසාද ස්නාපනය තුළින් ජම්ම පාපයෙන් නිදොස් වූ මනුෂ්‍යයාට ක්‍රිස්තුන් වහන්සේ තුළ පූර්ණත්වයට පත්වීමට ගැඹුරු හා අඛණ්ඩ සිත් හැරීමක් අවශ්‍යය වේ. එනුමත් මෙම බැඳීම දෙදරා යන බලවේගවලදී පාපයට වැටෙන මිනිසා පසුතැවිල්ල තුළින් සැබෑ සිත් හැරීමක් අවශ්‍ය වන වග ජේසුස් වහන්සේම උගන්වයි. පාපයට වැටුණු මිනිසා බාහිර දේවල් තුළින් නෙවා ඇතුළාන්ත වෙනස් වීම් තුළින්ම ස්වාමින් වහන්සේ හා සමගි විය යුතු වේ. එය මෙලෙස දිවැසිවර ජෝවෙල් ප්‍රකාශ කරයි.

***''සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක.***
***උපවාසයෙන් ද, වැලපීමෙන් ද මුළු සිතින් දැන්වත් මා වෙත හැරී එන්න.***
***වත ඉරාගෙන නොව සිත ඉරගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න.***
***මන්ද, එතුමාණෝ කරුණාභරිත, දයාන්විත, වහා නොකිපෙන, තිර පෙමින් සමන්විත කමාවීමට කැමති දෙවි කෙනෙකි. (ජෝවෙල් 5:12-14)***

මේ දේව ලක්ෂණය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිත පැවැත්ම තුළින් පෙන්වීය. ''මා යාග පූජාවට නොව දයාවට කැමැත්තෙමි. මා ආවේ දැමිටුන් නොව පව්ටුන් කැඳවීමට ය.'' එබැවින් උන්වහන්සේ පව්කාරයින් සොයා ගියහ. ඔවුන් සමඟ කෑම අනුභව කළහ.

### 5.5.2 සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ක්‍රිස්තුන් වහනසේ ස්ථාපිත කළ සේක.

පව් කමාවේ සක්‍රමේන්තුව තුළ දේව සැබැදියාව බිඳීගිය මිනිසාව නැවත උත්ථාන කිරීමට දෙවියන් වහන්සේගේ ආදරයේ කියාදාමය මේ අයුරින් සිදුවෙන අතර එම වරප්‍රසාදය දානය කිරීම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින්ම ස්ථාපිත කර ඇත.

''පාස්කු දින හෙවත් ක්‍රිස්තුන් වහන්සේ මරණින් උත්ථාන වූ දින ගෝලයින් මත හුස්ම හෙළා ශුද්ධාත්මයාණන් පිළිගන්න ඔබ යමකුගේ පව් කමා කරන්නහු ද ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ. ඔබ යමකුගේ පව් කමා නොකරන්නහු ද ඒවා කමා නොකරනු ලැබේයි'ය පැවසීයි'' (ජොහාන් 20:22-23)

මේ හෙයින් ඉතා පැහැදිලිව ම මෙම සක්‍රමේන්තුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇත. එපමණක් ද නොව මේ සක්‍රමේන්තුව මඟින් ජේසුස් වහන්සේට පව්කාර මිනිසාව ගලවා ගැනීමට ක්‍රියාකාරී වේ. එබැවින් සමගි සන්ධානයේ සක්‍රමේන්තුව තුළ දෙවියන් අත්දැකීමට පව්කාර මිනිසාට අවස්ථාව ඇත. ඔහුගේ / ඇයගේ ගැලවීම ලැබීමට ද ඉඩප්‍රස්ථා ඇත.

### 5.5.3 මෙම සක්‍රමේන්තුව ලැබීමට සුදානම් වීම.

එබැවින් මිනිස් දුර්වලකමින් සිදුවූ වැරදිවලදී මිනිසා සැබෑ

* පසුතැවිල්ල තුළින්
* තමාගේ පව් සිහිකර
* ඒවාට දුක් මනස්ථාප වී
* මින් මතු පව් නොකරන්නට ගැඹුරින් අදිටන් කොට

* පව් සියල්ල දෙවියන් වහන්සේගේ නියෝජිත පියතුමාට ප්‍රකාශ කළ යුතු ය.
* තවද අවසාන වශයෙන් පියතුමා නියම කරන දඬුවම් පිළිපැදීම කළ යුතු වේ.

★ **පියතුමාට පව් කීම**

මෙම මස්ථාපනයේ ක්‍රියාවලිය තුළින් තමාගේ හදවතට සවන් දී තමාගේ පාපයන් සිහිපත් කර ඒවාට මනස්ථාපනය වී පව් පියතුමාට උච්චාරණය කිරීම කතෝලිකයින් පාපොච්චාරණය කිරීමේ සාමාන්‍ය පිළිවෙත වේ.

''එහෙත් අපි පාපොච්චාරණය කරමු නම් විශ්වාසවන්ත වූ ද, ධර්මිෂ්ඨ වූ ද, දෙවියන් වහනසේ සියලු පාපවලින් ද අදමිටුකම්වලින් ද අප පවිත්‍ර කරන සේක.'' (1 ජොහාන් 1:9)

පූජාප්‍රසාදි තුමෙකුට යමෙකු තමන් කළ වැරදි ප්‍රකාශ කිරීම තුළින් සිදුවනුයේ සමාජයට එය ප්‍රකාශකර සමාජයෙන් ද සමාව ලබා ගැනීමකි. එම පියතුමා සමාජය නියෝජනය කරන්නෙකු වේ. එපමණක් නොව පියතුමා දෙවියන් වහන්සේ තෝරාගත් විශේෂ තැනැත්තෙකු වේ. පියතුමා ද මනුෂ්‍යයෙක් ලෙස වැරදි අඩුපාඩුකම් තිබිය හැක. එනමුත් පාපොච්චාරණය නාමයෙන් දෙවියන් වහන්සේගේ කමාවේ ආශිර්වාදය දානය කරයි. මෙහිදි පූජාප්‍රසාදිවරයාව කැඳවා ඇත්තේ මනස්ථාපනයට ජනයා යොමු කරන මහා බලවේගයක් ලෙසිනි.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් පහත සාදහන් වචන වදාරමින් පියතුමා පාපොච්චාරණයේ දී පව්වලට සමාව දානය කරයි.

''ස්වකීය පුත්‍රයාණන්ගේ මරණය හා උත්ථානය මගින් සකළ ලෝකය තමන් හා සමාදානය කර පව්කමාව සඳහා ශුද්ධාත්මයාණන් අප වෙත පැමිණෙවූ කරුණාබර දෙවි පියාණන් වහන්සේ ශාන්ත සභාවේ සේවය මගින් ඔබට සමාවත්, සාමයත් දානය කරන සේක්වා. පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් මම ඔබේ පව් කමා කරමි.''

# හයවන පාඩම

## 6. ශු. සභාව පිළිබඳ වතිකාන ප්‍රකාශනය හා වර්තමාන ලෝකයේ ශු. සභාව පිළිබඳ වතිකාන ප්‍රකාශනය පිළිබඳ අවබෝධය

## 6.1. ශු. සභාව, ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය හා ශු. සභාව පිළිබඳ වතිකාන ප්‍රකාශනය

**විමුක්තියේ සලකුණ වන සභාව:**
ක්‍රිස්තුන් වහන්සේ ලෝක ජාතීන්ගේ ආලෝකය වන සේක (ජොහන් 9:5). මෙය ඉදිරියට ගලා යන ස්ථාවර සත්‍යයකි. එම නිසා ක්‍රිස්තු-සභාව ද නවීන ලෝකයට ක්‍රිස්තු-ආලෝකය ගෙන දීමේ වගකීම දරයි. ඈ එසේ කරනුයේ, දෙවියන් වහන්සේ හා සමග ද, මානව සමාජය හා සමග ද නිසි සම්බන්ධතාවය ගොඩ නැංවීමෙනි. අද ලොව තුළ ඉස්මතු වන සමාජයීය, කාර්මික, සංස්කෘතික එකමුතුව ප්‍රයෝජනයට ගෙන, සාමයේ - ඒකත්වයේ නව සාමජයක් බිහි කිරීම කිතුනු සභාවේ අනිවාර්ය කාර්යයකි.

ශු. සභාව වූ කලී, ක්‍රිස්තුන් වහන්සේව අදහන අයගෙන් යුත් සමාජයයි. මෙම සමාජය පැරණි ගිවිසුමේ ඉශ්රායෙලයට නැකම් කියන බව ඔබ දනියි. අද ස්ථිර සංස්ථාවක් වශයෙන් දිස්වෙන මෙම සභාව පෙන්තකොස්ත දිනයේ දී ලෝකයට ප්‍රකාශ විය. කාලයේ අවසානයේදී උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේගේ මහිමාලංකාරයෙන් සම්පූර්ණත්වයට පත්වන මේ ශුද්ධ සමාජය තුළ, සියලු දම්වුවන් රැස් කරයි. මෙය දෙවි පියාණන් වහන්සේගේ කැමැත්ත හා සැලැස්ම වේ. මෙම කැමැත්ත හා සැලැස්ම ඉදිරියට ගෙන යාම සඳහා, ක්‍රිස්තුන් වහන්සේ මිහිමත දේව රාජ්‍යය හෙවත් ශු. සභාව පිහිටෙවූ සේක. එම සභාවට දෙවි පියාණන්ගේ අභිරහස ප්‍රකාශ කළ සේක. තම කීකරුකමින් මිනිසාට ගැලවීම සලසා ලූ සේක.

අද දේව බලයේ හේතුවෙන් සංවර්ධනය වන ශු. සභාව තුළ:
- දිව්‍ය පූජාව මගින් කල්වාරි යාගය ඉදිරියට ගලයි.
- පාස්කු බැටළුවා (ක්‍රිස්තුන් වහන්සේ) පූජා කෙරෙයි
- එමගින් අපගේ විමුක්තියේ කෘත්‍යය ක්‍රියාත්මක වෙයි
- දිව්‍ය භෝජනය මගින් විශ්වාසිකයන්ගේ ඒකත්වය පිළිබිඹු වෙයි, ක්‍රියාත්මක වෙයි.
- එවිට පරම ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ප්‍රකාශ වෙයි, ක්‍රියාත්මක වෙයි.

ක්‍රිස්තු-සභාවේ ජීවනය වන ශුද්ධාත්මයාණෝ, සදා ජීවනය උනන උල්පත වන සේක (ජොහන් 4-14). උන්වහන්සේගේ වරප්‍රසාදවල හේතුවෙන්, මිනිසාට පව් කමාව ද, නව (දේව) ජීවනය ද ලැබෙයි. එපමණක් ද නොව මිනිසා (ක්‍රිස්තුන් වහන්සේ තුළ) උත්ථානය වෙත ගමන් කරයි. ශුද්ධාත්මයාණෝ විශ්වාසිකයන් තුළ මාළිගයක මෙන් වෙසෙමින් (1 කොරින්ති 3:16, 6:19), ඔවුන් තුළ යාච්ඤා කරමින්, ඔවුන් දේව දරුවන් බවට සාක්ෂි දෙන සේක. මුළු සභාව සත්‍යය වෙත ගෙනයමින්, සහභාගිත්වයේ හා සේවයේ එක්සත්කම දෙන සේක. විවිධ දීමනාවන් දානය කරමින්, නානාවිධ සේවාවන් දියත් කරන සේක. සුබාරංචියේ ඇතුළාන්ත බලයෙන් සභාව දියුණු කර, එහි නිරන්තර නව ජීවනයක් ජනිත කරන සේක. ක්‍රිස්තු මනාලිය වන සභාව තම සමණානන් වන ක්‍රිස්තුන් වහන්සේ සමග පිරිපුන් සබැඳියාවක් වෙත ගෙන යන සේක. මෙලෙස, ශුද්ධාත්මයාණන් ද, ප්‍රියාව වන සභාව ද එක්ව් “වඩින්නැ” යි ජේසුස් ස්වාමින් වහන්සේට කියති. මෙලෙස සමස්ත සභාව හෙවත් “ක්‍රිස්තු-සමයේ-නව සමාජය” ශු. ත්‍රිත්වයට සම්බන්ධ කරන ලද සෙනගක් වශයෙන් ප්‍රකාශ වෙයි.

මෙම විමුක්තිදායක සමාජය, ශු. ලියවිල්ල තුළ විවිධ රූප, වර්ණවලින් දිස්වෙයි. ඒවා ඔබ අධ්‍යයනය කර, ගැබ්වන අරුත වටහා ගන්න. ඔබ ද මෙම සමාජයට අයත් වන හෙයින්, එවැනි දැනුම මගින්, “ඔබට ඔබවම තේරුම් ගැනීමට, ඔබ ලැබූ බෞතිස්ම කැඳවීම වඩා පැහැදිලි කර ගැනීමට, වඩා ඵලදායක කිතුනු ජීවිතයක් ගත කිරීමට, වඩා කාර්යක්ෂම ධර්මෝපදේශකයෙක් වීමට” මග පැදෙයි.

ශු. සභාව දෙවියන් වහන්සේගේ කෙත ය (1 කොරින්ති 3:9). මෙහි වැවෙන ඔලිව ගසේ මුල වනුයේ ආදි පිතෘවරු ය. ජුදෙයන් හා අන්‍යජාතිකයන් අතර සමගිය වර්ධනය වනුයේ එම ඔලිව ගස (දේව වචනය හෙවත් ක්‍රිස්තුන් වහන්සේ) නිසා ය.

ශු. සභාව දෙවි පියාණන්ට අයත් මිදි වත්තකි (යෙසායා 5:1). ක්‍රිස්තුන් වහන්සේ සැබෑ මිදිවැල වන සේක. එහි අතු වන අපි උන්වහන්සේගෙන් ජීවිතය ද සාරත්වය ද ලබමු. සභාව මගින් අපි උන්වහන්සේ තුළ ජීවත් වෙමු. උන්වහන්සේ නොමැතිව කිසිවක් කරන්නට අපට නොපිළිවන (ජොහන් 15:5).

ශු. සභාව දෙවියන් වහන්සේගේ ගොඩනැගිල්ල ය. එහි කොන් ගල වනුයේ ක්‍රිස්තුන් වහන්සේ ය. එම පදනම මත, අපෝස්තුළුවරුන් විසින් ශු. සභාව ගොඩ නංවන ලදි (1 කොරින්ති 3:11). සභාවට ස්ථිරත්වය හා ශක්තිය ලැබෙනුයේ ද මෙම කොන් ගලෙන් ය. මෙසේ ඉදිකරන ලද සභාව නමැති ගොඩනැගිල්ලට විවිධ නාමයන් යෙදෙයි.

- දේව ගෘහය - දෙවියන් වහන්සේගේ පවුල එහි වෙසෙයි (එපීස 2:19-22).
- දේව වාසස්ථානය - දෙවියන් වහන්සේ එහි වාසය කරන සේක (නූතන දෙව් මැඳුර තුළ දිව්‍ය සත්ප්‍රසාදයෙහි ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින සේක).
- ශුද්ධ නගරය වන ජෙරුසලම - අපි මේ නගරය තුළ ජීවමාන ගල් මෙන් ගොඩනගනු ලබමු. (1 පේදුරු 2:5)
- අපගේ මාතාව - ශුද්ධාත්මයාණන් මගින් අපි ඇ තුළ ජනිත කරනු ලබමු. (ගලාති 4:26)
- නිමල අජබාලකයාණන්ගේ- ක්‍රිස්තුන් වහන්සේ ඇයට ප්‍රේම කර, ඇ ශුද්ධවත් කරනු සඳහා සිය නිමල සොයුරිය දිවි පිදූ සේක (එපීස 5:26). එම සභාව ගිවිසුමකින් සම්බන්ධ කරගෙන එය පෝෂ්‍ය කර නඩත්තු කරන සේක. එළිදරව්ව (19:7)

මෙම සභාව ප්‍රේමයෙන් හා ඇදහිල්ලෙන් ක්‍රිස්තුන් වහන්සේට යටත් වෙයි. දේව ප්‍රේමයේ සලකුණු වලින් පිරිපුන් වෙයි. උත්ථාන වූ තම ස්වාමීන් වහන්සේ වෙත සභාව ගමන් කරන්නේ මෙලොව විප්‍රවාසියකු මෙන් කල් යවමිනි. නිතර ලොව්තුරු දෙය සොයමින් ඉදිරියට යන සභාව, අනාගතයේදී, උත්ථාන වන්නවුන්ගේ මහිම තේජස දර්ශනය වන තුරු අපේක්ෂාවෙන් පසුවෙයි.

අද ලොවට විමුක්තියේ සලකුණ වන සභාව දුක්පීඩා විඳිමින්, දිළිඳුකම අත්දකිමින්, ක්‍රිස්තු මාර්ගයෙහි ගමන් කරයි. දුගීනට සුබ අස්න දෙසයි. පසුතැවිලි වූවන් සුව කරයි. නැති වූ බැටළුවන් ගැලවීම වෙත ගෙන එයි. ශුද්ධවන්ත වෙමින් පවතියි. දයා සේවාවන්හි යෙදෙයි. ජන වන්දනාව මගින් මිනිසුන් දෙවියන් වහන්සේ වෙත ගෙන යයි. ප්‍රසාද නිධාන මගින් ඔවුන් ශුද්ධවන්ත කරයි. මෙලෙස "දෙවි-මිනිස්" සබැඳියාව ජනිත කරයි. සාමයේ සමාජය වර්ධනය කරයි. ලොවට උත්ථානයේ බලාපොරොත්තුව දෙයි. ඇ මේ සියල්ල ම කරන්නේ, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ විමුක්තිදායක සලකුණ වශයෙනි.

**වීර දේව ජනතාව:**
පින්වත් සොයුර/සොයුරිය, අද ඔබ දේව ජනතාව අතර වීරයෙකි. වීරවරියෙකි. ඔබ පරාජිත පිරිසකට අයත් නොවෙයි. ඔබ ලෞකික බව පරදවා ලොව්තුරු ක්ෂේත්‍රයකට මානව පවුල ඔසවන පුදුම ධර්මදූත යෝධයෙකි. ඔබ අයත් වීර ජනතාව ගැන දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පවසන දේ අධ්‍යයනය කරන්න. ඔබ ලැබූ ශුද්ධාත්ම දායාදයට සාක්ෂි දැරීමට ඉදිරිපත් වන්න. ධෛර්යය ගන්න, ඔබේ සාක්ෂිය අවැසි කාලය දැන උදාවී තිබේ. "විශාල ජනකායකට සුවිශේෂය දේශනා කිරීමට මෙන් ම, අපෝස්තලික මෙහෙය ක්‍රියාත්මක කිරීමට, සුළු පූජක පිරිසක් සිටින මෙවැනි යුගයක, ධර්මෝපදේශකයාගේ සේවය අතිශයින් වැදගත් වෙයි."

දෙවියන් වහන්සේ සැම යුගයක ම ජීවත් වූ, ජීවත්වන දැහැමියන් පිළිගන්නා සේක. උන්වහන්සේට අවැසි වනුයේ සාමූහික විමුක්තිය ය. මෙය ගැලවීමේ ඉතිහාසයෙන් ඔබ අධ්‍යයනය කළෙහි ය. දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ මගින් ජුදෙයන් හා අන්‍ය ජාතිකයන් එක්කර, කල්වාරි ගිවිසුම මුළු විශ්වය හා සමග පිහිටුවා ගත් සේක. අද දේව ජනතාව "මාංශයෙන් නොව ජලයෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් ඉපදී,

- තෝරා ගත් වංශයක් ද
- රාජකීය, පූජක ප්‍රජාවක් ද,
- ශුද්ධ ජාතියක් ද
- දේව සන්තක (පූජිත) සෙනගක් ද වෙති."

එබැවින් ඔවුන්ගේ තත්ත්වය, "දේව දරුවන්ගේ ගෞරවය හා නිදහස වේ". ඔවුන්ගේ හදවත් තුළ ශුද්ධාත්මයාණෝ වෙසෙති. ඔවුන්ගේ ප්‍රතිපත්තිය ක්‍රිස්තු-ප්‍රේමයේ නව පණතයි. (ජොහන් 13:34). ඔවුන්ගේ අපේක්ෂාව, "මිහිමත ඇරඹී ලෝකාන්තිමයේ දී පූර්ණත්වයට පැමිණෙන, එනෙක් පතුරුවා හැරිය යුතු දේව රාජ්‍යයයි." එය උදාවන විට, "මවා ඇති මේ විශ්වය ජරාපත් වීමේ වහල්කමින් මිදී දේව දරුවන්ට හිමි මහිමාන්විත නිදහස ලබයි" (රෝම 8:21).

අද දේව ජනතාව සුළු පිරිසක් (කුඩා රැළක්) මෙන් දිස් වුවත්, මුළු මානව පවුලට ඒකත්වයේ අපේක්ෂාවේ හා විමුක්තියේ බීජාංකුරයක් වෙයි. ක්‍රිස්තු ජනතාව වූ කලී, ප්‍රේමය, සත්‍යය හා සහෝදරත්වය විඳහා දක්වන, දිනවන පිරිසකි. ක්‍රිස්තු උපකරණයකි. එම ජනතාව ලෝකයේ ආලෝකය වශයෙන් ද, පොළොවේ ලුණු මෙන් ද, ලෝකය තුළ ව්‍යාප්ත වෙයි.

නව ජෙරුසලම බලා ගමන් කරන මේ ජනතාව නව ඉශ්රායෙලය වේ. ක්‍රිස්තුන් වහන්සේ එම ජනතාව රුධිර යාගයෙන් මිලයට ගෙන, තම ආත්මයෙන් පූර්ණ කොට, දෘශ්‍යමාන සාමාජීය ඒකත්වයකට අවැසි වන වත්කම් ඔවුන්ට දුන් සේක. එමනිසා, කාලය හා භූගෝලීය සීමාවන් ඉක්මවා යන සභාව හෙවත් දේව ජනතාව, ලෝක ව්‍යාප්ත වී, මානව ඉතිහාසයට ඇතුළු විය යුතු ය. හිරිහැර හා පීඩාවන් මැද ගමන් කරන මේ ජනතාව, දේව බලයෙන් සවිමත් වෙයි. ඇදහිල්ල පිරිහී යා නොදී රැක ගනියි. ක්‍රිස්තු මනාලිය වශයෙන් ශුද්ධවත්ව පවතිමින්, කුරුසියේ මග ගෙන, බැස නොයන ආලෝකය වෙත (උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ වෙත) ගමන් කරයි. අඛණ්ඩව නව ජීවිතයක් අත්කර ගනියි.

දේව ජනතාවගේ (බෞතිස්ම) පොදු පූජකත්වය සභාවේ (දේව සේවක) නිල පූජකත්වයෙන් වෙනස් වන්නේ, “ප්‍රමාණයෙන්” පමණක් නොව “හරයෙන්ම” ය. එහෙත් ක්‍රිස්තු පූජකත්වයට පංගුකාර වීමේ හේතුවෙන්, සභාවේ පොදු (ජන්ම) පූජකත්වයත්, නිල පූජකත්වයත් එකම මූලාශ්‍රයට සම්බන්ධ වෙයි.

**නිල පූජකවරය**
දේව ජනතාව හැඩ ගස්වයි, පාලනය කරයි, ක්‍රිස්තු නියෝජිතයා වශයෙන් ක්‍රියා කරයි, දිව්‍ය සත්ප්‍රසාදීය යාගය ඇතිවන්නට සලසයි. මුළු ජනතාවගේ නාමයෙන් එය දෙවිඳුන්ට පුදයි.

තම ජන්ම පූජකත්වයේ හේතුවෙන් විශ්වාසිකයෝ, දිව්‍ය සත්ප්‍රසාදීය යාගය පිදීමට හවුල් වෙති. ප්‍රසාද නිධාන ලැබීමෙන්, යාච්ඤා කිරීමෙන්, දෙවිඳුන් පැසසීමෙන්, උන්වහන්සේට තුති පිදීමෙන්, දමිටු ජීවිත සාක්ෂියෙන්, ආත්ම පරිත්‍යාගයෙන්, ක්‍රියාකාරී දයාවෙන් ආත්මික පුද පඬුරු පුදති.

විවිධ ප්‍රසාද නිධාන මගින් ශක්තිය ලබන දේව ජනතාව, සැබෑ ඇදහිල්ල රැක ගනියි. එය ලොවට ප්‍රකාශ කරති. ඒ අනුව තම ජීවිතය සකස් කර ගනිති. ශුද්ධාත්ම දීමනාවන් ලැබ, ධර්ම දානයෙහි යෙදෙමින් (සභා පාලනය යටතේ) දේව රාජ්‍යයට සාක්ෂි දරති. හිතුවක්කාර ලෙස නොව, සභා මාර්ගෝපදේශය අනුව විවිධ සේවාවන්හි යෙදෙති.

සකල ලෝක ජාතීන් අතර ඇත්තේ එක ම දේව ජනතාවකි. ඔවුහු ස්වර්ගීය රාජ්‍යයක පුරවැසියෝ වෙති. විවිධ ලෝක සංස්කෘතීන් පොහොසත් කරන, ශුද්ධවන්ත කරන දේව ජනතාව ලෝක සාමයේ පෙර නිමිත්තක් වන, එම සාමයට අනුබල දෙන, දේව සෙනගගේ පොදු ඒකත්වයට පංගුකාර වීමට සියලූ මනුෂ්‍යයන් කැඳවති.

කතෝලික ජනතාව, එකම සමිඳාණන් ද, එකම බෞතිස්මයද, එකම ඇදහිල්ල ද පිළිගනිති, ප්‍රකාශ කරති. සභාවේ මුළු පැවතුම් පිළිවෙත ද, එහි පිහිටුවන ලද විමුක්ති සාධකයන් ද පිළිගෙන, සුදු පියාණන් හා රදගුරුවරුන් මගින් සභාව පාලනය කරන ක්‍රිස්තුන් වහන්සේ හා සමග දෘශ්‍යමාන සංස්ථාවට සම්බන්ධ වෙති.

**මෙම සබැඳියාවේ ප්‍රධාන ලක්ෂණ:**
- විශ්වාසය ප්‍රකාශ කිරීම.
- දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම.
- ශාසනයේ පාලනයට අවනත වීම.
- සභාව සමග සහභාගිත්වය.

වශයෙන් දැක්විය හැකි ය. ප්‍රේමයේ හා විමුක්තියේ ජීවනය දේව ජනතාව සතු වනුයේ, තම සුදුසුකමේ හේතුවෙන් නොව, ක්‍රිස්තුන් වහන්සේගේ විශේෂ වරප්‍රසාදයේ හේතුවෙනි.

විවිධ රෙප්‍රමාදු සභාවන් ද, මෙතෙක් සුබ අස්න නොලැබූ අයද දේව ජනතාවට නන් අයුරින් සම්බන්ධ වෙති. සත්‍යය සොයන ඔවුනට “ආශාවේ බෞතිස්ම” ලැබෙනා බව සභාවේ පිළිගැනුමයි. එවන් අය, විවිධ අයුරින්, තම සංස්කෘතික පසුබිම අනුව, සුබ අස්න හා ශීල ධර්මය (විවිධ මට්ටම් වලින්) උගනිති. ඔවුනට හරි මග දැක්වීමට කතෝලික ජනතාව යුහුසුළු විය යුතු ය.

සුබාරංචිය ප්‍රකාශ කරමින්, සංවාදය මගින් විවිධ ජනතාවන් අතර මාංශගත වෙමින්, විවිධ නොකිතුනු සංස්කෘතීන් විනිවිද ගොස්, ඒවායෙහි ගැබ් වන සියලූ යහපත් දේ පිළිගෙන, එය ශුද්ධවත් කිරීම නූතන දේව ජනතාව සතු වගකීම වෙයි.

මෙම වගකීමට ඔබ දක්වන ප්‍රතිචාරය කිමෙක් ද? මේ ගැන සිතන්න. "ඉර උදාවන තැන් පටන් ඉර බැස යන තැන් දක්වා සියලූ ජාතීහු මාගේ නාමයට ගෞරව කරති. ඔවුහු සෑම තැනම සුවඳ දුම් ද, පිරිසිදු පූජා ද මට ඔප්පු කරති. සියලූ ජාතීහු මාගේ නාමයට ගෞරව කරති" (මලාකි 1:11).

දෙවියන් වහන්සේගේ මේ වදන යථාර්ථයට නැංවීම සඳහා ඔබත්, ඔබේ සහෝදර දේව ජනතාවට අත හිත දෙන්න.

**දේව ජනතාව බබළවන ආභරණ:**
ගිහි පූජක දෙපක්ෂයෙන්ම පැවිදියාවට කැඳවීම ලබාගත් අය එමට ය. ඔවුහු විවිධ පැවිදි සමාජවලට (නිකායනට) බැඳි.

- **දිළිඳුකම** - **පිරිසිදුකම** - **කීකරුකම**

නමැති සුවිශේෂක අනුශාසනාවන් ක්‍රියාවට නංවමින්, භාග්‍ය අට අනුව ජීවත් වීමටත්, පැමිණෙන්නට තිබෙන මහිමාන්විත නව පෙරුසලම හෙවත් තේජෝමාන දේව රාජ්‍යයට සාක්ෂි දැරීමටත් ඉදිරිපත් වෙති. ඔවුන්ගේ මේ ක්‍රියාකාරිත්වයේ හේතුවෙන් සභාවේ ගැලවීමදායක පරිශ්‍රමය ඉදිරියට යයි. ඉහත දක්වූ වේද භාර මගින් ශක්තිමත් වන පැවිදියාවේ මේ කැපවීම ක්‍රිස්තුන් වහන්සේ හා ක්‍රිස්තු-මනාලිය වන සභාව අතර ඇති නොබිඳිය හැකි ප්‍රේම බන්ධනයේ සලකුණක් වන හෙයින්, එය සම්පූර්ණ වූ කැපවීමක් වෙයි. එපමණක් නොව, පැවිදි තත්ත්වය සභාවේ පාලන සංස්ථාවේ අංශයක් නොවුව ද, එය වෙන් කළ නොහැකි ලෙස සභාවේ ජීවිතයට හා ශුද්ධවත්කමට සම්බන්ධ වෙයි.

පැවිදි නිකායික නීති රීති අනුමත කරන සභාව, පැවිදියාව පිළිගනිමින්, එය ශාසනීය නීත්‍යානුකූල තත්ත්වයක ගරුත්වයට ඔසවයි. පැවිදියන්ගේ වේද භාර පිළිගනියි. නිල වශයෙන් කරන යාච්ඤා වලින් පැවිද්දන් උදෙසා දේව පිහිට අයැදියි. ඔවුන් දේව හස්තයට භාර කර, ඔවුනට ලොව්තුරු ආසිරි දානය කරයි. ඔවුන්ගේ ආත්ම පූජාවට දිව්‍ය සත්ප්‍රසාදීය යාගය සම්බන්ධ කරයි.

සභාවේ ආශාව වනුයේ, පැවිදියාව මගින් :
- කන්දක් මත භාවනා කරමින් සිටි,
- ජන සමූහයාට දේව රාජ්‍යය දේශනා කළ,
- රෝගීන් හා අංගවිකල වූවන් සුවපත් කළ,
- පව්ටුවන් දම්ටුවන් කළ,
- බාලයන් ආසිරි ගැන් වූ,
- සියල්ලනට යහපත සිදු කළ,
- දෙව් පියාණන්ට අවනත වූ,

ක්‍රිස්තුන් ස්වාමින් වහන්සේ ප්‍රකාශ කිරීම ය.

ක්‍රිස්තු මනාලිය සරසන, බබළවන පැවිදියාවේ දහම් ගුණ සුවඳ හා දැහැමි ඔපය දෙගුණ තෙගුණ වනුයේ, පැවිද්දන් ලෝකයේ ඇති සමහර වටිනා දේවල් ත්‍යාජ කිරීමේ හේතුවෙනි. එම ත්‍යාජය මානව ස්වීයත්ව වර්ධනයට බාධාවක් නොව, රුකුළක් ම වෙයි. සුවිශේෂක අනුශාසනාවන් මගින්, හදවත පිරිසිදු කර ගැනීමට ද, ආධ්‍යාත්මික නිදහස ලබාගැනීමට ද ආධාර ලැබෙයි. ඒවා මගින් ප්‍රේමයේ උද්යෝගය නැංවෙයි. උත්ථාන වූ තත්ත්වයට අදාළ ජීවිත රටාවක් පිළිබිඹු කෙරෙයි. මෙය සෙසු දේව ජනතාවට මහඟු ආදර්ශයකි. මානව සමාජය ලත් ලොව්තුරු කැඳවීම පැවිදියාව මගින් විදහා දක්වෙයි.

එමනිසා, විවිධ සේවාවල යෙදෙන, ක්‍රිස්තු මනාලියට (සභාවට) ආභරණයක් වන, ස්ත්‍රීන් හා පුරුෂයන් සහෝදරයන් හා සහෝදරියන් පැසසිය යුතු බව, උනන්දු කළ යුතු බව දෙවන වතිකාන මන්ත්‍රණ සභාව උගන්වයි.

එම ඉගැන්වීම ඉදිරියේ, දහම් ගුරුවරුනට පැවරෙන වගකීම් මෙහි ලා දක්වෙයි.
- පැවිදියාව ගැන නිවැරදි දැනුමක් ලබා ගැනීම,
- පැවිද්දන් දිරි ගැන්වීම,
- සුදුසුකම් ඇති සිසුන් පැවිදියාව වෙත යොමු කිරීම.
- පැවිදි සමාජවලට ආර්ථික, අධ්‍යාපනික උදව් ලබා දීම.
- පැවිද්දන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

## 6.2. වර්තමාන ලෝකයේ ශු. සභාව

**වර්තමාන ලොකයේ ශු. සභාව :-**
කතෝලික සමාජ දර්ශනය පිළිබඳ විශ්ව අනුශාසනා පත්‍ර ගණනාවක් ඇත. වර්තමාන ලෝකයේ ශු. සභාව එයින් එකක් පමණකි.

කාර්මික විප්ලවය නිසා ලෝකය තුළ ඇති වූ ඇතැම් විෂම ප්‍රතිඵල හේතුවෙන් දුගියන් ආරක්ෂා කිරීමට ද කම්කරු අයිතීන් සුරැකීමටද පෞද්ගලික දේපල ආරක්ෂා කිරීමට ද සේවක සහ හාම්පුතුන් සතු යුතුකම් පෙන්වා දීමටද ක්‍රිස්තියානි ශීලධර්මය අවබෝධ කිරීමට ද, 13 වෙනි ලියෝ පාප් වහන්සේ 1891 දී වෙහෙසෙන මිනිස්සු නැමැති ප්‍රකාශනය නිකුත් කළහ.

දෙවෙනි පියුස් පාප් වහන්සේ 1931 දී 'සතලිස් වසර' නමින් ප්‍රකාශයක් නිකුත් කළහ. ඊට පසුබිම වූයේ 1914 - 1919 අතර ඇති වූ පළමු ලෝක සංග්‍රාමය, 1917 රුසියානු විප්ලවය, 1929 ලැටරන් ගිවිසුම, 1929-31 අතර ඇතිවූ ලෝක ආර්ථික පරිහානිය සමාලෝචනය කරමින් "වෙහෙසෙන මිනිස්සු" නැමැති ප්‍රකාශනය සිහිපත් කිරීම ය.

1961 දී අයුක්තියට පිළිතුර නමින් තවත් ප්‍රකාශනයක් 23 වෙනි ජුවාම් පාප්වහන්සේ නිකුත් කළේ මානව අයිතීන් සහ යුතුකම් පෙන්වාදීමටත් රාජ්‍ය පාලකයන් අතර සම්බන්ධතා පෙන්වා දීමටත් රාජ්‍යයන් අතර සම්බන්ධතා පෙන්වා දීමටත්, රාජ්‍යය සහ ලෝක සමාජය අතර සම්බනධතා පෙන්වාදීමටත්, සභාව පෝෂණය කරන ධර්මානුශාසනයක් වශයෙනුත් ය.

1965 දී 6 වෙනි පාවුළු පාප් වහන්සේගේ මූලිකත්වයෙන් දෙවෙනි වතිකාන මන්ත්‍රණ සභාව විසින් 'වර්තමාන ලෝකයේ ශුද්ධ සභාව' නැමැති ප්‍රකාශය නිකුත් කරන ලදි.

**පශ්චාත් මන්ත්‍රණ සභා ප්‍රකාශන :**
6 වෙනි පාවුළු පාප් වහන්සේ විසින් ජනතා ප්‍රගතිය නැමැති විශ්ව ප්‍රකාශනයෙන් මිනිසාගේ පූර්ණ සංවර්ධනය පිළිබඳව අදහස් ඉදිරිපත් කළ හ.

නව සමාජ ප්‍රශ්න හමුවේ කිතුනු ක්‍රියාකාරීත්වය පෙන්වා දීම සඳහා 1971 දී සමාජ සාධාරණත්වය සහ සංවර්ධනය නමින් ප්‍රකාශනයක් නිකුත් කර ඇත.

එම වර්ෂයේදී ම ලෝක රදගුරු මණ්ඩලය ලෝකය තුළ සාධාරණත්වය යන මැයෙන් ප්‍රකාශනයක් ඉදිරිපත් කරන ලදි.

6 වෙනි පාවුළු පාප් වහන්සේ 1975 දී ධර්මදානය නමින් නිකුත් කළ ප්‍රකාශනයෙන් සුබාරංචිය ප්‍රකාශ කිරීමේ ක්‍රම සහ විධි ද, ධර්මදානය සහ සංස්කෘතිය පිළිබඳව ද අනුශාසනාවක් කර ඇත.

ලෝකය තුළ ගලවා ගනු ලැබූ මනුෂ්‍යයාගේ තත්ත්වය සහ ගැලවීමේ අභිරහස විග්‍රහ කරමින් දෙවෙනි ජුවාම් පාවුළු පාප් වහන්සේ නව දැක්මක් ඉදිරිපත් කළ හ. ඉන්පසු 1981 දී "මිනිස් ශ්‍රමය" නමින් ද ජනතා ප්‍රගතියේ විසිවෙනි සංවත්සරය සිහිපත් කිරීම "සමාජ සැලකිල්ල" නමින් ද 1991 දී "වෙහෙසෙන මිනිස්සු" ශත සංවත්සරය සිහි කිරීමට 'සියක් වසර' ද ප්‍රකාශයට පත් කර ඇත. මේ ප්‍රකාශන මගින් ජනතාවට අනුශාසනා කර ඇත්තේ වෙනස්වන ලෝකය තුළ විවිධ දේශපාලන මතවාද හමුවේ සභාවේ ස්ථාවරය අවධාරණය කිරීමට ය.

**වර්තමාන ලෝකයේ මනුෂ්‍යාගේ තත්ත්වය**
වේගයෙන් වෙනස් වන වර්තමාන ලෝකයේ ප්‍රධාන ලක්ෂණ කීපයක් මෙසේ ය.

(1) අසීමිතවූද වේගවත් වූද, විපර්යාසයන් ලොව පුරා පැතිර යයි. මේ විපර්යාසයන් මනුෂ්‍යයා කෙරේ බලපා ඇත. සාමාජික වූද, සංස්කෘතික වූද, විපර්යාස නිසා මනුෂ්‍යයාගේ ආගමික ජීවිතයෙහි ද අනියම් විපාක ඇතිවී තිබේ.

**මෙකල මනුෂ්‍ය ආකල්පයන් මෙසේ වුවද පහත දැක්වෙන ප්‍රශ්න වලට ඔහු නියත පිළිතුරු අපේක්ෂා කරයි.**

- දුක් වේදනා, ශෝකය, මරණය ආදියේ තේරුම කුමක් ද?
- මහත් පාඩු විඳගෙන ලබන ජයග්‍රහණවලින් කුමන ඵලක් ද?
- මනුෂ්‍යයා විසින් සමාජයට කුමන දේ දෙනු ලැබිය හැකි ද ?
- මනුෂ්‍යයා සමාජයෙන් බලාපොරොත්තු විය යුතු දේ කුමක් ද?
- මෙලෝ ජීවිතයෙන් පසු කුමක් සිදුවේ ද?

**මේ පිළිබඳව සභාවේ ඉගැන්වීම මෙසේ ය.**
උතුම් කැඳවීම අනුව ජීවත් වීමට මනුෂ්‍යයාට අවශ්‍ය ශක්තිය සහ ආලෝකය ශුද්ධාත්මයාණන් මගින් දානය කිරීමට මරණය ජයගත් ක්‍රිස්තුන් වහන්සේට හැකිය. ක්‍රිස්තුන් වහන්සේ තුළ මානව ඉතිහාසයේ යතුර ද, කේන්ද්‍රීය ස්ථානයට දිනුම් කණුව ද ඇත්තේ ය. ශු. සභාව ක්‍රිස්තු ආලෝකය යටතේ සකල මනුෂ්‍යන්ට කතා කරති.

**මනුෂ්‍යත්වයේ ගරුත්වය :-**
මනුෂ්‍යා පිළිබඳ පරස්පරවූ මත තිබේ. වරෙක ඔහු සෑම දෙයකම පාලකයා ය. විටෙක කිසිත් නොකළ හැකි අධමයෙකි. මනුෂ්‍යයාගේ යථා ස්වාභාවය දේව ප්‍රකාශන වල ආලෝකයෙන් ශු. සභාව පෙන්වා දෙයි.

**ඒ අනුව මනුෂ්‍යයා;**

- දේව සමානකමට මවා ඇත.
- මැවුම්කාරයාණන් දැනගෙන උන්වහන්සේට ප්‍රේම කළ හැකිය.
- මෙලොව සෑම දේ පාලනය කරගෙන දේව මහිමය සැලසිය හැක.
- ඔහු සමාජමය සත්ත්වයෙකි.
- ස්ත්‍රිය සහ පුරුෂයා වශයෙන් මවා ඇත.
- සාමූහික සහජීවනය ඔහුගේ පැවැත්මේ පදනම ය.
- මනුෂ්‍යයා මනහර නිර්මාණයකි.

**පාපය :-**
ආරම්භයේ දී ම යක්ෂයාගේ පෙළඹවීම නිසා තම නිදහස වැරදි ලෙස භාවිතා කළ මනුෂ්‍යයා දේව අභිමතයෙන් බැහැරව, දේව මහිමය ප්‍රකාශ කරනු වෙනුවට, මැවුම්කාරයාණන්ට සේවය කරනු වෙනුවට මැවිල්ලට සේවය කළේ ය. ඒ නිසා මැවුම්කාරයාණන්ගෙන් නොවූ විෂම ප්‍රතිඵලවලට මුහුණ දීමට මනුෂ්‍යයාට සිදුවිය. එමතු ද නොවේ. තම ප්‍රභවය දෙවියන් වහන්සේගෙන් බව පිළිගැනීමට අකමැති වෙමින්, දේව සබඳතා බිඳ දමා ගත්තේ ය.

එහෙයින් මනුෂ්‍යයා තමා තුළ ම භේද වුවෙකි. ඔහුගේ පෞද්ගලික සහ සාමූහික ජීවිතය, යහපත සහ අයහපත අතරේ ද පවත්නා නිරන්තර අරගලයක් බවට පත්ව ඇත. එහෙත් අයහපතට එරෙහිව සටන් කර එය පරාජය කිරීම මනුෂ්‍යයාට ස්ව ශක්තියෙන් කළ නොහැක්කකි. තමන් කිසියම් වහල්භාවයක යදම්වලින් බැඳ සිටින්නා සේ ඔහුට හැඟේ. මේ යදම් බිඳ දමා, මනුෂ්‍යයා නිදහස් කර ලෝකයේ අධිපතින් නෙරපා දැමුවේ මෙලොවට වැඩම කළ ස්වාමීන් වහන්සේ ය.

**මනුෂ්‍යයා නිර්මාණය වී ඇති ආකාරය :-**

1. මනුෂ්‍යා ශරීරයක් සහ ආත්මයක් ඇත්තකු පමණක් නොව, බුද්ධියක් සහ අධිෂ්ඨානයක් ද, හෘදයක් සහ හෘදය සාක්ෂියක් ද ඇත්තෙකි. ඔහුගේ ශාරීරික නිර්මාණය තුළ ලෝකයේ මූල ධාතු සියල්ල ම ඒකරාශිව ඇත. ඒ නිසා මනුෂ්‍යයා තම ශාරීරික පැවැත්ම සුළු කොට නොසැලකිය යුතු ය. එසේ ම මනුෂ්‍ය ශරීරය දේව නිර්මාණයකි. අවසාන දිනයේ නැවත උත්ථාන වන්නකි. සියලුම මානව ක්‍රියාකාරකම්වල පදනම ශරීරයයි. පාපය නිසා මනුෂ්‍ය ශරීරයේ කැරලිකාර ස්වාභාවයක් ඇත. එහෙත් අමතක නොකළ යුත්තක් ඇත. එනම් මනුෂ්‍යයා යනු සමාජයේ නිර්නාමික අවයවයක් නොවන බව ය. මනුෂ්‍යයා තම හෘදය තුළට එබී බැලුවොත් දෙවියන් වහන්සේ එහි ඔහු බලාපොරොත්තුවෙන් වැඩ සිටින බව දැනගත හැකි ය.

2. මනුෂ්‍යයා තම බලය සෑම තැනම පතුරුවා හරින නමුත් මානව යහපත සඳහා එම බලය යොදා ගැනීමට ඔහු අපොහොසත් ය. වඩාත් ගුප්ත කරුණු ගැන උනන්දුවන නමුත් තමා ගැන වඩාත් සැක සහිත තත්ත්වයක සිටී. විවිධ නීති අනාවරණය කරන නමුත් ඒවා ක්‍රියාත්මක වීමක් සිදු නොවේ.

3. ධනයෙන් බලයෙන් ආඪ්‍ය වන නමුත්, විශාල පිරිස් සාගින්නෙන් සහ දිළිඳුකමෙන් දුක් විඳිති. නිදහස ගැන සෑම විට ම කථා කරන නමුත්, නව ආකාරයේ වහල්කම්වලට යටවී සිටිති. එක්සත් කම සහ සාමූහිකත්වය ගැන උනන්දු වන නමුත් ආර්ථික, සමාජීක සහ දේශපාලන වශයෙන් පවතින භේදය උග්‍රවී ඇත. සාමය ගැන කථා කරන නමුත් සෑම තැන ම යුද්ධය පවතී.

   මෙවන් හේතු නිසා මනුෂ්‍ය ආධ්‍යාත්මයේ ද, ජීවිත ක්‍රමයේද, බලවත් වෙනස්කම් ඇතිවී විප්ලවීය ස්වරූපයකින් ජන ජීවිතය කෙරේ බලපා ඇත. විද්‍යාවේ සහ තාක්ෂණයේ නව සොයාගැනීම් නිසා අභ්‍යාවකාශය පවා ජය ගැනීමට පියවර තබා ඇත.

   මනුෂ්‍යයා කාලයට ද අභියෝග කර ඇත. කාලය විසින් සඟවා තැබූ ඈතම අතීතය ද වර්තමානයට ගෙන ඒමට මනුෂ්‍යයා අද පොහොසත් ය. එපමණක් නොව, වර්තමානයේ සිට අනාගතය දැකීමට ඔහු සමත් ය.

   පියා මූලික පවුල ද, වංශය හා ගෝත්‍රය ද පාරම්පරික සමාජය ද වෙනස්වීම්වලට මුහුණපා ඇත. නාගරීකරණය වේගයෙන් ගම් දනව් සිසාරා ගොස් අවසන් ය. විද්‍යුත් සංනිවේදන මාධ්‍ය නිසා මුළු ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත්ව තිබේ. තවද මනුෂ්‍යයෝ තම පාරම්පරික

නිජබිම් අත්හැර නව රටවලට සංක්‍රමණය වෙමින් සිටිති. එක් එක් ජනකොටසකට ආවේණික වූ සංස්කෘතින් විශ්ව සංස්කෘතියක් ලෙස හැඩ ගැසෙමින් පවතී.

මානසික සදාචාර සහ ආගමික විපර්යාසයන් නිසා සම්මත ආචාර ධර්ම සහ සදාචාර ධර්ම බිඳ වැටෙමින් තිබේ. මේ ලීලාව තරුණ පක්ෂය කෙරෙන් වඩාත් කැපී පෙනේ. සමාජ ජීවිතය කෙරේ තමන්ගේ ආනුභාවය දැනගෙන එය ක්‍රියාත්මක කිරීමට ඔවුහු නොඉවසිලිමත්ව සිටිති. මේ නිසා ගුරු දෙගුරුන්ට තම යුතුකම් ඉටු කිරීමේ දුෂ්කරතා මතු වී ඇත. පාරම්පරිකව පවත්වාගෙන ආ සමාජ ක්ෂේත්‍රයන් යල් පැන ගියා සේ සලකති. පොදුවේ බලන විට ලෞකික වශයෙන් ද පූර්ණ ලෝකයක් පතන නමුත් ආත්මික දියුණුව ගැන එවන් ප්‍රබෝධයක් නැත. ඒ නිසා බාහිර අලංකාරය මුත් ඇතුලාන්ත ප්‍රගතියක් දක්නට නැත.

ජනගහනයේ අතිරික්තය නිසා ද ආර්ථික සහ සමාජ බලපෑම් නිසා ද, පරම්පරා අතර ඇති පරතරය නිසා ද, ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර ඇති නව සමාජ සබඳතාවන් නිසා ද පවුල් ජීවිතයේ එකමුතුව සහ සමගිය බිඳී ගොස් ය.

ලෝකය තුළ සාමය සහ සමාදානය ඇතිකිරීමේ මුවාවෙන් තම තමන්ගේ දෘෂ්ටීන් පතළ කිරීමේ යටි අරමුණ ඇතිව බල තණ්හාවෙන් ප්‍රබල ජාතීන් කටයුතු කිරීමට පෙළඹී සිටිති. මේ සියල්ල නිසා අන්‍යෝන්‍ය සැකය, වෛරය, විරෝධය සහ පීඩනය ව්‍යාප්තව ඇත.

එහෙයින් බොහෝ මනුෂ්‍යයෝ අසාධාරණකමින් හෝ අසමාන බෙදා හැරීමෙන් හෝ තමන්ට නොලැබී ගිය ලාබ ප්‍රයෝජන කළහකාරී ලෙස බලෙන් ඉල්ලා සිටිති. සාගින්නෙන් පීඩිත රටවල් පොහොසත් රටවල ආධාර පතති. කාන්තාවෝ නීතියෙන්ද සිරිත් විරිත් වශයෙන් ද පිරිමින් හා සමානත්වයක් ඉල්ලති. ගොවි කම්කරු ජනතාව, ජීවිතයේ අනිවාර්ය දේ පමණක් නොව පෞද්ගලිකත්වයේ අයිතිවාසිකම් ද සොයා යති. ශිෂ්ටාචාරයේ ලාබ ප්‍රයෝජන සැමට ම පොදු විය යුතු ය යන සංකල්පය ව්‍යාප්ත වෙමින් පවතී. තමාට සේවය කිරීමට හෝ තමා වහල් බවට පැමිණ වීමට හෝ බලයක් ඇතිව තමා විසින් ම ලිහා හරින ලද ශක්තීන් නිසි ලෙස භාවිත කිරීමේ වගකීමට තමන් බැඳී සිටින බව දන් මනුෂ්‍යයන්ට අවබෝධ වෙමින් පවතී.

**තවත් ගැටළු:**
මනුෂ්‍යයා තුළ නොයෙක් දුර්වලතා ඇත්තේ ය. එසේ ම අසීමිත ආශාවන් ද උසස් තත්ත්වයකට කැඳවීමක් ද ලබා ඇති බව තේරුම් ගනී. දුර්වල පව්කාරයෙකු වූ ඔහු බොහෝ විට තමා අකමැති දේ කරන අතර කැමති දේ නොකර සිටියි. ඒ අතර ලෞකිකත්වය පිළිබඳ බොහෝ දෙනා දෙන අර්ථකථන පිළිගනී. ස්වඋත්සාහයෙන් පමණක් ම සත්‍යවූද යහපත්වූද සම්පූර්ණ වූද නිදහස ලබා ගත හැකියයි සිතයි. මනුෂ්‍ය ක්‍රියාකාරීත්වයන් තුළින් සියලූ ආශාවන් ඉටුකර ගත හැකි යයි බලාපොරොත්තු වෙයි. මේ අතර සමහරු මනුෂ්‍ය ජීවිතය අර්ථ විරහිත දෙයකැයි කළකිරෙති.

**බුද්ධියේ උතුම්කම:**
බුද්ධිය නිසා මනුෂ්‍යයා සියලූ භෞතික දේ ඉක්මවා යන්නෙකි. දිව්‍ය බුද්ධියේ ආලෝකය ඔහුට ලැබී ඇත. ඒ නිසා විද්‍යාවන්හි ද, ශිල්ප කර්මාන්තයෙහි ද, කලාවන්හි ද ප්‍රවීණතාවක් ඔහු ලබා ඇත. එහෙත් පාපය නිසා ඔහුගේ බුද්ධියේ ප්‍රභාවය අඩවන් වී පවතී. ඒ නිසා, දේව දීමනාවක් වන ප්‍රඥාව මගින් බුද්ධිය නිසිමග හැසිරවිය යුතු ය. නැත්නම් මනුෂ්‍යයාගේ බුද්ධිය තුළින් ගන්නා තීරණ සහ නිර්මාණ ලෝකයේ අනාගතයට අහිතකර විය හැකි ය.(අවි ආයුධ නිපදවීම)

**හෘදය සාක්ෂියේ උතුම්කම:**
යහපත සහ අයහපත පිළිබඳව දෙවියන් වහන්සේ විසින් ලියන ලද නීතියක් මනුෂ්‍ය හෘදයේ ඇත්තේ ය. එය හෘදය සාක්ෂියයි. ඊට කීකරු වීම මනුෂ්‍යයාට ගෞරවයකි. මනුෂ්‍යයා විනිශ්චය කරනු ලබන්නේ ද ඒ අනුව ය. නිවැරදි හෘදය සාක්ෂියක් විසින් පාලනය කරනු ලබන ප්‍රමාණය අනුව මනුෂ්‍යයෝ අන්ධ තීරණයන්ගෙන් වැළකී, සදාචාර න්‍යායට අනුකූලව පවතින්නට උත්සාහ කරන්නෝ ය. එහෙත් හෘදය සාක්ෂිය අවිද්‍යාවෙන් නොමග යා හැකි නිසා කල්පනාකාරී විය යුතු ය.

**නිදහසේ උතුම්කම:**
සැබෑ නිදහස යනු දේව සමානත්වයේ විශිෂ්ට ලකුණකි. මනුෂ්‍යා සිය කැමැත්තෙන් ම දෙවියන් වෙත ගොස් උන්වහන්සේට පක්ෂපාතව සිටිමින් සම්පූර්ණ අකලංක සැපත කරා නිදහසේ යා යුතු ය. සත්‍යය සොයා යාමටත්, එය පිළිගැනීමටත්, ප්‍රකාශ කිරීමටත් මනුෂ්‍යයාට ඇති අයිතිය නිදහස වශයෙන් හඳුන්වා දීමට ද පුළුවන. එහෙත් මානව නිදහස පාපයෙන් පළුදුවී ඇති නිසා දෙවියන් වහන්සේ වෙත ඔහුගේ සම්බන්ධතාව පරිපූර්ණ කරගත හැක්කේ දේව වරප්‍රසාදයේ ආධාරයෙන් පමණ ය.

**මරණයේ අභිරහස:**
කිසි විටෙක හුදු ද්‍රව්‍යයකට හැරී නොයන සදාතනික බවේ බීජයක් මනුෂ්‍යයා තුළ ඇති නිසා ඔහු මරණයට බලවත් අප්‍රසාදයක් දක්වයි. මරණය නිසා මනුෂ්‍යයා සියළු ම භෞතික සබඳතාවලින් වෙන්වෙයි. මනුෂ්‍යයා මරණයට දක්වන අප්‍රසාදය නැති කිරීමට වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ප්‍රමාණවත් නොවේ. මනුෂ්‍යයාගේ ශාරීරික ජීවිතය දිග්ගැස්සවීමෙන් ඔහු තුළ පිහිට තිබෙන සදා ජීවිතය කෙරේ ඇති ආශාව සංසිඳවිය නොහැකි වීම තවත් මානව අසහනයකි.

මරණය පිළිබඳව අභිරහස ක්‍රිස්තුන් වහන්සේ විසින් නිරාකරණය කරනු ලැබ ඇත. ක්‍රිස්තුන් වහන්සේ මරණය ජය ගැනීම තුළින්, මනුෂ්‍යයා ඔහුට හිමි යථා තත්ත්වයට පත්ව සිටී. උන්වහන්සේ සිය මරණය මගින් මනුෂ්‍යයා සදාතනික මරණයෙන් නිදහස් කළ සේක. මනුෂ්‍යයාට මරණය පිළිබඳ කනස්සලුවීම අවශ්‍ය නැත. ඔහුට දෙවිඳුන් හා සැබෑ ජීවිතය අත්කර ගැනීමේ බලාපොරොත්තු විශ්වාසය තුළින් ලැබේ.

**අදේව දෘෂ්ඨිය:**
මනුෂ්‍යයාගේ උතුම් බවට විශේෂ හේතුව වනුයේ ඔහු දෙවියන් වහන්සේ සමඟ සහායකත්වයට කැඳවනු ලැබීම ය. එසේ මනුෂ්‍යයා දෙවිඳුන් සමඟ සම්භාෂණයෙහි යෙදී සිටීමට සුදුසු තත්ත්වයකද සිටින්නෙකි. දෙවියන් වහන්සේ විසින් ප්‍රේමයෙන් මවනු ලැබ ආරක්ෂා නොකරන්නේ නම් මනුෂ්‍යයාට පැවැත්මක් නැත. එහෙත් නූතන බොහෝ දෙනෙක් මේ දේව ජීවන සබඳතාව නොපිළිගනිති. ප්‍රතික්ෂේප කරති. මේ අදේවදෘෂ්ඨිය ගැන අවධානය යොමු විය යුතු ය.

සමහරු දෙවි කෙනෙකු නැතිබව කියති. සමහරු දේව සංකල්පය ප්‍රතික්ෂේප කරති. තවත් අය විද්‍යානුකූලව දේව ඇදහිල්ලට තැනක් නැතැයි කියති. මනුෂ්‍යත්වය, දේවත්වයටත් වඩා උසස් බව තවත් මතයකි. ලෝකයේ පවතින අයුක්තිය, අසාධාරණය නිසා දෙවි කෙනෙකු සිටිය නොහැකි බව තවත් අදහසකි. ලෞකිකත්වයට බර වූ නූතන ශිෂ්ටාචාරය ද දේව ඇදහිල්ලට බාධාවකි. ආගමික විශ්වාසයන්ට එරෙහිව නැඟී එන ප්‍රතික්‍රියා නිසා අදේව වාදයට යොමු වේ. විවේචනාත්මක මේ ප්‍රතික්‍රියාවන්ට නිසි ලෙස මුහුණ දීමට හැකිවන ලෙස විශ්වාසකයන් වඩාත් ප්‍රබලව දැනුවත්ව සිටිය යුතු ය.

**ක්‍රමානුකූල අදේව දෘෂ්ඨිය:**
මනුෂ්‍යයා ස්වාධීනත්වයට ඇති දැඩි අශාව නිසා දේව සංරක්ෂණයට ඔහු කැමති නැත. මෙලෙස අදේව දෘෂ්ඨියට ගැතිකම් කරන අයගේ මතය අනුව මනුෂ්‍යයාගේ පරමාර්ථය මනුෂ්‍යයාම ය. ඔහු මානව ඉතිහාසයේ ශිල්පියා ද නිර්මාණකයා ද බව සිතයි. එම සංකල්ප වලට පටහැනි නිසා දෙවි සමිඳුන් කෙනෙකු ඇති බව නොසිතයි. විද්‍යාවේ හා තාක්ෂණයේ මහිමයෙන් මේ අදේවවාදී මතය තහවුරු කිරීමට මාන බලති. මනුෂ්‍යයාගේ ආර්ථික හා සමාජමය නිදහස මත සැම දෙය ම රඳා පවතින බව පිළිගන්නා මතය අනුව, ඇතැමුන් කියන්නේ ආගම මායාකාරී චින්තනයක් බව ය. මේ අනුව කටයුතු කරන අය රාජ්‍ය බලය අත්පත් කර ගත්විට රාජ්‍ය බලය පවා යොදා අදේව දෘෂ්ඨිය පතුරුවා හරියි.

**අදේව දෘෂ්ඨිය සහ ශු. සභාවේ ආකල්පය:**
මනුෂ්‍යයා සතු සහජ ශ්‍රේෂ්ඨත්වයෙන් ඔහු පහතට හෙළන්නාවූ අදේව වාදය සභාව තරයේ හෙළා දකියි. ඒ නිසා සභාව දරන චින්තනයන් මතක තබා ගන්න.

දෙවිඳුන් පිළිගැනීම මානව ගරුත්වයට මදිකමක් නොවේ. මනුෂ්‍යයාගේ ආරම්භය සහ පූර්ණත්වය දෙවියන් වහන්සේ ය. මනුෂ්‍ය පුත්‍රයෙකු වශයෙන් ඔහුට දේව පුත්‍රත්වයේ කැඳවීම ලැබී තිබේ. මෙලොව වගකීම් දැරීමට ඔහුට දේව අනුග්‍රහයෙන් නව පෙළඹවීමක් ලැබේ. මනුෂ්‍ය ජීවිතය යනු මරණයෙන් සියල්ල නිමාවට පත්වන තත්ත්වයක් නොවේ.

අදේව දෘෂ්ඨියට සැබෑ ප්‍රතිඋත්තරය වන්නේ සභාවේ ඉගැන්වීම අනුව සාමාජිකයන් ගෙවන පූර්ණ ජීවිතයයි. ශු. සභාව එම මඟ පෙන්වීම කරන්නේ දෙවි පියාණන් සහ දේව පුත්‍රයාණන් මනුෂ්‍යයන් අතරේ එක්තරා ආකාරයකින් දෘෂ්‍යමාන වන්නට සලස්වන ශුද්ධාත්ම අනුග්‍රහයෙනි. මේ මඟ පෙන්වීමේ සාර්ථක ප්‍රතිඵල ලබන්නට පරිණත වූ විශ්වාසයක් අවශ්‍ය ය. ප්‍රාණපරිත්‍යාගීවරු එවැනි විශ්වාසිකයෝ ය. එසේ ම සිහි තබාගත යුතු තවත් කරුණක් ඇත. විශ්වාසිකයන් සහ අවිශ්වාසකයන් තමන් හා එක සමානව ජීවත්වන මේ ලෝකයේ දියුණුව ගැන වෙහෙස විය යුතු බවයි. ඒ නිසා ඇතැම් රාජ්‍ය පාලකයන් විශ්වාසිකයන් සහ අවිශ්වාසිකයන් අතරේ අයුතු වෙනස්කම් පෙන්වා මානව අයිතීන් නොතැකීම සභාව තරයේ ම හෙළා දකියි.

**නව මනුෂ්‍යයා - ක්‍රිස්තුන් වහන්සේ:**
ප්‍රථම මනුෂ්‍යයාවූ ආදම්, ක්‍රිස්තුන් වහන්සේගේ පූර්වාදර්ශයකි. අන්තිම ආදම් වූ ක්‍රිස්තුන් වහන්සේ, දේව ප්‍රේමයේ අභිරහස තුළින් මනුෂ්‍යයාගේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වන සේක. අදෘෂ්‍යමාන දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපය ක්‍රිස්තුන් වහන්සේ ය. උන්වහන්සේ පාපයෙන් විකෘති වූ මනුෂ්‍ය ස්වභාවය දේව සමානකමට හරවා ඇත. උන්වහන්සේ මංගගතවීම මගින් සැම මනුෂ්‍යයකුව ම තමන්ට සම්බන්ධ කරගෙන ඇත. උන්වහන්සේ මනුෂ්‍ය අත්වලින් වැඩ කළ සේක. මනුෂ්‍ය බුද්ධියෙන්

කල්පනා කළ සේක. මනුෂ්‍ය කැමැත්තෙන් ක්‍රියා කළ සේක. මනුෂ්‍ය හෘදයකින් ප්‍රේම කළ සේක. මරිය මව්න්ගෙන් ඉපිද අප අතරෙන් කෙනෙකු වූ සේක. පාපය හැර අන් සැම දෙයින් ම මනුෂ්‍ය තලයෙහි ම කෙනෙකු වූ සේක.

ක්‍රිස්තුන් වහන්සේගේ මරණය තුළින් අප යක්ෂයාගේ වහල්කමෙන් ද පාපයෙන් ද මිදී ඇත. මේ ගැන පාවුළු තුමා රෝමවරුන්ට ලියූ හසුනේ මේ උපුටනය මතක තබා ගන්න. "ක්‍රිස්තුන් වහන්සේ මළවුන් කෙරෙන් උත්ථාන කළ තැනැත්වහන්සේ ඔබ තුළ වසන ආත්මයාණන් වහන්සේ කරණකොට ගෙන ඔබගේ මරණීය ශරීරය ජීවමාන කරන සේක." (8:11) මේ කරුණ කිතුනුවන්ට පමණක් නොව සැම සුසිත් ජනයන් හට ද සාධාරණය වූ සත්‍යයකි. සැම මනුෂ්‍යයන්ට ම කිතු සමිඳුන්ගේ පාස්කු අභිරහසට සම්බන්ධ වීමේ අවස්ථාව උදාවී ඇත.

**මනුෂ්‍යයාගේ සාමාජික ජීවිතය:**
මනුෂ්‍යයා මවා ඇත්තේ සාමාජීය පුද්ගලයෙකු වශයෙන් ජීවත් වීමට ය. ක්‍රිස්තියානි දේව ප්‍රකාශනයන් මඟින් මනුෂ්‍යයන්ගේ අන්‍යෝන්‍ය පෞද්ගලික සබඳතා නැංවීමට රුකුලක් ලැබේ. ශුද්ධාසනයෙන් නිකුත් කළ විවිධ විශ්ව ලේඛනයන් මේ ගැන පැහැදිලි කර ඇත.

සියලූ මනුෂ්‍යයන් එක් පවුලක් වශයෙන් ද, සහෝදර කැලක් වශයෙන් ද සැලකීමත්, සැමට පිතෘ ප්‍රේමය දැක්වීමත් දේව අභිමතයයි. මේ නිසා ප්‍රථම පණත ප්‍රේමයයි. දේව ප්‍රේමයත් අසල්වැසි ප්‍රේමයත් වෙන්කළ නොහැකි ය. සැබෑ ප්‍රේමය නම් නිතිය සම්පූර්ණ කිරීම ය. ශුද්ධ ත්‍රිත්වයේ එකගත්වයේ ප්‍රේමයේ දේව දරුවන්ට ආදර්ශයක් විය යුතු ය.

සමාජ ක්ෂේත්‍රයේ ඇති සම්මතයන් සැම මනුෂ්‍යයා වෙනුවෙන් පවත්නා ඒවා ය. මනුෂ්‍යයා ඒවායේ උපාංග නොව හරයයි. අන්‍යයන් සමග ගනුදෙනු කිරීමෙන්, ආශ්‍රය කිරීමෙන්, සංවාදයෙන් මනුෂ්‍යයාට තම කුසලතා දියුණු කරගත හැකි ය.

ආගමික වශයෙන් වුව ද තම කැඳවීම සාර්ථකකර ගැනීමට සමාජ ජීවිතය පිටිවහලකි. එහෙත් සමාජ ජීවිතය විෂම තත්ත්වයට පත් කරන උඩගුව සහ ආත්මාර්ථය පිළිබඳව කල්පනාකාරී විය යුතු ය. පාපයේ ප්‍රතිඵලයක් වශයෙන් නපුරට යොමුවීමේ සහජයක් ඇතිව උපදින මනුෂ්‍යයා ඇතැම්විට විෂම සමාජ තත්ත්වය නිසා නව ආකාරවලින් නපුරට යොමු කෙරෙන බවද අමතක නොකළ යුතු ය.

**පොදු යහපත නගාලීම:**
පොදු යහපත යනුවෙන් අදහස් කරනුයේ සමාජ කණ්ඩායම්වලට සහ ඒවායේ සියලූ සාමාජිකයන්ට තමන් සම්පූර්ණ කර ගැනීමට ඉඩ සලසන සියලූ නියමයන් ය. මනුෂ්‍යයා සියලූ දේට වඩා උසස් නිසා ඔහුගේ අයිතිවාසිකම් සහ යුතුකම් නොකෙළෙසිය හැකි ය. පැහැර ගත නොහැකි ය. එහෙයින් ආහාර, වස්ත්‍ර, නිවාස, ජීවිත තත්ත්වයක් තෝරා ගැනීමේ සහ පවුලක් නිර්මාණය කර ගැනීමේ නිදහස, අධ්‍යාපනය රැකී රක්ෂා, හොඳ නම සහ ගෞරවය, පුවත් සහ තොරතුරු හෘදය සාක්ෂිය අනුව නිවැරදිව ක්‍රියා කිරීමේ අයිතිය, රහස් රැකගැනීම සහ ආගමික කරුණුවලදී යුක්ති සහගත නිදහස ආදී සැබෑ මනුෂ්‍ය ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සැමදේ ලබාදීම පොදු යහපත සැලසීම ය.

**මනුෂ්‍ය පෞද්ගලිකත්වය කෙරේ ගෞරවය.**
කිතුනුවා නිරන්තරයෙන් ම අසල්වැසියා ගැන සංවේදී විය යුතු ය. දුප්පත් ලාසරස්ට නොසැලකූ ධනවතා මෙන් නොවිය යුතු ය (ලූක් 16:18-31). සියල්ලන් විසින් පිටු දකින කෙනෙකු වුව ද විදේශික කම්කරුවකු වුව ද, විප්‍රවාසියෙකු, සරණාගතයෙකු වුව ද, අවජාතක දරුවෙකු වුව ද සාගින්නෙන් පෙළෙන්නෙකු වුව ද, ඔහුට ක්‍රියාකාරී ලෙස උදව් කළ යුතු ය.

සියලූ ආකාර මිනීමැරීම්, ගබ්සා කිරීම්, මානව ජීවිතයට විරුද්ධ සකල විධි ක්‍රියාවන් ශාරීරික, මානසික පීඩා කිරීම්, මානව පෞද්ගලිකත්වයට පටහැනි ක්‍රියාවන්, මනුෂ්‍ය තත්ත්වය කෙළෙසන ජීවිත ක්‍රම, අයුතු ලෙස සිරගත කිරීම්, රටින් නෙරපීම, වහල්කම්, ගණිකා වෘත්තිය, කාන්තාවන් හා දරුවන් විකිණීම, මනුෂ්‍යයා අප්‍රාණික උපකරණ ලෙස සැලකීම් යන මේ සියලූ දේ නිච ය, දූෂිත ය. ඒ නිසා පිටුදැකිය යුතු ය.

**සතුරන් වෙත ගෞරවය සහ ප්‍රේමය:**
ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න, සතුරන්ට වෛර කරන්න. යනුවෙන් ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න.(මතෙව් 5:43-44) මේ ඉගැන්වීම කිතුනුවන් අනුසාර කිරීම අවශ්‍ය ය, අන් අය විනිශ්චය කිරීම අපට අයත් කාර්යයක් නොවේ. එය දෙවියන් වහන්සේ සතු දෙයකි.

**මානව සමානත්වය සහ සමාජය සාමය:**
බුද්ධිය, දේව සමානකම, එකම ප්‍රභවය, එකම කැඳවීම, එකම ගැලවීම ඇති නිසා මනුෂ්‍යයන් අතර මූලික සමානතාවක් ඇත. මනුෂ්‍යයාගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමාජ හෝ සංස්කෘතික වෙනස්කම් සැලකීම ස්ත්‍රී පුරුෂ භාවය මත හෝ ජාතිය, වර්ණය, භාෂාව, ආගම ආදිය අනුව වෙනස්කම් කිරීම දේව අභිමතයට පටහැනි ය. කුමන මනුෂ්‍ය කණ්ඩායමක හෝ යුතුකම වනුයේ මනුෂ්‍යයාට සේවය කිරීම ය. එහෙත් තවමත් ඇතැම් රටවල පෞද්ගලික අයිතිවාසිකම්වලට ගරු කිරීමක් නැත. ස්ත්‍රිය පුරුෂ පක්ෂයට වඩා පහත් ලෙස සැලකීම නිදසුනකි. තම තමන් ගැන පමණක් සැලකිලිමත්වීමට උගන්වන ආචාර ධර්මවලින් කිසිවකුත් තෘප්තියට නොපැමිණිය යුතු ය. ඇතැම් අය සමාජ නීති හා නියෝග නොසලකති. **(උදා:** බදුගෙවීම වාහන වේගය ආදිය) පුද්ගලයන් ද, පුද්ගල කණ්ඩායම් ද පළමුව තමන් තුළ සමාජ ගුණ ධර්ම වගා කරගෙන ඒවා සමාජයේ ව්‍යාප්ත කිරීමට වෙර දැරිය යුතු ය.

**වගකීම සහ සහභාගිවීම:**
අපගේ කාලයට අවශ්‍යවන පරිදි ශිෂ්ට නිපුණත්වයක් ඇති ස්ත්‍රී පුරුෂයන් පමණක් නොව, උදාර ගතිගුණ ඇති පුරවැසියන් ද නිර්මාණය කරන්නට හැකිවන්නේ සැම සමාජ පසුබිමකට ම අයත් තරුණ පක්ෂයට අධ්‍යාපනයක් ලබා දීමෙනි. එසේම හෘදය සාක්ෂියට අනුව තම යුතුකම් වඩාත් නිවැරදි ලෙස ඉටුකිරීමට ඔවුන්ගේ මනස වඩාත් උසස් ආකාරයකින් අභිවර්ධනය කිරීම ද අවශ්‍ය ය.

එසේ ම සැම මනුෂ්‍යයෙකුට ම තම කැඳවීම අනුව ජීවත් වීමට අවශ්‍ය පහසුකම් ද තිබිය යුතු ය. අන්ත දිළිඳුකමින් පෙළෙන කෙනෙකුට ඔහුගේ නිදහස සීමාවේ. එසේ ම අන්ත සුඛෝපභෝගීව ජීවත් වන අය ද අන්‍යයන්ගෙන් වෙන් වී හුදකලාවෙති.

පොදු ව්‍යාපාරයන්ට යමකු සම්බන්ධ වේ නම් එය අගය කළ යුතු ය. බොහෝ දෙනෙකුට සහභාගිවිය හැකි ජාතික ව්‍යාපාර අගය කළ යුතු ක්‍රියාකාරීත්වයන් ය.

ජීවත් වීමට හේතුව සහ ජීවිතයේ බලාපොරොත්තු මතු පරම්පරාවලට පෙන්වාදීමට හැකියාවක් ඇති අයගේ අත්වල මනුෂ්‍යයන්ගේ අනාගතය රඳා පවත්නා බව අමතක නොකළ යුතු ය.

**මාංශගත වාක්‍යාණන් සහ සාමූහිකත්වය:**
දේව අභිමතය වන්නේ එක් එක් තැනැත්තා ශුද්ධවත් කිරීම සහ ගැලවීම නොව, දේවවාදී වූද, දේව මෙහෙවරට යොමු වූද, ශුද්ධවත් ජනතාවක් පිළියෙළ කිරීම ය. ගැලවීමේ ඉතිහාසය ආරම්භයේ සිට ම දැකිය හැකි විශේෂ ලක්ෂණයක් නම්, පෞද්ගලිකව නොව එක්තරා සමාජයක සමාජිකයන් මෙන් මනුෂ්‍යයන් තෝරාගෙන ඇති බව ය.

මේ ලක්ෂණ ක්‍රිස්තුන් වහන්සේ ප්‍රයෝගික කළ සේක. විවාහ මංගල්‍යයට සහභාගි වීම, සකේවුස්ගේ ගෙදරට වැඩීම කිරීම, පව්කාරයන් සමඟ ආහාර අනුභව කිරීම ඊට නිදසුන් කීපයකි. ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි යන ඇමතීම ගැන ද සිතා බලන්න. අවසානයේ මානව සංහතිය වෙනුවෙන් ජීවිතය පූජා කළ සේක. ඉක්බිති ශුද්ධාත්මයාණන් මගින් විශ්වාසයේත්, ප්‍රේමයේත් ජීවිත ගත කරන සහෝදර සමාජයක් ආරම්භ කළ සේක. ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ගොඩනැංවූ සේක. මේ සාමූහිකත්වය පූර්ණත්වයට පත්වන දිනය දක්වා නිරන්තරයෙන් ම එය වර්ධනය කළ යුතු ය. එය කෙසේ කළ යුතුදැයි සිතා බලන්න.

**වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාවේ කාර්ය භාරය:**
ගැලවීම දායකවූ ද, ලෝකාන්තිමය දෙසට නැඹුරුව පවතින්නාවූ ද, මතු පැමිණෙන ලෝකයේදී සම්පූර්ණයෙන්ම ඉටු වන්නාවූ ද, පරමාර්ථයක් සභාවට ඇත. දෘශ්‍යමාන සභාවක් සහ ආත්මික සමාජයක් වන ශුද්ධ සභාව මනුෂ්‍ය සංහතිය සමඟ ඉදිරියට යමින් ලෝකයේ භාග්‍යයටත් අභාග්‍යයටත් කොටස්කාරයෙක් වෙයි. මනුෂ්‍ය සමාජයේ ආත්මය ශුද්ධවූ සභාව ය. එම නිසා සභාව පුද්ගලත්වයේ ගෞරවය සහ උසස් බව අගය කරයි. මනුෂ්‍ය සමාජ සම්බන්ධකම් ශක්තිමත් කරයි. දෛනික ජීවිතයේ මනුෂ්‍ය ක්‍රියාකාරීත්වයනට වඩාත් ගැඹුරු අර්ථයක් දෙයි. මෙසේ මානව සංහතිය තුළ මානුෂික ස්වරූපය වර්ධනය කරයි. මේ පරමාර්ථය ඉටු කිරීමට වෙහෙසෙන කුමන සභාවක් වුවද සතුටින් අගය කරයි.

**සභාව එකිනෙකාට දෙන්නට උත්සාහ කරන උපකාර:**
ශු සභාව මනුෂ්‍යයාට ඔහුගේ පැවැත්මේ අර්ථය එළිදරව් කරයි. මනුෂ්‍යයා තමාගේ ජීවිතයේ ද, ක්‍රියාකාරීත්වයන්හි ද, මරණයේ ද අර්ථය යම් තරමකින් හෝ දැන ගැනීමට උත්සාහ කරයි. කැමති වෙයි. මේ සඳහා නිශ්චිත පිළිතුරක් දිය හැක්කේ දෙවියන් වහන්සේට පමණි. උන්වහන්සේ මේ කාර්යය ඉටු කරනුයේ මනුෂ්‍ය ස්වභාවය ගත් දේව පුත්‍රයාණන්ගේ ප්‍රකාශයන් මගිනි. මේ අනුව විවිධ දූෂිත මතවලට විරුද්ධ මනුෂ්‍යත්වයේ උතුම්කම ආරක්ෂා කිරීමට සභාවට හැකි වන්නේ ය.

දේව නීතියේ නියමයන්ගෙන් නිදහස්ව සිටින විට පමණක් තම පෞද්ගලික අයිතිවාසිකම් සහතික වශයෙන් ලබාගත හැකියයි සමහරු සිතති. එය ප්‍රබල දුර්පරීක්ෂාවකි. එවන් තත්ත්වයක් ඇති වුවහොත් සිදුවන්නේ මනුෂ්‍යයාගේ උසස් බව ආරක්ෂා වීම නොව විනාශවී යාම ය.

**සභාව මනුෂ්‍ය සමාජයට දෙන්නට උත්සාහ කරන උපකාරː**
ශුද්ධවූ සභාවට භාරවී ඇති මෙහෙය, දේශපාලන හෝ ආර්ථික හෝ සමාජමය කාර්යයක් නොවේ. එය ආගමික මෙහෙවරකි. මනුෂ්‍ය සමාජය දේව නීතියට අනුකූලව පිහිටුවීමත් ශක්තිමත් කිරීමත් අවශ්‍යය. කාලය හා ස්ථානය අනුවත් එවන් ක්‍රියාකාරීත්වයන් ඇරඹීමට සභාවට ශක්තිය ඇත. දයාවේ පුණ්‍ය ක්‍රියා සහ එවැනි සත් ව්‍යාපාරයන් එවැනි ක්‍රියාකාරීත්වයනට නිදසුන් ලෙස ගත හැකි ය.

මෙවැනි ක්‍රියාකාරීත්වයන්හි දී සභාව තමන්ට ආවේණික කාර්යයනට මිස, මනුෂ්‍ය සංස්කෘතියේ විශේෂ ආකාරයකට හෝ දේශපාලනමය වූත් ආර්ථික සහ සමාජමය වූත් කිසියම් නියමයන්ට බැඳී නැත. පුද්ගලයාගේ සහ පවුලේ මූලික අයිතීන් ද පොදු යහපතේ අවශ්‍යතාවන් ද පිළිගන්නා ඕනෑම රජයක් යටතේ සැම දෙනාගේ ම යහපත සඳහා ක්‍රියාකාරීවීමේ අවස්ථාවන් සභාව බෙහෙවින් ම අගය කරයි.

**කිතුනුවන් මගින් මානව ක්‍රියාකාරීත්වයන්ටː**
ලොව සැම දෙය ම අනිත්‍ය යයිද මෙලොව අපට පවතින වාසස්ථානයක් නැතැයි ද සිතමින් මෙලොව තම යුතුකම් සහ වගකීම් පැහැර හැරීම වැරදි ය. ආගම යනුවෙන් අදහස් කරන්නේ දේව වන්දනාවේ සහ සදාචාරයේ යුතුකම් ඉටු කිරීම පමණකැයි සිතා, ලෞකික කටයුතු වලට ආගමික සම්බන්ධතාවක් නැති ලෙස ක්‍රියාකිරීම ද වැරදි ය. ඇදහිල්ල සහ දෛනික ජීවිතය අතරේ ගැටුමක් නොතිබිය යුතු ය. මෙලොව තම යුතුකම් සහ වගකීම් පැහැර හරියි. ලෞකික යුතුකම් සහ වගකීම් ඉටුකිරීම පිළිබඳව සමාජයට පරම ආදර්ශය විය යුත්තේ කිතුනු ගිහියා ය. එම ආදර්ශය නිවැරදි හෘදය සාක්ෂියේ ප්‍රභාවෙන් ආලෝකමත් විය යුතු ය. ඒ සඳහා ගිහියා ශු. සභාව උගන්වන ධර්මය සාවධානව තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කිරීම මැනවි. එවිට සමාජය මැද සැම අවස්ථාවකදීම සාක්ෂි දැරීමට ගිහියන්ට හැකි වන්නේ ය.

ශුද්ධ වූ සභාවේ සැබෑ මුහුණුවර ලෝකය දකින්නේ ආත්මික පාලකයන්ගේ ජීවිත තුළිනි. ක්‍රිස්තියානි, පණිවිඩයේ බලය සහ ශක්තිය මනුෂ්‍යයන් මගින් මනින්නේ එයින් ය. වර්තමාන මනුෂ්‍යයා රාජ්‍ය තන්ත්‍රවූද, සමාජමය වූ ද ඒකත්වයකින් වඩ වඩා සම්බන්ධව සිටින හෙයින් පූජාප්‍රසාදීවරු ද, රාජගුරුප්‍රසාදීවරුන් හා ශුද්ධෝත්තම පියතුමන් සමඟ හැකියාවන් සහ උත්සාහයන් අතින් සම්බන්ධ වී මුළු මනුෂ්‍ය වර්ගයා දේව ජනතාව ලෙස ඒකත්වයට පත්වන පිණිස, තමන් අතරේ ඇතිවිය හැකි වෙනස් කම් මකා දැමිය යුත්තෝ ය. නූතන යුගයේ සුබාරංචි පණිවිඩය සහ එය භාරව සිටින අයගේ ජීවිතාදර්ශය අතර ඇති පරතරය සභා ක්‍රියාකාරීත්වයට බාධාවකි. එම නිසා ශු. සභාව ක්‍රිස්තුන් වහන්සේගේ සජීවී සලකුණ ලෙස වඩාත් දීප්තිමත්ව බබළන පිණිස තමන් පිවිතුරු විය යුතු බව සැමටම මතක් කර දෙයි.

**ලෝකයෙන් ශු. සභාවට ලැබෙන උපකාරː**
මනුෂ්‍යාගේ ඉතිහාසයෙන් සහ සංවර්ධනයෙන් ශු. සභාවට විවිධ භාෂාවන්ගෙන් ලැබෙන උපකාර රැසකි.

නව ඉතිහාසයේ ආරම්භයේ පටන් ම ශු. සභාව, විවිධ භාෂාවන්ගෙන් ද අදහස්වලින් ද, දාර්ශනිකයන්ගේ ප්‍රඥාවෙන් ද, සුබාරංචිය පැහැදිලි කරන්නට උත්සාහා කරන නිසා, මනුෂ්‍යයා ලබා ඇති යටගියාවේ අත්දැකීම් ද, විද්‍යා දියුණුව ද, සංස්කෘතික සම්පත් ද, නව අනාවරණයන්ද සභාවට බෙහෙවින් ම ප්‍රයෝජනවත් ය. සැම දෙයක්ම පාහේ විශේෂයෙන් මානව චින්තනයන්ගේ ද වහ වහා වෙනස් වන නූතන යුගයේ මුළු දේව ජනතාවගේ ද විශේෂයෙන් සභා ශ්‍රේෂ්ඨයන්ගේ ද, දේව ධර්මාචාර්යවරුන්ගේ ද වගකීම වන්නේ ශුද්ධාත්ම මඟ පෙන්වීම අනුව, අපගේ යුගයේ ප්‍රකාශ වන අදහස්වලට ඇහුම්කන් දී ඒවා පැහැදිලි කර දේව වචනයේ ආලෝකයෙන් නිසි අර්ථ කථනයන් ඉදිරිපත් කිරීම ය.

**ආරම්භය සහ අවසානය - ක්‍රිස්තුන් වහන්සේ ය.**
ලෝකයට උදව්වන සභාව ලෝකයෙන් ද බොහෝ උදව් ලබයි. එසේ ලබමින් දේව රාජ්‍යයේ පූර්ණත්වය සහ මානව විමුක්තිය පතා ක්‍රියාකාරී වෙයි.

සියලූ දේ මවනු ලැබූ දේව වාක්‍යාණන් සියලූ මනුෂ්‍යයන් තමන් තුළ ඒකරාශි කර ගන්නා පිණිස මනුෂ්‍යයා වූ බව ඔබ දන්නෙහි ය. මනුෂ්‍ය වර්ගයා පිළිබඳ ඉතිහාසයේ අභිමතාර්ථය ස්වාමීන් වහන්සේ ය. ශිෂ්ටාචාරයේ පදනම ද මනුෂ්‍ය වර්ගයාගේ කේන්ද්‍රස්ථානය ද උන්වහන්සේය. උන්වහන්සේ පියාණන් විසින් උත්ථානය කරනු ලැබූ සේක. ජීවතුන්ගේ සහ මළවුන්ගේ විනිශ්චයකාරයාණන් කරනු ලැබූ සේක. ශුද්ධාත්මයාණන් තුළ සියල්ලන් ඒකරාශි කරනු ලැබූ සේක.

මේ මහා දේව ජන සමාජය ප්‍රේමයේ සැලැස්ම අනුව අවසානය දෙසට ගමන් ගනිමින් සිටිති. ඒ ස්වර්ගයේ ද, පොළොවේ ද සියල්ල ක්‍රිස්තුන් වහන්සේ තුළ එක්රුස් කරන පිණිස ය. (එපේසි 1:9)

**විවාහයේත් පවුලේත් උතුම්කම**

විවාහයෙන් සහ පවුලෙන් ඇතිවන යහපත් තත්ත්වය පුද්ගලයන්ගේ ද, ක්‍රිස්තියානි සමාජයේ ද යහපත කෙරේ බලපායි. මිහිපිට මුල්ම ප්‍රේමයේ මූලික සමාජය බහුභාර්යා සේවනයන් ද, දික්කසාදයෙන් ද, චාරිත්‍ර විරෝධී කාම සම්භෝගයෙන්ද, තවත් විවිධ දූෂණයන්ගෙන් ද අනතුරට මුහුණ දී ඇත. අධික ආත්මාර්ථකාමීත්වය ද, සැපවිඳීම ජීවිතයේ අරමුණ කර ගැනීමෙන් ද, අයථා උත්පත්ති පාලන ක්‍රමවලින් ද, ආර්ථික හේතූන් නිසා ද, මානසික බලපෑම්වලින් ද, ලෞකික අවශ්‍යතාවයන් මුල්කර ගැනීම නිසා ද පවුල් සංස්ථාව බිඳවැටෙමින් තිබේ.

විවාහය දේව සැලැස්මේ කොටසකි. එය අවලංගු කළ නොහැකි ගිවිසුමකි. එය එසේ වන්නේ දරුවන්ගේ යහපත පිණිසත් සමාජයේ යහපත පිණිසත් ය. ඒ යහපත සැලසෙන්නේ දරුවන් ජනිත කිරීමෙනුත්, ඔවුන්ට නිසි අධ්‍යාපනය දී පුහුණු කිරීමෙනුත් ය. මේ සඳහා අඹුසැමියන් අන්‍යෝන්‍ය විශ්වාසයෙන් යුතුව පතිවත සහ පතිනිවත ආරක්ෂා කළ යුතු ය.

පුරාණයේ දී දෙවියන් වහන්සේ ප්‍රේමයේ සහ විශ්වාසයේ ගිවිසුමකින් ජනතාව ඉදිරියේ පෙනී සිටි සේක. ආශිර්වාදකාර බන්ධනයේ ප්‍රසාද නිධානය මගින් විවාහ වූ කිතුනු ජීවිත තුළට ක්‍රිස්තුන් වහන්සේ ඇතුළු වී ඔවුන්ගේ ජීවිත ශුද්ධවත් කරන සේක. ප්‍රේමයෙන් සපුරාලන සේක. වගකීම් ඉටු කිරීමට ශක්තිමත් කරන සේක. එමගින් දේව මහිමය ප්‍රකාශ කිරීමට සලසන සේක.

මව්පියන් පවුලේ යාච්ඤාවලින් ද, ආදර්ශයෙන්ද දරුවන්ට මඟ පෙන්විය යුතු ය. ඔවුහු දරුවන්ට අධ්‍යාපනය දීමේ සහ ආගමික පුහුණුව දීමේ කාර්යය සැලකිල්ලෙන් ඉටු කිරීමට බැඳී සිටිති. දරුවන් ද තම දෙමාපියන් ශුද්ධවත් කිරීමට උදව් කළ යුතු ය. ඔවුන් තම දෙමාපියන්ගේ කරුණාවට කෘතවේදී වීම මගින් දාරක ප්‍රේමය ප්‍රකාශ කිරීමට අවශ්‍ය ය. මව්පියන්ගේ දුෂ්කර අවස්ථාවලදී ද, මහලු වයසේ දී ද, වැන්දඹු තත්ත්වයට පත්වූ විට ද ඔවුන්ට දරුවන්ගේ රැකවරණය අවශ්‍ය ය.

**විවාහක ප්‍රේමය**

සරණ ගිවිසගත් අය ද, විවාහවූ අය ද පරිශුද්ධ ආදරයෙන් සහ ස්ථිර ප්‍රේමයකින් තමන්ගේ කැඳවීම පෙහොණි කර ගත යුතු ය. කුමන ජාතියක ජන කොටස් අතර වුව ද අඹු සැමි ප්‍රේමය මහත් ගෞරවයකින් සැලකේ. ආත්මාර්ථකාමී ලෙස ද, සැණෙකින් ද, අවාසනාවන්ත ලෙස ද නිම වන හුදු කාමුක ආකර්ෂණයකට වඩා සැබෑ විවාහක ප්‍රේමය උත්කෘෂ්ඨ ය. මේ ප්‍රේමයේ ප්‍රකාශවීම පූර්ණත්වයට පැමිණෙන්නේ ලිංගික සංවාසයෙනි. එය විවාහය තුළ උතුම් සහ සම්භාවනීය ක්‍රියාවකි. එය වඩාත් ප්‍රකාශ වන්නේ ස්වත්‍යාජයේ ක්‍රියාවක් වූ විට ය. සැබෑ විවාහක ප්‍රේමය දුකේදීත් සැපේදීත් ස්ථාවරව පවතී. විවාහකයන් මේ කරුණු අවබෝධ කරගත හොත්, බහු භාර්යා සේවනය, පරපුරුෂ සේවනය සහ දික්කසාදය ඇති නොවේ. ඒ නිසා කිතුනුවන් සැබෑ විවාහක ප්‍රේමයට සාක්ෂි දැරිය යුතු ය. ලෝකය එහි අගය දකින්නේ එවිට ය. තරුණ තරුණියන්ට නියම කාලයේ දී අන්‍යෝන්‍ය කැමැත්තෙන් සහ ප්‍රේමයෙන් විවාහ ජීවිතයට ඇතුළත් වීම සඳහා මේ පිළිබඳව දැනුවත් කළ යුතු ය.

**විවාහයේ ඵලදායි බව**

විවාහයේ ප්‍රධාන අරමුණ ප්‍රජනනය සහ දරුවන් ඇති දැඩි කිරීම ය. ඒ නිසා විවාහකයන් ක්‍රිස්තියානි වගකීමක් ඇතිව සුහදව ජීවත් වෙමින් තවත් අයට ජීවිතය දෙමින් දරුවන් ඇති දැඩි කළ යුතු ය. දරුවන්ගේ යහපත තකා, කාලානුරූපීව ලෞකික සහ ආධ්‍යාත්මික තත්ත්වයන් ද, සමාජයේ යහපත ද සභාවේ යහපත ද, සලකා ඔවුන්ට මඟ පෙන්විය යුතු ය. දරුවන් ලැබීමට කොතෙක් ආශාවෙන් සිටිය ද, එසේ නොලැබුණත් ඔවුන්ගේ විවාහයේ වලංගු බව එයින් නැතිවන්නේ නැත.

**විවාහක ප්‍රේමය සහ මානව ගරුත්වය:**

කොතෙකුත් බාධා සහ අමාරුකම් පැමිණිය ද, මානව ගරුත්වය කෙලෙසන විසඳීම් වෙත යොමු නොවිය යුතු ය. පිළිසිඳීම ඇතිවූ මොහොතේ පටන් එම ජීවිතය ආරක්ෂා කළ යුතු ය. අවිචාරවත් ලෙස තීරණ නොගත යුතු ය. ගබ්සාව සහ බාල ඝාතනය මිනී මැරීම් ය. විවාහය තුළ ඇතිවන ලිංගික ක්‍රියාකාරීත්වය මානව ගරුත්වයට අදාළව සිදුවිය යුත්තකි. සභාව අනුමත නොකළ ක්‍රම උපක්‍රම මගින් පවුල් සංවිධානය නොකළ යුතු ය. අප මිනිස් ජීවිතය ගැන සැලකිය යුත්තේ සදාතන ජීවිතය පිළිබඳව ආකල්ප ඇතිව ය.

**පවුල් ජීවියේ අභිවෘද්ධිය**

පවුල් ජීවිතය මානව පැවැත්ම පොහොසත් කරන මාර්ගයකි. දරුවන් ඇති දැඩි කිරීමේ දී පියාගේ ක්‍රියාකාරීත්වය සහ මවගේ සැලකිල්ල වැදගත් ය. වැඩුණු දරුවන්ට මනා පුහුණුවක් ලැබිය යුතු ය. කැඳවීම භාර ගන්නටත් යහපත් ජීවිත තත්ත්වයක් තෝරා ගන්නටත් හැකිවන්නේ එවන්

පුහුණුවක් ලද විට ය. විවාහ ජීවිතයට ඇතුළත් වුවහොත් තම පවුල ගොඩනගා ගන්නට ඔහුට හැකියාව තිබිය යුතු ය. මේ පිළිබඳව උපදෙස් දීම මිස බලකිරීමක් දෙමාපියන්ගෙන් නොවිය යුතු ය.

සමාජයේ පදනම පවුල ය. පවුල නගා සිටුවීම රජයේ ද අනිවාර්ය වගකීමකි. ඒ සඳහා රජය පවුල් ස්ථාවරය සඳහා නීති ක්‍රියාත්මක කිරීම අවශ්‍ය ය. වෛද්‍ය විද්‍යාව, ජීව විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, නීතිය වැනි ක්ෂේත්‍රයෙහි විශේෂඥයින් ලවා විවාහකයන් දැනුවත් කිරීමේ ව්‍යාපෘති රජය මගින් ඇරඹිය හැකි ය. පූජකවරු ද පවුල් ජීවිතය පිළිබඳ ගැටළු ගැන ප්‍රවීණතාවක් ලබා ගෙන, දේශන මගින් ද, ජනවන්දනාවෙන් ද, වෙනත් ශාසනික ක්‍රම මගින් ද විවාහක කැඳවීම ගෙනයාමට මග පෙන්විය යුත්තෝ ය.

විවාහකයෝ සිතින්, හෘදයෙන් අන්‍යෝන්‍ය ශුද්ධවත් බවින් දුකේදී ත්, සැපේදී ත්, ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කර ස්වාමීන් වහන්සේ තම මරණයෙන් සහ උත්ථානයෙන් ලොවට අනාවරණය කළ ප්‍රේමයේ අභිරහසට සාක්ෂි දැරිය යුතු ය.

**සංස්කෘතිය සංවර්ධනය (විශ්වාසය සහ සංස්කෘතිය)**

සංස්කෘතිය පිළිබඳව විවිධ අර්ථ කථනයන් ඇත. කිසියම් ජනතාවකගේ අනන්‍යතාවය ඔවුන්ගේ සංස්කෘතිය තුළින් තේරුම් ගත හැකි ය. පොදු ජන ජීවිතයේ හද ගැස්ම සංස්කෘතිය මගින් ප්‍රකාශ වේ. සංස්කෘතිය යන්නෙහි සාමාන්‍ය අර්ථය මනා ලෙස සකස්වීම ය. මනුෂ්‍යයා ශිෂ්ටාචාරයට පත්වූ දා පටන් ඒකරාශි කරගත් හරවත් අත්දැකීම් සම්භාරය සංස්කෘතිය ලෙස හැඳින්වීමට පිළිවන. විද්‍යාවේ සහ තාක්ෂණ ප්‍රගතිය නිසා සංස්කෘතික ප්‍රවර්ධනය තුළ මනුෂ්‍යයාට ආවේණික යහගුණදම් සහ වටිනාකම් උසස් තත්ත්වයට පත්වේ. එමගින් සිරිත් විරිත් සහ සමාජයන් වඩාත් යහපත් බවට පැමිණේ.

එහෙත් සත්‍ය අනාවරණය කර ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රම පමණක් යෙදීම අනතුරුදායක ය. ඊට හේතුව විද්‍යාවෙන් දැනගත හැකි වන්නේ ඉන්ද්‍රිය ගෝචර දේ පමණකි. එවිට ආධ්‍යාත්මික යථාර්ථයන් ගැන අවධානය යොමු නොවේ. එවිට ආයාසයෙන් ම ද්‍රව්‍ය දෘෂ්ටියට හෝ ලෞකික වාදයට ගොදුරුවීමේ අනතුර මතු වෙයි.

**සුබාරංචිය සහ සංස්කෘතිය:**

දෙවියන් වහන්සේ තම සෙනඟට අනාවරණය වී අන්තිමයේදී පුත්‍රයාණන් තුළින් තමන් හඳුන්වා දුන් විට උන්වහන්සේ කථා කළේ ඒ ඒ වකවානුවල පැවති ජන සංස්කෘතීන් අනුව ය. අද ශුද්ධ සභාව සුබාරංචිය ප්‍රකාශ කිරීමටත්, එය අර්ථ කථනය කිරීමටත්, ජන වන්දනාව සහ කිතුනු ජීවිතය තුළින් එය ප්‍රකාශ කිරීමටත් විවිධ සංස්කෘතික මාර්ගයන් යොදාගෙන තිබේ. සුබාරංචිය කිසියම් දේශයක ජන ජීවිතය තුළ මුල් බැස ගන්නේ, එය එරට සංස්කෘතිය හා සමගාමී වුවහොත් පමණකි. සකල ලෝකයේ සැම ජන කොටසකට ම සුබාරංචිය ප්‍රකාශ කිරීමට නියමව ඇති නිසා සභාව එක දේශයකට හෝ ජන කොටසකට සීමාවන්නේ නැත. විවිධ සංස්කෘතීන් තුළ ක්‍රියා කිරීම නිසා ඒවා වඩාත් පොහොසත් වෙයි. ඔප් නැංවෙයි. පාපය නිසා වැටුණු මිනිස් ජීවිතය සහ පිරිහුණු සංස්කෘතිය සුබාරංචිය නිසා නවතාවයකට පත්වෙයි. පාපය නිසා ඇතිවූ දෝෂයන් දුරුවෙයි. සදාචාරය පවිත්‍ර වෙයි. මෙලෙස සභාව තම ධර්මදූත ප්‍රයත්නයේදී මානව ශිෂ්ටාචාරය ගොඩනගන්නටත්, මනුෂ්‍යයන්ගේ අභ්‍යන්තර නිදහසට මග පෙන්වන්නටත් දායක වනු ඇත.

**විවිධ සංස්කෘතීන්හි සම ස්වරත්වය**

සංස්කෘතිය තුළින් මානවයාගේ පූර්ණත්වයත් සමාජයේ යහපතත් සෙවිය යුතු ය. ඒ සඳහා ආගමික සදාචාරික සමාජික දැනුම දැනුම ගැඹුරු කර ගැනීමට භාවනාවද අන්තර් දෘෂ්ටීන් පිළිබඳ අවබෝධය ද, පෞද්ගලික විචාරය ද වර්ධනය කර ගැනීම අවශ්‍යයි. මේ සඳහා දැනුවත් වීමේදී විශ්වාසය සහ ඥානය යනුවෙන් එකිනෙකාට වෙනස් ක්ෂේත්‍ර දෙකක් ඇති බව අමතක නොකළ යුතු ය.

සත්‍යය සෙවීමටත්, අදහස් ප්‍රකාශ කිරීමටත්, ප්‍රචාරය කිරීමටත්, තමන් කැමති කලාවන් වර්ධනය කිරීමටත් කිසිදු වාරණයක් නොතිබිය යුතු ය. තහංචි නොකළ යුතු ය. නිදහස තිබිය යුතු ය. සංස්කෘතික රටාවන් බිහි කිරීමේ තීරණ ගැනීම රජයට අයිති දෙයක් නොවේ. රජය කළ යුත්තේ සියලූ ජනකොටස් තුළ ඊට ආවේණික සංස්කෘතික ජීවිතය පුබුදුවන්නට ආධාර සහ පහසුකම් සැලසීම ය. සංස්කෘතිය කිසි විටෙකත් දේශපාලනික හෝ ආර්ථික අරමුණකට ආයුධයක් නොවිය යුතු ය.

**සමාජ ආර්ථික ජීවිතය සහ දියුණුව**

ආර්ථික නිෂ්පාදන ක්ෂේත්‍රයේ කුමන බල ශක්තියකටත් වඩා මානව ශ්‍රමය වටින්නේ ය. නාසරතයේ දී තම අත්වලින් වැඩ කර මානව ශ්‍රමයේ ගරුත්වය ප්‍රකාශ කළ ජේසුස් වහන්සේගේ ගැලවීමේ කාර්යයට මනුෂ්‍යයා හවුල්වන්නේ ශ්‍රම පරිත්‍යාගයෙහි.

මනුෂ්‍යයාට තම ජීවන කුසලතාවලට අදාලව රැකියා ලබාදීම අවශ්‍යයි. ඔහුට ඔහුගේ පවුලට භෞතික, සමාජික, සංස්කෘතික හා අධ්‍යාත්මික වශයෙන් මානව ගරුත්වයක් ඇතිව ජීවත් වන්නට සාධාරණ වැටුපක් ලැබිය යුතු ය. කම්කරුවන්ට හානිවන ආකාරයට ව්‍යාපාර සංවිධානය කිරීම වැරදි ය. සම්පූර්ණ නිපැයුම් ක්‍රමය, මනුෂ්‍යාගේ පෞද්ගලික වුවමනාවන්ට ද, ඔහුගේ ගෘහ ජීවිතයට ද හානියක් නොවන ලෙස තිබිය යුතු ය. සේවකයන්ට ඔවුන්ගේ පවුල්වල සමාජමය, සංස්කෘතික සහ ආගමික කටයුතු කරන්නට විවේකයක් ම නිවාඩුවක් දිය යුතු ය. එසේ ම සේවකයන් ද තම ශ්‍රමයත් කාලයත් තම හෘදය සාක්ෂියට අනුව ඵලදායක ලෙස සේවයට යෙදවිය යුතු ය.

**කම්කරු ආරවුල්:**

කුමන ව්‍යාපාරයක හෝ සාර්ථක භාවය රඳා පවතින්නේ. සේවක ශ්‍රමය නිසා ය. එම නිසා සේවකයන්ට කෙලින්ම හෝ නියෝජනයෙන් හෝ එවායේ පංගුකාරකම දිය යුතුය. එසේ ම සේවකයන්ට සැබෑ ලෙසින් වෘත්තීය සමිති පිහිටුවාගන්නට නිදහස ද අවශ්‍ය ය. කිසියම් ආරවුලක් ඇතිවූ විට සංවාදයෙන් එය සාමකාමීව විසඳා ගැනීම මූලික ප්‍රතිපත්තිය විය යුතු ය. වැඩ වර්ජනය යනු සියළුම සාමකාමී මාර්ගවලින් නොහැකි වූ විට ගතයුතු අවසාන පියවර ය. කිසි විටෙකත් එය ආරවුල් විසඳීමේ ආරම්භක පියවර නොවීමට වගබලා ගත යුතු ය.

**භාණ්ඩ නිෂ්පාදනයේ පොදු පරමාර්ථය:**

දේව සැලැස්ම අනුව මෙලොව ඇති සෑම දෙය ම සෑම මනුෂ්‍යයෙකුගේ ම ප්‍රයෝජනය සඳහා පවතී. තමන් සතු දේ පාවිච්චි කරන විට පවා "තමාගේම" යන්න නොව "පොදු" යන හැඟීමක් අප තුළ තිබිය යුතු ය. එසේ වුවහොත් එය අන් අයගේ යහපත සඳහාත් භාවිත කිරීම පහසු වෙයි. සෑම කෙනෙකුට ම තමන්ගේ ජීවිතයට අවශ්‍ය දේ නොලැබේ නම් එවැනි සමාජ රටාවන් වෙනස් කළ යුතු ය. "සාගින්නෙන් මරණාසන්න වුවන්ට කෑම දෙන්න. එසේ නොකළ හොත් ඔබ ඔවුන් මරා දමන්නාහු ය." යන කියමන අපේ ආදර්ශය විය යුතු ය.

**අයෝජන සහ මුදල්**

මුදල් ආයෝජනය කළ යුත්තේ දැනුත් අනාගතයේදීත් මිනිසුන්ට රැකියා ලබා දීමටත් සෑහෙන ආදායමක් ලබා ගැනීමටත් ය. ආයේජනය පාලනය කරන්නවුන් සහ ආර්ථිකය සකස් කරන්නවුන් සිහි තබාගත යුතු මූලික කරුණක් ඇත. එනම් තම ක්‍රියාදාමයන් තුළින් සියල්ලන්ටම යහපත් ජීවන තත්ත්වයක් ලබා දීමේ අවශ්‍යතාවය ය. මුදල්වල වටිනාකම වෙනස් වීමෙන්, ආර්ථිකව දුර්වල රටකට අසාධාරණ අයුරින් පීඩා විඳීමට ඉඩ නොදීමට වග බලා ගත යුතු ය.

**පෞද්ගලික දේපල වස්තු අයිතිය:**

තමන්ගේ අනන්‍යතාව සහ කුසලතා ප්‍රකාශ කිරීමටත්, සමාජයට තම වගකීම් ඉටු කිරීමටත් හැකිවන්නේ දේපල හා වස්තුව හිමිව තිබුණොත් පමණි. තම ජීවිත පැවැත්මට අවශ්‍ය අවම වස්තු ප්‍රමාණය අයත් කර ගැනීමේ මූලික අයිතියක් මනුෂ්‍යයාට ඇත. නීත්‍යානුකූල අධිකාරයක් විසින් සාධාරණ වන්දියක් ගෙවා පොදු යහපත තකා දේපල සහ වස්තු පවරා ගත්විට, විවිධාකාරව තිබෙන පොදු අයිතිවාසිකම්වලට පෞද්ගලික අයිතිවාසිකම් බාධාවක් නොවිය යුතු ය. පොදු යහපතට විරුද්ධව, පෞද්ගලික දේවලින් අයථා ප්‍රයෝජන ගැනීම වැළැක්වීමට රජයට අයිතියක් තිබේ. සංවර්ධනය අඩු බොහෝ ප්‍රදේශවල, විශාල වතු ද ලාභය තකා තබාගෙන සිටින මුඩුබිම් ද ඇත. සමහර විට එම ප්‍රදේශවල බහුතර ජනතාව ඉඩම් නැති හෝ කුඩා ඉඩම් කැබලි ඇති කොටසකි.

ඉඩම් හිමියන් තම සේවකයන් ද, අඳ ගොවියන් ද, බදුකාරයන් ද ගැන මානුෂික හැඟිමකින් ක්‍රියා කළ යුතු ය. ඔවුන්ගේ අනාගතය, නිවාස සුබසාධනය ගැන සැළකිය යුතු ය. වැටුප් සහ ආදායම් වැඩිවීමේ ක්‍රම ද, වැඩ කිරීමට යහපත් වාතාවරණයක් ද, දිරිගැන්වීම් ද, අනන්‍යතා ප්‍රකාශයට ඉඩ ද ඇති කිරීම අවශ්‍ය ය.

**ආර්ථික ව්‍යාපාර සහ දේව රාජ්‍යය:**

ආර්ථික හා සමාජීය සංවර්ධනය ගැන උද්යෝගයෙන් වැඩ කරන යුක්තිය සහ සාධාරණත්වය සඳහා පෙරමුණ ගන්නා කිතුනුවෝ මානව සංහතියේ දියුණුව සහ සාමය සඳහා මහඟු සේවාවක් ඉටු කරති. කිතුනු වටිනාකම් අනුව අවශ්‍ය නිපුණතාවන් සහ අත්දැකීම් ලබා ලෝකයේ ක්‍රියාකාරීත්වයන් මධ්‍යයේ ඔවුහු අවංකව ද, ඍජුව ද ක්‍රියාකළ යුත්තෝ ය. කිතු සමිඳුන් ඉදිරිපත් කළ භාග්‍ය අට ඔවුන්ගේ ජීවිත දර්ශනය විය යුතු ය.

**කිතුනුවකු වශයෙන් පුරවැසි වගකීම:**

වර්තමානයේ ප්‍රබල ලෙස ඇතිවන සමාජීය වෙනස්වීම් දේශපාලන ජීවිතයට ද බෙහෙවින් බල පවත්වයි. ලෝකය තුළ අද මානව ගරුත්වය ගැන ඇතිවී තිබෙන තියුණු දැනුම නිසා, බොහෝ ජන කොටස් රැස්වීම් පැවැත්වීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතීන් ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරයි. ඒ නිසා සාමාජීය හෝ ආගමික නිදහසට බාධා කරන දේශපාලන පක්ෂ ප්‍රතික්ෂේප

කෙරේ. පොදු යහපත නොතකන, තම පාක්ෂිකයන්ගේ වාසිය පමණක් තකන දේශපාලනය ද ප්‍රතික්ෂේප වේ. දේශපාලනයේ හරය විය යුත්තේ යුක්තිය හොඳ හිත සහ මහජන සේවයයි.

විවිධ මත දරන්නන්ගෙන් සමන්විත දේශපාලන ක්ෂේත්‍රය පවත්වාගෙන යාමට නම් පිළිගත් අධිකාරියක් අවශ්‍ය ය. එම අධිකාරිය ක්‍රියා කළ යුත්තේ සදාචාර ප්‍රතිපත්ති සීමාව තුළ පොදු යහපතට අදාළ නීත්‍යානුකූල අධිකරණ බලයක් යටතේ ය.

**ජන ජීවිතයට සහභාගිවීම:**
සුදුසුකම් ඇති සියලු ම පුරවැසියන් උද්යෝගිමත්ව දේශපාලන ක්ෂේත්‍රයට සහභාගි වීම මානව ස්වාභාවයට එකඟ ය. එසේ සහභාගිවිය යුත්තේ සමාජය නීත්‍යානුකූල පදනමක් මත ගොඩනගන්නටත්, විවිධ ආයතනයන්හි විෂය සීමාවන් හා අරමුණු තීරණය කරන්නටත් පාලකයන් පත්කර ගැනීමටත් ය. ඡන්දය පාවිච්චි කිරීම සැම දෙනාගේ ම අයිතිය හා වගකීමකි. පොදු යහපතට අවශ්‍ය භෞතික දෑ සැපයීමත් පෞද්ගලික වශයෙන් සේවය කිරීමත් රටවැසියන්ගේ යුතුකම ය.

පොදු යහපත තකා යම් අවස්ථාවක මිනිස් අයිතිවාසිකම් තාවකාලිකව සීමා කළ හොත් තත්ත්වය වෙනස් වූ වහාම එය යථා තත්ත්වයට පත් කළ යුතු ය. මානව අයිතීන් පැහැර ගන්නා ඒකාධිපති පාලනයක් වේ නම් එය අමානුෂික භාවය පෙන්නුම් කිරීමකි.

රටවැසියන් පටු ආකල්පවලින් තොරව දේශහිතෛශීව සිටිය යුතු ය. කිතුනුවන් තම වගකීමේ ආකල්ප විදහා පාමින් පොදු යහපතට සේවය කරමින් ආදර්ශමත් විය යුත්තෝ ය. දේශපාලකයෝ පෞද්ගලික ප්‍රයෝජනයට මුල් තැන නොදිය යුත්තෝ ය. අයුක්තියට හා අත්තනෝමතික රජයකට විරුද්ධව කිතුනුවන් අවංකව සහ බුද්ධිමත්ව ක්‍රියා කළ යුතු ය.

**දේශපාලනය සහ ශු. සභාව**
රටවැසියන් හැටියට කිතුනුවන්ගේ ක්‍රියාවන් අතරත්, සභාව නමින් කිතුනුවන් කරන ක්‍රියා අතරත් වෙනසක් තිබිය හැකි බව සැලකිය යුත්තකි. සභාව කුමන ආකාරයකින් හෝ දේශපාලන සමාජයට අනුරූපවී නැත. සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දීම සභාවේ ස්ථාවරයයි. එසේ ම දේශපාලන සමාජයටත් ශු. සභාවටත් ඔවුන්ගේ ක්ෂේත්‍ර තුළ නිදහස සහ ස්වාධීනත්වය ඇත්තේ ය. ජාතීන් අතරත් ජාතියක් තුළත් යුක්තිය සහ දයාව වර්ධනය කිරීමට සභාවේ සහය ලැබේ.

ඕනෑ ම තැනක, ඕනෑ ම අවස්ථාවක සැබෑ නිදහසින් විශ්වාසය ප්‍රකාශ කරන්නටත්. උගන්වන්නටත්, දූත මෙහෙවර අවහිරයෙන් තොරව කරගෙන යන්නටත් සභාවට නිදහස තිබිය යුතු ය. මානව විමුක්තිය පතා දේශපාලන කටයුතුවල දී පවා අදහස් ප්‍රකාශ කිරීම සභාවේ යුතුකම ය. එසේ කරන්නේ සුබාරංචියයට එකඟව දූත මෙහෙවර සපුරාලීමටත් සාමය ඇති කිරීමටත් ය.

**සාමය නඟාලීම සහ අන්තර් ජාතික සබඳතා දියුණු කිරීම:**
"සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝ ය." මෙය ක්‍රිස්තුන් වහන්සේගේ අනුශාසනයකි. සාමය ලැබෙන්නේ සුසිත් ජනයන්ට බව උන්වහන්සේගේ උපන්දින පණිවිඩයෙන් ප්‍රකාශ වේ.

සාමය යනු යුද්ධය විරහිත වීම නොවේ. බලය තුලනාත්මකව තබා ගැන්මකුත් නොවේ. විරුද්ධවාදියා පරාජය කිරීම ද නොවේ. ඒකාධිපති බලයෙන් ඇතිවිය හැකි දෙයක් ද නොවේ. සැබවින් ම ධාර්මිකත්වයේ ප්‍රතිඵලයකි. දේව අභිමතය අනුව ජීවත්වීමේ ප්‍රතිඵලයකි. සාමය සදහට ම පවතින ලෙස එකවර ම ගොඩනැගීමට නොහැකි ය. එය නොකඩවා දිගින් දිගට ම ගොඩනැගිය යුත්තකි. ඒ සඳහා නිතර අවදිව සිටිය යුතු ය. සාමය ගොඩනැගීමට අන් අයට ගෞරවයත් අන් අය සමඟ සහෝදරත්වයෙන් ජීවත් වීමට ප්‍රායෝගික අධිෂ්ඨානයත් අවශ්‍ය ය. සාමය සඳහා යා යුත්තේ ප්‍රේමයේ මාර්ගය ඔස්සේ ය. භේදයේ බිත්ති බිඳ දමා ජේසුස් වහන්සේ කුරුසය මගින් සියල්ලන් පියාණන් වහන්සේ සමඟ සමගි කළ සේක. උන්වහන්සේ මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් "මාගේ සාමය මම ඔබ වෙත තබා යමි"යි ප්‍රකාශ කළ සේක. එසේ තබා ගිය සාමය කිතුනුවන් විසින් ලොවට බෙදා දිය යුතු ය. යෙසායා දිවැසිවරයා ප්‍රකාශ කළ පරිදි කඩුවලින් (ගිනි අවිවලින්) හී වැල් ද හෙල්ලවලින් දැකැති ද තනාගෙන ජාතියක් ජාතියකට එරෙහි නොවූ අවි නැති සාමකාමී සමාජයක් කරා ජනතාව යොමු කිරීම කිතුනු වගකීම ය.

**යුද්ධය වැළැක්වීම:**
විද්‍යාත්මක සහ විද්‍යුත් රසායනික අවි නිපදවීම මුළු මානව සංහතියට ම තර්ජනයකි. ත්‍රස්තවාදය තවත් අභියෝගයකි. මිනිස් වර්ගයාගේ හෘදය සාක්ෂියේ මූලධර්මයන්ට විරුද්ධව කරන ක්‍රියාවන් සියල්ල ම මහා අපරාධ වේ.

යුද්ධයේ අමානුෂික ගතිය අඩු කරන අටියෙන් ඇතිකරගෙන තිබෙන ගිවිසුම්, සහාව ගෞරවයෙන් අගය කරයි. යුදබිය වැළැක්වීමට ප්‍රමාණවත් බලයක් ඇති ජාත්‍යන්තර බලමණ්ඩලයක් නැති නිසා රජයකට තම ආරක්ෂාව සඳහා පියවර ගැනීමට අයිතියක් තිබේ. එහෙත් අවි ආයුධ තිබුණ පලියට ඒවා භාවිතා කිරීම යුක්ති සහගත නොවේ. ලෝකයේ ප්‍රබල රටවල් දනට රුස් කරගෙන ඇති අවි ආයුධ යුද්ධයක් සඳහා යෙදවුවහොත් මිහිමත කිසිදු මනුෂ්‍ය ජීවියෙකු ඉතිරි නොවන්නට ද පුළුවන. අවි ආයුධ රුස්කරගෙන ඒවා ප්‍රදර්ශනය කිරීම සතුරා බියගැන්වීමේ උපාය මාර්ගයක් ලෙස ද සලකති. සැබෑ නිරායුධ තත්ත්වයක් ඇතිවිය යුත්තේ එක් පාර්ශ්වයකින් පමණක් නොවේ. එය එකඟත්වයේ සාමූහික ප්‍රතිඵලයක් විය යුතුය. එසේ ඒ සඳහා අන්තවාදී ජාති මමත්වයෙන් සහ උන්නතිකාමිත්වයෙන් ඇත්විය යුතු ය. විපක්ෂ භාවය, අපහාසය, අවිශ්වාසය, අන්‍ය ජාතිකයාට වෛරය පූර්ව විනිශ්චයන් මගින් තීරණ ගැනීම වැනි දේ අත්නොහැරියොත් ලෝක සාම වැයම නිෂ්ඵල වන්නේ ය.

## ලෝක සමාජයක් බිහි කිරීම:

සන්නිවේදන මාධ්‍යවල දියුණුව, විවිධ ගිවිසුම් අන්‍යෝන්‍ය සහජීවනය වැනි කරුණු නිසා ලොව සියලු ජනකොටස් වඩා සමීපව බැඳී සිටිති. සමස්ත ලෝකය ම එක ම ගම්මානයක් බවට පත්වෙමින් තිබේ. මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ විවිධ ලෝක සංවිධානයන් මහත් මෙහෙවරක් ඉටු කරයි. ඒ මෙහෙවර වඩාත් සාර්ථක වීමට නම්, ආර්ථික අහේති ඉවත් කළ යුතු ය. අධ්‍යාපනයේ මාර්ගයෙන් හා වෘත්තීය පුහුණුවෙන් සෑම පුරවැසියෙකුගේ ම ශ්‍රමය දේශයේ සංවර්ධනයට යොමු කළ යුතු ය.

නොදියුණු ජාතීන්ට මෙවන් සහන සැලසීමට ඉදිරිපත් වන සංවර්ධිත රටවල් එය කළ යුත්තේ අවංක චේතනාවෙන් ය. දේශපාලන ආධිපත්‍ය පැතිරවීමටවත් තමන්ගේ දෘෂ්ටිවාදයන් පැතිරවීමටවත් නොවිය යුතු ය.

මේ සඳහා මූලික මාර්ගෝපදේශයන් කිහිපයක් පහත දක්වේ.

1. සංවර්ධනයේ සහ ජාතීන්ගේ ප්‍රගතියේ ඉලක්කය විය යුත්තේ ජනතාවගේ පූර්ණ මානව සංසිද්ධිය ඇති කිරීම ය.
2. සංවර්ධනය වෙමින් පවත්නා රටවලට උදව් දීම දියුණු ජාතීන්ගේ යුතුකම ය.
3. ජාත්‍යන්තර සමාජයේ ආර්ථික වර්ධනය සමායෝජනය ප්‍රබෝධමත් කරමින් ඉදිරියට යා යුතු ය.
4. බොහෝ තැන්වල ඇති සමාජමය හා ආර්ථික ආකෘතීන් සංශෝධනය කළ යුතු ය.

## ජනගහන ප්‍රශ්නය

අධික වේගයෙන් වැඩිවන ජනගහනයෙන් ඇතිවන බරපතල ප්‍රශ්න විසඳීමට ජාත්‍යන්තර සහයෝගය අවශ්‍ය ය. විවාහවීමටත් දරුවන් ඇතිදැඩි කිරීමටත් ඇති මානව අයිතිය අනුව පවුලේ ප්‍රමාණය සීමා කිරීම දෙමාපියන් සතු කාර්යයකි. එය රටක පොදු අධිකාරියකට දියයුතු නොවේ. දෙමාපියන් තම හෘදය සාක්ෂිය අනුව තීරණය ගත යුතු වේ.

## ජාත්‍යන්තර උදව්:

ලෝකය තුළ සාමූහික සහෝදරත්වයේ සමාජයක් ගොඩනැංවීමට කිතුනුවන්ගේ පූර්ණ සහයෝගය ලැබිය යුතු ය. වැඩි දෙනා කිතුනුවන් වූ ඇතැම් ජාතීන් මෙලොව සම්පත් බහුලව භුක්ති විඳින අතර, තවත් ජාතිහු අපමණ දුක් විඳිති. මේ අවාදර්ශය නැවැත්වීමට අවශ්‍ය ය. සහාවේ පුරාණ සිරිත අනුව කිතුනුවෝ මේ යුතුකම, අනවශ්‍ය වැඩිපුර ඇති දේවලින් පමණක් නොව තම අත්‍යවශ්‍ය ධනයෙන් පවා ඉටුකළ යුත්තෝ ය.

## ජාත්‍යන්තර සංවිධානයන්හී කිතුනුවෝ

කිතුනුවන්ට කළ හැකි ඉතා විශිෂ්ට ජාත්‍යන්තර කාර්යය නම් ජාත්‍යන්තර ආයතනවල සේවය සාර්ථක වීමට උදව්වීම ය. සාමකාමී ලෝකයක් බිහි කිරීමට පූර්ණ සහයෝගය ලබාදිය යුතු ය. මේ වැඩ කොටසද සාර්ථක වන්නට නම් කතෝලිකයෝ අනෙක් සභාවල කිතුනුවන් සමඟ උරෙනුර ගැටී ක්‍රියාකිරීමට අධිෂ්ඨාන කළ යුත්තෝ ය.

# හත්වන පාඩම

# 7. සන්නිවේදන මාධ්‍යයන් හා ආගම ඉගැන්වීමේ ක්‍රම

## 7.1. සන්නිවේදන මාධ්‍යයන් හා ආගමික අධ්‍යාපනය:

සන්නිවේදන මාධ්‍යයන් වශයෙන් හඳුන්වන්නේ සෑම ආගමකට ම අයිති ලොකු කුඩා, බාල, මහළු සෑම දෙනාට ම පොදුවේ පණිවිඩ හෝ නිවේදන ගෙන එන විවිධ ආරංචි මාර්ග වේ. නූතන ලොවේ තාක්ෂණික හා විද්‍යාත්මක දියුණුවත් සමග සන්නිවේදන මාර්ග පොදු මිනිස් ජීවිතයට ප්‍රබල බලපෑමක් ඇති කරයි. සමහර සන්නිවේදන මාර්ග නැතිව ම අද මිනිසාට පූර්ණ මිනිසෙක් ලෙස ජීවිත් වීමට බැරි තරම් ය. සන්නිවේදන මාර්ගවලින් ප්‍රධාන ඒවා නම්, ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත, පොත් පත්, සඟරා, චිත්‍ර කථා, චිත්‍රපටි, නාට්‍ය යනාදිය වේ. මෙම මාධ්‍යයන් ආගමික අධ්‍යාපනයට උපයෝගිකර ගැනිම නූතන ධර්මෝපදේශයෙහි අංගයක් වී තිබේ.

## 7.2. ගුවන් විදුලිය

ගුවන් විදුලිය ප්‍රබල ජන සන්නිවේදන මාර්ගයකි. ගුවන් විදුලිය මගින් ආගමික පණිවිඩයක් එක එල්ලේ ම ප්‍රචාරය කිරීම ආගමික අධ්‍යාපනයට යොමු කිරීමකි. ඊට අමතරව දවසේ සිතුවිලි, ආගමික වැඩ සටහන්, විශේෂ ආගමික උත්සව දිනයන්, එම උත්සවය අළලා ගී, කථා, නාට්‍යය යනාදිය ප්‍රචාරය කිරීම ගුවන් විදුලිය ආගමික අධ්‍යාපනයට නැඹුරු කිරීමකි. තවද හොඳ ගී කවි, සිංදු, නාට්‍යය යනාදී විවිධ වැඩසටහන් මගින් යහපත් මානව ගතිගුණවල අගය දැක්වීම මානව සබඳතා වර්ධනය කිරීමට රුකුල් දෙන අදහස් පැතිරීම යනාදිය මගින් ආගමික අධ්‍යාපනයට රුකුලක් ලැබේ.

## 7.3. රූපවාහිනිය:

තවත් ප්‍රබල සන්නිවේදන මාර්ගයකි. අසන දෙයට වඩා දකින දෙය මානව ජීවිතයට විශාල බලපෑමක් ඇති කරන නිසා, රූපවාහිනි වැඩ සටහන් මගින් මානව සමාජ උන්නතියට තුඩු දෙන වැඩ සටහන් විකාශනය කිරීම ආගමික අධ්‍යාපනයට අත දීමකි. විවිධ ජීවිත කථා සහ සිදුවීම් ඇසුරෙන් නිර්මාණය කරන රූපවාහිනි චිත්‍රපට හොඳ මානව ගතිගුණ විදහා පෑමට උපයෝගී කර ගත යුතු ය.

## 7.4. පුවත්පත් සහ චිත්‍රකථා

පුවත්පත් හා ලේඛන මාර්ග සමාජයට විවිධ පණිවිඩ හා අදහස් උදහස් ප්‍රචාරය කිරීමට වැදගත් මාධ්‍යයකි. ආගමික පුවත් පත් හා ලේඛන වලින් එක එල්ලේ ම දහම් පණිවිඩය ප්‍රචාරය කිරීමට ආධාර වන්නේ වුව ද, මේ ආගමික පොත පත පැතිරෙන්නේ සීමිත සංඛ්‍යාවක් අතර ය.

සාමාන්‍ය පුවත් පත් හා සඟරා යනාදියෙන් එක එල්ලේ ම ආගමික පණිවිඩ ප්‍රචාරය නොකරන නමුදු මානව ගුණධර්ම හා සමාජ සංවර්ධනයට අත දෙන ලේඛන පමණක් ප්‍රචාරය කිරීමෙන් ආගමික අධ්‍යාපනයට රුකුලක් ලැබේ.

අද විවිධ වයස්වල පසුවන සිසු දරුවන් අතර ඉතා ජනප්‍රිය ලේඛන මාර්ගයක් වන චිත්‍ර කථා ගැන ද කිව යුත්තේ ඉහත කී දෙයම වේ. ආගමික ස්වරූපය ගත් චිත්‍ර කථා නොවුවත් යහපත් ගුණ ධර්ම ඇති කිරීමට ද, සිසු දරුවන්ගේ ආගමික, සමාජික, අධ්‍යාපනික, මානසික වර්ධනයට ද අත දෙන චිත්‍ර කථා නව නවත් සුලභ කිරීමෙන් මෙම මාධ්‍ය ප්‍රයෝජනවත් අධ්‍යාපන මාර්ගයක් කර ගත හැකි ය.

## 7.5. පාඩම් සූදානම් කිරීම

සෑම ආගම් පාඩමකට ම මනා ලෙස සූදානම් වීම සෑම ධර්මෝපදේශකයෙකුගේ ම යුතුකම වේ. පාඩමකට සූදානම් වීමේ දී සලකා බැලිය යුතු කාර්යයන් රාශියක් තිබේ. ඉන් ප්‍රධාන ඒවා ගැන පාඩම ඉගැන්වීමට පෙර, සිත යොමු කර පාඩමකට සූදානම් වීම අත්‍යාවශ්‍ය වෙයි. සූදානම් නොවූ පාඩමකට බොහෝ විට අරමුණක් නැත. ගුරුවරයා කුමක් උගන්වන්නේ ද කියා ඔහු ම නොදනියි. දරුවන්ට ඉන් ප්‍රයෝජනයක් අත් නොවෙයි. ඔවුන්ට පාඩමේ අර්ථයක් නොමැත. පාඩම නීරස වෙයි. කාලය නාස්ති කිරීමකි. පාඩමක් සූදානම් කිරීමේ දී පහත දැක්වෙන දෑ සිහි තබා ගත යුතුය.

- තමා උගන්වන්නට යන පාඩම කුමක් ද? එහි විෂය කරුණු කියවා බලා ඒ පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගැනීම.
- තමාට නොතේරෙන හෝ ගැටළු ඇති ස්ථාන පොත පත ඇසුරෙන් හෝ එවන් උගත් අයෙකුගෙන් අසා බලා විසඳාගෙන පැහැදිලි අවබෝධයක් ලැබීම.
- අතිරේක පොත පත කියවා විෂය කරුණු පිළිබඳව දැනුම පුළුල් කර ගැනීම.

- ගුරු අත් පොත කියවා බලා අදාළ විෂයය කරුණු ඉදිරිපත් කරන ආකාරය ද, පාඩම සංවිධානය කරගත යුතු ආකාරය ද ගැන අවබෝධයක් ලබා ගැනීම.
- පාඩමට අවශ්‍ය උපකරණ හා ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර කුමක්දැයි තීරණය කර, ඒවා කලට වේලාවට සකස් කර ගැනීම.
- පාඩම් සටහනක් පැහැදිලිව ලියා, කළුලෑල්ල මත ගොඩ නගා ගත යුතු කරුණු රතු ඉරකින් ඇඳ, විෂයය කාර්යය ද සූදානම් කර ගැනීම.
- පැහැදිලි අරමුණක් ඇතිව, ආත්ම විශ්වාසයෙන් යුතුව, පාඩම ඉගැන්වීමට ඉතා උනන්දුවෙන් සිටීම.
- තමන්ගේ කාර්යය සාර්ථකව ඉටුකිරීමට දෙවි වරම් පතා ශුද්ධාත්ම ආලෝකය ඉල්ලා දෙවිඳුන් යැදීම.

**පාඩම් සටහනක් පිළියෙල කිරීමේදී ඔබේ අවධානය යොමු විය යුතු කරුණු:**

- නියමිත තේමාව
- තේමාවට අදාළ වූ පාඩම
- කාලය
- අරමුණු - පොදු අරමුණ

**සුවිශේෂ අරමුණු**

- දැනීම (ප්‍රජානන)
- ආකල්ප (ආවේදනික)
- කුසලතා (මනෝචාලක)
- විෂය අන්තර්ගත (උගන්වන විෂය කරුණු)
- ආධාරකය (ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ)
- ගුරු වැඩ-සිසු වැඩ (පාඩම සංවර්ධනය කිරීම)
- ක්‍රියාකාරිත්වයයන් (පාඩම වඩාත් තහවුරු කිරීම සඳහා සිසුන් ලවා කළ හැකි දේවල්)
- ඇගයීම (පොදු අරමුණ සම සුවිශේෂ අරමුණු ඉටුවුවා දැයි මැන බැලීම)

## 7.6. ගුරුවරයාගේ ස්වීයත්වය:

**හැඳින්වීම :**

ගුරුවරයාගේ ස්වීයත්වය වශයෙන් හැඳින්වෙන්නේ සිසුන් ඉදිරියේ ගුරුවරයා විදහාපාන දර්ශනය හා ඔහුගේ ජීවන චරිතයේ කැපී පෙනෙන ගුණාංග වේ. මෙය ඇතැම්විට ගුරු පෞරුෂත්වය සමග සම්බන්ධ වේ. ගුරුවරයාගේ ස්වීයත්වය හේතුවෙන්, ඔහු අනෙක් අයගෙන් වෙන් කොට, ඔහු මෙවැනි කෙනෙක් කියා කීමට හැකි වෙයි.

**ගුරු ස්වීයත්වයේ ප්‍රධාන ලක්ෂණ:**

- තමාගේ ජීවිත ආදර්ශය තුළින් කැපී පෙනෙන ගුණාංග, තම ක්‍රියා කලාපය තුළින් විදහා පෑම.
- ඉගැන්වීමේ කාර්යය තුළ තමාට ම ආවේණික වූ කථා විලාශයෙන්, ඉරියව් මගින්, ක්‍රියාශීලි භාවයෙන් එම කාර්යය සාර්ථක ලෙස ඉටු කිරීම.
- තමාගේ නිර්මාණ ශක්තිය මෙහෙයවා පාඩම තුළ තම නිර්මාණ ඉදිරිපත් කර තමාට ම පෞද්ගලික වූ කුසලතාවන් පිළිබිඹු කිරීම.
- ගුරුවරයාගේ පෞද්ගලික ජීවිතය හා බාහිර දර්ශනය තුළින් සිසුන්ට යමක් ඉගෙන ගැනීමට හැකියාවක් ඇති කිරීම.
- තමාගේ අභ්‍යන්තර ගුණාංග වන ආත්ම ශක්තිය, දේව විශ්වාසය, චිත්ත ධෛර්යය, දයාව, කරුණාව, ජ්වලිතභාවය, ප්‍රේමය නමැති ගුණාංග තමාට පෞද්ගලික වූ ක්‍රියාවලියක් තුළින් පිළිබිඹු කිරීම.
- ඉගැන්වීම සංවිධානය කිරීමේ දි හා පන්ති පාලනයේදී ගුරුවරයා දක්වන හැකියාව.
- ගුරුවරයා කුමන කෙනෙක් යන්න ද, ඔහු උගන්වන දෙය ඔහු තරයේ විශ්වාස කරයි ද, ඒ අනුව ජීවත් වෙනවා ද යන කරුණුවලට පිළිතුරු තම ජීවිත ආදර්ශක මගින් පහදා දීමට සිසුනට හැකියාව ලබා දීම.

## 7.7. පන්ති පාලනය හා විනය:

**හැඳින්වීම:**

පන්ති පාලනය යනුවෙන් අදහස් කරන්නේ සිසුන් පන්ති කාමරයක ඉගෙන ගන්නා විට එහි පවතින සුහද වාතාවරණය හා ඉගැන්වෙන කාලය, සිසු අවධානය බාධකිවලින් තොරව එම කාර්යය සඳහා ම යොමු කිරීමයි. හොඳ පන්ති පාලනයක් හා විනයක් ඇති කිරීමට තුඩු දෙන

සාධක කිහිපයක් ම ඇත. දක්ෂ හෝ විශාරද ගුරුවරයෙකුට වුවත් අධ්‍යාපන ප්‍රතිපත්ති සහ මනෝ විද්‍යාව ගැන හා ගුරු පුහුණුවක් නොමැතිව පන්තියක් තුළ මනා සංවිධානයක් හා විනය පාලනයක් ඇතිකර ගැනීමට නොහැකි ය.

පන්ති පාලනය හා විනය, ගුරු පුහුණුවකින් හා අත් දැකීම් රාශියකින් ලබාගත යුතු නිසා, යම් අධ්‍යාපන ප්‍රතිපත්ති කිපයක් පමණක් මෙහි ඉදිරිපත් කළ හැකි ය.

- සෑම ගුරුවරයෙක් ම පන්ති පාලනය විනය පිළිබඳ යම් අවබෝධයක් ගුරු පුහුණුවක් මගින් ලබාගත යුතු ය. එසේ නොවුවහොත් ඔහුට වෘත්තීමය පුහුණුවක් නොමැත. ඔහු අසාර්ථක ගුරුවරයෙක් වන්නට පුළුවන.
- විනය හා පන්ති පාලනයේ පරමාර්ථය නම් ඉගැන්වීමේ කාර්යයට අනුබල දෙන යහපත් වාතාවරණයක් පංති කාමරය තුළ බිහි කිරීම ය.
- ගුරුවරයාට ද, සිසුනට ද ඉගෙන ගැනීමේ කාර්යය තුළ සම්පූර්ණයෙන් ම අවධානය යොමු කිරීමට හැකි වන්නේ පන්ති කාමරය තුළ ඉගෙන ගැනීමේ වාතාවරණයක් ඇති වූ විට ය.
- පන්ති පාලනයට හා විනයට බාධා කරන කරුණු නම්, යම් යම් පුද්ගල සිසුන් හෝ කණ්ඩායම් මගින් විවිධ ශබ්දවලින් හා කෑ කෝ ගසමින් ඉගැන්වීමට හා ඉගෙන ගැනීමට බාධා කිරීමයි.
- පන්ති පාලනය හා විනය ඇති කිරීමට සිසුනට තද නීති රීති පැනවීම, ශාරීරික දඬුවම් දීම, ඉතා දරුණු ලෙස බැණ වැදීම යනාදිය හොඳ ප්‍රතිකර්ම ලෙස අද පිළි නොගැනේ.
- හොඳ පන්ති පාලනයකට අවශ්‍ය වන්නේ ගුරුවරයා විසින් සිසුන් අවබෝධ කරගෙන ඔවුන්ගේ මානසික තත්ත්වයට අනුකූල වන පරිදි තම පාඩම් ඔවුන්ට පහසුවෙන් අවබෝධ වන අන්දමින් සරල භාෂාවෙන් ඉදිරිපත් කිරීමයි.
- ගුරුවරයා මනා සූදානමින් යුතුව, පැහැදිලි අරමුණක් ඇතිව, පාඩමට යෙදී ඇති කාලය සම්පූර්ණයෙන් ම ඉගැන්වීමේ කටයුතු අතරේ බෙදා ගෙන, මුළු කාල වේලාව ම සිසුන්ව ඉගැන්වීමේ කටයුතුවල නිරත කිරීමයි.
- පන්ති පාලනයට ආධාර වන තවත් කරුණක් නම්, ශ්‍රව්‍ය දෘශ්‍යාධාර භාවිතය හා ගුරු සිසු සබඳතාවයයි. මෙම ආධාර මගින් පාඩමට ගුරු සිසු සබඳතාව වර්ධනය වීමත් සමග සිසු සහභාගිත්වය ද වැඩි වේ.
- ගුරුවරයාගේ මනා පෞරුෂත්වය පන්ති පාලනයට හා විනයට බලපාන බව ද කිව යුතුම ය. ගුරුවරයාගේ වැදගත් පෙනුම ද, පාලන ශක්තිය ද, ඉගැන්වීමේ දක්ෂතාවය ද, ඉරියව් සහ කථා ස්වරය ද, දැනුම ප්‍රකාශන ශක්තිය ද යන පෞරුෂත්වය හා සම්බන්ධ දේ පන්ති පාලනයට බෙහෙවින් ම බලපායි.
- ගුරුවරයාගේ පාලන බලයත්, සිසුවා ඊට අවනත වීමත් විනය රැකගැනීමට තුඩු දෙයි. ගුරුවරයාගේ පිතෘක පාලන බලයට තමා අවනත විය යුතු බව සිසුවා අවබෝධ කර ගන්නේ ගුරුවරයා තම පාලන බලය මෙහෙයවා ඉගැන්වීමේ කාර්යය තුළ සිසුන් හසුරුවා ගන්නා දක්ෂතාවය මත ය.

## 7.8. ප්‍රාථමික, පශ්චාත් ප්‍රාථමික පන්ති විශේෂ ක්‍රම

**ප්‍රාථමික පන්ති සඳහා විශේෂ ක්‍රම**

වයස 5-11 දක්වා ප්‍රාථමික අධ්‍යාපන යුගය වේ. මෙම වයස්වල පසුවන සිසුන්ට ආගම ධර්මය ඉගැන්වීමේ දී භාවිත කළ යුතු ක්‍රම තුළින් විධිමත් දේව ධර්මයක් ඉගැන්වීමට වඩා දෙවිඳුන් හා දෙවිඳුන්ගේ ප්‍රේමය, ජේසුතුමා හා දෙව්මව් මගින් හඳුනා ගැනීමත්, දේව දරුවන් වශයෙන් ජීවත් විය යුතු ආකාරය එදිනෙදා ජීවිත ආදර්ශ වලින් පිළිබිඹු කර, ඒ අනුව ජීවත් වීම අපේක්ෂා කෙරේ. එබැවින් ප්‍රාථමික පන්තිවල සරල ඉගැන්වීම් ක්‍රම භාවිතා කෙරේ. ඉන් සමහරක් නම්;

**I. කථාන්තර ක්‍රමය :**

පාඩම ආරම්භයේදී ම ගුරුවරයා පාඩමට අදාළ වන ඉතා සිත් කාවදින කථාන්තරයක් ඉදිරිපත් කරයි. මෙයට සිසු සැමදෙනාගේ ම අවධානය යොමු වේ. ඉන්පසු ප්‍රශ්න උත්තර සංවාදයක් මගින් ඉහත කියන ලද කථාවේ කරුණු මගින් පාඩමට අදාළ විෂය කරුණු කිපයක් ඉදිරිපත් කළ හැකි ය. ජේසු තුමා ද උපමා කථා මගින් කළේ මෙවැනි දෙයකි.

**II. පින්තූර ක්‍රමයː**

එකිනෙකට සම්බන්ධ පින්තූර කිහිපයක් මගින් සම්පූර්ණ පාඩම ඉගැන්විය හැකි ය. එක එක පින්තූර ක්‍රමානුකූල ලෙස ඉදිරිපත් කිරීමෙන් පසුව ඒවායෙහි ඇති දර්ශනය ගැන සිසුන් හා සංවාදයක් ගොඩ නගා ගෙන විෂය කරුණු ඉගැන්විය හැකි ය. වර්ණ හා විශාල පින්තූර මෙම කාර්යයට වඩාත් උචිත ය.

**III. සංවාදක ක්‍රමයː**

යම් ක්‍රියාවලියක් (උදාː දිව්‍ය පූජාව) සිසුන්ට නිරණය කිරීමට ඉඩ දීමෙන් පසුව ඔවුන් සමග ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමෙන් සංවාදයක යෙදී පාඩමක් ඉගැන්වීම.

**IV. ක්‍රියාකරකම් ක්‍රමය:**

යම් ක්‍රියාකාරකමක සිසුන් යොදවා ඔවුන්ගේ අත්දැකීම් විස්තර කිරීමෙන් හා අදහස් ප්‍රකාශ කිරීමෙන් පාඩම ගොඩ නැගීම. මෙම ක්‍රියාකාරකම්වලින් සමහරක් නම්, නාට්‍යයක් රඟ දැක්වීම, දිව්‍ය පූජාවට සහභාගිවීම, අනාථ නිවාසයක් බලන්නට යාම, දෙමාපියන් සමග වන්දනා ගමනක් යාම.

**පශ්චාත් ප්‍රාථමික පන්තිවලට විශේෂ ක්‍රම**

**I. ව්‍යාපෘති ක්‍රමය**

විෂය නිර්දේශයට අයිති යම් කොටසක් සිසුන් කිහිප දෙනෙක් ලවා අධ්‍යයනය කොට ඒ පිළිබඳ තමන් ඉගෙන ගත් දෙය වාර්තා කිරීම. ව්‍යාපෘති මගින් එක එක විවිධ වැඩ කොටස් අධ්‍යනය කොට නිම කිරීමට භාර දිය හැකි ය.

**II. කණ්ඩායම් වැඩ**

කණ්ඩායම් මගින් විෂය කරුණු ඉගෙන ගෙන තම කණ්ඩායමේ කටයුත්ත නිමා කර, ඒ පිළිඳව වාර්තා සැපයීම.

**III. ගැටළු විසඳීමේ ක්‍රමය**

ගුරුවරයා සමාජයේ හෝ පුද්ගල ජීවිතයට අදාළ ගැටළුවක් පාඩම ආරම්භයේදී ඉදිරිපත් කරයි. සිසුන් විසින් මෙය ගැඹුරට සලකා බැලීම. තව ද කිතුනු දර්ශනය ඔස්සේ එයට විසඳුමක් සෙවීම. ඉදිරිපත් කරන විසඳුම්වල අඩුපාඩු සෙවීම. අවසානයේදී කිතුනු දර්ශනය මෙම අවස්ථාවේදී පෙන්වා දීම.

## 7.9. මනෝවිද්‍යාත්මක ඉගැන්වීම:

20 වන සියවස ආරම්භයේ සිට ම මනෝ විද්‍යාවේ නව සොයා ගැනීම් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පෙරළියක් ඇති කළේ ය. අධ්‍යාපන මනෝ විද්‍යාවේ උදාවත් සමග නව අධ්‍යාපන ක්‍රම බිහිවිය. ගතානුගතික ඉගැන්වීම් ක්‍රම අභාවයට ගියේ ය. මනෝ විද්‍යාත්මක පදනමක් මත නවතාවයෙන් ගොඩ නැගූ ධර්මෝපදේශ ක්‍රමය මනෝ විද්‍යාත්මක ක්‍රමය යනුවෙන් හැඳින්වී ය. 1930 දී පමණ බිහි වූ මියුනික් ධර්මෝපදේශ ක්‍රමය ද මෙම මනෝවිද්‍යාත්මක පදනම මත ගොඩ නැගූ නිසා මෙය ද මනෝවිද්‍යාත්මක ක්‍රමය යනුවෙන් හැඳින්වේ.

**මනෝවිද්‍යාත්මක ඉගැන්වීමේ ලක්ෂණ සමහරක් :**

- දැනුම ඉදිරිපත් කිරීමේදී දන්නා දෙයින් නොදන්නා දෙයටත්, සරල දෙයින් සංකීර්ණ දෙයටත්, සංයුක්ත දෙයින් ව්‍යුක්ත දෙයටත් පිවිසීම.
- ගුරු කේන්ද්‍රිය හෝ විෂය කේන්ද්‍රිය අධ්‍යාපන ක්‍රමයක් වෙනුවට සිසු කේන්ද්‍රිය අධ්‍යාපනයක් ඇති කිරීම.
- සිසුවාගේ වයස, ඔහුගේ ආශාවන් හා මානසික තත්ත්වයට උචිත වන ලෙස ඉගැන්වීම කිරීම.
- දැනුම දීමේ කාර්යය තුළ දැනුම ලබා ගැනීමේ ප්‍රධාන මාර්ගය වන ඉන්ද්‍රිය ගෝචර අවදි කිරීමට ශ්‍රව්‍ය දෘශ්‍යාධාර බහුලව භාවිතා කිරීම.
- සෑම ආගමික පාඩමක් තුළ පැහැදිලි අරමුණක් තිබීම.
- මෙම අරමුණ සම්පූර්ණ කර ගැනීමට <u>දැනුම</u> වශයෙන් සිසුවාට ඉදිරිපත් කළ යුතු විෂය කරුණු තිබීම. සිසුවාගේ ජීවිතය ගොඩ නගා ගත හැකි <u>කුසලතාවන්</u> කුමක් ද යන්න සොයා බැලීම. ඔහුගේ සිතුම් පැතුම් නියම කිතුනු සාරධර්ම මත ගොඩනගා ගැනීමට අවශ්‍ය <u>ආකල්ප</u> පාඩම තුළින් බිහි කිරීම.

මනෝ විද්‍යාත්මක ක්‍රමය අනුව පාඩමක් සූදානම් කිරීම:

ඉහත දැක්වූ දැනුම-කුසලතා-ආකල්ප යන කරුණු තුන ප්‍රධාන අරමුණු සම්පූර්ණ කර ගැනීමට උපයෝගී වන පරිදි පහත සඳහන් පස් පියවර අනුව පාඩමක් ගොඩ නගා ගත හැකි ය.

- සූදානම
- ඉදිරිපත් කිරීම
- පාඩම් විස්තරය
- සාරාංශය
- ක්‍රියාකාරකම්, ඇගයීම්

**සූදානම :**

මෙම පියවර යටතේ සඳහන් වන කරුණු අනුගමනය කිරීම යෝග්‍ය වේ.

- ආගමික වාතාවරණයක් පන්ති කාමරය තුළ ඇති කිරීමට සුළු යැදුමක්, ආයාචනයක්, නිහඬතාවක් යනාදි දෙය භාවිතා කිරීම.
- පාඩමේ මාතෘකාව ඉදිරිපත්කර සිසුන්ට එය ගැන ඉගැන්වීමට හොඳ සුහදතාවයක් බිහි කිරීම.
- පසුගිය පාඩමේ කරුණු ඉතා සුළු වශයෙන් සමාලෝචනයකර, එම කරුණුවලින් මෙම නව පාඩම සම්බන්ධ කිරීම.

- ගුරුවරයා මෙම නව පාඩම තුළ අලුත් දෙයක් උගන්වන්නට යන බව හැඟවීමට, දෘශ්‍යාධාර, පාඩම් සටහන් යනාදිය මගින් සිසු කුතුහලය අවුස්සා පාඩම ගැන උද්යෝගයක් ඇති කිරීම.

**ඉදිරිපත් කිරීම:**

- යම් කථාවක් හෝ සිදුවීමක් හෝ කථාන්තරයක් හෝ පින්තූරයක් මගින් පාඩමට අදාළ ප්‍රධාන කරුණු ක්‍රියාත්මක වී ඇති ආකාරය සිසුන්ට ඉදිරිපත් කිරීම.
- ඔවුන් දත් දුටු මේ කරුණු තුළින් නොදන්නා කරුණක් විස්තර කිරීමට සංවාදයක් සිසුන් සමඟ ඇති කිරීම.
- මෙම කථාව මගින් ප්‍රශ්න ඇසීමට, පිළිතුරු දීමට, අදහස් හුවමාරු කිරීමට සිසුන් පෙළඹවීම.
- ඉස්මතු වූ ප්‍රධාන කරුණක් හෝ දෙකක් කළුලෑල්ල මත විදහා පා, එය පාඩමට පිවිසීමට මාර්ගයක් කර ගැනීම.

**පාඩම් විස්තරය:**

මෙම පියවර පාඩමේ ප්‍රධාන කොටසයි. වැඩි කාලයක් මෙම පියවරේ කටයුතු සම්පූර්ණ කර ගැනීම සඳහා වැය කළ යුතු ය.

- ඉදිරිපත් කිරීමේ පියවර තුළ ගෙනහැර පෑ කරුණු සම්බන්ධකර, දන්නා දෙයින් නොදන්නා දෙයකට හෝ සංයුක්ත දෙයින් ව්‍යුක්ත දෙයකට පිවිසීම.
- විෂය කරුණු ක්‍රමානුකූල ලෙස කළුලෑල්ල මත ගොඩ නගා පැහැදිලිව විස්තර කිරීම.
- ශ්‍රව්‍ය දෘශ්‍යාධාර භාවිතා කරමින් ව්‍යුක්ත හෝ සංකීර්ණ විෂය කරුණු බුද්ධිය මගින් අවබෝධ වන පරිදි පැහැදිලිව විස්තර කිරීම.
- සිසු අවබෝධය හා උනන්දුව රඳවා ගැනීම සඳහා ඉගැන්වූ විෂය කරුණු පිළිබඳ ව ප්‍රශ්න කිරීම හා අවබෝධ නොවූ කරුණු ගැන වැඩි අවධානයක් යොමු කිරීම.
- කළුලෑල්ල මත සම්පූර්ණ පාඩම ගොඩ නැගූ කරුණුවලට අදාළ රූප සටහන්, චිත්‍ර සිතියම් යනාදිය වෙත සිසු අවධානය යොමු කරමින් විෂය කරුණු ඉගැන්වීම.

**සාරාංශය:**

මෙම පියවර තුළ දරුවා විසින් පාඩමේ ඉගෙන ගත් දෙය විමසා බලා පුනරීක්ෂණයක් මගින් එය ස්ථිර කරනු ලැබේ. එම ස්ථිර කිරීම සහ පුනරීක්ෂණය පහත සඳහන් වන පියවර මගින් කර ගැනීමට උත්සාහ කරනු ලැබේ.

- විෂය කරුණු හා ඉගෙන ගත් දෑ පිළිබඳව අනුපිළිවෙලට ප්‍රශ්න ඉදිරිපත් කිරීම හා සිසුන් තමන්ගේම ස්ව උත්සාහයෙන් පිළිතුරු සැපයීම.
- කළුලෑල්ල මත ගොඩ නගා ඇති පාඩමේ ප්‍රධාන කරුණු තම අභ්‍යාස පොත් හි සටහන් කර ගැනීමට නියම කිරීම.
- පාඩමේ ප්‍රධාන විෂය කරුණු පිළිබඳ පන්තියේ දී, පාඩම අවසානයේදී සුළු තරගයක් පැවැත්වීම. එය එකිනෙකාගෙන් ප්‍රශ්න අසා උත්තර සැපයීමක් විය හැකි ය.

**ක්‍රියාකාරකම් ඇගයීම:**

පාඩමේ දී ශිෂ්‍යයා විසින් ඉගෙන ගත් කරුණු ජීවිතයට ගොඩනගා ගැනීමට ක්‍රියාකාරකම් හෝ ශිෂ්‍ය කාර්යය මගින් ශිෂ්‍යයාට අවස්ථාවක් ලැබේ. ආගම ධර්මය යම් දැනීමකට පමණක් සීමා නොකර, එය යම් ආකල්ප, සිතුම් පැතුම් මගින් ජීවන ක්‍රියාවලියකට ගොඩ නගා ගැනීමට යම් අවකාශයක් ලැබෙන්නේ මේ පියවරේ දී ය.

ක්‍රියාකාරකම් පහත දැක්වෙන ආකාරයට විවිධ විය හැකි ය.

- ප්‍රශ්නවලට උත්තර සැපයීම
- තමාගේ අත්දැකීමක් කෙටියෙන් ලියා දැක්වීම.
- කරුණු සොයාගෙන වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- මව්පියන්ගෙන් අතිරේක කරුණු සොයා ගෙන ඒම.
- චිත්‍රයක් ඇඳ එයට උචිත මාතෘකාවක් ලිවීම.
- ව්‍යාපෘතියක් නම් කිරීම.
- යමක් නිරීක්ෂණය කර, ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- කණ්ඩායම් වැඩ.
- ජනවන්දනාවේ කොටස් විග්‍රහ කර බැලීම.
- පුවත් පතකට වාර්තාවක් සැපයීම.

**ඇගයීම:**

ඇගයීම ගුරුවරයාගේ කාර්යයකි. සිසුන් ලබාගත් දැනුම ඔවුන් කෙතරම් අවබෝධ කර ගත්තේ ද යන්න සොයා බැලීමට ඇති මාර්ගය ඇගයීමයි. තවද, දක්ෂ සිසුන් තව තවත් උනන්දු කරවීමටත්, අදක්ෂ සිසුන් දිරිගැන්වීමටත් අවස්ථාව ලැබෙන්නේ සිසු කාර්යය ඇගයීමෙන් පසුව ය. සිසුන් නිම

කරන ලද කාර්යය කෙතරම් සාර්ථක දැයි දැනගැනීමට සිසුනට ආශාවක් ඇත. එම ආශාව ඉටු කළ විට තවත් කාර්යයන් නිම කිරීමට ඔවුන් තුළ උද්යෝගයක් ඇති වේ. එයින් ඉගැන්වීමේ කටයුතු තව තවත් සාර්ථක වේ.

## මානව කේන්ද්‍රීය ක්‍රමය:

**හැඳින්වීම:**
ගතානුගතික ධර්මෝපදේශයේ කේන්ද්‍රය වනුයේ දෙවියන් වහන්සේ හා දේව ධර්ම ශාස්ත්‍රයට අදාළ වන කරුණු වේ. නූතන ධර්මෝපදේශයට මනෝ විද්‍යාවෙන් ඇති වූ බලපෑම් නිසා නොපෙනෙන දෙවියන් වහන්සේ ගැන කථා කිරීමට පෙර පෙනෙන්නට ඇති මිනිසා ගැන කථා කිරීම වඩාත් සුදුසු යයි ධර්මෝපදේශ විශාරදයින් පිළිගත් හ. එබැවින් මානවයා කේන්ද්‍රය කරගත් ධර්මෝපදේශ ක්‍රමයක් බිහිවුණි. මෙය මානව කේන්ද්‍රීය ක්‍රමය යනුවෙන් හැඳින්වේ.

**මෙම ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ:**

- ආගම පාඩම හුදු දැනුමට පමණක් සීමා නොකර, එය සමාජ ජීවිතයට සම්බන්ධ කිරීම.
- සමාජයේ එදිනෙදා සිදුවීම් තුළින් දෙවිඳුන්ගෙන් නොකඩවා පවතින අනාවරණය දැක්වීම.
- ආගම පාඩමේ දී නිවෙස, පාසල, ගම, රට, ලෝකය යන ස්ථානවල දී විවිධ සිදුවීම් පෙන්වා දී ඒවා තුළින් නියම කිතුනු ආකල්ප ඇතිකර ගැනීමට මඟ පෙන්වීම.
- මානව අයිතිවාසිකම්, මානව යුතුකම්, මානව ගුණාංග, මානව උතුම්කම යනාදිය තුළින් මානව ජීවිතයේ වටිනාකම් පිළිබිඹු කර, මානව ජීවිතය වඩා යහපත් කිරීමට කිතුනු දර්ශනය ඉදිරිපත් කිරීම.
- යහපත් මානව සබඳතා වර්ධනය කිරීමට තුඩු දෙන කරුණු ඉදිරිපත් කර, ඒ මගින් මානව සමාජය දෙවිඳුන් වෙත යොමු කිරීම විවිධ ආගම් අතර සහජීවනය මෙහිදී වැදගත් වෙයි.

මානව කේන්ද්‍රීය ක්‍රමයට අනුකූලව ඉගැන්වීමේ දී පියවර හතරක් අනුගමනය කිරීමට සිදුවේ. මෙම පියවර හතර අනුව පාඩම ක්‍රමානුකූලව ගොඩ නඟා ගත යුතු ය. මානව ජීවිතය පිළිබිඹු කරන ශ්‍රව්‍ය දෘශ්‍යාධාර ඉතා පුළුල් ලෙස භාවිතා කිරීම ඉගැන්වීමේ කාර්යයේදී අපේක්ෂා කරනු ලැබේ. තව ද, ශුද්ධ ලියවිලි පාඨවලින් උචිත කොටස් තෝරා ගෙන එය පොදුවේ කියවා කිතුනු දර්ශනය තුළින් සමාජ සිදුවීම් අවලෝකනය කිරීම ද අපේක්ෂා කෙරේ.

**ප්‍රථම පියවර - මානව අත්දැකීම්:**

පාඩමට පිවිසීමේ දී මානව අත්දැකීම් ද එය ආරම්භ කිරීමට යෝග්‍ය වේ. මානව අත්දැකීම් යනු එදිනෙදා ජීවිතයට සම්බන්ධ වන සිද්ධියක් හෝ ප්‍රවෘත්තියක් හෝ කථාවක් නැතහොත් ළමා ලෝකයට විශේෂ වූ යම් සාධකයක් පාඩම හා සම්බන්ධ කර එය මගින් පාඩමට පිවිසීම අපේක්ෂා කෙරේ. මෙය චිත්‍රපටයක් හෝ නවකථාවක් හෝ රූපවාහිනී දර්ශන කථාවක් හෝ ජන කථාවක් හෝ එදිනෙදා ජීවිතයට සමීප වන අත්දැකීමක් හෝ විය හැකි ය. මෙම අත්දැකීම මගින් සිසුන් හා සංවාදයක් ගොඩ නගා ගත හැකි ය.

**දෙවන පියවර - සුවිශේෂ දර්ශන:**

මෙහිදී උචිත ශුද්ධ ලියවිලි පාඨයක් තෝරා ගෙන එය පැහැදිලිව ද, ගෞරවයෙන් යුතුව ද, කියවා, දේව ප්‍රකාශනයේ ආලෝකය මානව සිදුවීම වෙත යොමු කිරීම කළ යුතු ය.

**තෙවන පියවර - පාඩම් විස්තරය:**

මෙහිදී පාඩමට අදාළ විෂය කරුණු ඉතා පැහැදිලි ලෙස විස්තර කර දිය යුතු ය.
කළුලෑල්ල භාවිතය, ශ්‍රව්‍ය දෘශ්‍යාධාර භාවිතය යනාදිය උපයෝගී කරගත යුතු ය. විෂය කරුණු ක්‍රමානුකූලව පාඩමේදී ගොඩ නඟා ගත යුතු ය. සරල භාෂාව, සංයුක්ත අදහස්, උපමා, රූපක යනාදි භාෂා විලාශය භාවිතා විය යුතු ය.

**හතරවන පියවර - සිසු ක්‍රියාකාරකම්:**

මෙහිදී සිසුවාට ලැබුණ අභියෝගයට ඔහු කෙසේ පිළිතුරු දිය යුතු ද? යන ආකාරය විමසා බැලීම යෝග්‍ය වේ. විවිධ ක්‍රියාකාරකම්, අභ්‍යාස, විමර්ශන, වාර්තා කිරීම්, නිර්මාණ, අදහස්, ප්‍රකාශන, අත්දැකීම් වලට භාජනයවීම් වැනි විවිධ සිසු කාර්යයන්වල සිසුවා නියුතු කිරීම ඵලදායක වේ. තමා ඉගෙන ගත් දෑ ක්‍රියාවට නැංවීමට ඔහුට අවස්ථාවක් සැලසීම මෙම පියවර තුළින් අපේක්ෂා කෙරේ. සිසු කාර්යයන් නොමැති පාඩමක් අසම්පූර්ණ පාඩමක් බව මෙහි දී මතක තබා ගත යුතු ය.

# අටවන පාඩම

## 8. මධ්‍යම හා නූතන යුගයේ ශු. සභා ඉතිහාසය (හයවන සියවසේ සිට නූතන යුගය දක්වා)

### 8.1 අපරදිග ලෝකය මත බලපෑ සභාව (ක්‍රි.ව. 700-1300)

ක්‍රි.ව. 750 දී, රවෙන්නා නගරය ලොම්බඩ්වරුන් යටතට පත්විය. පෙරදිග අගරජ උදව් නොකළ නිසා, දෙවන ස්ටීවන් පාප්තුමා ප්‍රැන්ක්වරුන්ගේ සහාය පැතුවේ ය. ඒ අනුව, ක්‍රි.ව. 754 දී ප්‍රැන්ක් නරපති පෙපෑන් රෝමවරුන්ගේ ආදි පිතෘවරයා වශයෙන් අභිෂේකය ලැබුවේ ය. මෙම නව සැලැස්ම පූර්ණත්වයට පත්වූයේ, ක්‍රි.ව. 800 දී නත්තල් දින පෙපෑන් රජුගේ පුත් චාර්ලමෙන් රෝම අගරජ වශයෙන් ද, ශුද්ධාසනයේ ආරක්ෂකයා වශයෙන් ද, තුන්වන ලියෝ පාප්තුමන් විසින් ඔටුණු ලැබීමෙනි. සිය අධිරාජ්‍යය තුළ රෝමානු රීතුවට (ලතින් භාෂා මාධ්‍යයන්, ආගමික වතාවත් පැවැත්වීම) අදාළ වත්පිළිවෙත් හා රෝම විනය, නීති ක්‍රියාත්මක කිරීම චාර්ලමේන් සතු වගකීම විය.

රදගුරුවරුන් හා තාපස නිකායන් (ඇබට්වරුන්) පත්කිරීමටත්, රදගුරු සංසදයන් මෙහෙයවීමටත් බලය අග රජුට පැවරිණි. මෙලෙස සුදු පියාගේ කාර්යභාරය තරමක් පසෙකට යැවිණි. සභාව හා රජය අතර පරතරය ක්‍රමයෙන් මැකී ගියේ ය.

ක්‍රි.ව. 1050 දී පමණ යුරෝපයේ සමාජයීය, ආර්ථික හා දේශපාලනමය වශයෙන් තරමක ස්ථාවර භාවයක් ජනිත විය. දර්ශන විද්‍යාව, දේව ධර්ම ශාස්ත්‍රය හා නීති විද්‍යාව හදාරණ ගිහි පිරිසක් බිහිවිය. ආධ්‍යාත්මික නවෝදයක් දියත් කරමින් පීටර් ඩේමියන් (ක්‍රි.ව. 1072), කාදිනල් හම්බර්ට් (ක්‍රි.ව. 1061) වැනි උගත්හු වෙහෙසුණ හ. මුළු කිතුනු ලොවම යහපත වෙත නැඹුරු කිරීම මොවුන්ගේ අරමුණ විය. 7 වන ග්‍රෙගරි පාප්තුමා (ක්‍රි.ව. 1085) නායකත්වය ගනිමින්, සභා නිලතල හා වරප්‍රසාද සම්පත් විකිණීම, සභා දේපළ රදගුරුවරුන්ගේ ද, පූජකවරුන්ගේ දරුවන්ට පැවරීම සහ රජවරුන් විධාන (ඩික්ටාටුස් පාපේ) සහ ශුද්ධාසනික අධිකරණය (රෝම ක්‍යුරියාව) හේතු කොටගෙන තෙවන ඉනොසන්ට් (ක්‍රි.ව. 1216) ශුද්ධෝත්තම පියතුමාගේ පාලන කාලයේ දී බටහිර ජාතීන් අතර ශුද්ධාසනයට අසමසම බලයක් ආරෝපිත විය. කැනන් ලෝ හෙවත් ශුද්ධාසනික නීතිය පෙරමුණ ගත්තේ ය. ප්‍රසාද නිධාන හා සම්බන්ධ ආධ්‍යාත්මිකභාවය යටපත් වී, නීතිමයභාවය ඉස්මතු විය.

ක්‍රි.ව. 1234 වන විට, ශු. සභාව නීතිමය පාලන සංස්ථාවක් බවට පත්විය. ගිහියා ද තාපසයා ද නිතී පිළිපදින්නන් බවට පත් වූහ. වැඩවසම් ක්‍රමයට නෑකම් කියන දිවුරුම් පිළිවෙත සභාව තුළ ද ක්‍රියාත්මක වූයෙන්, රදගුරුවරු පාප්තුමන්ට විශ්වාස පක්ෂව කටයුතු කරනා බවට දිවුරුම් දුන්හ. ශු. සභාවේ මධ්‍යගත බලය පාප්තුමා සතුවිය. එතුමන් රාජාභිමානයෙන් ඔටුනු පළන්දනු ලැබීම ද මේ වකවානුවේ දී ඇරඹුණි. මෙම සිරිත 1978 දක්වා පැවතිණි. පළමුවන ජුවාම් පාවුළු පාප්තුමා ද, දෙවන ජුවාම් පාවුළු පාප් තුමා ද ඔටුන්න ප්‍රතික්ෂේප කරමින් සභාවේ එඬේරික පාලනය කරට ගත්හ.

සභාවේ ලෞකික බලය වැඩිවෙත් ම, අභ්‍යන්තර ආධ්‍යාත්මික ජීවය අඩපණ විය. එහෙත් පූජකවරුන්ට බ්‍රහ්මචාර්ය අනිවාර්ය වීම හා නව තපස් නිකායයන් බිහිවීම (කමල්ඩොලීස් සා. රොමුවල්ඩ් ක්‍රි.ව. 1027 දී ඇරඹූ, කාතුසියන් - සා බෲනෝ ක්‍රි.ව. 1101 ඇරඹූ. සිප්රේෂියන් - සා රොබට් මොලෙස්මේ ක්‍රි.ව. 1111 සහ සා. බර්නාඩ් ක්‍රි.ව. 1153 ඇරඹූ මෝල්ටා නයිට්වරු, ටෙම්ප්ලාර් නයිට්වරු, ටියුටොනික් නයිට්වරු ***(නයිට්වරු වූ කලී පැවිදි වීර සේවක පිරිසකි. සදාචාරය රැකීමත්, යුක්තිය හා සාධාරණත්වය සඳහා සටන් කිරීමත් මොවුන් සතු යුතුකම විය.)*** සභාවේ ආධ්‍යාත්මකභාවයට නව ජීවනයක් ගෙන දීමට හේතු විය. බයිබල් අධ්‍යයන කණ්ඩායම් පිහිටුවා ගත් ගිහියෝ කැපවුණු ගිහි ජීවිත තත්ත්වයට ඇතුළු වූහ.

පලස්තීනයේ ශුද්ධාසනය, සැරසන්වරුනගෙන් මුදා ගැනීම සඳහා දියත් කරන ලද කුරුස යුද්ධ හේතුකොට ගෙන පහත දැක්වෙන දේ උදා විය.

- කිතුනු යුරෝපයේ ආගමික ජ්වලිතකම පුනර්ජීවය ලැබීම.

- කිතුනු සාමූහික බලය ඉස්මතු විය.
- පෙරදිග ශිෂ්ටාචාරයේ ආභාෂය බටහිර ක්‍රිස්තියානියට විවෘත විය.
- එම ආභාෂයේ හේතුවෙන් අපරදිග කිතුනු සභාව තුළ දේව ධර්ම ශාස්ත්‍රය හා දර්ශන විද්‍යාව සංවර්ධනය වීම.

මැදි යුගයේ සාන්ත බර්නඩ්තුමා සභා මාර්ගෝපදේශකයා වශයෙන් ගැනෙයි. එතුමා පාප්වරුන්ට ද අවවාද කරමින් ලෞකික නායකයන් වශයෙන් නොව, එඬේර පාලකයන් වශයෙන් ද දිවැසිවරුන් වශයෙන් ද ශුද්ධ වූ සභාවේ දෘශ්‍යමාන නායකයන් ද ලෙස කටයුතු කිරීම යෝග්‍ය වන බව ප්‍රකාශ කළේ ය. තවද මේ සාන්තුවරයා දේවමාතා භක්තියට ප්‍රබල ඉදිරි තල්ලුවක් ද දුන්නේ ය.

සභාවේ දේව ධර්ම ශාස්ත්‍රිය පදනම තහවුරු කිරීමෙහි ලා අත දුන් තවත් පඬිවරයෙකි. සාන්ත ඇන්සලම් තුමා. එතුමා එංගලන්තයේ කැන්ටබරිහි අගරදගුරු තනතුර දැරුවේ ය. එතුමන්ද පණ දුන් ශාස්ත්‍රිය ව්‍යාපාරය හේතු කොටගෙන 13 වන ශත වර්ෂය ආරම්භයේ දී දේව ධර්ම ශාස්ත්‍රිය ආයතන කිහිපයක් එක්වීමෙන් පැරීසියේ විශ්ව විද්‍යාලය බිහිවිය. එම තැන ව්‍යාප්ත වීමේ හේතුවෙන්, බොලොඤ්ඤා, පාදුවා, නේපල්ස්, මොන්ට්පෙලියර්, ඔක්ස්පර්ඩ්, කේම්බ්‍රිජ්, සලමන්නා හා වලෙන්සියා වැනි නගරවල ද සරසවි විවෘත කරන ලදී. වේද භේදික මතයනට (ඇල්බිජෙන්සින් හා වොල්ඩෙන්සියන් නමැති වේද භේද) විරුද්ධව නව බලප්‍රහාරයක් බිහිවුයේ අසීසියේ සාන්ත ප්‍රැන්සිස් තුමන් හා ස්පාඤ්ඤයේ සාන්ත දොමිනික් තුමන් විසින් අරඹන ලද ප්‍රැන්සිස්කාන හා දොමිනිකාන තාපස නිකායයන්ගේ ධර්ම දූත සේවාව හේතුකොටගෙන ය. මොවුහු ධර්මදානයෙහි ලා උත්සුක වූහ. සුවිශේෂ අනුශාසනාවෙන් එනම් දිළිඳුකම, කීකරුකම හා පිරිසිදු කම මැනවින් ක්‍රියාත්මක කළ හ. මොවුන්ගේ ජීවිත සාක්‍ෂ්‍යය දුටු බොහෝ කිතුනුවෝ වේද භේදිත මත ප්‍රතික්‍ෂේප කරමින් ශු. සභාවට අවනතව ජීවත් වූහ.

**දේව ධර්ම ශාස්ත්‍රයේ නවෝදයට පහත දැක්වෙන තාපස තුමන්ලා ද අත දුන්හ.**

| | | | |
|---|---|---|---|
| ⋆ දොමිනිකාන නිකාය | - | සාන්ත ඇල්බට් | (ක්‍රි.ව. 1280) |
| | - | සාන්ත තෝමස් ඇක්වයිනස් | (ක්‍රි.ව. 1274) |
| | - | මාස්ට එක්හාට් | (ක්‍රි.ව. 1328) |
| ⋆ ප්‍රැන්සිස්කාන නිකාය | - | හේල්ස්හි ඇලෙක්සැන්ඩර් | (ක්‍රි.ව. 1245) |
| | - | සාන්ත බොනවැන්චර් | (ක්‍රි.ව. 1274) |
| | - | ඩන්ස් ස්කෝටුස් | (ක්‍රි.ව. 1308) |

දිළිඳු දිවි පෙවෙත හා ධර්මදානය ද ස්ථිර ඇදහිල්ල හා භක්තිය ද මෙම තාපස නිකායයන්ගේ විශේෂ ලක්‍ෂණ විය.

### 8.1.1 ග්‍රීක ඕතඩොක් සභාව බිහිවීම.

ක්‍රි.ව. 451 සිට පෙරදිග පැවැති සභාව හා අපරදිග පැවැති සභාව අතර සුහදතාවය එතරම් ස්ථාවර නොවීය. මෙයට සභා ඉතිහාසයෙහි සංකීර්ණ තත්ත්වය හේතු දැක්වෙයි. එක් පිළකට දොස් තැබීම සාධාරණ නොවෙයි. 1043 දි පෙරදිග පැවැති සභාවේ නායකත්වයට පැමිණි රදගුරු මයිකල් සෙරුලාරියුස් තුමා ශුද්ධාසනය ගැන පහත් අදහස් දැරුවේය. බටහිර පැවැති සභාවේ නායකයා වශයෙන් පාප්තුමා ක්‍රියාත්මක කළ නවෝදය සම්බන්ධව එතරම් පැහැදිලි සංකල්ප සෙරුලාරියුස් තුමා සතු නොවීය. ලතින් පිළිවෙත් හා ග්‍රීක පිළිවෙත් භාවිතා කිරීම ගැන ද යම් යම් අර්බුද හට ගැනිණි. පාප්තුමාගේ නායකත්වය, අවිවාහක පූජක පත්වීම, නුමුහුන් පූප භාවිතය ගැන ද ඔහුට ගැටළු ඇති විය. මේ සම්බන්ධව පාප්තුමන්ගේ නියෝජිතයෝ හිතුවක්කාර ලෙස ක්‍රියා කරමින්, සෙරුලාරියුස් තුමන් ද, පෙරදිග අගරජු ද, ඔවුන්ගේ අනුගාමිකයන් ද සභාවෙන් නෙරපන ලද බවට නියෝග පත්‍රයක් කොන්ස්තන්තිනෝපල් හි සාන්ත සෝපියා දෙව්මැදුරේ පුදසුන මත තබා පිටත්ව ගියහ. ඉන් ඉක්බිති ලතින් රීතුවට විරුද්ධව මහජන රැල්ලක් ඇති විය. එහි ප්‍රතිඵලය වුයේ ශුද්ධාසනික නියෝග පත්‍රය ප්‍රසිද්ධියේ පිළිස්සීමත්, පෙරදිග රදගුරු සංසදයන් මඟින් ඉහත සඳහන් සුදසුන් නියෝජිතයන් තීන්දු කරනු ලැබීමත් ය. මේ හේතුවෙන් සභාව තුළ පෙරදිග - අපරදිග භේදය දියුණු තියුණු විය.

දෙවන උර්බානු පාප්තුමා (ක්‍රි.ව. 1099) සාම මාවතක් විවෘත කළ ද, 4 වන කුරුස යුද්ධයේ දී (ක්‍රි.ව. 1202 - ක්‍රි.ව. 1204) අන්තියෝක් නගරය සම්බන්ධව පෙරදිග අගරජ හා කුරුස යුද්ධය

මෙහෙය වූ හමුදාපතීන් අතර ගැටුමක් ඇති විය. ග්‍රීක පේට්‍රියාක් තුමන් පලවා හැර ලතින් නායකයකු පත් කළ කුරුස යුද නායකයා ක්‍රි.ව. 1203 දී කොන්ස්තන්තිනෝපල් නගරය විනාශ කළේ ය. මේ හේතුවෙන් පෙර සඳහන් භේදය වඩාත් පුළුල් විය. 1276 දී ලියෝන්ස් නගරයෙහි පැවැති ජගත් මන්ත්‍රණ සභාව ද ක්‍රි.ව. 1439 දී ප්ලෝරන්ස් නගරයෙහි පැවැති ජගත් මන්ත්‍රණ සභාව ද සාමය ඇතිකර ගැනීමට උත්සාහ දැරු නමුත් නූතන දෙවැනි වතිකාන මන්ත්‍රණ සභා සමය වන තෙක් එම භේදය අඛණ්ඩව පැවතිණි.

## 8.2 ඒකත්වය බිඳීයාමෙන් පුළුල් ධර්මදූත සේවාවක් වෙත එළැඹි සභාව (ක්‍රි.ව. 1300-1750)

13වන ශත වර්ෂය අවසාන වන විට, අපරදිග පැවැති සභාව තුළ යම්කිසි දියුණුවක් විද්‍යාමාන විය. ජනවන්දනාව රෝම පිළිවෙත අනුව සංවිධානය කෙරිණි. රොමැනස්ක් (රෝම ගෘහ නිර්මාණ ශිල්ප කලාව අනුව), ගොතික් (ප්‍රංශ, ජර්මන්. ස්පාඤ්ඤ ගෘහ නිර්මාණ ශිල්පය අනුව), හුරුවට විශාල අලංකාර දේවස්ථාන ගොඩනැගිණි. ජපමාල භක්තිය, ශුද්ධවන්තයන්ට ගෞරව කිරීම. පශ්චත්තාපී වන්දනා ගමන්, නත්තල් ගවලෙන, පූර්ණ එල ගෙන දෙන යාච්ඤා වැනි ආගමික අභ්‍යාස හා කිතුනු චාරිත්‍ර ව්‍යාප්ත විය.

වේද භේදිකයනට දඬුවම් පැමිණවීම සඳහා අරඹණ ලද වේදරක්ෂණ අධිකරණ මඟින් යහපතක් සිදුවුයේ ද යනු ප්‍රශ්නයකි. වරදකරුවන් පුළුස්සා දැමීම නූතන කිතුනු ඇසට මෙන්ම සාන්ත ජෝන් ක්‍රිසොස්තම් හා මහා සාන්ත බර්නාඩ් වැනි පැරණි සභා පඬිවරුන්ට ද අප්‍රසන්න දර්ශනයක් විය. මැදි යුගයේ දී කිතුනු යුරෝපය ආගමික වශයෙන් ද, දේශපාලනමය වශයෙන් ද සමමිතික වීමේ හේතුවෙන්, වේද භේදයන් සමාජ විරෝධී ව්‍යාපාරයන් හැටියට ගැනුණා විය හැකි ය. සභාව තුළ මිනිස් දුබලතාවය මෙහිදී ඉස්මතු වෙන බව ඔබට ප්‍රත්‍යක්ෂ වනවා ඇත. එහෙත් ඉතිහාසමය සිද්ධීන් උචිත පසුබිමෙහි ලා අධ්‍යයනය කරන විට අපට සාධාරණ අර්ථ නිරූපණයක් වෙත එළැඹිය හැකි ය.

ක්‍රි.ව. 1300-1500 දක්වා කාලය තුළ ශුද්ධාසනයේ බලය උච්ච ස්ථානයකට නැංගේ ය. එය ප්‍රාදේශිය දේශපාලනමය බලය සමඟ ගැටෙයි ද යන්න ප්‍රශ්නයක් විය. එහෙත් විවිධ යුරෝපීය ප්‍රාන්තයන් තුළ ජාතිවාදි හැඟීම් උදාවූ හෙයින් සභාවට අසීමිත බලයක් අත් නොවීය. මෙම වකවානුවේ දී රෝමයෙහි ජර්මන් බලපෑම් අධික වූයෙන් සභාව තුළ යම්කිසි ලෞකික ගතියක් ඉස්මතු විය. පාප්තුමන් ප්‍රංශයේ අවිඤ්ඤාන්හි වාසය කිරීම තරමක ආශිර්වාදයක් වන්නට ඇත. නොබෝ කලකින් උද්ගත වූ අවාසනාවන්ත තත්ත්වය, එනම් රෝමයෙහි එක් පාප්තුමෙක් ද, අවිඤ්ඤාන්හි තවත් පාප්තුමෙක් ද එකවර ශුද්ධාසනයට හිමිකම් කීම කිතුනු සභාව තුළ විශාල අවාදර්ශයක් මෙන් ගත හැකි ය. ක්‍රි.ව. 1417 දී කොන්ස්ටන්හි පැවැති ජගත් මන්ත්‍රණ සභාව විසින් මෙම ගැටළුව විසඳන ලදී. එහෙත් ඒ වන විට බටහිර පැවැති කිතුනු සභාව තදබල ලෙස අබලන් විය.

සභාව සතුවූ මහා ධනස්කන්ධය හරිහැටි පරිහරණය කිරීමට නොදත් පාලකයන් තැනින් තැන සිටීමේ හේතුවෙන් සභාවේ මුහුණුවර අවාදර්ශී බවෙන් විකෘති විය. ප්‍රති සංවිධානයක අවශ්‍යතාවය කැපී පෙනුන ද එවැන්නක් සිදු නොවී ය. ක්‍රි.ව. 1400 දී ඇති වූ ශාස්ත්‍රිය නවෝදයේ (ද රෙනෙයිසාන්ස්) හේතුවෙන් ද ඉතාලියේ පාප්වරු කලාත්මක ප්‍රතිසංවිධානයක් දියත් කළ ද ආගමික වශයෙන් ද සමාජ ක්ෂේත්‍රයෙහි ද ක්‍රිස්තුන් වහන්සේ තමනට පැවරු වගකීම නිසි ලෙස ඉටු නොකළ බව කිව යුතු ය. මෙම තත්ත්වය රෙප්‍රමාදු විප්ලවයට තුඩු දුන් බව පැහැදිලි වෙයි.

## 8.3 යුරෝපය තුළ සභාව බෙදීයාම

### 8.3.1 සභාව බෙදීයාමේ පසුබිම

දහසයවන සියවසේ දී යුරෝපය තුළ සමාජීය හා ආර්ථික අංශයෙහි ශීඝ්‍ර දියුණුවත් ඇති වූ කාල සීමාවකි. විද්‍යාවේ දියුණුව මෙන්ම දේශීය සහ දේශාන්තර වෙළෙඳ දියුණුව ද ඇති වූ කාල සීමාවකි. කලා ශිල්ප අතින් ඉමහත් දියුණුවක් ලබා තිබූ කාල පරිච්ඡේදයකි.

මධ්‍යතන යුගයේ දී කතෝලික සභාව ද වාණිජකරණයට හසුවී බොහෝ දුරට ලෞකිකත්වය රජ කරන්නට විය. එවකට සිටි බොහෝ පාප්තුමන්ලා ආධ්‍යාත්මිකත්වයෙන් පිරිහුණු අය වූහ. කාර්දිනල්වරු, රදගුරුවරු, පූජකවරු විවිධ රජවරුන්ගේ වුවමනා එපාකම් සිදුකිරීමට බැඳී සිටිනු දක්නට ලැබිණි. දේවධර්මය හා චර්යා රටාවල් පහළ මට්ටමක පැවැතිණි. ගිහි ජනතාවගේ ජීවිත පැවැත්ම පැවිදි හා පූජක ජීවිතයට වඩා පහත්යයි අර්ථ නිරූපණය කෙරිණි. ශු. ලියවිලි පරිහරණය කිරීමේ දී සභාව විසින් විවිධ සීමාවන් දමා තිබිණි. පූර්ණඵල මුදලට විකිණෙනට විය. බොහෝ පූජක පැවිදි අයගේ ජීවිත රටාව සුඛෝපභෝගි විය. සාමාන්‍ය ගිහි ජනතාව සභා ජීවිතයෙන් ක්‍රමයෙන් ඈත්වන තත්වයකට පත්විය.

### 8.3.2 මාටින් ලූතර්ගේ විප්ලවය (ක්‍රි.ව. 1483 - 1546)

මාටින් ලූතර් ජර්මන් ජාතික දේවධර්මවේදියකි. ප්‍රොතෙස්තන්ත රෙප්‍රමාදු ධර්මයේ ආරම්භකයා ඔහු ය. ක්‍රි.ව. 1483 නොවැම්බර් මස 10 වන දින උපත ලැබූ ඔහු ඉගෙනීමේ අති දක්ෂයකු විය. ක්‍රි.ව. 1507 දී අගුස්තීනු නිකායේ පූජකවරයකු ලෙස පත්විය. ක්‍රි.ව. 1512 දී ආචාර්ය උපාධිය ලැබීය. පසු කලක ජර්මනියේ විටින්බර්ග් විශ්ව විද්‍යාලයේ දේවධර්මය ඉගැන්වීමේ කතිකාචාර්යවරයෙක් විය.

එක් අවස්ථාවක රෝමයේ සංචාරයක නියුතුවූ ලූතර් දුටුවේ සභාවේ නායකයන්ගේ අක්‍රමිකතාවයන් ය. මේ ගැන බලවත් සිත් තැවුලකට පත් ඔහු සභාවේ අනියම් ක්‍රියා හෙළිකරමින් ලේඛනයක් ක්‍රි.ව. 1517 ඔක්තෝබර් මස 17 වන දින ප්‍රකාශයට පත් කළේ ය. එහි චෝදනාත්ම වගන්ති 95 ක් අඩංගුවිය. මෙහිදි ප්‍රධාන වශයෙන් මුදල්වලට පූර්ණඵල විකිණීම ගැන ලූතර් චෝදනා නගා තිබිණි. ක්‍රි.ව. 1520 වසරේ ජුනි මස 15 වන දින ලූතර්ගේ ඉගැන්වීම් දසවන ලියෝ පාප්තුමා හෙළා දකින ලදී. පසුව ක්‍රි.ව. 1521 ජනවාරි මාසයේ දී පමණ ඔහුව සභාවෙන් නෙරපා දමන ලදී. මෙහි ප්‍රතිඵලය වූයේ රෝමයේ පාප්තුමාගේ නායකත්වයෙන් පැවැති බටහිර කිතුනු සභාව දෙකඩ වීම ය.

**ලූතර්ගේ ඉගැන්වීම්**

- ''ගැලවීම සඳහා ඇදහිල්ල හා විශ්වාසය පමණක් සෑහේ'' යන ඉගැන්වීම.
- දස පණත මගින් සිදුවනුයේ සිය පාපි බව මිනිසාට මතක් කර දීම පමණි යන ඉගැන්වීම.
- බෞතිස්මය හා සත්ප්‍රසාද පිළිවෙත පමණක් ප්‍රසාද නිධාන වශයෙන් ගැනීම.
- පූපය හා මිදියුෂ දිව රහස් කිරීමේ දී ඒවායේ භාවාර්ථය වෙනස් නොවන බව ඉගැන්වීම.
- සුදු පියාණන්ගේ නායකත්වය ප්‍රතික්ෂේප කිරීම.
- පූජකවරය හා බ්‍රහ්මචාරිය හෙළා දැකීම.
- ජන්ම පාපය නිසා සෑම මිනිසකුම පාපයේ වහල්කරුවකුව ඇත.
- මිනිසා පාපයට වහල්ව ඇති බැවින් තමන්ගේ ගැලවීම ලබා ගැනීමට තමන්ට නොහැකි ය.
- තම තමන්ගේ භාෂාවලින් දේව මෙහෙයන් පැවැත්වීම වැඩදායක ය. ලතින් භාෂාව අවශ්‍ය නැත.
- මරණින් පසු ස්වර්ගය හෝ නිරය විනා ශුද්ධිකාග්නි ස්ථානයක් වැනි තැනක් හෝ තත්ත්වයක් නැත.
- පූර්ණ ඵල මගින් හෝ වෙනත් ධර්ම ක්‍රියා මගින් මළවුන්ට සහය වීමට අපට නොහැකි ය.
- ශුද්ධෝත්තම පියතුමන් විසින් පූර්ණඵල ප්‍රදානය කිරීම අයුතු ලාභ ලැබීමකි.
- ශු. බයිබලයේ සමහර ග්‍රන්ථ දේවානුභාවයෙන් ලියවී නැත.

### 8.3.3 ජෝන් කැල්වින් සහ ස්වින්ග්ලි

**ජෝන් කැල්වින් (ක්‍රි.ව. 1509 - 1564)**

ප්‍රංශයේ උපත ලද ජෝන් කැල්වින් පැරිස් නුවරින් දේවධර්මය හා නීතිය හදාරා තම තරුණවියේ දීම ලූතර්ගේ ප්‍රොතෙස්තන්ත රෙප්‍රමාදු ප්‍රගමනයට නායකත්වය දෙන්නට ඉදිරිපත් විය. ජෝන් කැල්වින් විසින් රචිත ''ක්‍රිස්තියානි ධර්මායතන'' යන ග්‍රන්ථයෙන් තම ඉගැන්වීම් පැහැදිලි කර දී ඇත. කැල්වින් ශුද්ධවූ බයිබලයේ සඳහන් නොවන සෑම ඇදහිල්ලක්ම ප්‍රතික්ෂේප කළ අතර ඔහුගේ අනුගාමිකයන්ගේ විශ්වාසය ශුද්ධවූ ලියවිල්ල මත

පමණක් පදනම් කරගත යුතු බවට අනිවාර්ය කළේ ය. ජෝන් කැල්වින් රෙප්‍රමාදු සහ ප්‍රෙස්බිටේරියන් යන සභාවල නිර්මාතෘවරයා ය.

***ජෝන් කැල්වින්ගේ ඉගැන්වීම***

- ★ දෙවියන් වහන්සේගේ උති උසස් කමත් - මිනිසාගේ අන්ත දුබලකමත් ප්‍රකාශ කරයි.
- ★ හොඳ හෝ නරක මිනිසාට කළ නොහැකි අතර ඒ සියල්ල දේව අභිප්‍රාය අනුව සිදුවේ.
- ★ ජීවිතයේ විනය විශේෂ වේ.
- ★ ලැබී තිබෙන සම්පත් ඒ විනය අනුව හරියාකාරව පරිහරණය කළ යුතු වේ.
- ★ දේව මාතා භක්තිය, ශුද්ධවරයන්ට ගෞරවය කිරීම, දිව්‍ය පූජාව නොපිළි ගනී.

***උල්රිච් ස්වින්ග්ලි (ක්‍රි.ව. 1483 - 1531)***

ස්විස්ටර්ලන්ත ජාතිකයෙකු වූ ස්වින්ග්ලි කතෝලික ධර්ම විරෝධී ව්‍යාපාරයක් ගෙන ගිය අයෙකි. ආත්ම ගැළවීම පිණිස මනුෂ්‍යයාට නිදහස් කැමැත්ත සහාය වන බව නොපිළිගෙන ආරම්භයේ සිටම දේව කැමැත්ත අනුව සමහරුන් මෝක්ෂයටත්, අන් සමහරුන් නිරයටත් නියම වී තිබෙන බව ස්වින්ග්ලි ඉගැන්වීය. හොඳ නොහොඳ, යහපත අයහපත, තෝරාගැනීම අපගේ වගකීමෙන් තොර දේව දෛවයේ තීරණයක් බව ස්වින්ග්ලිගේ ඉගැන්වීමක් විය. ස්වාමින් වහන්සේගේ අවසන් රාත්‍රි භෝජනය හුදෙක් සැමරුමක් පමණක් බවත් එය සිහිකිරීමක් ලෙස අප පුදන දිව්‍ය යාගය තුළ ලබන්නාවූ දිව්‍ය සත්ප්‍රසාදය මඟින් සැබෑ ලෙස ක්‍රිස්තුන් වහන්සේව අපට නොලැබෙන බවත් පැවසීය. ක්‍රි.ව. 1529 දී ලූතර් මුණ ගැසී ඔහු සමඟ ධර්ම එකඟත්වයකට පැමිණීමට උත්සාහ දැරූ නමුත් දෙදෙනා භේද වූහ. පසු කාලයක කතෝලික පිරිස් හා ඇති වූ සිවිල් යුද්ධයක දී ස්වින්ග්ලි සටන් බීමේදී මරණයට පත්විය.

***උල්රිච් ස්වින්ග්ලිගේ ඉගැන්වීම***

- ★ ආගමික කටයුතු සඳහා ප්‍රතිමා භාවිතය හා දිව්‍ය පූජාව ද ඔහු විසින් ප්‍රතික්ෂේප කරන ලදී.
- ★ ආත්ම ගැළවීමට මිනිසාගේ නිදහස් කැමැත්තට ඉඩක් නැති අතර එය දේව කැමැත්තේ අනුව සිදු වේ.

### 8.3.4 එංගලන්ත සභාව බිහිවීම

එංගන්තයේ සිටි අටවෙනි හෙන්රි රජතුමා (ක්‍රි.ව. 1507-1547) කතෝලික විශ්වාසය රැකගත් දැහැමි රජෙක් විය. ක්‍රි.ව. 1517 දී ලූතර් ආරම්භ කළ ආගම් විප්ලවයට අටවැනි හෙන්රි රජු තදින් විපක්ෂ වූවා පමණක් නොව ලූතර්ගේ මතය හෙළා දකිමින් සක්‍රමේන්තු හත පිළිගත් විශිෂ්ට ලිපියක් පළ කර ''සමයාරක්ෂක'' යන ගෞරව සම්මානය ක්‍රි.ව 1521 දී දසවන ලියෝ පාප්තුමන් අතින් ලබා ගැනීමට වරම් ලත් අයෙක් විය.

අටවෙනි හෙන්රි රජු විවාහ වී සිටියේ කැතරින් කුමරිය සමඟ ය. හෙන්රි රජුගෙන් කැතැරින් කුමරියට දාව පුතෙකු නොමැතිවීම ගැන හෙන්රි රජු සිටියේ කණගාටුවෙන් ය. ඒ මන්ද යත් තමන්ගෙන් පසු සිහසුන බාරදීමට පුතෙකු බලාපොරොත්තුවීම ය. තම බිරිඳ දික්කසාද කර වෙනත් බිසවක් සරණ පාවා ගැනීමට රජුට අවශ්‍ය විය. එවකට සිටි 7 වන ක්ලෙමන්ට් නැමති පාප්තුමාගෙන් රජු දික්කසාදය සඳහා අවසර ඉල්ලූ කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. එවකට කැන්ටබරියේ අගරදගුරුතුමාව සිටි කාදිනල් වෝල්සේ මාර්ගයෙන් කළ ඉල්ලීමෙන් ද ප්‍රතිඵලයක් නොවූ නිසා හෙන්රි රජු ක්‍රි.ව. 1529 දී කාදිනල් වොල්සේව තනතුරින් පහකර දමා තමාගේ හිතවතෙකු වූ සර් තෝමස් මුවර් නමැති කතෝලික නීතිඥයාව එංගලන්තයේ කුලපති ලෙස පත් කර ගන්නා ලදී. නමුත් සර් තෝමස් මුවර් පාප්තුමාට යටහත් පහත් කතෝලිකයකු වශයෙන් තම මිතුරු හෙන්රි රජතුමා තමන්ට දුන් තරතුර බාරගැනීමට පෙර තමාට රජුගේ දික්කසාදය පිළිබඳ ප්‍රශ්නයට මැදිහත් වන්නට නොහැකි බව රජුට ප්‍රකාශ කර සිටියේ ය.

අවසානයේ දී ක්‍රි.ව. 1534 දී අටවන හෙන්රි රජතුමා එංගලන්ත සභාව පිහිටුවා එහි නායකත්වය ද ඔහුටම පවරා ගත්තේ ය. ඔහු කතෝලික සභාව හා විශේෂයෙන් රෝමය සමඟ ඉතා අමනාපයෙන් කටයුතු කළේ ය. තෝමස් මුවර් පියතුමා ද තම තනතුර පිළිගැනීමේ දී එංගලන්තයේ රජු ඉදිරිපිට කළ යුතු ව තිබූ පොරොන්දු ගැනීම පවා ප්‍රතික්ෂේප කළේ ය. ඔහු කළ දේ නීත්‍යානුකූල නොවුණ ද එංගලන්ත නීති ක්‍රමයේ පැවති නිශ්ශබ්දභාවය නිසා තෝමස් මුවර් පියතුමාට එරෙහිව කිසිදු නීතිමය පියවරක් නොගත්තේ

ය. එහෙත් හෙන්රි රජතුමා ඔහුට සමාව නොදුන් අතර පසුව ක්‍රි.ව. 1535 දී තෝමස් මුවර් පියතුමාගේ හිසගසා දැම්මේ ය. මෙලෙස තෝමස් මුවර් පියතුමා කතෝලික විශ්වාසය ආරක්ෂා කිරීමෙහි ලා දිවිපිදූ ප්‍රාණපරිත්‍යාගිවරයකු බවට පත්විය. පසු කලෙක රොචෙස්ටර්හි රදගුරුවරයාව සිටි ජෝන් ෆිෂර්ව ද හිසගසා මැරුවේ ය. තෝමස් මවුර් පියතුමා හා ජෝන් ෆිෂර් තුමා පසු කලෙක කතෝලික සභාව විසින් සාන්තුවර භාවයට ඔසවන ලදී.

එංගලන්ත සභාව මුල් කාලයේ දී පාප්තුමාගේ අධිකාරී බලය ප්‍රතික්ෂේප කරමින් කතෝලික සභාවෙන් ඉවත්ව ගිය ද පසුව කැල්වින්වාදයට හසුවී බොහෝ ලෙස ප්‍රොතෙස්තන්ත ස්වභාවයක් ගත්තේ ය. ක්‍රි.ව. 16 වන හා 17 වන සියවස් වලදී එංගලන්තය තුළ කතෝලිකයෝ ඉතා දැඩි ලෙස පීඩාවට පත් කරනු ලැබූහ. පාප්තුමාට යටහත් පහත් අය දේශපාලන වශයෙන් රජයට විරුද්ධ පිරිසක් ලෙස ඔවුහු හංවඩු ගැසූ හ. නමුත් පසුව කාලයාගේ ඇවෑමෙන් එංගලන්ත සභාවෙන් වැඩි කොටසක් නැවතත් කතෝලික ස්වරූපයක් ගත්තේ ය. මේ අතර විශේෂයෙන්ම එංගලන්ත සභාවේ උසස් සභාවට අයත් ඇන්ග්ලිකන්වරු ප්‍රොතෙස්තන්ත ලක්ෂණවලට වඩා කතෝලික ලක්ෂණ උසුලන ඇදහිලිවන්තයන් පිරිසක් ලෙස පෙනේ.

## 8.4 ප්‍රතිසංස්කරණය හා පුනරුදය

### 8.4.1 ත්‍රිදෙන්තිනු මන්ත්‍රණ සභාව (ක්‍රි.ව. 1545-1563)

ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරුදීම සඳහා කතෝලික සභාව තුන්වන පාවුළු ශුද්ධෝත්තම පියාණන්ගේ මුලිකත්වයෙන් මන්ත්‍රණ සභාවක් කැඳවීය. එය ත්‍රිදෙන්තිනු නොහොත් ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාව වේ. එහිදි පහත දැක්වෙන තීරණ ගන්නා ලදී.

- ලූතර්ගේ සියලුම ඉගැන්වීම් ප්‍රතික්‍ෂේප කිරීම.
- ශුද්ධ බයිබලය, සම්ප්‍රදාය යන දෙකම ධාර්මික සත්‍යතාවන්හි උල්පත් වන්නේ ය.
- පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ ග්‍රන්ථ සියල්ලම දේවානුභාවයෙන් ලියන ලද ඒවා විය. ශුද්ධ ලියවිලි පාඨ දෙවියන් වහන්සේ වෙතින්ම නික්මුණු ඒවා බවත්, එබැවින් ඒවායේ අර්ථය ගෙනහැර දැක්වීමේ බලය ශුද්ධ වූ සභාවට පමණක් අයත් බව.
- දේශනා කිරීමේ බලයත්, ඉගැන්වීමේ බලයත් ශුද්ධ වූ සභාවට ක්‍රිස්තුන් වහන්සේ විසින් දානය කරන ලද ඒවා ය.
- ශුද්ධ වූ පේදුරුතුමාත්, එතුමාට පසුව අඛණ්ඩව පැමිණෙන ශුද්ධෝත්තම පියවරුන් ශුද්ධ වූ සභාවේ නායකත්වය දරති. ශුද්ධෝත්තම පියතුමන් නොවරදිනසුලු භාවයේ වරම ලද කෙනෙකි.
- වල්ගේට් යැයි හඳුන්වනු ලැබූ ශුද්ධ වූ බයිබලය ශුද්ධ වූ සභාවේ අනුමැතිය ලද කෘති වේ.
- ප්‍රසාද නිධාන හතම ක්‍රිස්තුන් වහන්සේ විසින්ම ස්ථාපනය කරන ලද ඒවා විය.
- දිව්‍ය යාගය, කල්වාරි යාගය, නිරය, සාන්තුවර බැතිය, ශුද්ධ වූ ප්‍රතිමා තැබීම, පූර්ණ ඵල ආදිය ශුද්ධ වූ සභාව විසින් පිළිගන්නා ලදී.
- විවාහය සක්‍රමේන්තුවකි. විවාහ බන්ධනය සදාකාලික ය.
- විශ්වාසයේ ඵලයන් වන යහපත් ක්‍රියා තුළින් ප්‍රකාශ වන විශ්වාසය නිසා මිනිසා විනිශ්චයකාරයකු වේ.

#### මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නවෝදමය ව්‍යාපෘති

- පූර්ණඵල ලබාදීම පිළිබඳ දේශනා කිරීමේ ක්‍රමය ඉවත් කිරීම.
- මරියතුමිය හා ශුද්ධවන්තයින්ට නියමිත පරිදි ගෞරව කිරීමට උනන්දු කරවීම.
- පූජක පුහුණුව සඳහා සෑම පදවියකටම සෙමනේරියක් (දෙව්සත්හලක්) ආරම්භ කිරීම.
- කතෝලිකයින් සතියකට වරක්වත් දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීම
- නිතර නිතර සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ඒ මගින් පව් සමාව ලබා ගැනීම.
- දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව හා දිව්‍යා සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගැනීමට උනන්දු කරවීම.
- ශුද්ධ වූ සභාවේ ධර්මෝපදේශකයින් සඳහා " ත්‍රිදෙන්තීනු ධර්මෝපදේශය" නැමති කෘතිය 5 වනපියුස් (Pius v) ශුද්ධෝත්තම පියතුමා 1566 දී ප්‍රකාශයට පත් කළේ ය.

## 8.4.2 නව තාපස පන්ති බිහිවීම

**ජේසු නිකාය**

ක්‍රි.ව. 1534 දී ස්පාඤ්ඤයේ ශු. ඉග්නාසියුස් ලොයලා තුමා විසින් ජේසු නිකාය ආරම්භ කරන ලදී. ඉහළ අධ්‍යාපනයක් ලත් නිකායේ තාපසයෝ ගැඹුරු ආධ්‍යාත්මික ජීවිතයක් ගත කළ හ. එකල යුරෝපයේ පැතිර තිබූ රෙප්‍රමාදු භක්තිකයන්ගේ වැරැදි ඉගැන්වීම්වලට ජේසු නිකායේ තාස පන්තිය මඟින් පිළිතුරු දී බොහෝ ජනතාවට නිවැරදි මඟ පෙන්වීමක් ලබා දුන්නේ ය.

පාප්තුමාට කීකරු වීම, කතෝලික සභාවේ ධර්මවේදය උගන්වා ඒවා ආරක්ෂාකර දීමට ජේසු නිකායේ තාපසයෝ පෙරමුණ ගත්හ.

ලොයොලා තුමා විසින් රචිත ''ආධ්‍යාත්මික පුහුණුව'' යන ග්‍රන්ථය අද පවා ප්‍රචලිත ග්‍රන්ථයකි. ජේසු නිකායේ තාපසයෝ ධර්මෝපදේශය ග්‍රන්ථ කිහිපයක් ද ලියා ඇත. මින් ප්‍රධාන වන්නේ පීටර් කැනීෂියස් තුමා ලියූ කතෝලික විශ්වාසයේ ධර්මෝපදේශ ග්‍රන්ථය යි. ත්‍රිදෙන්තිනු මන්ත්‍රණ සභාවේ දී දේව ධර්මාචාර්ය ලෙස කටයුතු කළේ ජේසු නිකායික ශු. නොබට්, බෙලාර්මින් යන පැවැදි උතුමන්ලා ය. ''ආසියාවේ මහා ධර්මදූතයා'' යන විරුධාවලිය ලත් ප්‍රැන්සිස් සේවියර් මුනිතුමා ජේසු නිකායේ ආරම්භක සාමාජිකයෙකි. අද ලොව පුරාම ජේසු නිකායේ තාපසයෝ විසිරී සිටිති.

**කාර්මෙල් නිකාය**

- පලස්තීනයේ කාර්මෙල් කන්දේ මෙම නිකාය ආරම්භ විය. තපස් ජීවිතය සඳහා වන විනය රීති මාලාවක් 12 වන සියවසේ සකස් කර දෙන ලදී.
- ශුද්ධ වූ සයිමන් ස්ටොක් මෙම පැවිදි ජීවිතයේ සම්ප්‍රදාය එංගලන්තයට රැගෙන ගොස් කාර්මෙල් පැවිදි ජීවිතයට සහාය ලබා දුන්නේ ය.
- කාර්මෙල් නිකායේ පැවිදිවරියක වූ අවිලා හි තෙරේසා තුමිය (ක්‍රි.ව. 1515-1582) තම පැවිදි නිකාය තුළ ම නවෝදයක් ඇති කිරීමට උත්සාහ කළා ය. දෙවියන් වහන්සේ මෙතුමියට විවිධාකාරයෙන් දර්ශනය වූ සේක. කාර්මෙල් නිකායේ ආරම්භයේ වූ තපස් දිවිය හා භාවනායෝගී දිවිය කාර්මෙල් නිකාය තුළ නැවත ඇති කරලීමට උත්සාහ කර නවෝදයක් ඇති කළා ය. "පූර්ණ දිවියකට මඟ", ''ඇතුළාන්ත මන්දිරය'' නැමැති ආධ්‍යාත්මික කෘතිය ග්‍රන්ථාරූඪ කළා ය.
- අවිලාහි තෙරේසාතුමියගේ යොමුකිරීම හා මඟ පෙන්වීම තුළ ශුද්ධ වූ කුරුසියේ ජේදුරුතුමා (1542- 1591) මෙම පුනරුදමය කාර්යයෙහි නියැලුණේය. මෙතුමා විසින් ද ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ ග්‍රන්ථ ලියා ඇත.
  ඒවා නම්, *''කාර්මෙල් පර්වතය නැග්ම'', ''අඳුරු රාත්‍රිය'', ''ආධ්‍යාත්මික ගීතය'', ''ප්‍රේමයේ ජීවන දැල්ල''*
- මොවුන් දෙදෙනාගේ ආධ්‍යාත්මික ජීවිත කෘති බොහෝ දෙනාගේ ජීවිතවලට ඉමහත් සහනයක් විය. යාච්ඤාමය ජීවිතය, භාවනායෝගී යැදුම්, අත්දැකීම් කරගන්නා ආකාරය පිළිබඳ මොවුන්ගේ ආධ්‍යාත්මික නිර්මාණ බොහෝ ඵලදායී ඒවා විය.
- ආධ්‍යාත්මික ජීවිතයේ දේව සබඳතාව අත්දැකීමට බැගෑපත්කම නැතිවම බැරිය යන උපදෙසට ජේසුගේ කුඩාමල වන තෙරේසා තුමිය සාක්ෂි දරන්නී ය.

**කැපුචින් නිකාය**

- 13 වන ශතවර්ෂයේ ශුද්ධවූ අසීසියේ ෆ්‍රැන්සිස් තුමන් විසින් ස්ථාපිත ෆ්‍රැන්සිකාන පැවිදි නිකායේ නවෝදයක් (පුනරුදයක්) අවශ්‍ය බව හැඟුණි.
- 16 වන සියවසේ දී අසීසියේ ෆ්‍රැන්සිස් තුමන්ගේ නීති ඉතා සූක්ෂම ලෙස පිළිපැදිය යුතු යැයි ද මුල් කාලයේ මෙම නිකායේ වූ ශුද්ධ ලියවිලි උපදේශාත්මක ජීවිත ක්‍රමය නැවත ඇති කළ යුතු යැයි මතෙඹ පස්සි නමැති ෆ්‍රැන්සිස්කාන පැවිදිවරයාගේ නායකත්වයෙන් බොහෝ පැවිද්දෝ තීරණය කළ හ.
- මෙම නවෝදය සෙමින් සෙමින් ඉදිරියට ඇදුණි. තම ඉගැන්වීමේ සේවාවත්, තපස් ජීවිතයත් සම්බන්ධ කරමින් දිවි ගෙවූහ. රෝගීන්ට උපස්ථාන කිරීම හා දුෂ්කර ක්‍රියා කිරීම තුළින් මහන්සි වී උපයාගෙන දිවි ගෙවූහ.
- ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට විරුද්ධව ඉගැන්වූහ.

## 8.5 නූතන යුගය (ක්‍රි.ව. 1750 සිට අද දක්වා)

### 8.5.1 ප්‍රංශ මහා විප්ලවය (1789-1795)

1788 දී මහත් ආර්ථික දුෂ්කරතා ඇතිවිය. වගාවන් පාළුවීම හේතුවෙන් සාගතය ඇතිවී ජනතාව කුසගින්නේ මියැදුණහ. ජීවන බර දැරිය නොහැකිව දිළිදු ප්‍රජාව හා කම්කරුවෝ රටේ නීති ක්‍රමය සංශෝධනය කළ යුතු යැයි පවසමින් විප්ලව කළහ. සමහර පහළ ස්ථරයේ පූජකවරු හා ප්‍රභූවරු ඔවුන් සමග එක් වූහ.

රටේ ජනතාවගේ කැමැත්තට පාලනය කළ යුතුය යන රූසෝගේ අදහස මෙයට හේතු කාරකයක් විය. එකල රට පාලනය කළ ලූවී රජ තුමන්ව මැරූහ. ජනරජ ක්‍රමයට විරෝධය පෑ දහස් ගණන් ප්‍රභූවරුන් , පූජකවරුන් හා පැවිද්දන් මරනු ලැබූහ. ප්‍රභූවරුන් හා ඉඩම් හිමි විශාල පිරිසක් රටින් පිටුවහල් වූහ. අනෙකුත් අය තම පාරම්පරික උරුමය අත් හැරියෝ ය. පැවති තත්ත්වය සමතයකට පත් කිරීම සඳහා ප්‍රංශ රටේ නීති සභාව වන ස්ටේට්ස් ජෙනරල් ක්‍රි.ව. 1789 මැයි 5 වන දින ලෙර්සෙයිල්සිල් හි රැස්ව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනගන ලදී.

මෙම නීතිය නොපිළිගත් රදගුරුවරුන්ට හා සිය ගණන් පූජකවරුන්ට බලපෑම් කළහ. සමහරු මරනු ලැබූහ. තවත් සමහරු රටින් පිටුවහල් කරනු ලැබූහ. 1793 දී ප්‍රංශයෙන් කිතුදහම තුරන් කළ යුතු යැයි වෘත්තීය උත්සව, දැනුම මංගල්‍ය, යහගුණ මංගල්‍ය යැයි උත්සව සමරමින් කිතුනු මංගල්‍ය දින හා ඉරු දින වන්දනාවට බාධා පැමිණවූහ. ප්‍රසිද්ධ දේවස්ථානයක් වන නෝට්‍ර ඩෑම් දේවස්ථානයේ අල්තාරය මත ගණිකාවක් සිටුවා "මැය සාමාන්‍ය දැනුමේ දෙවියා" යැයි වන්දනා කළහ.

- 1797 දී නැපෝලියන් අධිරාජයා ලෙස පත්වූ පසු, 6 වන පියුස් ශුද්ධෝත්තම (Pius vi) පියතුමා සමඟ ගිවිසුමක් අත්සන් කොට ශුද්ධ සභාවෙන් බොහෝ ඉඩම්, රටවල් හා මිල අධික අතින් ලියන ලද ග්‍රන්ථ පිටපත්, කලා වස්තුන් ලබා ගත්තේය. 1798 දී රෝමයේ ප්‍රංශ ජාතිකයකු මරනු ලැබීම අළලා රෝමය අල්ලාගෙන ශුද්ධෝත්තම පියතුමන්ගේ වස්තු පැහැර ගෙන වැනීසියට ශුද්ධෝත්තම පියතුමන්ව පිටුවහල් කරනු ලැබීය. 1799 දී මෙතුමා ස්වර්ගස්ථ විය.
- නැපෝලියන්, ශුද්ධෝත්තම පියතුමාණන් වන 7 වන පියුස් පාප්තුමන් සමග 1801 දී ගිවිසුමක් අත්සන් කොට ශුද්ධ වූ සභාවේ අයිතීය නැවත ලබා දුන්නේය. දේවස්ථාන විවෘත කරනු ලැබීය. පැවිදි නිකාය තම සේවාවන් ආරම්භ කළෝ ය. කතෝලික දහම ප්‍රසිද්ධියේ පිළිගනු ලැබීය. මීට පෙර රජ සතුවූ සභා දේපළ සභාව නොදුන් අතර පූජකවරුන්ට පඩියක් ගෙවීය.
- නමුත් නැපෝලියන් ඒකාධිපති පාලකයකු ලෙස වෙනස් වී, රෝමය පළාත් අගනුවර කර ශුද්ධ වූ සභාවට නැවත බලපෑම් කිරීමට පටන් ගත්තේය. නමුත් 7 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා නොබියව නැපෝලියන්ට විරුද්ධ වී ශුද්ධ වූ සභාව ආරක්ෂා කළේ ය. 1814 දී වොටර් ලූ යුද්ධයෙන් නැපෝලියන් පරාජය වූ පසු ශුද්ධ වූ සභාව නිදහසේ ප්‍රංශය තුළ ව්‍යාප්ත වන්නට පටන් ගැනුණි.

7 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන්ගේ කාලය නව පැවිදි නිකාය ආරම්භ විය.

මාරියනිස්ට්ස්. මාරිස්ට් ද ලාසල් සහෝදරවරු. දයාවේ සොහොයුරියෝ, ලොරෙට්ටෝ පැවිදි සොයුරියෝ, පෝලිස්ට්ස් , සැලේසියානු නිකාය, දේව වචනයේ සභාව, සුදු පියවරුන් යන මෙම පැවිදි නිකාය ධර්මදූත කාර්ය, සමාජ සේවය, අධ්‍යාපන, එඩේරිය සේවය වැනි කාර්යයන් හි නිරත වී ශුද්ධ වූ සභාවට නව ජීවයක් හා නවතාවක් ලබා දුන්හ. 1815 දී විශ්වාසය පැතිරවීමේ සභාව ස්ථාපනය කළේ ය.

### 8.5.2 පළමුවෙනි වතිකානු මන්ත්‍රණ සභාව (1869 - 1870)

- ක්‍රි.ව. 1869 දෙසැම්බර් 8 වන දින පළමු වතිකානු මන්ත්‍රණ සභාව රෝමයේ දී රැස්වුණි. ශුද්ධ වූ සභාවේ මූලික සත්‍යතාවන්, දෙවියන් වහන්සේ ජීවමානයි යන අදහස ස්වභාව ධර්මයත් දෙවියන් වහන්සේත් දෙවියන් වහන්සේගේ ප්‍රකාශනත්, සාමාන්‍ය බුද්ධිය හා දේව එළිදරව්ව අතර ඇති සම්බන්ධතාව වැනි ඉගැන්වීම් ඩෙයි ෆීලියුස් නමැති ප්‍රථම අදහස් මාලාව ප්‍රකාශ කරන ලදි. තවද දෙවිකෙනෙක් නැතැයි යන මතය, ද්‍රව්‍ය වාදය ආදි වැරදි මත ප්‍රතික්ෂේප කරන ලදි.
- ශුද්ධෝත්තම පියතුමා නායකත්වය ගෙන ශුද්ධවූ පේදුරු තුමාගේ ශුද්ධාසනයේ සිට ධාර්මික පදනම ප්‍රකාශයට පත් කරන විට නැතහොත් පහදන විට ශුද්ධාත්ම වරමින් සත්‍ය කථා

කරයි. ශුද්ධෝත්තම පියාණන්ගේ නොවරදින සුලු ස්වභාවයයැයි එය හඳුන්වනු ලැබේ. ඒ සමඟ ම ශුද්ධෝත්තම පියතුමන්ගේ නායකත්වය පිළිගන්නා ලදී.

- ක්‍රි.ව. 1870 දී ප්‍රංශ - බෲසිය අතර යුද්ධය ආරම්භ වූ නිසා මන්ත්‍රණ සභාව අත් හිටවන ලදී. මේ නිසා ශුද්ධ වූ සභාවේ සේවය, ගිහියන්ගේ හා පැවිද්දන්ගේ තත්ත්වය යන්න පිළිබඳව සාකච්ඡා කළ නොහැකි විය.
- නමුත් 18 වන සියවසේ දී අඩපණ වූ ශුද්ධෝත්තම පිය තනතුරත්, ආත්මික අධිකාරියත්, 19 වන සියවසේ. මැද භාගයේ අති මහත් ආත්මික හා ශීලධාර්මික අධිකාරියත් (Spiritual and moral) ශුද්ධෝත්තම පියතුමන්ට නැවත ලබා දෙන ලදී.

## 8.6 නුතන ලෝකය තුළ සභාවට විශිෂ්ට සේවයක් කළ පාප්වරු

### 8.6.1 9 වන පියුස් පාප්තුමා (ක්‍රි.ව. 1846-1878)

පළමුවෙනි වතිකාන සමුළුව කැඳවන ලද්දේ මෙතුමා ය. එනම් ක්‍රි.ව. 1869-1870 යන කාලය තුළය. එම් මන්ත්‍රණ සභාවේ දී පාප්තුමාගේ නොවරදින සුලුභාවය පිළිගත යුතු සත්‍යයතාවයක් බව තහවුරු විය. දේව මාතාවන් ජම්ම පාප දෝශයෙන් රහිතව පිළිසිඳුණු තැනැත්තියක් බව මෙතුමානෝ ක්‍රි.ව. 1854 වර්ෂයේ දෙසැම්බර් මස 08 දී ප්‍රකාශයට පත් කළේ ය.

ක්‍රි.ව. 1858 පෙබරවාරි මස 11 වන දින දේවමාතාවන් වහන්සේ ලූර්දුවේ දර්ශනය වූයේ මෙතුමාගේ පාලන සමයේ ය. වසර 32 ක් මෙතුමා සභාව පාළනය කළේය. දීර්ඝතම කාලයක් පාප්ධුරය දරා ඇත්තේ මෙතුමා ය.

### 8.6.2 13 වන ලියෝ පාප්තුමා (ක්‍රි.ව. 1878-1903)

උගත් දේව ධර්මවේදියකවූ මෙතුමා දේවධර්මය පිළිබඳ අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණයක් සිදුකළේ ය. ශු. බයිබලය විද්‍යාත්මකව හැදෑරීමට මඟ පෑදීය. වතිකානු ලේඛනාගාරය අධ්‍යාපන ගවේෂණය සඳහා සැමට විවෘත කර දුන්නේ ය. ලොව සෑම රටක් සමඟම සබඳතා පැවැත්වීය. විවිධ පොත පත, අපෝස්තලික අනුශාසනා පත්‍ර රාශියක් ලියා ඇත. (ජපමාල භක්තිය. ශුද්ධාත්මයාණන් වහන්සේ. දිව්‍ය සත්ප්‍රසාදය...) ප්‍රථම විශ්ව ලේඛනය වන ''වෙහෙසන මිනිස්සු'' නොහොත් රේරුම් නොවාරුම් ලේඛනය ලොවට ඉදිරිපත් කළේ ය. කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කිතුනු දැක්ම මෙම ලේඛනයෙන් විදහා දැක්වේ.

මෙතුමා 1902 දී රෝමයේ ශු. බයිබලීය කොමිසම ස්ථාපනය කළේ ය.

### 8.6.3 10 වන පියුස් පාප්තුමා (ක්‍රි.ව. 1903 -1914)

උගත් සිල්වත් පාප්තුමෙකි. ළමා හා තරුණ අය වෙත විශේෂ අවධානයක් යොමුකළ මෙතුමාණෝ ඔවුන්ව නඟා සිටුවීමට වෙහෙස මහන්සිවිය. ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමේ වයස් සීමාව අඩුකළේ මෙතුමා ය. (බාලවියේ දී දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම), නිතර නිතර හා දිනපතා දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට අනුමත කිරීම හා ජනවන්දනාව කෙරෙහි වැඩි වධානයක් යොමු කරමින් ජනවන්දනාවේ විවිධ ප්‍රතිසංවිධානයන් ඇති කිරීමට මූලිකවිය. පසුකලයක මෙතුමාව 12 වන පියුස් පාප්තුමා විසින් සාන්තුවර භාවයට ඔසවන ලදී.

### 8.6.4 15 වන බෙනඩික් පාප්තුමා (ක්‍රි.ව. 1914-1922)

ප්‍රගතිශීලි පාප්තුමෙකි. මෙතුමානන්ගේ පාලන සමය තුළ පළමුවන ලෝක මහා සංග්‍රාමය පැවැති අතර ලොව පුරා කොමියුනිස්ට් වාදය පැතිරෙමින් තිබු මේ අවධියේ කතෝලිකයනට එක්තරා ආකාරයකට පීඩන සමයක් පැවැති කාල පරිච්ඡේදයකි. ක්‍රි.ව. 1917 දී පෘතුගාලයේ පාතිමා නුවරදී දෙව්මව් කුඩා දරුවන් තිදෙනෙකුට දර්ශනය වූයේ මෙතුමාගේ පාලන සමයේ දී ය.

### 8.6.5 දෙවන පියුස් පාප්තුමා (ක්‍රි.ව. 1922-1939)

මෙතුමාගේ පාලන සමයේ ඉතාලියේ ආඥාදායකයා වූයේ බෙනිටෝ මුසෝලිනීය. ඉතාලි රජය හා ශුද්ධෝත්තම පියතුමා අතර 192ව9 දී ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ගිවිසුම ලතරානු ගිවිසුමයයි හඳුන්වනු ලැබේ. ලතරානු ගිවිසුමට අනුව වතිකානය ස්වාධීන රටක්

ලෙසත් මධ්‍යස්ථ රටක් ලෙසත් එහි පාලනය ශුද්ධෝත්තම පාප්තුමා ලෙසත් හැඳින්වීය. දෙවන පියුස් පාප්තුමා ගිහි ධර්මදූත සේවාව නඟා සිටවීමට උස්සාහ කළ අයෙකි. ගිහියා පිළිබඳ විවිධ අනුශාසනා පත්‍ර නිකුත් කළේ ය. රේරුම් නොවාරුම් අනුශාසනා පත්‍රයේ 40 වසර සැමැරීමට ''ක්වාඩ්රෝ ජෙසිමෝ අන්නෝ'' නම් සන්දේශය නිකුත් කිරීම මෙතුමා විසින් කරන ලදී.

**8.6.6 12 වන පියුස් පාප්තුමා (ක්‍රි.ව. 1939-1958)**

මෙතුමා උගත් පඬිවරයෙකි. භාෂා විශාරදයකි. ආධ්‍යාත්මිකත්වයෙන් හෙබි පාප්තුමෙකි. මෙතුමාගේ පාලන කාලයේ දී දෙවන ලෝක මහා යුද්ධය පැවැතිණි. ලෝක සාමය සඳහා මෙතුමා මහත් වෙහෙසක් ගත්තේ ය. යුද සිරකරුවන් ආරක්ෂා කිරීමට විවිධ මාර්ගයන් යෙදවීය. දෙව් මව් ආත්ම ශරීරය පිටින් ස්වර්ගාරෝපණයවීම පිළිගත යුතු සත්‍යයතාවයක් බව ප්‍රකාශ කළේ මෙතුමා ය. දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමේ අනුශුද්ධය ලිහිල් කිරීම.

අති ඉන්ද්‍රීය ක්‍රිස්තු දේහය නැමැති අනුශාසනාපත්‍රය මෙතුමා නිකුත් කළ විශේෂිත ලිපිය විය. ගිහි ධර්ම දූත සේවාව ගැන මෙතුමා වඩාත් උත්සුක වූ පාප්තුමෙකි. 1943 දී එතුමාණෝ නිකුත් කළ ''ඩිවිනෝ අප්පලාන්ටේ ස්පිරිටු'' නමැති විශ්ව ලේඛනය මඟින් බයිබල් පණිවුඩය දෙස විද්‍යාත්මකව බැලීම අවධාරණය කර ඇත.

**8.6.7 23 වන ජුවාම් පාප්තුමා (ක්‍රි.ව. 1958-1963)**

සභා ඉතිහාසයේ මහා පෙරලියක් ඇති කළ පාප්තුමා ලෙස මෙතුමාව හැඳින්විය හැක. දෙවෙනි වතිකානු කතිකාවත කැඳෙව්වේ මෙතුමාය. ලෝක සාමය වෙනුවෙන් ඉමහත් සේවාවක් කළ උතුමෙකි. ''ලෝකය සාමය'' නැමති විශ්ව ලේඛනය, ''අයුක්තියට පිළිතුර'' යන විශ්ව ලේඛනයත් නිකුත් කරන ලදී.

අනෙකුත් කිතුනු සභාවන් හා ජාතින් සමග නිරන්තරයෙන් කටයුතු කරමින් විශ්ව සහෝදරත්වය වර්ධනය කිරීමට මහත් වෙහෙසක් දැරීය. මෙතුමා ආධ්‍යාත්මිකත්වයෙන් ඉහළ පාප්තුමෙකි. මෙතුමාව වර්තමානයේ දී භාග්‍යවරභාවයට ඔසවා ඇත.

**8.6.8 6 වන පාවුලු පාප්තුමා (ක්‍රි.ව. 1963-1978)**

අතරමඟ නැවතී තිබූ දෙවන වාතිකාන මන්ත්‍රණ සභාව ඉදිරියට ගෙන ගියේ මෙතුමා ය. මෙතුමා 1965 දී දෙවනි වතිකාන කතිකාව සාර්ථකව නිම කරන ලදී. ප්‍රගතිශීලි පාප්තුමෙකි. ලොව විවිධ රටවල සංචාරයන් ආරම්භ කළේ මෙතුමාය. ක්‍රි.ව. 1970 දෙසැම්බර් මස 04 වන දින ශ්‍රී ලංකාවට ද පැමිණියේ ය. පාප්තුමෙකු ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවට පැමිණීම ඓතිහාසික සිද්ධියක් විය. ජනතා ප්‍රගතිය මෙතුමා ලියූ විශ්ව ලේඛනයකි. ''ධර්මදානය'' පිළිබඳ අපෝස්තලික අනුශාසනා පත්‍රයත් මෙතුමා ලියා ඇත.

**8.6.9 2 වන ජුවාම් පාවුළු පාප්තුමා (ක්‍රි.ව. 1978-2005)**

වර්ෂ 600කට පසු ඉතාලියේ පිටස්තර රටකින් පාප් ධුරයට පත් දෙවන ජුවාම් පාවුළු පාප්තුමා පෝලන්ත ජාතිකයෙකි. ප්‍රගතිශීලි පාප්තුමෙකි. ලොව බොහෝ රටවල සංචාරය කර ඇති මෙතුමා ක්‍රි.ව. 1995 දි ශ්‍රී ලංකාවට පැමිණියේ ය. එහිදි මෙතුමා විසින් ජුසේ වාස් පියතුමාව භාග්‍යවරයට එසවන ලදී.

විශ්ව ලේඛන හා අනුශාසනා පත්‍ර රාශියක් මෙතුමා නිකුත් කර ඇත. ඉන් සමහරක් නම් ''උදාවෙන තුන්දාහේ යුගය පිළිබඳ අපෝස්තලික විශ්ව ලේඛනය, ධර්මෝපදේශය පිළිබඳ අනුශාසනා පත්‍රය, ගැලැවුම් කාරයාණන්ගේ මෑණියෝ ලේඛනය, නූතන ලෝකය තුළ කිතුනු පවුල ලේඛනය, ගිහියා පිළිබඳ අනුශාසනා පත්‍රය, පූජක පැවිදි කාර්යය පිළිබඳ අපෝස්තලික විශ්ව ලේඛනය වේ.

ආධ්‍යාත්මිකත්වයේ පරිපුන් මෙතුමා ලොව බොහෝ රටවල ජනතාව අතර පිළිගත් ආගමික නායකයෙක් විය. මෙතුමා 2005 වසරේ දී ස්වර්ගස්ථ විය. අද මෙතුමාව සභා මාතාව භාග්‍යවරයෙක් බවට ඔසවා ඇත.

# නවවන පාඩම

## 9. ලංකා සභා ඉතිහාසය (පෘතුගීසි යුගයට පෙර හා පෘතුගීසි යුගය)

### 9.1 පෘතුගීසින් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාධක:

විධිමත්ව ක්‍රිස්තු ධර්මය ව්‍යාප්ත වූයේ ක්‍රි. වර්ෂ 1505න් පසුව වුවත් ඊට පෙර පවා ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි දක්නට ඇත. ඉන් ප්‍රධාන සාධක කිහිපයක් පහත දැක්වේ.

1. **කොස්මස්ගේ ප්‍රකාශය:**

   ක්‍රි.ව. 6 වන සියවසේ දී රටවල් සමූහයක සංචාරය කළ කොස්මස් නම් තවුසා ලියූ "ද ක්‍රිස්ටියන් ටොපෝග්‍රැෆි" නම් ග්‍රන්ථයේ ශ්‍රී ලංකාව ගැන මෙසේ සඳහන් කර ඇත.

   ඉන්දීය සාගරයේ පිහිටි සිංහල දිඹ යනුවෙන් ඉන්දීය ජාතිකයන් විසින් ව්‍යවහාර කරනු ලබන විශාල දූපතක් වේ. ග්‍රීකයෝ ඊට "තප්‍රොබෝනය" යන නම භාවිතා කළ හ. එහි රජවරුන් දෙදෙනෙක් සිටින අතර ඔවුන් එකිනෙකට විරුද්ධ ය. මේ දිවයිනේ පදිංචිව සිටින පර්සියන් ජාතිකයන්ට අයත් ක්‍රිස්තියානි දේවස්ථානයක් ඇත. පර්සියාවෙන් පත්වීම ලබා පැමිණි පූජක තුමා සමඟ තේවාචාරී කෙනෙක් ද එහි වෙසෙති. ඔවුන්ට ආගමික වත් පිළිවෙත් සඳහා අවශ්‍ය උපකරණයන් ඔවුන් සමීපයේ ම ඇත.

   මොහුගේ මෙම ප්‍රකාශනයට අනුව එකල ශ්‍රී ලංකාවේ නෙස්ටොරියන් සමාජයට අයත් ක්‍රිස්තියානින් සිටි බව සිතිය හැක.

2. **අනුරාධපුර කුරුසය**

   1912 දී අනුරාධපුරයේ නටබුන් අතර තිබී ගලක කෙටූ කුරුසයක් සොයා ගන්නා ලදී. මෙබඳු කුරුස ඉන්දියාවේ ද තිබී සොයාගෙන ඇත. නෙස්ටොරියානු ක්‍රිස්තු භක්තිකයන් සිරි කුරුසයට දැඩි භක්තියක් දැක්වූ බව කියැවේ. මෙම කුරුසය කොස්මස් සඳහන් කර ඇති කිතුනුවන්ගේ දෙව්මැඳුරට අයත් කුරුසයක් ද, නැතහොත් ඔවුන් පදිංචිව සිටි ගෙදරක තිබී හමුවූයේ ද, නෙස්ටෝරියන් කිතුනුවන් සිටියේ අනුරාධපුරයේ ද යන්න ස්ථිර ලෙස නිගමනය කිරීමට සාක්ෂි නැත.

3. **මිගාර සෙන්පති**

   ඉන්දියාවෙන් පැමිණි පළමුවෙනි කාශ්‍යප රජ (ක්‍රි.ව. 473-491) යටතේ ද, ඊට පසුව 1 වන මොග්ගල්ලාන රජු (ක්‍රි.ව. 491-508) යටතේ ද සේනාපති වශයෙන් සේවය කළ ක්‍රිස්තු භක්තිකයකු වූ මිගාර, "අභිසේක ජින" වෙනුවෙන් මැඳුරක් තනා එය කැප කිරීම සඳහා උළෙලක් පැවැත්වූ බව චූල වංශයෙහි සඳහන් වේ. (39:6-7, 40-41). තමා පිට ජයග්‍රහණය ලද තැනැත්තා හෙවත් තමා දමනය කරගත් තැනැත්තා යන අර්ථය ඇති "ජින" යන පාලි වචනයෙන් බුදුන් වහන්සේ ද, ජෛන ආගමේ ශාස්තෘවර වර්ධමාන ද, ආජීවන සමය ආරම්භ කළ මක්ඛලී ගෝසාල ද හඳුන්වනු ලැබී ය. ක්‍රිස්තුස් යන අර්ථය ඇති අභිෂේක යන වචනය ජින යන්නට ඈඳනු ලැබීමෙන් " ක්‍රිස්තුන් වහන්සේ" හඳුන්වනු ලබන බව සෙනරත් පරණවිතාන මහතා පවසයි.

   තුන්වන ශත වර්ෂයේ පමණ දකුණු ඉන්දියාවේ ක්‍රිස්තු භක්තිකයන් සිටි බැවින් ඔවුන් නිතර නිතර ලංකාවට එන්නට ඇතැයි සිතිය හැක. මිගාර මෙන් ලංකාවේ රජුගේ සෙබළුන් ලෙස ඉන්දීය කිතුනු හේවා භටයන් සේවය කරන්නට ද ඇත.

4. මුගලන් රජු දවස කිතුනු ලාංඡන සහිත රන්කාසි තිබූ බව සීගිරි පුවතින් හෙළිවේ.

5. අරාබි භූ විද්‍යාඥ අල් ඉද්රිඩ් පවසන අන්දමට පොළොන්නරු සමයේ දී බෞද්ධ, ඉස්ලාම්, ක්‍රිස්තියානි සහ ජුදා ආගමිකයන් වෙනුවෙන් නියෝජිතයන් සිව් දෙනෙකු සිංහල රාජ සභාවේ සිටි බව අනාවරණය වේ. එහෙත් මේ කාලය තුළ විදේශික කිතුනුවන් මිස ස්වදේශික කිතුනුවන් සිටි බවට සාධක හමුවී නැත. මෙසේ පෘතුගීසින් පැමිණීමට පෙර ක්‍රිස්තියානින් මෙහි සිටි බවට අනුමාන සාධක ඇතත් සංවිධානාත්මක ලෙස කිතු දහම පැතුරුණු බවට ස්ථිර සාක්ෂි දක්නට නොමැත.

## 9.2 පෘතුගීසි යුගය (ක්‍රි. වර්‍ෂ 1505 - 1658)

**දහම් බීජ වැපිරීම :**
පෘතුගාලය වූ කලී යුරෝපයේ බටහිර දිසාවේ පිහිටි කුඩා රාජ්‍යයකි. බුර්ගන්ඩිහි සිටුකුමරුගේ සහාය ඇතිව, මුස්ලිම්වරුන්ගේ පාලනයෙන් විමුක්තිය ලැබූ පෘතුගීසිහු යුරෝපයේ මුස්ලිම් වෙළෙඳ අධිකාරිය බිඳ දමීම සඳහා, අප්‍රිකාව වටා, පෙරදිග මුහුදු මාර්ගයක් සොයා ගැනීමට යත්න දැරූහ. මෙම ප්‍රයත්නය සාර්ථක වූයේ 1497 දී වස්කෝ ද ගාමා ඉන්දියාවේ කැලිකට් නගරයට මුහුදින් සේන්දු වීමෙනි.

මීට වසර අටකට පසු ඉන්දියාවේ පෙරදිග ආණ්ඩුකාර ධුරයට පත්වූ ප්‍රන්සිස්කු ද අල්මේදා, ලංකාව, පේගුව හා මලක්කාව යන පෙදෙස්වලින් මුස්ලිම්වරුන් පන්නා දැමීමේ බලාපොරොත්තුවෙන් පසුවිය. මුස්ලිම්වරුන් ද මලක්කාව, රතු මුහුද හා පර්සියානු වරාය ඔස්සේ පිහිටි සුපුරුදු නැව් මාර්ග අහිමි වුයෙන් මාලදිවයින හරහා යාත්‍රා කළ හ. මෙය ද වැළැක්වීම සඳහා ප්‍රන්සිස්කු ද අල්මේදා නැව් හතකින් යුත් කණ්ඩායමක් සංවිධානය කර, මුස්ලිම්වරුනට පහර දීමට තම පුත් ලොරෙන්සෝ ද අල්මේදා කොචින් නගරයෙන් පිටත් කර යැවීය. කුණාටුවකට හසුවූ මෙම නැව් කණ්ඩායම, 1505 නොවැම්බර් 15 දින ගාලු වරායට සම්ප්‍රාප්ත විය. තමන් ළඟා වූ දූපත ලංකාව බව දැනගත් විට, ලොරෙන්සෝ වෙරළට ආසන්නව යාත්‍රා කොට, අගනුවර වූ කොළොම්පුරයට පැමිණියේ ය.

එම වකවානුවේ දී, කෝට්ටේ 8 වන වීර පරාක්‍රමබාහු රජතුමා ද, කන්ද උඩරට මහනුවර වික්‍රමබාහු රජු ද, යාපනය පරරාජසේකරන් නැමැති රජු ද පාලනය කළ හ. ටික කලකින් කෝට්ටේ රජු හා සමඟ සුහද වූ පෘතුගීසිහු, කොළඹ බලකොටුවක් ද තනා ගත් හ.

පැරණි ග්‍රීකයන් "තප්‍රබෝනය" යනුවෙන් හැඳින්වූ ලංකාවට පෘතුගීසින් පා තැබූ බවත්, ඒ හේතුවෙන් සුබාරංචිය එම ජනතාව වෙත ගෙන යා හැකි බවත්, පෘතුගාලයේ රජතුමා රෝමයේ ජූලියස් පාප්තුමනට දන්වා යැවී ය.

කෝට්ටේ රජු ද පෘතුගීසින් හා සමඟ ගිවිසුම් සබඳතාවක් ඇතිකර ගත්තේ ය. තම රාජ්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන්ගේ පිහිට පැතුවේ ය. පෘතුගීසිහු 1539 දී සීතාවක මායාදුන්නේ රජුට විරුද්ධව කෝට්ටේ රජුට යුද සහාය දුන් හ.

බුවනෙකබාහු රජු ද සිංහල - පෘතුගීසි සබඳතා තර කිරීම සඳහා සලප්පු ආරච්චි නැමති සිංහල රාජ දූතයා පෘතුගාලයේ ලිස්බන් නගරයට යැවී ය. එම දූත ගමනේ හේතුවෙන්, බුවනෙකබාහුගේ මුණුබුරා වූ ධර්මපාල කුමරු (බුවනෙකබාහු රජගෙන් පසු) කෝට්ටේ රජකමට පත්වන බව පෘතුගාලයේ තෙවන ජෝන් රජ විසින් සහතික කරන ලදී. මෙහි සංකේතයක් වශයෙන්, සලප්පු ආරච්චි පෘතුගාලයට ගෙන ගිය ධර්මපාල කුමරුගේ රන් රුවට උත්සවාකාරයෙන් ඔටුණු පළඳවන ලදී. එපමණක් ද නොව, බුවනෙකබාහුගේ ඉල්ලීම අනුව මෙරට ක්‍රිස්තියානි ධර්ම ප්‍රචාරය සඳහා 1543 දී ජෝන් ද විලා කොන්ඩේ පියතුමා හා තවත් ප්‍රැන්සිස්කානු මිෂනාරි පස්දෙනෙකු සලප්පු ආරච්චි සමඟ ලංකාවට පැමිණිය හ. ඔවුන් පිළිගත් රජතුමා කෝට්ටේ රාජධානිය තුළ නිදහසේ ධර්මය ප්‍රචාරය කිරීමට අවසර දුන්නේ ය.

නව ධර්මය ජනප්‍රිය විය. මීට හේතු වූයේ ධර්මදූතයන්ගේ ජීවිත සාක්ෂියත්, දුගීනට දැක්වූ කරුණාවත්, රෝගීනට උපස්ථාන කිරීමත්, කුල භේද නොතකා ජනතාවට ලංවී කළ සේවයත් ය. සිංහල භාෂාව නොදත් ධර්මදූතයෝ පරිවර්තකයන් මගින් දේශනා කළ හ. බොදුනු සංකල්පයනට හුරු වූ සිහළුන්ට කිතුනු සංකල්ප ඉගැන්වීම පහසු නොවූ බවඔබට වැටහෙනවා ඇත.

බුවනෙකබාහුගේ මරණින් පසු ධර්මපාල කුමරා කෝට්ටේ රජ විය. ඊට වසර පහකට පසු 70,000 ක් පමණ මුහුදුබඩ ජනයා ක්‍රිස්තියානිය වැළඳ ගත්හ. ධර්මපාල ද ඉන්පසු ක්‍රිස්තියානි වුයෙන්, පෘතුගීසිනට මෙන් ම මිෂනාරීනටද වාසි ඇති විය. දේවස්ථාන, පාසල්, පුණ්‍යාතන පිහිටුවීමට අවස්ථාව ලැබුණි. බෞද්ධ ජනතාව කැරලි ගසා, සීතාවක මායාදුන්නේ රජු වටා රොක් වූහ. මායාදුන්නේගේ පුත් රාජසිංහ යුද වැද, කෝට්ටේ රාජධානිය යටත් කර ගත් හෙයින්, ධර්මපාල කොළඹ නගරය තම රාජධානිය වශයෙන් තෝරා ගත්තේ ය. එහි දී, හෙතෙම (තමාට දරුවන් නොසිටි හෙයින්) තම මරණින් පසු රාජ්‍යය පෘතුගාලයේ රජුට අයිති වන සේ, 1580 දී අන්තිම කැමති පත්‍රයක් ලියා තැබිය. ඒ අනුව, 1597 දී ධර්මපාල රජුගේ අභාවයෙන් පසු, කෝට්ටේ රාජධානිය පෘතුගීසිනට අයත් විය.

ධර්මපාල රජුගේ පියා වූ විදිය බණ්ඩාර පෘතුගීසින්ට විරුද්ධ වූයෙන්, ඔවුන් රිදවීම පිණිස පානදුර, කළුතර, මග්ගොන, බේරුවල, ගාල්ල, වැලිගම වැනි ස්ථානයන්හි පිහිටි දේවස්ථාන ගිනිබත් කළේ ය, පූජකවරුන් ද කිතුනුවන් ද මරා දැම්මේ ය. මෙලෙස 1555 දී උද්ගත වූ පීඩනයෙන් ප්‍රැන්සිස්කෝ ද බ්‍රාගා, ජාවෝකල්වෝ, අන්තෝනියෝ පදාවෝ නැමති ප්‍රැන්සිස්කන් පියවරු ප්‍රාණ පරිත්‍යාගී වූහ.

කෝට්ටේ හත්වන බුවනෙකබාහු රජගේ සොයුරා වූ වික්‍රමබාහු රජ, මහනුවර පාලනය කළේ ය. හෙතෙම මායාදුන්නේට විරුද්ධව පෘතුගීසින්ගේ සහාය පැතී ය. ඔවුන් සතුටු කිරීම සඳහා මිෂනාරි පියවරුන් මහනුවරට කැඳවූ මොහු, රහසින් ක්‍රිස්තියානිය වැළඳගත් බව සඳහන් වෙයි.

වික්‍රමබාහුගේ පුතණුවන් වූ කරලියැද්දේ බණ්ඩාර, තම පියාණන් සිහසුනෙන් පහ කර දමා, රජ විය. ඔහු මායාදුන්නේට බිය වී, පෘතුගීසි සහාය ලබාගෙන, ක්‍රිස්තියානිය ද වැළඳ ගත්තේ ය. ඔහුගේ ඥාතීන් හා රාජ්‍ය සේවකයෝ ද බෞතිස්මය ලැබූහ. ඔහුගේ සොහොයුරිය වූ දෝන මර්ගරීතා කෝට්ටේ ධර්මපාල රජු හා සමග විවාහ වූවා ය. මේ හේතුවෙන් මහනුවර ධර්ම ප්‍රචාරක කටයුතු වලට ඉදිරි තල්ලුවක් ලැබිණි. 1582 දී සීතාවක රාජසිංහ මහනුවර ආක්‍රමණය කළෙන් කරලියැද්දේ බණ්ඩාර පැන ගියේ ය. අතරමග දී වසුරිය වැළදී ඔහු මිය ගියේ ය. ඔහුගේ දියණිය ද, මුණුබුරු යමසිංහ කුමරු ද කොළඹ පෘතුගීසි රැකවරණය ලැබූ හ. පසුව, යමසිංහ දොන් පිලිප් නමින් ද, දූ කුමරිය දෝන කතරිනා නමින් ද බෞතිස්මය ලබා ගත් හ.

මහනුවර වැසියන් විසින් රාජසිංහ පලවා හරින ලදී. එවිට ගම්පොළ දේවියගේ පුත් ප්‍රන්සිස්කෝට රාජ්‍යය හිමි විය. මෙය ඇසූ යමසිංහ කුමරු හිමිකම් පෙන්වා මහනුවර රාජ්‍යය ලබා ගත් නමුත් ඉක්මනින් මිය ගියේ ය. එවිට ඔහුගේ පුත් දොළොස් හැවිරිදි දොන් ජාවෝ සිංහාසනාරූඪ විය. එහෙත්, යමසිංහ සෙන්පති වූ කොනප්පු බණ්ඩාර, දොන් ජාවෝ සහ පෘතුගීසින් පන්නා දමා පළමුවන විමලධර්ම නමින් මහනුවර රජ විය (මුලින් මොහු දොන් ජෝන් ය).

මොහු නෙරපා මහනුවර සිංහාසනය දෝන කතරිනා කුමරියට ලබා දීම සඳහා පෘතුගීසි සේනාවක් මහනුවරට පැමිණිය ද කොනප්පු බණ්ඩාර ඔවුන් පලවා හැර, දෝන කතරිනා කුමරිය සරණ පාවා ගත්තේ ය. විමලධර්ම රජ ක්‍රිස්තියානියටත්, පෘතුගීසින්ටත් විරුද්ධ වුව ද, දෝන කතරිනා බිසව නිසා ජනතාවට පීඩා නොකළේය.

ඔහුගෙන් පසු රජ වූ සෙනරත් කුමරා බැතිමත් බෞද්ධයක් විය. දෝන කතරිනා ඔහුට ද බිසව වූවා ය. ඒ හේතුවෙන්, කිතුනුවනට පීඩාවක් නොවී ය. විමලධර්මගේ පුත් කුමරා මරා තම පුතණුවන්ට රාජ්‍යය බාරදීමට සෙනරත් අදහස් කළ බව දැනගත් දෝන කතරිනා බිසව ශෝකයෙන් මිය ගියා ය. මහනුවර රජ පවුලේ කතෝලික වංශ පරපුර ඇයගෙන් අවසන් විය. සෙනරත් රජ සමය තුළ ක්‍රිස්තු ධර්මය ප්‍රචාරයට බාධා ඇති නොවිය. එලෙස ම සිංහල රජ පරපුරේ අන්තිමයා වූ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (1706-1739) ද මහනුවර කතෝලිකයනට පහසුකම් සැලසුවේ ය. ඔහුට පෙර මහනුවර රජ කළ 2 වන රාජසිංහ (දෝන කතරිනාගෙන් සෙනරත්ට දාව උපන් කුමරෙකි), දෙවන විමලධර්මසූරිය (1687-1706) නමැති රජවරු ද ලන්දේසි පීඩනයට පත් වූ කතෝලිකයනට පිහිට වූ බව ඉතිහාසයෙහි දැක්වෙයි. ජුසේ වාස් පියතුමාටත්, ඔරාතෝරියාන පියවරුන්ටත් උසස් ලෙස සැලකුවේ, පෙර සඳහන් නරේන්ද්‍රසිංහ රජතුමා ය. මෙලෙස, කන්ද උඩරට මහනුවර පෙදෙසෙහි ද කිතු සසුන ව්‍යාප්ත විය.

**සීතාවක ධර්ම ප්‍රචාරය :**
පළමුවන රාජසිංහ රජුගේ ඇවෑමෙන් නිකපිටියේ බණ්ඩාර සීතාවක රාජ්‍යයට හිමිකම් කීය. ඊට විරුද්ධ වූ පෘතුගීසීහු ඔහු කොළඹට යැවූ හ. දොන් පිලිප් නමින් බෞතිස්මය ලැබූ හෙතෙම පෘතුගාලයට යවනු ලැබූයෙන්, 1611 දී ප්‍රන්සිස්කානු තාපසාරාමයක මිය ගියේ ය. මෙකල සීතාවක ධර්ම ප්‍රචාරක කටයුතු ව්‍යාප්ත වන්නට ඇත.

සීතාවක යුගයේ දී පහළ වූ අලගියවන්න කිවිඳුන් විසින් සාහිත්‍යමය ග්‍රන්ථ කීපයක් ලියැවිණි. එතුමන්ගේ කෘතියක් වන "කොන්සන්තිනු හටන" සිංහල හටන් කාව්‍යයේ පළමුවැන්න වශයෙන් ගත හැකි ය. එය පෘතුගීසි ආණ්ඩුකාර කොන්ස්තන්තිනු සහ සිංහල සෙන්පති අන්තෝනියෝ බරෙත්තු යන දෙදෙනා අතර වූ යුද්ධය පදනම් කොට ලියන ලදී. එම කෘතිය සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයට මුදුන් මල්කඩක් බඳු වෙයි.

**එහි ත්‍රිත්ව වර්ණනාව මෙසේ ය.**

බසරක අරුත මෙන - වෙනස නොම පැ පැවතිණ
පිත් පුත් විද යන - තෙවක් එක් සුර වදිම් අදරින
සව්ලොව සත් මුදුන් - සිය සිරිපා කමල දුන්
මෙත් ගුණ පිරින දුන් - වදිම් යේසු ක්‍රිස්තු සුරිඳුන්

**දෙව්මව් වර්ණනාව මෙසේ ය.**

රිවි කැන් පහතින - නිකුත් නල සිළු විලසින
කන්නිමරි කුසයෙන - පහළ සුරුඳුන් වදිම් අදරින
රණහස වනිතා - ගුණයෙන් යුත් විනිතා
තෙදිය නෙක මාතා - රකි මුළු ලොව යේසු මාතා

**යාපනයේ ධර්මදූත සේවාව:**
මෙය පරරාජසේකරන්ගේ (හෙන්දහමනසිංහ යනු මොහුට තවත් නමකි) රාජ්‍ය සමයේ දී ඇරඹිණි. රජුගේ අවසරය ඇතිව, ප්‍රැන්සිස්කානු පියවරු මාලිගය අසල දේවස්ථානයක් ද, ආරාමයක් ද තැනූ හ. පසුව බලයට පත් සංගිලි පෘතුගීසින්ටත් සහාවටත් සතුරු විය. යාපනයේ කිතුනුවනට හිරිහැර කළ සංගිලි, මන්නාරමටද යුධ හමුදාවක් ගෙන ගොස් එහි විසූ ක්‍රිස්තු භක්තිකයන් 600 ක් පමණ ඝාතනය කළේ ය. එම ප්‍රාණ පරිත්‍යාගිවරුන් අතර කුඩා ළමුන් ද සිටි බව වාර්තා වෙයි. සංගිලි රජු පෘතුගීසින්ට යටත් වූවායින් පසු ගෝවට යවනු ලැබ මරණීය දණ්ඩනයට පාත්‍ර විය.

1623 දී හෙන්දහමනසිංහ රජුගේ පුත් කුමරා දොන් කොන්ස්තන්තිනු යන නමින් බෞතීස්මය ලැබූ විට, යාපනයේ රජ පවුලේ වෙනත් අය ද ක්‍රිස්තියානි වැළඳ ගත්හ. මෙය යාපනයේ ධර්මදූත ව්‍යාපාරයට රුකුලක් විය. ගෝවේ දී උසස් අධ්‍යාපනය ලැබූ දොන් කොන්ස්තන්හිනු ප්‍රැන්සිස්කන් නිකායේ පූජකයෙක් විය. ඔහුගේ සහෝදරියෝ වන දෝන ඉසබෙලා හා දෝන මරියා ද පැවිදි වූහ. මොවුන් දෙදෙනා ප්‍රථම ලාංකිය කන්‍යා සොයුරියන් වශයෙන් ගැනෙති. සමහර රජවරු අවංක චේතනාවෙන් බෞතිස්මය ලැබූ බව කිව යුතු ය. රජ පවුල කිතුනු වීම ධර්ම ප්‍රචාරයට ඉමහත් වාසියක් වූ බව ඔබට වැටහෙනවා ඇත.

පීඩා නොපැමිණියේ ද නොවෙයි. සතුරු රජවරු කිතුනුවන් පෙළූහ. බාහිර පීඩන, ආගම් විරෝධී පීඩන, පාලකයන් අතර තරග හා පෘතුගීසි පාලකයන්ගේ කෲරතර ක්‍රියාදාමය හේතුකොට ගෙන සභා ව්‍යාප්තිය මන්දගාමී වූ බව දැක්වෙයි.

1658 දී ඕලන්දයන් යාපනය අල්ලා ගත් විට කතෝලික ධර්මදූත කටයුතු සම්පූර්ණයෙන් අඩපණ විය.

**දහම් බීජය රෝපනය කළ නිකායයන්**

ශ්‍රී ලංකාවෙහි දහම් සේවාවට කැපවූ පැවිදි නිකායයන් වශයෙන්, ප්‍රැන්සිස්කාන, අගුස්තින, දොමිනිකාන හා ජේසු නිකායයන් හැඳින්විය හැකි ය.

අසීසියේ ප්‍රැන්සිස් තුමන් විසින් අරඹන ලද, එම නාමය දරණ නිකායේ පියවරුන් පස් දෙනෙක් 1543 දී සිංහල රාජදූත සලප්පු ආරච්චි සමග ලංකාවට පැමිණි අයුරු සඳහන් කළෙමු. ඉමහත් බාධකයන් මැද දහම් සේවාවේ යෙදුණු මේ මිෂනාරිවරු පුරා වසර 60 ක් තිස්සේ මෙරට ධර්මදානයෙහි ලා තනිව ම කළ සේවය ප්‍රශංසා කටයුතු ය. මෙම නිකායේ මිෂනාරීන් විසින් ගොඩ නංවන ලද දේවස්ථාන නවගමුව, මාපිටිගම, දොම්පේ, වත්තල හා කොළඹ යන ස්ථානවල පිහිටියේ ය. කොළඹ සිට දෙවුන්දර දක්වා දේවස්ථාන 40 ක් ද, ගාල්ලේ දෙව් මැදුරක් හා ක්‍යාරාමයක් ද, කොග්ගල ශු. ජුසේ තුමාට කැප කරන ලද පල්ලියක් ද මොවුන් විසින් තනන ලදී.

මේ නිකායේ අන්තෝනියෝ පෙක්සෝටෝ පියතුමා සිංහල පද්‍ය කාව්‍යක් ද, දෘෂ්‍ය කාව්‍යයක් ද, ආගමික නාට්‍ය කිහිපයක් ද රචනා කළ බව ඉතිහාසයෙහි දැක්වෙයි. මාතර පැවැති ප්‍රථම පාස්කු දර්ශනය ද මේ පියතුමාගේ නිෂ්පාදනයක් වූ බව සමහරු කියති. ප්‍රැන්සිස්කානු පියවරුනගේ අවංක ජ්වලිත සේවය හේතුකොට වෙනත් පැවිදි පූජක පිරිස් මෙහි පැමිණීමේ දේව ආශිර්වාදය ලක්වැසි ජනතාවට ලැබිණි.

1602 දී ජේසු නිකායේ ද, 1605 දී දොමිනිකාන නිකායේ ද, 1606 දී අගුස්තින නිකායේ ද පියවරු මෙහි පැමිණ දහම් සේවයෙහි යෙදුණ හ. මහඔයෙන් එගොඩ පෙදෙස ජේසු නිකායටත්, සබරගමුව අගුස්තින නිකායටත්, සත් කොරළය දොමිනිකාන නිකායටත්, සෙසු ප්‍රදේශ ප්‍රැන්සිස්කාන නිකායටත් භාර දෙන ලද්දේ කොචින්හි රදගුරුතුමන් විසිනි.

ජේසු නිකාය ඇරඹූ ලොයෙලාහි සාන්ත ඉග්නාසියුස් උපදෙස් දෙමින් මෙසේ පැවසී ය. "දහම් සේවයෙහි නියුතු අය, දේශිය භාෂාවෙන් ඉගැන්විය යුතු බැවින්, මිෂනාරිවරුන්ගේ ප්‍රථම කාර්යය වනුයේ දේශිය භාෂාවන් හැදෑරීමය". මෙරට සේවය කළ ජේසු නිකායේ පියවරු, මේ උපදෙස් අනුව ක්‍රියා කරමින්, සිංහල-දෙමළ භාෂාවන් හදාරා පඬිවරු බවට ද පත්වූහ. 1616 දී ප්‍රාණ පරිත්‍යාගී වූ මතෙයෝ පෙලංගොට්ටි, ජෝන් මනෙල්ල එවැනි අය වූහ. දෙමළ භාෂා විශාරද ලැම්බර් රුයිස් පියතුමා අවසන් හුස්ම හෙළුවේ දෙමළ බසින් දෙවියන් යදිමින් ය.

**මෙම පියවරුන් කළ පොත් දෙවර්ගයකි.**

- යුරෝපීය පියවරුන්ට දේශිය භාෂා ඉගෙනුමට ආධාර වශයෙන්,
- දේශිය ජනයාට ධර්මය හැදෑරීමට මාර්ග වශයෙන්,

මෙම සාහිත්‍යමය පදනම අදත් අනුස්මරණය කෙරෙයි.

දොමිනිකාන හා අගුස්තිනි නිකායික පියවරු මෙරට දියත් කළ දහම් සේවාවේ හේතුවෙන්, රඹුක්කන, දූනගහ, අත්තනගල්ල, වැලිවේරිය, පිටගල්දෙනිය, මාපිටිගම, අම්පේ, බෙන්තොට, නාරාහේන්පිට වැනි ගම්වල මිසම් පිහිටුවන ලදී. ඒ ඒ ප්‍රදේශවල 500 - 3000 දක්වා කතෝලික බැතිමතුන් සංඛ්‍යාවක් සිටි බව ඉතිහාසඥ කෙව්රෝස් දක්වයි.

**අධ්‍යාපනය, සමාජ සේවය හා සංස්කෘතික දායාද :**

එකල පැවැති යුරෝපීය සිරිත අනුව, පෘතුගීසි පාලකයෝ ලක්දිව අධ්‍යාපනය පූජක පක්ෂයට භාර දුන්හ. ඒ නිසා ම නොබෝ කලකට පෙර ප්‍රැන්සිස්කාන පියවරු මෙහි දෙව්මැදුරු අසල පාසල් ද ආරම්භ කර, ආගම, ලිවීම, ගායනය, ලතින් භාෂාව හා සදාචාරය වැනි විෂයයන් ඉගැනවූහ. මෙහි පැමිණි සෙසු නිකායික පියවරු ද එලෙස ම කළහ. දේවස්ථාන ආශ්‍රිත ගැමි පාසල් හැර නගරබද විදුහල් ද පැවැත්වූහ. කොළඹ, යාපනය, නවගමුව වැනි ස්ථානයන්හී එවැනි විදුහල් තිබූ බවට සාක්ෂි ඇත. ගුරු විදුහලක් ද ප්‍රැන්සිස්කාන පියවරුන් විසින් පාලනය කරන ලද බව ඉතිහාසයෙහි දැක්වෙයි.

ශු. සභාවේ සාමාන්‍ය සිරිත අනුව, මෙරට මිෂනාරීන් විසින් කොළඹ, යාපන, මන්නාරම වැනි ස්ථානවල රෝහල් අරඹන ලදි. එපමණක් ද නොව රෝගින්ගේ හා දුගින්ගේ සහනය මෙන්ම සුවපහසුව සඳහා ද "දයා සේවා සමාගම" නමින් තවත් ආයතනයක් තිබූ බව වාර්තා වෙයි. අනාථ දරුවනට අධ්‍යාපනය දීම, මළවුන් වැළලීම වැනි සේවාවන් මෙම සමාගම මගින් සංවිධානය කෙරුණු බව ද දැක්වෙයි. රෝහල් සේවාව සඳහා අවශ්‍ය විය පැහැදම් සම්මාදම් මගින් ලබාගත් අතර, කතෝලිකයන් එම රෝහල්වල වැටුප් රහිත දයා සේවාවක් කළ බව ද සඳහන් වෙයි. පෘතුගීසි ආභාෂයේ හේතුවෙන් යම් යම් සංස්කෘතික අංගයන් සිංහල ද්‍රවිඩ සංස්කෘතියට එක්වූ බව කිව යුතු ය. ඉන් සමහරක් මෙසේ දක්වමු.

- කුල භේදයේ නුසුදුසු අංග ක්‍රමයෙන් ඉවත් වීම.
- විවාහය හා සම්බන්ධ කිතුනු සිරිත ගුරු කරනු ලැබීම.
- සමහර පෘතුගීසි වචන සිංහල භාෂාවට එක්විය. (පේදුරු, පාවුළු, ජූසේ ආදී නාමයන් : බෙන්තික්දික්, කුරුසේ, කොන්තේ, කොම්සම වැනි වචන)
- අපරදිග ගෘහ නිර්මාණ ශිල්පය, සිත්තම් හා මූර්ති කලාව, සංගීතය, ඇඳුම් පැළඳුම් මෙරටට ඇබ්බැහි වීම.
- ආගමික නාට්‍ය රඟපෑම
- ඉරිදා විවේක දවසක් ලෙස සලකනු ලැබීම.
- නත්තල උත්සවාකාරයෙන් ගැනීම.
- පාස්කු කාලය උපවාස කාලයක් වශයෙන් ගැනීම.

පෘතුගීසින් බයිනෙත්තුවේ බලයෙන් ක්‍රිස්තියානි ආගම පතල කළ බව සමහරු කියති. මෙය සත්‍ය නම්, ලන්දේසි යුගයේ දී ඇතිවූ කෲරතර පීඩන ඉදිරියේ කතෝලික ධර්මය මැකී යනවා නොඅනුමාන ය.

## ධර්මාචාර්ය විශේෂ විභාගය සඳහා කියවිය යුතු අතිරේක පොත්

- ශු. බයිබලය
- ඊශ්‍රායෙල් ඉතිහාසයේ විකාශය - 2
- ධර්මෝපදේශය පිළිබඳ අනුශාසනා පත්‍රය
- ශු. සභාව පිළිබඳ වතිකාන ප්‍රකාශනය
- වර්තමාන ලෝකයේ ශු. සභාව පිළිබඳ වතිකාන ප්‍රකාශනය
- ගිහි ධර්මදූත සේවාව පිළිබඳ වතිකාන ප්‍රකාශනය
- ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසය
- නව විශ්විය ධර්මෝපදේශය පොත
- දහම් මග සඟරාව
- දහම් දියඹ
- සාවනා පොත් පෙළ
- දහම් පාසල් ගුරුවරයා
- දම්මිණ සඟරාව
- ප්‍රාග් ඉතිහාසය තුළ දේව අනාවරණය
- බයිබලය ගැන දැනගන්න (පෝස්ටරය )
- ජනවන්දනා වර්ෂය (පෝස්ටරය)
- උසස් පෙළ කතෝලික ධර්මය විෂයය අත් පොත්
- පවි සමාව
- සිරි ලක් කිතු සසුන
- දිව්‍ය සත්ප්‍රසාදය

**ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය**

19, බැල්කම් පෙදෙස,

කොටා පාර, කොළඹ 08.

දුරකථනය : 011-2685459

ෆැක්ස් : 011-2665021

විද්‍යුත් තැපෑල: natcatbible@gmail.com

ISBN 978-624-6121-01-3

9 786246 121013

Printed By : S&S Printers 0112384028